


# “අපේ ඉඩම්, අපේ ජීවිතයයි”

## මහජන ඉඩම් කොමිෂන් වාර්තාව
## 2019-2020

PARL
People's Alliance for Right to Land

ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය காணி உரிமைக்கான மக்கள் கூட்டணி **People's Alliance for Right to Land**

# “අපේ ඉඩම්, අපේ ජීවිතයයි”


## මහජන ඉඩම් කොමිෂන් වාර්තාව

## 2019-2020

People's Alliance for Right to Land











PARL
People's Alliance for Right to Land

# මහජන ඉඩම් කොමිෂන් වාර්තාව 2019-2020

# පටුන

**07** ස්තූතිය

**11** විධායක සාරාංශය

**17** හැඳින්වීම

1.1 ක්‍රමවේදය
1.2 අරමුණ
1.3 මගපෙන්වන වටිනාකම් සහ මූලධර්ම

**26** ජනතාවගේ ඉඩම් ගැටලු

2.1 ඉඩම් භුක්තිය අහිමි කිරීම
2.2 ජීවනෝපායන් සහ සමාජ සුරක්ෂිතභාවය අහිමි වීම
2.3 පාරිසරික හායනය
2.4 අනන්‍යතාවය වියැකීයාම
2.5 ඉඩම් සන්තකය, ඉඩම් අයිතිවාසිකම් සහ මානව ආරක්ෂාව සඳහා කාන්තාවන්ගේ අරගල

**65** නිර්දේශ

**88** ඇමිණුම්



# ස්තුතිය

විමසීම් සඳහා සහභාගී වූ සියලුම පුද්ගලයින්ට සහ වින්දිත ප්‍රජාවන්ට ඔවුන්ගේ කාලය, හැකියාව සහ අත්දැකීම් අපත් සමඟ බෙදා ගැනීම පිළිබඳව මහජන ඉඩම් කොමිෂන් කණ්ඩායම විසින් ස්තුතිවන්ත වන අතර ම අතිශයින් අගයකොට සළකන්නෙමු.

උපදේශන ක්‍රියාවලියේ දී අපට ලබා දුන් සියලුම සහයෝගය වෙනුවෙන් සකුන්තලා කදිරගාමර්, නීතිය හා සමාජ භාරය (LST) සහ කාර්ය මණ්ඩලය, ගෞතමන් බාලචන්ද්‍රන් සහ වගවීම උදෙසා වූ ඉල්ලුම හා මැදිහත්වීම් වර්ධනය කරවීම සඳහා වූ ව්‍යාපෘතිය (IDEA) කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමු. විමසීම් සංවිධානය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින ඉඩම් අයිතිය සඳහා වන ජනතා සංධානයේ (PARL) හවුල්කරුවන් වෙත අපි හදවතින්ම ස්තුතිවන්ත වන්නෙමු. මෙම මූලාරම්භය යථාර්ථයක් බවට පත්කිරීම වෙනුවෙන් පහත සඳහන් සංවිධාන විසින් දරන ලද දැඩි වෙහෙස පිළිබඳව අපි විශේෂයෙන්ම කෘතඥ වන්නෙමු.

- ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය (NAFSO)
- මන්නාරම සමාජ හා ආර්ථික සංවර්ධන සංවිධානය (MSEDO)
- මානව නංවාලීමේ සංවිධානය (HEO)
- ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (MONLAR)
- ඉඩම් අයිතිය සඳහා අම්පාර දිස්ත්‍රික් සන්ධානය
- කඳුකර ජනතා ඉඩම් අයිතිය සඳහා ව්‍යාපාරය (MPPLR)
- උතුරුමැද පළාත් ජනතා සැලසුම් සංසදය
- ඌව පළාත් ජනතා සැලසුම් සංසදය
- මධ්‍යම පළාත් ජනතා සැලසුම් සංසදය
- පාස පරවිගල් තරුණ සංවිධානය, කිලිනොච්චිය

මෙම මුලපිරීම සංකල්පීයකරණය කිරීමේ දී අත්‍යාවශ්‍ය අංගයක් වූ, නීතිය හා සමාජ භාරයේ හිටපු ජ්‍යෙෂ්ඨ පර්යේෂක, අභාවප්‍රාප්ත විජේ නාගරාජ් මහතාගේ දැක්ම, මතවාදය සහ කැපවීම අපි මෙහි දී ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු.

අප විසින් මෙම වාර්තාව දිවයින පුරා ඉඩම් හා නිවාස අයිතිවාසිකම් වෙනුවෙන් අරගල කරන සියලුම ජන කොටස් හා ප්‍රජාවන් වෙනුවෙන් පිළිගන්වන අතර, ශ්‍රී ලංකාවේ ඉඩම් හා නිවාස සම්බන්ධ ගැටළු සහ දුක්ගැනවිලි විසඳීමේ දී ජනතාව කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් වෙනුවෙන් පෙනී සිටීමට කැප කරන්නෙමු.

# මහජන ඉඩම් කොමිසම කණ්ඩායම

## කොමිසමේ සමාජිකයින්

- **අර්මිසා ටෙගල්,** නීතිඥ කොළඹ
- **ගනේෂලිංගම් ගනේෂ්,** වතු කම්කරු අයිතිවාසිකම් සමාජ ක්‍රියාකාරී, කඳුකර ජනතා ඉඩම් අයිතිය සඳහා ව්‍යාපාරය, මස්කෙලිය
- **ගොඩ්ප්‍රි මලර්නේසන්,** සමාජ ක්‍රියාකාරී, මාතරම් පදනම වව්නියාව
- **ඉරෝමි පෙරේරා,** පර්යේෂිකා, කොළඹ
- **ජන්සිලා මජීඩ්,** කාන්තා අයිතිවාසිකම් සමාජ ක්‍රියාකාරිණිය, කාන්තා ක්‍රියාකාරී ජාලය, මුලතිව්
- **කේ. නිහාල් අහමඩ්,** සමාජ ක්‍රියාකාරී, මානව නංවාලීමේ සංවිධානය, අම්පාර
- **මහේන්ද්‍රන් තිරුවරන්ගන්,** යාපනයේ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය
- **ප්‍රියාලාල් සිරිසේන,** නීතිඥ කොළඹ
- **ප්‍රියංකර කොස්තා,** සමාජ ක්‍රියාකාරී, ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය, මීගමුව
- **සජීව චාමිකර,** පරිසරවේදී, ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය, කොළඹ
- **සරලා එම්මානුවෙල්,** කාන්තා අයිතිවාසිකම් සමාජ ක්‍රියාකාරිණී, ආපදා කළමනාකරණය සඳහා කාන්තා සන්ධානය, මඩකලපුව

## ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය සම්බන්ධීකරණ කණ්ඩායම

- සඳුන් තුඩුගල
- මරීසා ද සිල්වා
- නිල්ශාන් ෆොන්සේකා
- නටාෂා වැන්හොෆ්

## වාර්තාව කෙටුම්පත් කිරීම, සංස්කරණය කිරීම සහ වෙනත් සහාය

- ගෞතමන් බාලචන්ද්‍රන්
- දිනාලි අබේසේකර
- චන්නක ජයසිංහ
- අනිත්‍රා වරියා
- ටාරා ක්වින්
- බිනෙන්ද්‍රී පෙරේරා
- ලක්මාලි හේමචන්ද්‍ර

## සටහන් වාර්තා කිරීම

- ලිඩියා ගීතාංජලී ත්‍යාගරාජා
- පී.එන්. අනුරාදි පෙරේරා
- විද්‍යා මුතුලිංගම්
- ඈන් ෆිගුරාඩෝ
- නෙලූනි තිලකරත්න
- මඩසාමි විජයකාන්ත්
- විනුෂා පෝල්රාජ්
- එස්.එල්. සුරේෂ්
- එම්. මිරුනාලන්
- අනුරාධ ගීත් පතිරණ
- සෑම් පෝල්

## පරිවර්තකයන්

- තම්බිරාජා නෙසරාජ්කුමාර්
- ඇන්තනි ජේසුදාසන්
- අලදීන් හමීර්

## සැපයුම් සහය

- එස්.එච්. වසන්ත
- නලින්ද නන්දසිරි හන්වැල්ල

**කවරය සහ පිටු සැකැස්ම** - දුෂාන්ත කුමාර



# විධායක සාරාංශය

පවතින ඉඩම් ප්‍රතිපත්ති, ඉඩම් නීති සහ ඉඩම් පරිපාලන ක්‍රියා පටිපාටි සහ භාවිතයන් හේතුවෙන් ප්‍රජාවන් මුහුණ දෙන විවිධාකාර ගැටලු සහ ඒවායේ ප්‍රතිඵලයන් අධ්‍යයනය කිරීමේ අරමුණින් මහජන ඉඩම් කොමිසම ආරම්භ කරන ලදී. රජයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ජනතාවගේ අපේක්ෂාවන් අඛණ්ඩව බැහැර සිටින තත්ත්වයක් තුළ ජනතා අදහස් මත ගොඩනැගෙන ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සඳහා මුල පිරීම මෙහි මූලික අරමුණ වේ.

මහජන ඉඩම් කොමිෂන් සභාව සමාජ ක්‍රියාකාරීන්, ශාස්ත්‍රඥයින්, පර්යේෂකයින් සහ නීතිඥයින් ඇතුළු පුද්ගලයින් 11 දෙනෙකුගෙන් සමන්විත වේ. කොමිෂන් සභාව 2019 මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළ දී අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, හැටන්, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මොණරාගල, මුලතිව්, මාතර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක 18 ක් පුරා අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල ප්‍රජාවන් සහ බලපෑම ට ලක් වූ පුද්ගලයින් වෙත පැමිණ අදහස් විමසීම් සිදුකරනු ලැබීය. කොමිසමේ සාමාජිකයින් විසින් පුද්ගලයන් 885 ක්, එනම් කාන්තාවන් 428 ක්, පිරිමින් 452 ක් සහ තවත් 5 දෙනෙකු සමඟ සාකච්ඡා කරනු ලැබීය. විවිධ ජනවාර්ගික, ආගමික, සමාජීය හා ආර්ථික පසුබිම් සහිත භූගෝලීය ප්‍රදේශ සහ හරස්කඩ නියෝජනය කිරීම හැකි තරම් පුළුල් ලෙස සහතික කිරීමේ අරමුණින් මෙම ස්ථාන තෝරාගෙන තිබේ. විරෝධතා දක්වන ස්ථාන, අවතැන් වූ සහ ඉඩම් නොමැති ප්‍රජාවන්, නෙරපා හරින ලද්දන් සහ/හෝ වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඇති අය සිටින ස්ථාන සහ සංවර්ධන හා නාගරික පුනර්ජනනීය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින හෝ සැලසුම් කර ඇති ප්‍රදේශ වෙත කොමිෂන් සභාව විසින් නිරීක්ෂණ චාරිකා සිදුකරන ලදි.

කාලය, සම්පත්, සංවිධායක හවුල්කරුවන් ට ලබාගත හැකි තොරතුරු සීමා වීම සහ වෙනත් ප්‍රායෝගික කරුණු හේතුවෙන් බලපෑම ට ලක් ව ඇති සියලුම ප්‍රදේශ නැරඹීමට කොමිසමට ඉඩ නොලැබුණි. කාලය සීමාවීම ජනතාව සමඟ ගැඹුරු ලෙස සාකච්ඡා කිරීම කෙරෙහි ද බලපෑම් ඇතිකරවනු ලැබීය. දිගු කලක් තිස්සේ පැවති අසාධාරණයන් හේතුවෙන් පරම්පරා ගණනාවක් පුරා පැතිර ඇති වූ බලපෑම් විස්තර කිරීමට මිනිසුන්ට බොහෝ කාලයක් අවශ්‍ය බව මෙහි දී අපේක්ෂා කරන ලද අතර, ඒ බව පැහැදිළිවම පෙනෙන්නට ද තිබුණි. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය නිසා ඇති වූ අයුක්තිය සහ අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ අංශය පිළිබඳ ව සොයා බැලීමට බොහෝ විට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.

මෙම වාර්තාවේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය, නීතිය සහ පරිපාලනය සඳහා මග පෙන්වීමක් ලෙස ක්‍රියා කිරීමයි. මෙහි දී වත්මන් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට උත්සාහ කරන නිසා, ඉඩම් අරගල හේතුවෙන් ඇති වන ජනතාවගේ දුක් ගැහැටවලට වඩා හොඳින් ප්‍රතිචාර දැක්වීමට සහ ඔවුන්ගේ ජීවිත සංවර්ධනය කිරීමට උපකාරී වන අතරම, අනාගත පරපුර වෙනුවෙන් පාරිසරික තිරසාරභාවය සහ සමාජ වගකීම ප්‍රවර්ධනය කිරීමට ද හැකි වනු ඇත. මෙම වාර්තාව මගින් නිශ්චිත ඉඩම් අරගල හා ගැටළු සඳහා විසඳුම් ලබා නොදෙන අතර ඒ වෙනුවට මිනිසුන් හා ඉඩම් සමඟ ගනුදෙනු කිරීමේ දී යහපත් භාවිත ක්‍රියාපටිපාටීන්, මාර්ගෝපදේශන මූලධර්ම සහ ප්‍රමුඛතා නිර්දේශ කරනු ලැබේ.

කොමිෂන් සභාව සහ PARL විසින් මෙම වාර්තාව සහ එහි නිර්දේශ ඉඩම්, වන්දි ගෙවීම්, සංක්‍රාන්ති යුක්තිය, ප්‍රතිසන්ධානය, කාන්තා අයිතිවාසිකම්, සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන රජය, අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන ආදී විවිධ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරනු ඇත. විවිධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මෙන්ම ආයතනික හා කාර්ය පටිපාටික ප්‍රතිසංස්කරණ සඳහා වන මෙම වාර්තාවේ නිර්දේශයන් බලපෑමට ලක් වූ ප්‍රජාවන් විසින්ම මෙහෙයවනු ලබන අතර, සමස්තයක් වශයෙන් ඉඩම්

හා ඉඩම් පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ වඩාත් අර්ථවත් හා තිරසර සාකච්ඡාවකට මෙය හේතු වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. තව ද, මෙම වාර්තාව සිංහල හා දෙමළ භාෂාවෙන් විමසීමට සහභාගී වූ ප්‍රජාවන් වෙත මෙන්ම රට පුරා විවිධ ආකාරයේ ඉඩම් අරගලවල යෙදී සිටින අය සමග ද බෙදා ගනු ඇත. හවුල් අත්දැකීම් සහ සාමූහික නිර්දේශයන් අඛණ්ඩ උද්දේශන සහ මහජන ව්‍යාපාර ශක්තිමත් කිරීමට සහ දිරිගැන්වීමට ඉවහල් වනු ඇති බවත්, ප්‍රජාවන් විසින් මෙම වාර්තාවේ අන්තර්ගතය ඉදිරියට ගෙනයනු ඇති බවත් මෙන්ම ඒවා ඔවුන්ගේ කාර්යයන් හි දී භාවිතා කරනු ඇතැයි ද, අපි අපේක්ෂා කරන්නෙමු. හවුල් අත්දැකීම් සහ සාමූහික නිර්දේශයන් මෙම ප්‍රජාවන්ගේ අඛණ්ඩ උද්දේශනයන් සහ ව්‍යාපාරයන් හි දී ඔවුන්ව ශක්තිමත් කරනු ඇතැයි ද, මෙම වාර්තාවේ අන්තර්ගතය ඔවුන්ගේ කාර්යයන් සඳහා යොදා ගැනීම සඳහා ඔවුන්ට උපකාරී වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙම වාර්තාව සාහිත්‍ය සමාලෝචනයක, විමසීම්වල දී සටහන් තබාගන්නන් විසින් ගන්නා ලද පුළුල් සටහන් සහ පටිගත කිරීම්වල සහ, කොමිසමේ සාමාජිකයින් සහ පර්යේෂකයන්ගේ විසින් සිදුකළ නිරීක්ෂණ හා විශ්ලේෂණයන් හි එකතුවකි. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් පවත්නා ප්‍රවණතාවන් සහ තමන්ගේ සොයාගැනීම් බෙදා ගැනීම සහ විශ්ලේෂණය සඳහා මෙන්ම, රැස්කරනු ලබන තොරතුරු සාරාංශගත කිරීමේ හා සැසඳීමේ ආකාරයන් හඳුනා ගැනීම සඳහා ද නිතිපතා සංවාද පවත්වනු ලැබීය. තොරතුරු පුළුල් ලෙස ප්‍රධාන තේමාවන් හතරකට වර්ගීකරණය කර ඇත - භුක්තිය අහිමි කිරීම, ජීවනෝපායන්, පරිසරය සහ අනන්‍යතාවය.

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති සියලුම නිර්දේශයන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ දැනුම්වත් කිරීම් වලින් ලබාගත් එකතු කිරීම් වලින් ලබාගෙන තිබේ.

## ඉඩම් ගැටලුව- ප්‍රධාන තේමාවන් හතර

**භුක්තිය අහිමි කිරීම** - ඉඩම් භුක්තිය අහිමි කිරීම යනු ජීවනෝපායන්, සමාජ ආරක්ෂණ හා සමාජ සංචලතාව, පාරිසරික යුක්තිය සහ අනන්‍යතාවයට බලපාන බහුවිධ ගැටලුවකි. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉඩම් පවරා ගැනීමේ ගැටලු විශාල සංඛ්‍යාවක් හමුදාකරණය හා ආයතනික වශයෙන් පදනම් වූ ජනවාර්ගිකත්වය මත පදනම් වූ වෙනස්කම් කිරීම සමග සම්බන්ධ විය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ආකෘතිය, නිලධාරිවාදී අසමත්වීම් සහ මලයාහා මක්කල් හෝ උඩරට ජනතාව සම්බන්ධ අවස්ථාවේ දී මෙන් විශේෂයෙන් පාලන ක්‍රමවේදය තුළින්ම සිදුකරන බැහැර කිරීම් යනාදිය ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය අහිමි කිරීමට හේතුවන ප්‍රධානම සාධක වේ.

**ජීවනෝපායන් සහ සමාජ සුරක්ෂිතභාවය අහිමි කිරීම** - භුක්තිය අහිමි කිරීම ප්‍රජාවගේ ජීවනෝපාය කෙරෙහි බලපෑම් කෙරෙන බොහෝ ස්වරූපයන් තිබේ. පුළුල් මට්ටමින්, මෙම කොටස මගින් ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවනෝපායන් සඳහා වැදගත් වන අවකාශයන් වෙත ප්‍රවේශය සහ බලය අහිමිවීම හේතුවෙන් ප්‍රජාවන් මුහුණ දෙන බාධක විස්තර කෙරේ. ජනතාවගේ ජීවනෝපායන් කෙරෙහි බලපාන ගැටලුවල ප්‍රධාන අංග හතර වන්නේ (1) යුද්ධය, ගැටුම් සහ හමුදාකරණය (2) නිලධාරිවාදී අසමත්වීම්, (3) මහා පරිමාණ සංවර්ධනය, කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වන ආරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම (4) මිනිසුන්ගේ ජීවනෝපායන් සහ ඔවුන්ගේ ඉඩම් හිමිකාරිත්වය අතර සම්බන්ධතාවයේ තිබෙන අද්විතීය ස්වභාවයක් සහිත වැවිලි අංශය.

**පාරිසරික හායනය** - කොමිෂන් විභාගය අතරතුර, සහභාගී වූ ජනතාවගෙන් බොහෝ දෙනා තම ජීවනෝපායන් අවට පරිසර පද්ධති සමග සම්බන්ධ වී ඇති බවත්, ඒවා අවට ස්වාභාවික සම්පත් මත යැපෙන බවත් දැන සිටියහ. රජයේ ප්‍රතිපත්ති, රාජ්‍ය අරමුදල් සහිත සංවර්ධන ව්‍යාපෘති සහ රාජ්‍යයේ නොවන ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් සහ ප්‍රජාවන්ගේ ඉඩම් පරිහරණ ක්‍රියාකාරකම් අවට පරිසර පද්ධතියට අහිතකර ලෙස බලපාන අවස්ථා බොහොමයක් කොමිසමට හඳුනාගත හැකිවිය. කොමිෂන් සභා විභාගය මත පදනම්ව, පහත සඳහන් ප්‍රධාන ඉඩම් පරිහරණ ආකාරයන් පරිසරයට අහිතකර බව

හඳුනාගෙන තිබේ - (1) වාරිමාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘති ආදී මහා පරිමාණ ව්‍යාපෘති, (2) සංචාරක ව්‍යාපාරය, (3) මහා පරිමාණ වාණිජ කෘෂිකර්මාන්තය (4) හමුදාකරණය.

**වියැකී ගිය අනන්‍යතාව** - ප්‍රතිපත්ති සම්පාදනයේ දී හෝ නීතිය අනුව, ඉඩම් සමඟ ඇති සම්බන්ධය දකින්නේ - ඔප්පු, බලපත්‍ර, බලය පැවරීමේ ආකෘති පත්‍ර, ගාස්තු සහ බදු ලේඛන හරහා ය. කෙසේ වෙතත්, රට පුරා පැවැත් වූ ජනතා විමසීම්වල දී, ජනතාව ඉඩම් හා සම්බන්ධවන හා බැඳෙන විවිධ වූ ස්වරූපයන් සහ ඒවා ඔවුන්ගේ අනන්‍යතාවය සහ ප්‍රජාව හැඩගස්වන ස්වරූපයන් ඔවුහු පැහැදිලි ව විස්තර කළහ. ඉඩම් ගැටලු විසඳීමේ ක්‍රියාවලිය මගින්, මිනිසුන්ගේ පුද්ගල හා වාර්ගික සංදර්භයන් අනුව හැඩගස්වනු ලැබ ඇති අත්දැකීම් සහ ඔවුන්ගේ අභිලාෂයන් පිළිගත යුතුය. මෙම සම්බන්ධතාවයන් වර්ගීකරණය කර ඇත්තේ, (1) පවුල් අනන්‍යතාවය, (2) ආගමික හා ප්‍රජා අනන්‍යතාවය සහ (3) භුක්තිය අහිමි කළ වූවන්ගේ අනන්‍යතාවය වශයෙනි.

එහෙත් ඉඩම් සමඟ ඇති එවන් සම්බන්ධතාවයකින් සැමවිටම අදහස් කෙරෙන්නේ ඔවුන්ට දැන් සිටින ස්ථානයේම දිගින් දිගටම රැඳී සිටීමට අවශ්‍ය බව නොවේ. තම ජීවිතයේ ප්‍රගතිය, තම දරුවන් සඳහා වඩා යහපත් ජීවිත සුරක්ෂිතාවය, අනාගතය සඳහා පරිසරය ආරක්ෂා කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට යන්ත්‍රණයක් නොමැති බැවින් ස්වභාවික විපත් වලින් ආරක්ෂා වීම ආදිය වෙනුවෙන් ඉවත්වී යාම පිළිබඳ ව ජනතාව සාකච්ඡා කළහ.

**ඉඩම් හිමිකාරීත්වය, ඉඩම් අයිතිවාසිකම් සහ මානව ආරක්ෂාව සඳහා කාන්තාවන්ගේ අරගල** - මහජන ඉඩම් කොමිෂන් සභා රැස්වීම්වල දී, අපි සෑම දිස්ත්‍රික්කයකම බොහෝ කාන්තාවන් සමඟ සාකච්ඡා කළෙමු. කාන්තාවන් බොහෝ ඉඩම් අරගලවල කොටස්කරුවන් සහ නායිකාවන් බවට පත්ව ඇති අතර සමහර අවස්ථාවල දී කාන්තාවන් තම ප්‍රජාවන් සඳහා ඉඩම් අයිතිවාසිකම් සහතික කිරීම වෙනුවෙන් හඬ සහ බලය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් මහජන දේශපාලනයට ද, අවතීර්ණ වී තිබේ. කාන්තාවන්ගේ අනන්‍යතාවන් හා සමාජ ආර්ථික සුරක්ෂිතතාවයට සමීපව ඉඩම් සම්බන්ධ වී ඇති බව කොමිෂන් සභාව සමඟ කළ මෙම සාකච්ඡාවලින් පැහැදිලි විය. රැස්වීම් කිහිපයක දී කොමිසමේ සමාජිකයින් කාන්තාවන්ට වඩාත් නිදහසේ කථා කිරීමට අවස්ථාව ලබා දීම සඳහා ඔවුන් වෙන් වෙන්ව කණ්ඩායම්වලට බෙදා කාන්තාවන් සාකච්ඡා කරනු ලැබී ය. ඉඩම්වලින් බැහැර කිරීම සහ එහි ප්‍රතිඵල ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ අත්දැකීමක්ය යන කාරණය විද්වත් සාහිත්‍යයේ දී මෙන්ම ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල එවැනි ක්‍රියාදාමයන්ගේ ඉතිහාසය තුළ ද, තහවුරු වී තිබේ. මෙම ස්ත්‍රී - පුරුෂ යථාර්ථය පිළිබඳ ගැඹුරු සාකච්ඡාවකට, ලේඛනගත කිරීමට සහ විශ්ලේෂණය කිරීමට මහජන විමසීම් මුළුමනින්ම හිතකර නොවූ නමුත්, අනිවාර්යයෙන්ම කාන්තාවන්ගේ සාක්ෂි මගින් ඔවුන්ගේ නොපෙනෙන පෞද්ගලික අත්දැකීම් වඩාත් දෘශ්‍යමාන කෙරෙයි. කාන්තාවන්ගේ අරගල සහ ගැටලු පහත සඳහන් කරුණු හරහා ඉදිරිපත් කරන ලදී - (1) භුක්තිය අහිමි කිරීම, අවතැන්වීම සහ අනන්‍යතාවය, (2) විවාහය සහ දෑවැද්ද, (3) ඉඩම් සහ නිවසේ වැඩකටයුතු, සහ (4) ආරක්ෂාව සහ අභිමානය පිළිබඳ කාන්තාවන්ගේ සංකල්පීයකරණය.

## නිර්දේශ

සියලුම දිස්ත්‍රික්කවල ඉඩම් ගැටලු හේතුවෙන් පීඩාවට පත් ශ්‍රී ලාංකිකයන්ගේ අදහස් හා ඉල්ලීම් මෙම නිර්දේශවලින් පිළිබිඹු වේ. මෙම වාර්තාවේ ග්‍රහණය කරගෙන ඇති අදහස් අතර, සෘජුවම බලපෑමට ලක්ව ඇත්තේ තමාගේම ඉඩමක් වුවද, ඉඩම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔවුන්ගෙන් කිසි විටෙකවත් විමසා නොමැති අය මෙන්ම ප්‍රතිපත්ති සහ තීරකයන් විසින් ප්‍රමාණවත් ලෙස නොසැලකූ අය ද, ඇතුළත් වේ. මෙහි සමහර නිර්දේශයන් මීට ප්‍රථම සිදුකර ඇති ජනතාව කේන්ද්‍ර කරගත් උපදේශනයන් සහ ස්ථාපිත ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර අනෙක් නිර්දේශ මෙම උපදේශනයටම සුවිශේෂී ඒවා වේ.

නිර්දේශයන්ගේ සාරාංශයක් පහත දැක්වේ.

### 1. ඉඩමට පිවිසීමට, සන්තකයේ තබා ගැනීමට සහ භාවිතා කිරීමට ඇති අයිතිය

මෙම නිර්දේශයන් මගින් මිනිසුන්ට ඉඩම් සඳහා ප්‍රවේශය, භාවිතා කිරීම, හිමිකර ගැනීම සහ ශ්‍රී ලංකාවේ ඉඩම් නොමැතිවීම මෙන්ම නිවාස නොමැතිවීම ආදී ගැටලු වඩාත් හොඳින් විසඳා ගත හැකි ආකාරය පිළිබඳ ව නෛතික හා පරිපාලනමය පිළිගැනීමක් වෙනුවෙන් පෙනී සිටී. සමහර නිර්දේශයන් අතරට ඔවුන් කැමති ජීවනෝපායන් වල නිරත වීමේ අයිතිය, රටේ සමහර ප්‍රදේශවල ඇති උරුමය සමඟ සම්බන්ධ විවාහ භාවිතයන්, පරම්පරා ගණනාවක් තිස්සේ ඓතිහාසිකව සිදුවන ඉඩම් සන්තක කරගැනීමේ සහ සමහර ඉඩම්වල ආගමික හෝ සංස්කෘතික වැදගත්කම ආදිය මත පදනම්ව ඉඩම් සඳහා වූ ජනතාවගේ සබඳතා හඳුනා ගැනීම සහ අගය කිරීම ඇතුළත් වේ. පොදු ස්ථාන වෙනුවෙන් ජනතා කේන්ද්‍රීය අර්ථ දැක්වීම් සංවර්ධනය කිරීම (පොදු මහජන ඉඩම් හෝ අවකාශ) සහ ප්‍රජා දේපළ (සාම්ප්‍රදායික හෝ ඓතිහාසික සන්තකයේ හා භාවිතය මත පදනම් වූ ප්‍රජාවන් සන්තකයේ ඇති) සහ ඉඩම් සංවර්ධන ආඥා පනතේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් කොට සැලකීමේ වගන්ති වහා සංශෝධනය කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීම සඳහා ඔවුන් තවදුරටත් අවධානය යොමු කරයි.

### 2. ඉඩම් පාලනය

බලපෑමට ලක් වූ ජනතාවට භූගෝලීය වශයෙන් සමීපතම ආයතනවල දී ඉඩම් පාලන සේවාවන් (ඉඩම් පිළිබඳ තීරණ ගැනීම) ඵලදායී ලෙස ලබා ගත හැකි විය යුතු අතර ඒවා සක්‍රීය විය යුතුය. එවැනි කොමිෂන් සභාවක කාර්යයන් හා ක්‍රියාකාරිත්වය පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ සහිතව ජාතික ඉඩම් කොමිෂන් සභාව (එන්එල්සී) සඳහා නිර්දේශයක් ද මෙහි ඇතුළත් වේ.

### 3. ඉඩම් පරිපාලනය

බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගෙන් බොහොමයක් පැමිණිලි මතු වූයේ මෙම කාරණයට අදාළව ඔවුන් රාජ්‍ය නිලධාරීන් සමඟ කටයුතු කිරීමේ දීය. එබැවින් මෙම කොටසට ඉඩම් පරිපාලනයේ යෙදී සිටින රාජ්‍ය නිලධාරීන් සඳහා වූ චර්යාධර්ම පද්ධතියක් සහ අවම සුදුසුකම් ඇතුළත් ය. මෙම කොටසේ ඇති අනෙකුත් ප්‍රධාන නිර්දේශ අතරට ප්‍රජාවන් සමඟ අර්ථවත් හා ඵලදායී උපදේශන අවශ්‍යතාව සහ පොදු අරමුණු සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද, ඇතුළත් වේ. නිදසුනක් ලෙස, දැනුම් දීමේ අවස්ථාවේ දී පොදු අරමුණ පැහැදිළිව සඳහන් කිරීම, (එය දැනට ක්‍රියාත්මක නොවේ) එසේම ඉඩම් තොරතුරු කල්තියාම බෙදා හැරීම සහ අල්ලස් හා දූෂණ පිළිබඳ ගැටලු විසඳීම සඳහා වූ මාර්ගෝපදේශ ද, ඊට තවදුරටත් අන්තර්ගතය.

## 4. ආරවුල් විසඳීම සහ වන්දි ගෙවීම

මෙම කොටසේ නිර්දේශයන් මගින් පවත්නා නඩු යන්ත්‍රණයන් ශක්තිමත් කිරීම, ගුණාත්මක නීති ආධාර ලබාදීම සහ මැදිහත්වීම් සඳහා ප්‍රවේශයන් ඇති කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලුව විසඳීමට ස්වාධීන යන්ත්‍රණයක් සැකසීම පිළිබඳ ව අවධානය යොමු කෙරේ.

## 5. නැවත පදිංචි කිරීම

මෙම කොටස මගින් පෙන්නුම් කරන්නේ නැවත පදිංචි කිරීම අවසාන පියවරක් ලෙස භාවිතා කළ යුතු අතරම සත්‍යවශයෙන්ම ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නැවත ස්ථානගත කිරීමේ ඇගයීම් සිදු කළ යුතු බවයි. එසේම දැනුම්වත් කිරීමේ වැඩසටහන්, බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ප්‍රජාවන් සමඟ සාකච්ඡා කිරීම මෙන්ම සාකච්ඡා කිරීම සඳහා වන සමස්ත අවශ්‍යතාවය පිළිබඳ ව මෙහි දී තවදුරටත් තර්ක කෙරෙයි. නැවත පදිංචි කිරීම සඳහා වූ දේශීය නීති සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් පිළිපැදිය යුතු බවටත්, අව ම වශයෙන් 'ජාතික ස්වෙච්ඡා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය' අනුගමනය කළ යුතු බවටත් නිර්දේශයන් මගින් ඉල්ලා සිටී.

## 6. හමුදාහරණය සහ මානව ආරක්ෂාව

රජය වහාම ක්‍රියාත්මක වන පරිදි උතුරු හා නැගෙනහිර පළාත් හමුදාහරණය කළ යුතුය. යෝජිත නිර්දේශ අතරට හමුදාව විසින් අත්පත් කරගත් ඉඩම් ප්‍රජාවට ආපසු ලබා දීම, හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගැනීමෙන් අවතැන් වූවන්ට වන්දි, ප්‍රතිෂ්ඨාපන සහ අලාභ ගෙවීම සඳහා ඒ හා සමාන්තර විධි නියෝගයක් ලබාදීම, හෝටල්, ගොවිපොළවල් සහ වෙනත් වාණිජ ව්‍යාපාර ආදී මිලිටරි ව්‍යාපාර අවසන් කිරීම සඳහා ඉල්ලා සිටීම ද, ඇතුළත් වේ.

## 7. ඉඩම් සහ අනන්‍යතාවය

ඉඩම්/ජීවනෝපාය අතර ඇති සම්බන්ධයට සහ මිනිසුන්ට ඒ සඳහා ඇති බැඳීම හා අයිතිවාසිකම් පිළිබඳ ව ගරු කිරීම සඳහා වූ නිර්දේශ මෙම කොටසට ඇතුළත් වේ. උදාහරණ වශයෙන් ප්‍රජාවන් අවතැන්වීම සඳහා පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට හෝ වනජීවී හා වනාන්තර ආරක්ෂා කිරීමට අදාළ හේතුවලින් ප්‍රජාවන් ආරක්ෂා කිරීම පිළිබඳ නිර්දේශ මෙම කොටසට ඇතුළත් ය. ප්‍රදේශයේ තවදුරටත් සිදුවිය හැකි වාර්ගික ආතතීන් වළක්වා ගැනීම වෙනුවෙන් ඉඩම් වෙන් කිරීමේ දී, විවිධ ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන්හි පුද්ගලයින් තරඟකාරී හිමිකාරිත්වය ඉල්ලා සිටින අවස්ථාවන්හිදී භූමිය, ජල සම්පත් ආදිය සංවාද හා සාකච්ඡා මගින් මිත්‍රශීලීව විසඳා ගත යුතුය. කුල භේදය හේතුවෙන් ඉඩම් අහිමි වූවන් සඳහා ඉඩම් වෙන් කිරීම තවදුරටත් පුළුල් කළ යුතුය.

## 8. ඉඩම් සහ ජීවනෝපාය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් 80% ක් කුඩා පරිමාණ ගොවීන් විසින් භාවිතා කරනු ලැබේ. එබැවින් ඉඩම් ප්‍රතිපත්ති ඔවුන්ගේ ජීවනෝපායන්හි තිරසරභාවය ආරක්ෂා කර සහතික කළ යුතුය. එනිසා කෘෂිකර්මාන්තය හා ධීවර කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති ඉඩම් ප්‍රතිපත්තියට සහ එය ක්‍රියාවට නැංවීමට අනුපූරක විය යුතුය. ප්‍රතිපත්ති මගින් කාන්තාවන් ප්‍රාථමික නිෂ්පාදකයින් ලෙස හඳුනාගත යුතු අතර එමගින් ඔවුන්ගේ ජීවනෝපායන් තුළින් ඉඩම් හා ජල සම්පත් සමඟ ඇති සමීප සම්බන්ධතාවය හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලිය යුතුය.

## 9. ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ ජනතාවට සහ විශේෂයෙන් යෝජිත සංවර්ධන ප්‍රදේශවල වෙසෙන ප්‍රජාවන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර, ඔවුන් සංවර්ධන ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලැබිය යුතුය. පුද්ගලික සමාගම්, කාර්මික කලාප සහ වාණිජ ව්‍යවසායන් (රාජ්‍ය-පෞද්ගලික ව්‍යවසායන් ඇතුළුව) සඳහා වන ආර්ථික වාසි ජනතාව සඳහා මෙම මූලික ප්‍රතිලාභය ඉක්මවා නොයා යුතුය. මානව හා පරිසර කළමනාකරණ උපාය මාර්ග, මානව හිමිකම් තක්සේරු කිරීම්, ස්වාධීන පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් වැනි සංවර්ධන ව්‍යාපෘති සඳහා සහය විය යුතු තක්සේරු කිරීම් සහ උපාය මාර්ග පිළිබඳ ව ද, මෙම කොටසේ දී සාකච්ඡා කෙරෙයි.

## 10. වතු ඉඩම්: ඓතිහාසික දුක්ගැනවිලි හා පිරිහෙළන ශ්‍රම පිළිවෙත්

වතුකරයේ රැකියාවේ යෙදීම නිසා වතු කම්කරුවන්ට අවම වශයෙන් පර්චස් විස්සක්වත් ලබා දීම සහ ලිඛිතව ලබා දී ඇති ඉඩම ප්‍රයෝජනයට ගන්නා ආකාරය තීරණය කිරීමට කම්කරුවන්ට ඇති නිදහස වැනි මලයාහ ද්‍රව්‍යයන්ට විශේෂිත වූ නිර්දේශ මෙම කොටසට ඇතුළත් ය. එමෙන්ම වතු කළමනාකරණය ඇතුළු වතු ඉඩම්වල වෙසෙන සියලූම පුද්ගලයින්ගේ සහ කම්කරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ නිර්දේශ ද, මීට ඇතුළත් වේ.

## 11. පාරිසරික ආරක්ෂාව

සහභාගී වූ බොහෝ දෙනා තම ජීවනෝපායන් පරිසරය හා බැඳී ඇති ආකාරය සහ තමන් පරිසරය සමඟ කටයුතු කරන ආකාරයත් එය පරිසරය හා තමා කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳ ව දැන සිටියහ. මානව-වනජීවී ගැටුම හා කාලගුණික රටාවන්හි වෙනස්කම් පිළිබඳ ව සාකච්ඡා කරන විට මෙය විශේෂයෙන් ඉස්මතු විය. බොහෝ නිර්දේශයන්, රාජ්‍ය හා පළාත් පාලන සන්නිවේදනයේ අසාර්ථකත්වයන් වෙත යොමු වන අතර එය අදාළ ප්‍රජාවන් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ඈත් කරයි. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සහ නීති බලාත්මක කර ක්‍රියාත්මක කරන විට අවම පාරිසරික ප්‍රමිතීන් ස්ථාපිත කිරීම කෙරෙහි ද, මෙම නිර්දේශයන් මගින් අවධානය යොමු කර තිබේ.



# 1. හැඳින්වීම

**ඉඩම් අයිතිය සඳහා වූ මහජන සන්ධානය (PARL)** යනු ශ්‍රී ලංකාවේ දුප්පත් හා ආන්තිකකරණයට ලක් වූ ප්‍රජාවන්ගේ නිවාස, ඉඩම් සහ දේපළ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ ජාලයකි. ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් උද්දේශනය සඳහා දැනුවත් කිරීමේ හා බලපෑම් කිරීමේ පුළුල් උපදේශන ක්‍රියාවලීන්ගේ අවශ්‍යතාවය PARL විසින් හඳුනා ගනී. පවත්නා ඉඩම් ප්‍රතිපත්ති, ඉඩම් නීති සහ ඉඩම් පරිපාලනය හේතුවෙන් ප්‍රජාවන් මුහුණ දෙන ගැටලු හා ඒවායේ ප්‍රතිඵලයන් වූ බලපෑම් පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ අරමුණින් මහජන ඉඩම් කොමිසම ආරම්භ කරන ලදී. මෙම උපදේශන ක්‍රියාවලිය මගින් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ජනතාවගේ අපෙක්ෂාවන් අඛණ්ඩව බැහැර කරමින් සිටීම පිළිබඳ ව අවධානය යොමු කර තිබේ.

මහජන ඉඩම් කොමිෂන් සභාව සමාජ ක්‍රියාකාරීන්, ශාස්ත්‍රඥයින්, පර්යේෂකයින් සහ නීතිඥයින් ඇතුළු පළපුරුදු පුද්ගලයින් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.[1] කොමිෂන් සභාව 2019 මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළ දී දිස්ත්‍රික්ක 18 ක් පුරා අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල ප්‍රජාවන් සහ බලපෑමට ලක්වූ පුද්ගලයින් වෙත පැමිණ විමසීම් සිදුකරනු ලැබීය. අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, හැටන්, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මොණරාගල, මුලතිව්, මාතර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන ප්‍රදේශවල. කොමිසමේ සාමාජිකයෝ පුද්ගලයන් 885 ක්, එනම් කාන්තාවන් 428 ක්, පිරිමින් 452 ක් සහ තවත් 5 දෙනෙකු සමඟ කතා කළහ. PARL ජාල හවුල්කරුවන් විසින් කොමිෂන් සභා විමසීම් සම්බන්ධීකරණය කරනු ලැබීය. භූගෝලීය ප්‍රදේශ නියෝජනය සහ විවිධ ජනවාර්ගික, ආගමික, සමාජ හා ආර්ථික පසුබිම්වල අදහස්වල හරස්කඩ හැකි තරම් පුළුල් කිරීම සහතික කිරීමේ අරමුණින් ස්ථාන තෝරා ගන්නා ලදි. කොමිෂන් සභාව විසින් විරෝධතා දක්වන ස්ථාන, අවතැන් වූ සහ ඉඩම් නොමැති ප්‍රජාවන්, නෙරපා හරින ලද්දන් සහ/හෝ වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඇති අය සහ සංවර්ධන හා නාගරික පුනර්ජනනීය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින හෝ සැලසුම් කර ඇති ප්‍රදේශ වෙත නිරීක්ෂණ චාරිකා සිදුකරන ලදි. කාලය සීමා වීම, සම්පත්, සංවිධායක හවුල්කරුවන්ට ලබාගත හැකි තොරතුරු සහ වෙනත් ප්‍රායෝගික කරුණු හේතුවෙන් කොමිසමට බලපෑමට ලක් වූ සියලුම ප්‍රදේශ නැරඹීමට ඉඩ නොලැබුණි මිනිසුන් සමඟ ගැඹුරු ලෙස සාකච්ඡා කිරීම කෙරෙහි ද, කාලය සීමාවීම බලපාන ලදී. දිගු කලක් තිස්සේ පැවති අසාධාරණයන් හේතුවෙන් පරම්පරා ගණනාවක් පුරා පැතිර පැවති බලපෑම් විස්තර කිරීමට මිනිසුන්ට බොහෝ කාලයක් අවශ්‍ය බව අපේක්ෂා කරන ලද අතර, ඒ බව පැහැදිළිවම පෙනෙන්නට ද තිබුණි. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය නිසා ඇති වූ අයුක්තිය සහ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ පාර්ශවය පිළිබඳ ව සොයා බැලීමට බොහෝ විට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. මෙය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ කෙරෙහි යොමු වූ විමසීම්, විකාශනය හා ශක්තිමත් කිරීම වෙනුවෙන් විශාල ඉඩක් ලබා දිය යුතු වූ සංවාදයක ආරම්භයක් බව කොමිසම මගින් පිළිගනු ලැබිණි.

කොමිෂන් සභාව සහ PARL විසින් මෙම වාර්තාව සහ එහි නිර්දේශ ඉඩම්, වන්දි ගෙවීම්, සංක්‍රාන්ති යුක්තිය, ප්‍රතිසන්ධානය, කාන්තා අයිතිවාසිකම්, සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන රජය, අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන ආදී විවිධ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරනු ඇත. විවිධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මෙන්ම ආයතනික හා කාර්ය පටිපාටික ප්‍රතිසංස්කරණ සඳහා වන මෙම වාර්තාවේ නිර්දේශයන් බලපෑමට ලක්වූ ප්‍රජාවන් විසින්ම මෙහෙයවනු ලබන අතර, සමස්තයක් වශයෙන් ඉඩම් හා ඉඩම් පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ වඩාත් අර්ථවත් හා තිරසාර සාකච්ඡාවකට මෙය හේතු වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. තවද, මෙම වාර්තාව සිංහල හා දෙමළ භාෂාවෙන් විමසීමට සහභාගී වූ ප්‍රජාවන් වෙත මෙන්ම රට පුරා විවිධ ආකාරයේ ඉඩම් අරගලවල යෙදී සිටින අය සමඟ ද බෙදා ගනු ඇත. හවුල් අත්දැකීම් සහ සාමූහික නිර්දේශයන් අඛණ්ඩ උද්දේශන සහ මහජන ව්‍යාපාර ශක්තිමත් කිරීමට සහ දිරිගැන්වීමට ඉවහල් වනු ඇති බවත්, ප්‍රජාවන් විසින් මෙම වාර්තාවේ අන්තර්ගතය ඉදිරියට ගෙනයනු ඇතැයි මෙන්ම ඒවා ඔවුන්ගේම ක්‍රියාකාරකම්වලදී භාවිත කරනු ඇතැයි ද, අපි අපේක්ෂා කරන්නෙමු.

1. See page 8 for full list of Commissioners

## 1.1 අරමුණ

මෙම වාර්තාවේ අරමුණ වන්නේ ඉඩම් අරගල හේතුවෙන් ජනතාව විඳින දුක් ගැහැටවලට ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් ස්ථාපිත ක්‍රියාපිළිවෙළ ප්‍රතිසංස්කරණය කිරීම සහ ඔවුන්ගේ ජීවිත සංවර්ධනය කිරීම, පාරිසරික තිරසාරභාවය සුරක්ෂිත කිරීම සහ අනාගත පරපුර වෙනුවෙන් සමාජීය වශයෙන් වගකීම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය, නීතිය සහ පරිපාලනය සඳහා මගපෙන්වීමක් ලෙස දැනුම්වත් කිරීම යි. මෙම වාර්තාව මගින් නිශ්චිත ඉඩම් අරගල හා ගැටලු සඳහා විසඳුම් ලබා නොදෙන අතර ඒ වෙනුවට මිනිසුන් හා ඉඩම් සමග ගනුදෙනු කිරීමේ දී යහපත් භාවිත ක්‍රියාපටිපාටීන්, මාර්ගෝපදේශන මූලධර්ම සහ ප්‍රමුඛතා නිර්දේශ කරනු ලැබේ. බිම් මට්ටමේ උපදේශන මගින් දැනුම්වත් වාර්තාවේ නිර්දේශයන්, ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම මෙන්ම ඉඩම් ප්‍රතිපත්ති, නීති, ක්‍රියා පටිපාටි සහ භාවිතයන් වෙනුවෙන් වූ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින අය ද, සම්බන්ධයෙන් කටයුතු කරන බැවින්, ඔවුන්ට හා රජය යන දෙපාර්ශවයටම මාර්ගෝපදේශයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.2 ක්‍රමවේදය

ඉඩම් පිළිබඳ මහජන කොමිසම විසින් දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක ජනවාර්ගික අධ්‍යයන ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබුවේ ජනතාවගේ අත්දැකීම් සහ ශ්‍රී ලංකාවේ ඉඩම් හා ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිය හෝ හිමිකාරිත්වය පිළිබඳ අපේක්ෂාවන් මොනවාද යන පුළුල් ප්‍රශ්නය මත ය. දත්ත එක්රැස් කිරීම හා අර්ථ නිරූපණය වෙනුවෙන් මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා තෝරාගත් කොමිසමේ සාමාජිකයින් සියල්ලන්ටම ඉඩම් ගැටලු සම්බන්ධයෙන් ජනතාව සමග වැඩ කිරීමේ සැලකිය යුතු පළපුරුද්දක් තිබුණි. ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ ක්‍රම දෙක වූයේ (අ) මහජන අදහස් විමසීම සහ (ආ) බලපෑමට ලක්වූ ප්‍රජාවන් සමඟ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම.

මෙම ක්‍රමවේදයන් කොමිසමේ සාමාජිකයින් විසින් නිර්මාණය කරන ලද්දේ රජය, සිවිල් සමාජ කණ්ඩායම් සහ අනෙකුත් ක්‍රියාකාරීන් විසින් මීට පෙර සිදු කරන ලද සමාන ක්‍රියාදාමයන්ගේ සොයා ගැනීම් පිළිබඳ සාහිත්‍ය සමීක්ෂණයක් පදනම් කර ගනිමිනි. පර්යේෂණ කණ්ඩායමක් විසින් අදාළ සොයාගැනීම් ද ඇතුළුව ඉඩම් පිළිබඳ වූ සාහිත්‍යයේ අන්තර්ගතය එක්කොට සාරාංශ කරන ලදී. අවශ්‍ය වූ විට දී ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ විශේෂඥ දැනුම ද ඇතුළුව, කොමිසමේ සාමාජිකයින්ගේ විශේෂඥතාවය ද සමඟ සාහිත්‍ය සමීක්ෂණය මගින් උපදේශන සිදුවීමට නියමිත ක්ෂේත්‍ර පිළිබඳ ව දැනුම්වත් කරන ලදි. ඉඩම් ගැටලු සහ ඉඩම් අරගලවල සම්පූර්ණ ලැයිස්තුව පහත පරිදි වර්ගීකරණය කර තිබේ. ඒ හමුදාකරණය, සංචාරක ව්‍යාපාරය, සංවර්ධන ව්‍යාපෘති, වාණිජ කෘෂිකර්මාන්තය, වැවිලි කර්මාන්තය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ වනජීවී දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අත්පත් කර ගැනීම, මහා නගර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවතැන් වීම සහ ස්වාභාවික විපත් යනාදී වශයෙනි.

උපදේශනය පැවැත්වීමේ ක්‍රම, රාමුව සහ ක්‍රියා පටිපාටි 2018 අප්‍රේල් සිට 2019 පෙබරවාරි දක්වා පැවති රැස්වීම් හා වැඩමුළු මාලාවක සාකච්ඡා කරන ලදී. උපදේශන සඳහා මග පෙන්වීම සහ තොරතුරු විධිමත් ආකාරයකින් වාර්තා කිරීම සඳහා ප්‍රශ්නාවලියක් නිර්මාණය කර තිබේ. උපදේශනවල ආකෘතිය නිශ්චිත පූර්ව නිශ්චිත ක්ෂේත්‍රයන්, ගැටලු සහ තේමාවන් පිළිබඳ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවල සංකලනයක් මෙන්ම කේන්ද්‍රීය ස්ථානවල විවෘත මහජන අදහස් විමසීම ද විය යුතුය. දිස්ත්‍රික්කයේ සංවිධාන, ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ කණ්ඩායම් ජාලය හරහා මහජන අදහස් විමසීම් පිළිබඳ තොරතුරු ප්‍රජාවන් අතර බෙදා ගන්නා ලදී. ඉඩම් කොල්ලයෙන් පීඩාවට පත් වූවන්, ඉවත් කරනු ලැබූවන් සහ යටිතල පහසුකම් සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති නිසා අවතැන්වූවන්, වතු ප්‍රජාවන් සහ කාන්තාවන් ද ඇතුළු, විශේෂිත කණ්ඩායම් සමඟ වැඩ කරන සංවිධාන විසින් සෘජුවම ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා


සංවිධානය කරන ලදි. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා මගින් විශේෂිත කණ්ඩායම්වල අවශ්‍යතාවයන් පිළිබඳ අවබෝධයක් ලබා දුන්නද, කාන්තාවන්ගේ සහ අනෙකුත් ආන්තික කණ්ඩායම්වල නිශ්චිත අත්දැකීම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට හැකි ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා, ගැඹුරු සම්මුඛ සාකච්ඡා, පැවැත්වීමට උත්සහ කළ ද, එය අභියෝගයක් වූ එබැවින් මෙම වාර්තාවේ සාකච්ඡා කර ඇති කරුණු පරිපූර්ණ නොවේ.

මහජන ඉඩම් කොමිෂන් සභාව 2019 මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළ දිස්ත්‍රික්ක 18 ක් පුරා අවදානමට ලක්විය හැකි ප්‍රදේශ සහ ප්‍රජාවන් වෙත ගොස් විමසීම් පවත්වනු ලැබීය. සංචාරය කළ ප්‍රදේශ සහ දිස්ත්‍රික්ක පහත පරිදි ලැයිස්තු ගත කර තිබේ.



| දිස්ත්‍රික්කය | ස්ථානය | දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය | දිනය |
|---|---|---|---|---|---|
| මන්නාරම | මුල්ලිකුලම් | | හැටන් | හැටන් නගරය (PH)* | |
| | පල්ලිමුනේ | | | බාරන්ඩා ඩිවිෂන්, බොහිල් වතුයාය, කෙටබුල | |
| | කයාකුලි | | කිලිනොච්චිය | පන්නකණ්ඩි | |
| | සිලාවතුරෙයි | | | සෙන්චෝලේ ආදර්ශ ගම්මානය | |
| | සන්නාර් | | | කිලිනොච්චිය නගරය (PH) | |
| | මන්නාරම නගරය (PH) | | | පරන්තන් | |
| අනුරාධපුරය | අනුරාධපුර නගරය (PH) | | යාපනය | පලාලි (PH) | |
| පොළොන්නරුව | හිගුරක්ගොඩ (PH) | | | නීතාවන් සුභසාධක කඳවුර | |
| අම්පාර | අෂ්රෆ් නගර් | | | මිලිඩ්ඩි | |
| | සමන්තුරේ | | | තයිඩ්ඩි | |
| | පොතුවිල් | | කොළඹ | දෙමටගොඩ | |
| | ඇඩ්ලචෙනයි | | ගම්පහ | මීගමුව | |
| මොණරාගල | මොණරාගල නගරය (PH) | | | කටුනායක | |
| | පැලවත්ත | | ගාල්ල | රත්ගම | |
| මුලතිව් | කොක්කුතොඩාවේ | | මාතර | මාතර දික්වැල්ල | |
| | කෝකිලායි | | හම්බන්තොට | ගන්නොරුව | |
| | නීරාවිපිට්ටු | | | හම්බන්තොට නගරය (PH) | |
| | කෙප්පාපුලාවු | | මඩකළපුව | මඩකළපුව නගරය (PH) | |
| | පිලායිකුඩිරිප්පු | | | කල්කුඩාව සංචාරක කලා-පය | |
| | වද්දුවාල් | | | වහාරේ ඉල්මනයිට් | |
| | මුරිප්පු | | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය නගර (PH) | |
| | මුලතිව් නගරය (PH) | | | සාම්පූර් | |
| වව්නියාව | වව්නියාව නගරය (PH) | | | කුච්චවේලි | |
| බදුල්ල | බදුල්ල (PH) | | | | |
| | ෂෝලන්ස් වතුයාය, ලූණුගල, පස්සර | | | | |

*PH – මහජන විමසීම්


Public Hearing - PH
Focus group discussion
පලාලි
කිලිනොච්චිය
මුලතිව්
මන්නාරම
නගරය
වව්නියාව
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
හිඟුරක්ගොඩ
මඩකළපුව
බදුල්ල
මොණරාගල
හැටන්
හම්බන්තොට

ශ්‍රී ලංකාවේ සියලූම ප්‍රධාන ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ගැටලූ නිරූපණයවන ආකාරයෙන් සංචාරය කළ ප්‍රදේශ හඳුනා ගන්නා ලදී. තෝරා ගැනීම සිදු කරනු ලැබුවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් ලෙස නියෝජනය කිරීම සහ ප්‍රජාවන්ගේ සහ හඳුනාගත් ප්‍රදේශවල ජනවාර්ගික, ආගමික, සමාජීය හා ආර්ථික අංශ සැලකිල්ලට ගනිමින් විවිධ කාරණා පිළිබඳ හරස්කඩ දැක්මක් ඉදිරිපත් කිරීම සඳහා ය. මිලිටරිය සහ අනෙකුත් රාජ්‍ය කාරකයින් විසින් අත්පත් කරගත් ඉඩම්, අවතැන් වූ ස්ථාන, විරෝධතා ස්ථාන, පශ්චාත් යුධ සමයේ නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ, වාණිජ කෘෂිකර්මාන්තයෙන් පීඩාවට පත් ප්‍රජාවන් සහ වෙනත් මහා පරිමාණ ව්‍යාපෘති, වතු, පාරිසරික සංවේදී ප්‍රදේශ හෝ එහි ජෛව විවිධත්වයට බලපාන ප්‍රදේශ නාගරික පුනර්ජනනය සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ප්‍රජාවන් ඉවත් කිරීම සහ/හෝ වෙනත් ස්ථානයකට ගෙන යාම මෙයට ඇතුළත් ය. දිස්ත්‍රික්ක 18 ක් පුරා උපදේශන පැවැත්විණිඃ අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, හැටන්, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මොණරාගල, මුලතිව්, මාතර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ වවුනියාව. කොමිසමේ සාමාජිකයෝ පුද්ගලයන් 885 ක්, එනම් කාන්තාවන් 428 ක්, පිරිමින් 452 ක් සහ තවත් 5 දෙනෙකු සමඟ කතා කළහ.

සියලූම විමසීම් වලට පෙර තමන් සංචාරය කළ යුතු ප්‍රදේශ පිළිබඳ කොමිසමේ සමාජිකයින්ට සාරාංශ ලියකියවිලි ලබාදෙන ලදී. එමගින් නිශ්චිත ගැටලූ සහ පොදුවේ ඉඩම් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා අනුව ජනතාවට ස්වකීය නිර්දේශ සහ අපේක්ෂාවන් ඉදිරිපත් කිරීම වෙනුවෙන්, කලින් ලේඛනගතකර ඇති කරුණු සහ ගැටලූ පිළිබඳ ව දැනුම්වත් කෙරිණි. එසේම තොරතුරු එකතු කිරීමට, තොරතුරුවල පැහැදිලි කිරීම් හෝ අඩුපාඩු සම්පූර්ණකර ගැනීමට, සාකච්ඡාවට සම්බන්ධ වන ජනයාගේ අපේක්ෂිත වුවමනාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට කොමිසමට හැකි විය. ඉඩම් අරගලවල යෙදී සිටින පුද්ගලයින් බොහෝ විට ඔවුන් මුහුණ දුන් ගැටළුවලින් හෙම්බත් වී සිටි අතර සමහර විට දී නිර්දේශ යෝජනා කිරීම ද ඔවුන්ට දුෂ්කර විය.

මෙම වාර්තාව යනු විමසීම්වල දී සටහන් තබාගන්නන් විසින් එකතුකරගත් පුළුල් සටහන් සහ පටිගත කිරීම්, කොමිසමේ සාමාජිකයින් සහ පර්යේෂකයින්ගේ නිරීක්ෂණ හා විශ්ලේෂණයන්, සහ සාහිත්‍ය සමාලෝචනයන් හි එකතුවකි.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ප්‍රවණතාවන් සහ ඔවුන්ගේ සොයාගැනීම් බෙදාහදා ගැනීම හා විශ්ලේෂණය කිරීම සඳහා මෙන්ම රැස්කරනු ලබන තොරතුරු සාරාංශගත කිරීම හා එකතු කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම සඳහා නිතිපතා සංවාද පවත්වන ලදී. තොරතුරු පුළුල් ලෙස ප්‍රධාන තේමාවන් හතරකට වර්ගීකරණයකර තිබේ. එනම් භුක්තිය අහිමි කිරීම, ජීවනෝපායන්, පරිසරය සහ අනන්‍යතාවය යනුවෙනි. කොමිෂන් සභා සාමාජිකයින්ගේ විමසීම් හා අවධාරණයන්ගෙන් ලබාගත් සියලූම සටහන් මෙම පුළුල් කාණ්ඩ හතරට අනුව වර්ගීකරණය කරන ලද අතර, එහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ බලපෑම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. එකතු කරන ලද දත්ත විශ්ලේෂණය කර අවසාන සොයාගැනීම් හඳුනාගනු ලැබූවේ මෙම වර්ගීකරණයන් තුළ සිට ය.

එකතු කරන ලද තොරතුරු හා දත්ත වැඩමුළු මාලාවක් හරහා සම්පාදනය කර විශ්ලේෂණය කරන ලද අතර කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සහ පර්යේෂණ සහයකයින්ට අවසාන වාර්තාව කෙටුම්පත් කිරීම සඳහා පරිච්ඡේද පවරා තිබේ. මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති සියලූම නිර්දේශයන් බලපෑමට ලක්වූ ප්‍රජාවන් විසින් උපදේශනවල දී ලබාදුන් එකතු කිරීම් වලින් ලබාගෙන තිබේ.

## සීමාකම්

උපදේශන වලින් ලබාගත් දත්ත සෘජු පුද්ගල අත්දැකීම් හෝ තෙවන පාර්ශවයන්ගෙන් ලැබෙන තොරතුරු වලින් සමන්විත වන බව සැලසුම් අවධියේදී හඳුනා ගන්නා ලදී. ලබාගත් තොරතුරු උපදේශනය කළ අයගේ හැඟීම් ලෙස පිළිගත හැකි අතර, සමහර තොරතුරු සත්‍යාපනය කළ හැකි වුවද, බොහෝ විට ඒවා ලේඛන හෝ සනාථ කිරීම සමඟ තොරතුරු සත්‍යාපනය කිරීමට නොහැකි විය හැකිය. උපදේශනයේ අරමුණ සඳහා, ප්‍රධාන කරුණු වූයේ ඉඩම් ගැටලු සම්බන්ධයෙන් මිනිසුන් තුළ පැවති කල්පවත්නා හැඟීම් ය. ලැබුණු තොරතුරු බොහොමයක් මෙම ක්‍රියාවලියේ සොයාගැනීම් සනාථ කිරීම සඳහා කලින් ලේඛනගත කළ අත්දැකීම් වලට සමාන ය. අත්දැකීම් පිළිබඳ විස්තර, ඉදිරිපත් කළ විසඳුම් සඳහා ප්‍රායෝගික ප්‍රවේශය, පරිසරය හා අනාගත පරපුර කෙරෙහි දක්වන සැලකිල්ල යන සියල්ලම පුළුල් අත්දැකීම් වලට අතිරේක වූ තොරතුරු විය.

තවත් සීමාවක් වූයේ එක් එක් උපදේශනය සඳහා යොදා ගත හැකි කාලය යි. කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සිදුකළ ක්ෂේත්‍ර සංචාරයන් පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු තිබුණ ද, ඇතැම්විට බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට තමන්ට භුක්තිය ලැබුණු ආකාරය පිළිබඳ ඓතිහාසික වාර්තා ද ඇතුළත්ව සෑම විටම පාහේ ඔවුන්ගේ අත්දැකීම් සම්පූර්ණයෙන් විස්තර කිරීමට අවශ්‍ය විය. එබැවින්, උපදේශන, සහභාගි වන්නන්ට ඔවුන්ගේ අත්දැකීම් විස්තර කිරීමට සහ හැකි විසඳුම් පිළිබඳ ඔවුන්ගේ ඉදිරි දර්ශන සහ අදහස් පිළිබඳ සාකච්ඡාවකට සහභාගී වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී ඇති බව සහතික කිරීමේ සමතුලිත ක්‍රියාවක් බවට පත්විය. අදාළ අවස්ථාවන්හි බලාපොරොත්තු රහිතබව සහ දිගු අරගලවල තෙහෙට්ටුව නිසා සහභාගිවන්නාට අර්ථවත් විසඳුම් සිතීමට ඇති හැකියාව හීන වී ඇති බව අවස්ථා කිහිපයක දී නිරීක්ෂණය විය. ව්‍යුහාත්මක අසමානතාවයන් ගැඹුරින් මුල්බැසගත් සහ සම්මතයක් ලෙස පිළිගත් අවස්ථා ද තිබුණි. මෙම විශේෂිත සීමාවන්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ප්‍රතිචාර දැක්වූයේ, සහභාගිවන්නන් විසින් ප්‍රකාශ කරන ලද සෘණාත්මක අත්දැකීම් ධනාත්මක ස්වරූපයෙන් නැවත ප්‍රකාශ කිරීම සහ සහභාගිවන්නන් සමඟ සාකච්ඡා කිරීමෙන් විසඳුම් යෝජනා කිරීම මගිනි. බොහෝ විට සහභාගිවන්නන් විසින් මෙම නිර්දේශ සැකසීමේ ක්‍රමයට යහපත් ප්‍රතිචාරයක් දැක්වීය.

තෙවන සීමාව වූයේ සියලුම ක්ෂේත්‍ර වල දී හුදෙක්ම ස්ත්‍රී - පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කරගත් උපදේශන පැවැත්වීමේ දුෂ්කරභාවයයි. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කරගත් උපදේශන පවත්වන ලද ස්ථානවල ඉඩම් අරගලවල ස්ත්‍රී - පුරුෂ අත්දැකීම් මත පදනම්ව යම් එකතු කිරීමක් තිබෙන බව පැහැදිලිය. කෙසේ වෙතත්, විශේෂයෙන් විමර්ශනය නොකළහොත්, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂිත අත්දැකීම් සඳහා සහභාගිවන්නන් විසින්ම ප්‍රමුඛතාවය ලබා නොදෙන බව නිරීක්ෂණය විය. සහභාගිවන්නන්ගේ ලිංගභේදය පදනම් කරගත් අත්දැකීම් හැකි සෑම අවස්ථාවකදීම විමර්ශනය කර ලේඛනගත කර ඇති බව සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද අතර, මෙම දෘෂ්ටිකෝණයන් වාර්තාව හරස් කඩ තේමාවක් ලෙස මෙන්ම විශේෂිත අවස්ථාවන්හි තනි ගැටලු ලෙසත් දක්වා ඇති බව සහතික කිරීම වෙනුවෙන් විශේෂ අවධානය යොමු කරන ලදී.

## ආචාරධාර්මික සලකා බැලීම්

ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, සියලූම විමර්ශනයන් ආරම්භ කරන ලද්දේ, උපදේශන අභ්‍යාසයේ ස්වභාවය පිළිබඳ ව සහ මහජන ඉඩම් කොමිෂන් සභාවේ අභ්‍යාසයට සම්බන්ධ සංවිධාන පිළිබඳ ව සහභාගිවන්නන්ට දැනුම් දීමෙන් ය. ඔවුන් මුහුණ දෙන ඉඩම් ගැටලූවලට විසඳුම් ලබා දීමට කොමිසමට බලයක් නොමැති බව විශේෂයෙන් සඳහන් කරන ලදී. අපේක්ෂාවන් කළමනාකරණය කිරීමේ අරමුණින් මෙය සිදු කරන ලදී. උපදේශනය අතරතුර පටිගත ගත කිරීම සහ ඡායාරූප ගැනීම සඳහා සහභාගි වන්නන්ගේ කැමැත්ත ලබා ගන්නා ලදී. සියලූම තොරතුරු රහස්‍ය භාවය පවත්වා ගෙන යන බවටත්, සියලූම පටිගත කිරීම් සහ සටහන් වාර්තාව සකස් කිරීම සඳහා පමණක් භාවිතා කරන බවටත්, සියලූ උපුටා දැක්වීම් නිර්ණාමික වනු ඇති බවටත් සහභාගිවන්නන්ට සහතික කෙරිණි.



## 1.3 මගපෙන්වන වටිනාකම් සහ මූලධර්ම

ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය, ඉඩම් පරිහරණය, ඉඩම් අයිතිය, ජනතාවගේ ඉඩම් හෝ ඉඩම් පරිහරණයට බලපාන සංවර්ධනය පහත සඳහන් මාර්ගෝපදේශ මූලධර්ම අනුව සංවර්ධනය කිරීම, පරිපාලනය කිරීම සහ විනිශ්චයට ලක්කිරීම කළ යුතු බව නිර්දේශ කර තිබේ:

- මිනිසුන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සැළකීම.
- භූමියට මිනිසුන්ගේ පවත්නා සම්බන්ධතාවයන් අගය කිරීම, විශේෂයෙන් මෙම සබඳතාවල ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ස්වභාවය අගය කිරීම.
- ප්‍රාදේශීය ප්‍රජාවන් අගය කිරීම සහ ඔවුන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ප්‍රාදේශීය හා කලාපීය පරිමාණයෙන් ඇති විය හැකි කෙටිකාලීන හා දිගුකාලීන දේශගුණ සහ පාරිසරික බලපෑම් පිළිබඳ අවබෝධයකින් යුතු ව තීරණ ගැනීම.
- කාන්තා සහ අනෙකුත් ආන්තික කණ්ඩායම්වල ක්‍රියාකාරී සහභාගීත්වය සහතික කරමින්, තීරණ ගැනීමේ දී බලපෑමට ලක්වූවන්ගේ දැනුවත් සහභාගීත්වය සහතික කිරීම.
- සෑම මට්ටමකම ඉඩම් සම්බන්ධ තීරණ සාධාරණ හා සමානවීමට උත්සාහ කළ යුතුවීම.
- සියලු ක්‍රියාමාර්ග තුළ දී වෙනස් කොට නොසැලකීම සහ සමානාත්මතාවය ඇති කිරීම.
- වර්තමාන සහ අනාගත ශ්‍රී ලාංකිකයින් සතු අයිතියක් ඇති සීමිත ජාතික සම්පතක් ලෙස ඉඩම් හඳුනා ගැනීම.
- මානව ආරක්ෂාව අගය කිරීම.
- වගකිවයුතු, විනිවිද පෙනෙන සහ ජනතාව කේන්ද්‍ර කරගත් රාජ්‍ය ආයතන සහ මහජන සේවාවන් ඇතිබව සහතික කිරීම.

එබැවින් මේ ඔවුන්ගේ අත්දැකීම් සහ අපේක්ෂාවන් පිළිබඳ ව සාකච්ඡා කරන විට දී මිනිසුන් විසින් සාකච්ඡා කළ මූලධර්මයන්ය. මිනිසුන්ට ඇති සෘණාත්මක අත්දැකීම් අතර බොහෝ සමානකම් තිබෙන බව සඳහන් කිරීම වැදගත් වේ. එමෙන්ම ජනතාව ප්‍රකාශ කළ ධනාත්මක අපේක්ෂාවන්හි ද, සමානකම් තිබුණි. විවිධ ඓතිහාසික, සමාජීය, පාරිසරික, දේශපාලන හා වෙනත් සන්දර්භයන්හි සමාන ගැටලූ විසඳන විට දී විවිධ ආකාරයේ විසඳුම් පැන නගින බව වටහා ගැනීමට මෙය අපට උපකාරී වේ. විසඳුම් ප්‍රාදේශීය සංදර්භයන්ට සහ ප්‍රාදේශීය ජීවිත යථාර්ථයන්ට සුවිශේෂී වේ. ගැටලූව එක සමාන යැයි පෙනුණ ද, ඇතැම් විට දී මිනිසුන්ගේ ඉල්ලීම් හෝ යෝජිත විසඳුම් තැනින් තැනට වෙනස් හෝ පරස්පර විරෝධී ලෙස පෙනෙන්නේ මන්ද යන්න මෙයින් පැහැදිලි වේ.

# 2. ජනතාවගේ ඉඩම් ගැටලු

## 2.1 ඉඩම් භුක්තිය අහිමි කිරීම

ඉඩම් පවරා ගැනීම යනු ජීවනෝපායන්, සමාජ ආරක්ෂණ හා සමාජ සංචලතාව, පාරිසරික යුක්තිය සහ අනන්‍යතාවයට බලපාන බහුවිධ ස්වරූපයන් සහිත ගැටලුවකි. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉඩම් පවරා ගැනීමේ ගැටලු විශාල සංඛ්‍යාවක් හමුදාකරණය හා ආයතනික වශයෙන් ඇති ජනවාර්ගිකත්වය මත පදනම් වූ වෙනස්කොට සැළකීම හා සම්බන්ධ විය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ආකෘතිය, නිලධාරිවාදී අසමත්වීම් සහ මලයාහා මක්කල් හෝ උඩරට ජනතාව සම්බන්ධ අවස්ථාවල දී මෙන් විශේෂයෙන් පාලන ක්‍රමවේදය තුළින්ම සිදුකරන බැහැර කිරීම යනාදිය ද, ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය අහිමි කිරීමට හේතුවන ප්‍රධානම සාධක වේ.

### 2.1.1 හමුදාකරණය

"සාරියක් තිරයක් විදිහට එල්ලගෙන, අපි ඉන්නේ කැලෑවක. මේ ස්ථානය අපගේ සාම්ප්‍රදායික ඉඩම්. නාවික හමුදාව ඔවුන්ගේ පවුල් අරගෙන ඇවිත් එතන ජීවත් වෙනවා. ඔවුන් වනාන්තරයේ ගෙවල් හදලා ඒවා මිල දී ගන්නැයි අපෙන් ඉල්ලා සිටියත්, අපි ඉල්ලා සිටින්නේ අපිට ආපසු අපේ මුල් ඉඩම ලබා දෙන්න."

- මුල්ලිකුලම් සිට පැමිණි සහභාගීවන්නන්

යුද්ධයේ දී උතුරු හා නැගෙනහිර පළාත්වල අත්පත් කරගත් ඉඩම් මිලිටරි හා පොලිස් පාලනය යටතේ පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මීට පෙර එම ප්‍රදේශවල ජීවත් වූ බොහෝ ප්‍රජාවන්ට තම මුල් ඉඩම් වෙත ආපසු යා නොහැකි ය. මුල්ලිකුලම්, කෙපපිලාවු, යාපනය සහ කිලිනොච්චි යන ප්‍රදේශවල දෙමළ පවුල් සතු ඉඩම්වල හමුදාව පදිංචි වී සිටියි. එබැවින් ඉඩම් අයිතිය අහිමිකිරීම බොහෝ විට ජනවාර්ගිකත්වය මත පදනම් වූ වෙනස්කොට සැළකීම හා සම්බන්ධ ය.

"රජයේ නිලධාරීන් හමුදාවට බය යි. අපේ ඉඩම් අත්හරින ලෙස හමුදාවෙන් ඉල්ලා සිටිනවා වෙනුවට ඔවුන් අල්ලාගෙන තිබෙන අක්කර 0.5 පදිංචිව සිටි පවුල් 8 සඳහා එක් පවුලකට පර්චස් 20 බැගින් දෙන්න පොරොන්දු වුණා. නමුත් එම පොරොන්දුවට පවා ප්‍රගතියක් ලැබී නැහැ."

- පිලකුඩිඉරුප්පු, මුලතිව් සිට පැමිණි සහභාගීවන්නන්

"අපට හමුදාව අවශ්‍ය අපේ සීමාවට බාහිරින් එන තර්ජන වලින් අපව ආරක්ෂා කිරීමට මිසක්, අපේ කුඩා ගම අත්පත් කර ගන්න නෙවෙයි."

- කෙපපිලාවු සිට පැමිණි සහභාගීවන්නන්

### 2.1.2 වාර්ගිකත්වය පදනම් වූ වෙනස්කොට සැළකීම

"අපේ ආගමික ස්ථාන, පාසල් සහ කෘෂිකාර්මික ඉඩම් ඇතුළත්කරගෙන රජය විසින් ජාතික වන උද්‍යාන ප්‍රකාශයට පත් කරල තියෙනවා. අපි අපේ කුඹුරට ගියාම, පොලීසිය අපිව අත්අඩංගුවට ගන්නවා. නමුත් සිංහලයින් ලී කපන්න ගියාම ඒ අයට පොලිස් ආරක්ෂාවත් ලැබෙනවා."

- යාපනයේ පලාලි සිට පැමිණි සහභාගීවන්නන්

"අපි මෙහේ අවුරුදු 40 ක් ජීවත් වුණත් දෙමළ ජනයා සෑම විටම ඇවිත් ඉඩම් ඉල්ලනවා. ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරී සිංහලයන් නම් අපේ ගැටලුව විසඳෙනවා."

- මුලතිව් හි දිගුකාලීන සිංහල පදිංචි කරුවෙක්.

බොහෝ අවස්ථාවල දී, ප්‍රාදේශීය පරිපාලනයේ බහුතරය සිංහල නම් සිංහලයන්ට වරප්‍රසාද හිමිවන බවත්, පරිපාලනයේ බහුතරය දෙමළ නම් ද්‍රවිඩයන්ට වරප්‍රසාද හිමිවන බවත්, පරිපාලනයේ බහුතරය මුස්ලිම් නම් මුස්ලිම්වරුන්ට වරප්‍රසාද හිමිවන බවත් නිසා ශ්‍රී ලංකා සමාජයේ වාර්ගික ස්වභාවය සහතික වී තිබේ. නැවත පදිංචි කරවීම සහ නැවත ස්ථානගත කිරීම සඳහා වන ජනවාර්ගික පක්ෂග්‍රාහී ප්‍රතිපත්ති මගින් නිරන්තරයෙන් සිංහල හා දෙමළ හෝ සිංහල හා මුස්ලිම්වරුන් අතර ඉඩම් ආරවුල් ඇති වේ (උදාහරණ ලෙස ගල් ඔය යෝජනා ක්‍රමය, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය, දීඝවාපිය සහ අම්පාරේ නුරිචෝලායි සුනාමි නිවාස යෝජනා ක්‍රමය). මෙම ක්‍රියා පටිපාටිවල විනිවිදභාවය නොමැති වීම හේතුවෙන් සුළු ජන කොටස් විසින් මෙම ජනාවාස කෙරෙහි අවිශ්වාසයෙන් බලයි. ජන විකාශනය හැසිරවීම තුළින් බලධාරීන්ට තම මැතිවරණ බලතල දුර්වල කිරීමේ සැඟවුණු දුෂ්ඨ චේතනාවන් තිබෙන බවට ඔවුහු සැක කරති.

"ඉඩම්වලට අපට ඉඩම් සංවර්ධන ආඥාපනත් බලපත්‍ර සහ රිසිට්පත් තියෙනවා, නමුත් අපි නැවතත් එනකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම ප්‍රදේශය ගල් වලින් සලකුණු කරලා තියෙනවා. දැන් අවුරුද්දක් විතර ඇති, අපිට ඒ ඉඩමට ඇතුළු වෙන්න බැහැ."

- මතුරන්වල සිට පැමිණි සිට පැමිණි සහභාගීවන්නන්

තවත් කාරණයක් වන්නේ, රටේ විවිධ ප්‍රදේශවල වනජීවී සංරක්ෂණය හෝ පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා පුද්ගලික ඉඩම් වනාන්තර ඉඩම් වශයෙන් හදිසියේ හා අත්තනෝමතික ලෙස වෙන් කිරීම යි. සුළුතර ප්‍රජාවන්ගෙන් පමණක් ඉඩම් අත්පත් කර ගන්නා විට එම ගැටලුවට ජනවාර්ගික ස්වරූපයක් ඇතිවේ. ජනවාර්ගිකත්වය මත පදනම් වූ පාරිසරික ආරක්ෂාව හෝ පුරාවිද්‍යාත්මක සංරක්ෂණය පිළිබඳ කතිකාවකට වරප්‍රසාද ලබා දීම බොහෝ විට සුළුතර ප්‍රජාවන්ට ඉඩම් භුක්තිය අහිමි කිරීමකට හේතු වේ. සුළුතර මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ ඉඩම් අහිමි වූ මුලතිව් වැනි ප්‍රදේශවල එවැනි අවස්ථාවන් කොමිසමේ අවධානයට යොමු විය. විල්පත්තුවේ සහ ත්‍රිකුණාමලයේ ප්‍රජාවන් විසින් ද මෙවැනිම පැමිණිලි ඉදිරිපත් කරන ලදී.

### 2.1.3 ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ආකෘතිය

"අපේ ගෙවල් කඩා දැම්මේ සීනි සංස්ථාව වෙනුවෙන්. අපට වන්දි හෝ විකල්ප ඉඩම් ලැබුණේ නැහැ. අපේම ඉඩම් හිමි ගොවීන්ව හිටපු අපි, දැන් ඉඩම් අහිමි ගොවි කම්කරුවන් බවට පත් වෙලා ඉන්නේ."

- අම්පාරේ වර්නතුවාලි සිට පැමිණි සහභාගීවන්නන්

මහා පරිමාණයෙන් ඉඩම් භුක්තිය අහිමි කිරීම (ඉඩම් කොටු කිරීමේ ශෛලිය අනුව) මගින් ග්‍රාමීය ප්‍රදේශවල ඉඩම් කාර්මික ක්‍රියාකාරකම් සඳහා ලබා ගත හැකි බවට වූ මිථ්‍යාවක් මත රාජ්‍යයේ නව ලිබරල් ආර්ථික උපායමාර්ගය සකස් කර තිබේ. අලුතින් සැකසෙන කාර්මික හා වාණිජ ආර්ථිකයේ රැකියා සොයා ගත හැකි ශ්‍රම බලකායක් නෙරපා හරින ලද ජනතාවගෙන් බිහිවනු ඇතැයි එයින් අපේක්ෂා කෙරේ. මොණරාගල, හම්බන්තොට සහ අනුරාධපුර යන ප්‍රදේශවල වසර ගණනාවක් තිස්සේ දුප්පත් ගොවීන්ගේ ඉඩම් ප්‍රමාණයන් හැකිළීයන විට, බහු ජාතික කෘෂි ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් රජය විසින් විශාල ඉඩම් ප්‍රමාණයක් වෙන් කර දී තිබේ. ඉඩම් නොමැති අයට නැවත ඉඩම් බෙදා දීම වෙනුවෙන් ඉඩම් කච්චේරි කලාතුරකින් පමණක් පවත්වා ඇති අතර දැනටමත් බෙදා හැර ඇති ඉඩම් පවුලේ සාමාජිකයන් අතර බෙදා ගත යුතු ය. මේ අතර, නාගරික ඉඩම් ඉහළ ඉල්ලුමක් ඇති වෙළෙඳ භාණ්ඩයක් බවට පත්වන විට නාගරික දුප්පතුන්ට තම ඉඩම්වල සිට තදාසන්න ප්‍රදේශවලට හෝ නගර සීමාවෙන් පිටත පිහිටි නිවාස සංකීර්ණවලට යාමට බල කෙරී තිබේ.

ඉඩම් මිල හා කුලී වැඩිවීම මගින් නාගරික දුප්පතුන් අතර ඉඩම් සහ නිවාස නොමැති වීම පිළිබඳ ව ගැටලු ඇති කරයි (කොළඹ/මීගමුව නිවාස පිළිබඳ සිද්ධි අධ්‍යයන). නාගරික දුප්පතුන් ඔවුන්ගේ ජනාවාසවල සිට උස් මහල් නිවාස සංකීර්ණයකට ගෙනයාම මගින් ඔවුන්ට ඉඩම් පමණක් නොව, ජීවනෝපායන් සහ රැකවරණ ජාලයන් ද අහිමි කරයි. රට පුරා අත්පත් කර ගත් ඉඩම්, සංචාරක ආශ්‍රිත යටිතල පහසුකම් සහ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගැනෙයි.

රට පුරා අත්පත් කර ගත් ඉඩම් සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සහ 'දැවැන්ත සංවර්ධන' ව්‍යාපෘති සඳහා යොදා ගනී. සංචාරක කර්මාන්තය හේතුවෙන් භුක්තිය අහිමි කිරීම මල්වතු ඔය වැනි ස්ථානවල දක්නට ලැබෙන අතර, එහි දී නැඟී එන හෝටල් කර්මාන්තය සඳහා ඉඩම් ලබා දීම වෙනුවෙන් පහලින් පිහිටි ගම්මාන නැවත ස්ථානගත කොට තිබේ. ගම්වැසියන්ට නිල වශයෙන් ලබා දුන් හේතුව ගංවතුර තර්ජනයයි. බණ්ඩරාවෙල, හම්බන්තොට, කොළඹ, මීගමුව, සාම්පූර් සහ අරුවක්කාලු යන ප්‍රදේශවල භුක්තිය අහිමි කිරීම මහාමාර්ග, වරාය සහ ජලාශ ඇතුළු දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති සමඟ සම්බන්ධ වේ. මෙම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති සියල්ලම තීරණය කොට ක්‍රියාත්මක කරනු ලබන්නේ දැඩි ලෙස මධ්‍යගත රජයේ සංවර්ධන අංශයෙන් වන අතර ප්‍රාදේශීය ප්‍රජාවන්ට එහි තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීම සඳහා වූ ඉඩකඩ නැත.

### 2.1.4 නිලධාරිවාදී අසමත්වීම්

"ඉඩම් අත්පත් කර ගැනීම් හා ඒ හා සම්බන්ධ කටයුතුවලට රජයේ විවිධ දෙපාර්තමේන්තු සම්බන්ධ යි. යම් පුද්ගලයෙක් ඔහුගේ හෝ ඇයගේ ඉඩම් ප්‍රශ්නයකට විසඳුමක් සෙවීම සඳහා යම් දෙපාර්තමේන්තුවකට ගිය විට, ඔහුව හෝ ඇයව නැවතත් කිසිවෙකුත් දෙමළ භාෂාව කතා නොකරන වෙනත් කාර්යාල වෙත යවනවා. විවිධ දෙපාර්තමේන්තු ඒකාබද්ධ කිරීමෙන් ඉඩම් සම්බන්ධ සියලු ගැටලු සඳහා එක් කාර්යාලයක් පමණක් තිබිය යුතුයි."

- කිලිනොච්චියේ සිට පැමිණි සහභාගිවන්නන්

පරිපාලන බලධාරීන් විසින් අකාර්යක්ෂමතාව සහ උදාසීනත්වය නිසා ඔවුන්ගේ දුක්ගැනවිලි නොසලකා හැරීම පිළිබඳ ව මෙන් ම ආර්ථික හා දේශපාලනික වශයෙන් පොහොසත් අයගේ ඉල්ලීම් කඩිනමින් ඉටුකිරීම පිළිබඳ ව ද ජනතාව චෝදනා කරති. එසේම ඉඩම් පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණයේ ඌනතාවක් පවතින බවට ද, ජනතාව චෝදනා කරති. එහි ප්‍රතිඵලයක් ලෙස, එක් පළාත් පාලන ආයතනයක් විසින් ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කළ විට, තවත් ආයතනයක් එම ඉඩමට ඇතුළුවීම තහනම් කිරීම සිදු වේ. රජයේ විවිධ දෙපාර්තමේන්තු අතර ඇති ආතතීන් ජනතාවගේ ඉඩම් ගැටලු විසඳීමට අහිතකර ලෙස බලපායි. ඉඩම් නොමැති අයට බලපත්‍ර ලබා ගැනීමේ දී සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී කරදරකාරී හා ව්‍යාකූල නිලධාරිවාදී ක්‍රියා පටිපාටි හේතුවෙන් ජනතාව බොහෝ විට නොමඟ යැවෙනු ලැබේ.

"රජයේ නිලධාරීන් සිය රාජකාරිය අවංකව ඉටු කරනවා නම් අපට මහජනතාව විදිහට කිසිදු ගැටලුවක් ඇති වෙන එකක් නැහැ."

- මුලතිව් හි පලකුඩිඉරිප්පු සිට පැමිණි සහභාගීවන්නන්

නිසි වාර්තා පවත්වා නොගැනීම හෝ ලිපි ලේඛන නැති වී ඇති බව පැවසීම ආදී පහසු නිදහසට කරුණු ඉදිරිපත් කරමින් ජනතාවට ඉඩම් සඳහා ඇති අයිතිය පරිපාලනය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, මුල් අයිතිකරුවන් සිටියද, බලපත්‍ර සහ ඉඩම් ප්‍රදාන නීති විරෝධී මාරුවීම්වලට භාජනය විය හැකි නිසා, වාර්ෂිකව ඉඩම් බලපත්‍ර අලුත් කිරීම හා වෙනත් ක්‍රියා පටිපාටි පිළිබඳ ව ජනතාව අතර අවබෝධයක් නොමැතිකමෙන් ද, වංක පරිපාලන බලධාරීන් වාසි අත්කර ගනී. උදාහරණ වශයෙන්, මුලතිව් හි දී සම්මුඛ සාකච්ඡාවන්ට සම්බන්ධ වූ ප්‍රජාවන්ට ඔවුන්ගේ තාවකාලික බලපත්‍ර ස්ථිර ඔප්පු බවට පරිවර්තනය කිරීමට නොහැකි වී ඇත්තේ නිලධාරීවාදී අභියෝගයන් නිසාය.

"රජය දැනට පවත්නා නීති නිසි ලෙස ක්‍රියාත්මක කළහොත් ඉඩම් ගැටලු වලින් 80% ක් විසඳෙනු ඇත."

- වව්නියාවේ අමතිවාගම් සිට පැමිණි සහභාගිවන්නන්

1935 දී හඳුන්වා දුන් ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් ගොවීන් අතර ඉඩම් නොමැතිකම පිළිබඳ ගැටලුවට ප්‍රතිචාර වශයෙන් සීමිත ඉඩම් භුක්ති ක්‍රමයක් සකස් කර තිබේ. මෙම නීතිය යටතේ පළමුව ගොවීන්ට අවසර පත්‍රයක් යටතේ ද සහ පසුව ප්‍රදානයක් යටතේ ද ඉඩම් ලබා දෙනු ලැබේ. නමුත්, බලපත්‍ර උරුම කර ගත හැක්කේ පිරිමි උරුමක්කාරයින්ට පමණක් නිසා, ආඥා පනත මගින් කාන්තාවන්ට සෘජුවම වෙනස් කොට සලකනු ලබන අතර, වෙනස් කොට සැලකීම් ක්‍රියාත්මක කිරීමේ භාවිතයන් මගින් ද එයම තහවුරු වේ. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති ඉඩම් බලපත්‍ර අවලංගු කළ හැකි අතර එය පැවරිය නොහැක. ඉඩම් ප්‍රදානයන් පැවරිය හැකි නමුත් එය දැඩි කොන්දේසි වලට යටත් වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ ඉඩම් බෙදාහරිනු ලැබුවේ කච්චේරි හරහා ය. කෙසේ වෙතත්, මෙම ක්‍රමය ආරම්භයේ සිට ම පරිපාලන ගැටලු රාශියකට මුහුණ දී තිබේ. ජනාවාස හා ඉඩම් බෙදාහැරීම පිළිබඳ ජනවාර්ගික පක්ෂග්‍රාහී ප්‍රතිපත්ති සම්පාදනය, නිලධාරිවාදී ක්‍රියා පටිපාටි, දූෂණය, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති ඉඩම් නීති විරෝධී ලෙස පැවරීම, අනුප්‍රාප්තික ගැටලු සහ ඉඩම් කච්චේරි ක්‍රමය අත්තනෝමතික ලෙස භාවිතා කිරීම යන කරුණු කොමිසමේ මහජන විමසීමේ දී මතු වූ කරුණු අතර ප්‍රධාන වේ.

### 2.1.5 පාලන ක්‍රමවේදය තුළින්ම මලයාහා මක්කල් හෝ උඩරට ජනතාව බැහැර කිරීම

“මට ඉඩම් ඔප්පුවක් දුන්නා. ඔප්පුවට අනුව වෙන් කරන ලද ඉඩම ඉල්ලා මම වතු හිමියා වෙත ගිය අවස්ථාවේ ඔහු උපහාසාත්මකව ‘ඔබේ එකක් තිබේ නම් ගිහින් එය සොයා ගන්න’ කියලයි. එසේ ම ඇමතිවරයාගෙන් අපි ගෙවල් ඉල්ලූ විට, ‘ඔබට තේ සහ වැසිකිළි ලබා දී තිබෙනවා, ඉතින් ඔබට නිවාස අවශ්‍ය ඇයි?’ ඇමතිවරයා ඇහුවා.”

- හැටන්, බාරන්ද වත්ත සිට පැමිණි සහභාගිවන්නෙක්

වතු ප්‍රජාවන්ගේ ඡන්ද අයිතිය අහිමි කිරීම සහ ඔවුන්ව තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ගෙන් පද්ධතිමය වශයෙන් බැහැර කිරීම ඔවුන්ගේ ජීවන තත්ත්වයන්ට අහිතකර ලෙස බලපා තිබේ. වතුකරයේ ප්‍රජාවන්ට ඉඩම් බෙදාහැරීම සඳහා ප්‍රතිපත්තිමය වෙනස්කම් හඳුන්වා දී තිබියදීත්, පවතින නිලධාරිවාදී අසමත්වීම් ඉඩම් වතුකරයේ ඉඩම් නොමැති තත්ත්වයට හේතු වී තිබේ. විකල්ප රැකියා අවස්ථා සෙවීම වෙනුවෙන් මේ වන විටත් වතු අතහැර ගොස් ඇති අයට, ඔවුන්ගේ ඉඩම් නොමැතිකම වතුකරයේ තිබෙන බැඳුම්ගත ශ්‍රමය හා වතුකරයේ ඉඩම් නොමැතිකම පිළිබඳ විශාල ගැටලුවට සම්බන්ධ වී ඇති නිසා, ඒ වෙනුවෙන් ඒ අයට මෙම යෝජනා ක්‍රමවලට ප්‍රවේශ විය නොහැක. තවද, මෙම යෝජනා ක්‍රම මගින් වතු කම්කරුවන් සඳහා වෙන් කර ඇති ඉඩම් නායයෑම් හා වෙනත් ස්වාභාවික විපත් වලට ගොදුරුවන පදිංචිවිය නොහැකි ප්‍රදේශවල පිහිටා ඇති බව කොමිසමේ විමසීම්වලට සහභාගී වූවෝ කියා සිටියහ. ශ්‍රී ලංකාවේ ප්‍රථම තේ වතුයාය වන ලූල්කන්දුර වතුයායේ කම්කරුවන් ඉල්ලා සිටින්නේ තේ වතුයායේ අයිතිය කම්කරුවන්ට බාර දෙන ලෙසත්, ඉඩම් කම්කරුවන් අතර බෙදා දෙන ලෙසත් ය.



### 2.1.6 පාලන ක්‍රමවේදය තුළින්ම කුල පදනමින් බැහැර කිරීම

"ඉඩම් බෙදා දුන්නේ කාණ්ඩ විදිහට. කුලය පදනම් කරගෙන ඉඩම් බෙදා දුන්නා. පිටත ප්‍රදේශ පහත් කුලවල අයටත්, ඉන් පස්සේ තියෙන කොටස් මුස්ලිම්වරුන්ටත් වෙන් වුණා."

- මුලතිව්, මුරිප්පු සිට පැමිණි සහභාගිවන්නෙක්

නීතවන් සුභසාධන මධ්‍යස්ථානය යනු අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා යාපනයේ මල්ලකම් හි පිහිටි කඳවුරකි. මේ වනවිට කඳවුරේ පවුල් 61 ක පිරිසක් වාසය කරති. ප්‍රථමයෙන් වලිකාමම් (උතුර) විවිධ ගම්වලින් අවතැන් වූ අවස්ථාවේ සිට මේ දක්වාම ඔවුන්ගේ පවුල් 25 කට ආසන්න සංඛ්‍යාවක් මෙම කඳවුරේ ජීවත්ව තිබේ. මෙම කඳවුරේ වෙසෙන අවතැන්වූවන්ගෙන් බොහෝ දෙනෙකු පීඩිත කුල ප්‍රජාවන්ට අයත් ය. කඳවුර පිහිටා ඇති භූමිය වැසි සමයේ දී ගංවතුරට ගොදුරු වේ. මෙම කඳවුරේ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නැත. කඳවුරේ සමහර කාන්තා රැඳවියන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වලින් හැඟවෙන්නේ, ඔවුන්ගේ කුල පසුබිම හේතුවෙන් ප්‍රදේශවාසීන් විසින් රැඳවියන් පහත් කොට සලකන බවත්, අපකීර්තියට පත් කරන බවත් ය. සමහර විට මෙම කඳවුරුවල සිටින ළමුන් ද ගම්වැසියන්ගේ කුලවාදී අපවාදයන්ට ලක් වේ.

ජනවාර්ගික ගැටුමට හා හමුදාකරණයට පෙරාතුව ඇති වූ කුලය පදනම් කරගත් වෙනස්කම් කිරීම සඳහා ඉඩම් හිමිකම පිළිබඳ සියවස් ගණනක් පැරණි ඉතිහාසයක් තිබේ. හමුදාවේ භාරකාරත්වය යටතේ ඇති ඉඩම් ජනතාව වෙත මුදා හරිනු ලැබුව ද, දැනට 'නීතවන්' සුභසාධන මධ්‍යස්ථානයේ වෙසෙන අවතැන්වූවන්ගෙන් බොහෝ දෙනෙකුට ඔවුන්ට එම ප්‍රදේශයේ ඉඩම් හිමි වී නොතිබුණු බැවින්, ඔවුන් මීට පෙරාතුව ජීවත් වූ ප්‍රදේශවලට ආපසු යාමට හැකි වනු ඇති බවට විශ්වාසයක් ඔවුන්ට නැත. තන්ගස් පරම්සෝතිගේ 'යාපනයේ කුල හා කඳවුරු ජනතාව' යන ලිපිය මෙම තත්ත්වය විස්තරාත්මකව පෙන්වා දෙයි.[2] එම ලිපිය 2015 දී ලියා ඇතත්, කඳවුරුවල වෙසෙන අවතැන්වූවන්ගේ තත්ත්වය තවමත් සැලකිය යුතු තරමකට වෙනස් වී නැත.

තන්ගස් පරම්සෝති සිය ලිපියෙන් නිරීක්ෂණය කරන පරිදි, දෙමළ ජාතිකවාදී දේශපාලනඥයින් අවතැන්වූවන්ගේ කුල පසුබිම ඔවුන්ගේ ඉඩම් නොමැතිවීමට හේතුවක් ලෙස දිගටම පවතින ආකාරය පිළිබඳ ව කිසිදු ප්‍රමුඛතාවයක් ලබා නොදෙයි. ඉඩම් නොමැති වීම නිසා, ඔවුන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික පැවැත්ම උතුරේ පහත් කුල ප්‍රජාවන් කෙරෙහි වඩාත් අස්ථිර කරයි. සිවිල් යුද්ධය, අභ්‍යන්තර අවතැන්වීම සහ මිලිටරීකරණය පිළිබඳ දෙමළ ජනතාවගේ අත්දැකීම් විවිධාකාර බවට පත්කරවීමේ දී කුලය ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. හමුදාව ඉවත් කිරීම උතුරු පළාතේ ජනවාර්ගික සංහිඳියාවට හා සමාජ ආර්ථික සංවර්ධනයට වැදගත් වුවත්, එයට පමණක් උතුරේ පීඩිත කුල ප්‍රජාවන්ගේ ඉඩම් නොමැති තත්ත්වයට තනිව විසඳුමක් විය නොහැකිය. පීඩිත කුල පසුබිම්වලට අයත් අවතැන් වූ ජනතාවගේ පවුල් අවතැන් වූ දා සිට දැන් පුළුල් වී තිබේ. 1990 ගණන්වලට සාපේක්ෂව මෙම ප්‍රජාවන් හි වත්මන්හි ඉඩම් අවශ්‍යතාව පවත්නා පිරිස බොහෝය.

හමුදාව පදිංචිවී සිටින ගම්මානවල සිටි ඉඩම් නොමැති කාණ්ඩයේ ඇතැම් රැඳවියන්ගේ අදහස වන්නේ ඔවුන් දැනට ජීවත්වන ප්‍රදේශවල හෝ ඔවුන්ට අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ ප්‍රවාහනය සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ප්‍රදේශවල විකල්ප ඉඩම් ලබා දිය යුතු බවයි. තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන්, හොඳ තත්ත්වයේ පවත්නා පාසල් පිහිටි ගම්මානවල ජීවත් වීමට ඔවුන් කැමති ය.

2. Thanges, Paramsothy. "Caste and Camp People in Jaffna: Land Ownership and Landlessness." Colombo Telegraph, 8 Dec. 2015, https://www.colombotelegraph.com/index.php/caste-camp-people-in-jaffna-landownership-landlessness/

මෙම ඉල්ලීමෙන් පැහැදිලි වන්නේ අවතැන් වූ සෑම පවුලක්ම ඔවුන් අවතැන් වූ දා සිට ඔවුන් මුහුණ දී ඇති ගැටලුවලට විසඳුමක් වශයෙන් මීට ප්‍රථම ජීවත් වූ ප්‍රදේශයටම නැවත යාමට බලාපොරොත්තු නොවන බවයි. ඉඩම් බෙදා හැරීම සම්බන්ධ ව පීඩිත කුල ප්‍රජාවන්ට අයත් අභ්‍යන්තරව අවතැන් වූ දෙමළ ජනයා විසින් කරනු ලබන සමහර ඉල්ලීම් අනාගතයේ දී ඔවුන්ගේ සමාජ හා ආර්ථික සංචලතාව සමඟ බැඳී ඇති බව ද, එමගින් පෙන්නුම් කරයි.



## 2.2 ජීවනෝපායන් සහ සමාජ සුරක්ෂිතභාවය අහිමි වීම

ප්‍රජාවන් ඉඩම්වලින් බැහැර කිරීමට ලක්වීම ඔවුන්ගේ ජීවනෝපායන් කෙරෙහි බලපාන ආකාරයන් පිළිබඳ ව වාර්තාවේ මෙම කොටසින් අවධානය යොමු කෙරේ. පුළුල් මට්ටමින්, ඔවුන්ගේ ජීවනෝපායන් සඳහා වැදගත් වන අවකාශයන් වෙත ප්‍රවේශය සහ බලය අහිමිවීම හේතුවෙන් ප්‍රජාවන් තම ජීවනෝපායන් ඉටු කිරීමේ දී මුහුණ දෙන බාධක මෙම කොටසින් විස්තර කරයි.

යුද්ධය, ගැටුම් හා හමුදාකරණය, නිලධාරිවාදී අසාර්ථකත්වය, මහා පරිමාණ සංවර්ධනය, කෘෂිකාර්මික ව්‍යාපෘති සහ ආරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම නිසා මිනිසුන්ගේ ජීවනෝපායන් කෙරෙහි බලපාන ගැටලූ අනුව මෙම කොටස උප කොටස් හතරකට බෙදා තිබේ. මිනිසුන්ගේ ජීවනෝපායන් සහ ඔවුන්ගේ ඉඩම් හිමිකාරිත්වය අතර සම්බන්ධතාවයේ සුවිශේෂී ස්වභාවය නිසා සිව්වන උප පරිච්ඡේදය වතුකරය කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කර තිබේ.

### 2.2.1 යුද්ධය, ගැටුම් හා හමුදාකරණය

යුද ගැටුම් ආශ්‍රිත ගැටලූ සහ වැඩිවන හමුදාකරණයෙන් පැන නගින ගැටලූ ජීවනෝපායන්ට සෘජුවම බලපාන්නේ කෙසේද යන්න හෝ ජීවනෝපායන් කෙරෙහි බලපාන ගැටලූ වලට ඒවා පූර්වගාමී ලෙස ක්‍රියා කර ඇති ආකාරය මෙම කොටසින් විස්තර කෙරේ.

"දැන් යුද්ධයක් නැති නිසා, අපට අපේ ඉඩම නොදී ඉන්න බැහැ"

- කේප්පාපිලවු සිට පැමිණි සහභාගීවන්නන්

යුද්ධය හේතුවෙන් පලා යනවිට මිනිසුන් විසින් අතහැර දමා ගිය ප්‍රජා අයිතිය සතු වූ ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයක හමුදාව පදිංචි වී සිටිති. හමුදාව පදිංචි වී සිටීමෙන් මිනිසුන්ට සාම්ප්‍රදායික ඉඩම් සහ මෙම ඉඩම් හා බැඳී ඇති ජීවනෝපායන් වෙත පිවිසීම අහිමි කෙරේ. වට්ටුවාල් (මුලතිව්) හි දෙමළ ප්‍රජාව යුද්ධයේ දී අවතැන් වී ඇති අතර එම ක්‍රියාවලියේ දී ඔවුන් සතුව තිබූ ඉඩම් සඳහා වූ බලපත්‍ර ඔවුන්ට අහිමි වී තිබේ. නාවික හමුදාව විසින් පසුව මෙම ඉඩම් අත්පත් කර ගනු ලැබීය (එයට ප්‍රජාව සම්බන්ධ වී සිටි අයිස් කම්හලක් ද ඇතුළත් විය). අත්පත් කර ගැනීමෙන් පසුව, ප්‍රජාවට ඔවුන්ගේ ධීවර ජීවනෝපායන් සඳහා නාවික හමුදාවේ අවසරය ලබා ගතයුතු වේ.

සිලාවතුරෙයි ධීවර ප්‍රජාවක් සඳහා ද වට්ටුවාල්හි ප්‍රජාවට සමාන ඉතිහාසයක් තිබේ. මලයාලාර්කුලම්/අයියර්කුලම් (කිලිනොච්චි) හි ප්‍රජාවන් ඔවුන්ගේ ජීවනෝපාය ධීවර කටයුතු සඳහා භාවිත කළ ඉඩම්වලින් යුද්ධ කාලය තුළ දී අවතැන් විය. මුලිකුලම් සහ වෙරළබඩ ගම්මානයක් වන කයාකුලි යන ප්‍රදේශවල තම ඉඩම් හමුදාව විසින් අත්පත් කර ගැනීම නිසා ගම්වැසියන්ට තම ධීවර ජීවනෝපාය කටයුතුවල නිරත වීමට නොහැකිව වනාන්තරයකට යාමට සිදු වී තිබේ. තවද, විකල්ප ජීවනෝපායන් ලබා දිය හැකි මෑතක දී පිහිටුවන ලද ඇඟළුම් කම්හලක් ද ඔවුන්ට ඉතා දුරින් පිහිටා තිබේ.

ජනතාවගේ ඔවුන්ගේ ජීවනෝපායන් සඳහා ඉඩම් වලට ප්‍රවේශය ලබා දීමට හමුදාව කැමැත්තෙන් සිටිය ද, ප්‍රජාවන්ට එහි දී හමුදාව විසින් නියම කරන කොන්දේසි වලට යටත් වීමට සිදු වේ. අත්පත් කරගත් ඉඩම්වලින් කොටසක් ආපසු ලබා දුන් සන්නාර් (මන්නාරම) හි ධීවරයින් පිරිසක් සඳහා නාවික හමුදාවේ නීති රීති පිළිපදින බවට පොරොන්දු වූ විට පමණක් ධීවර කටයුතුවල නියැළීමට අවසර ලබා දී තිබේ.

පල්ලිමුනේ (මන්නාරම) 1990 දී නාවික හමුදාව සහ පොලීසිය විසින් ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් අවතැන් වූ ප්‍රජාවකගේ ඉඩම සඳහා ප්‍රජාවට කුලී ගෙවීම (නව ගාස්තු පිළිබඳ ව නැවත සාකච්ඡා කිරීමට එකඟ වූ පසුවත්) සිදුවුවහොත් දින නියමයක් නොමැතිව හමුදාවේ හා පොලීසියේ රැඳී සිටීමට ප්‍රජාව විසින් ඔවුන්ව දිරිගන්වනු ඇතැයි යන බිය නිසා මෙම ආයතන දෙක විසින් ලබා දෙන කුලිය භාර ගැනීම ප්‍රජාව විසින් ප්‍රතික්ෂේප කරති. කෙසේ වෙතත්, කුලිය භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් ඔවුන්ගේ පදිංචිය සනාථ කිරීම වළක්වන අතර, එමගින් ඔවුන්ට සුභසාධන වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට සහ සමාජ ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසු වේ. ඔවුන්ට ඉඩමට පිවිසිය නොහැකි නිසා ප්‍රජාවට ඔවුන්ගේ ඥාතීන් සමඟ ජීවත් වීමට බල කෙරී ඇති අතර, එය ඔවුන්ගේ ජීවනෝපායන් කරගෙන යාමට ඇති නිදහසට බලපා තිබේ. ඔවුන්ගේ මුල් වෙරළබඩ ඉඩම් ඔවුන්ගේ ධීවර භූමියට පිවිසීම සඳහා ඔවුන්ට පහසුකම් සපයයි. නමුත් වන්දි ඉඩම් භාර ගැනීම මගින් ඔවුන්ට ඒ සඳහා ගමන් කිරීමට අවශ්‍යවන දුර වැඩි වේ.

හමුදාව පමණක් නොව, ගැටුමේ දී විවිධ භූමිකාවන් ඉටු කළ අනෙකුත් සන්නද්ධ කණ්ඩායම් ද ප්‍රජාවන්ට තම ඉඩම් වලින් ඉවත් කිරීමට බල කර ඇති අතර එමගින් ද ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපායන් වල නිරත වීම වළක්වනු ලැබ තිබේ. මුරිප්පු සහ කුට්ටුකුම්බම් කිරාම් හි ඉන්දියානු සාම සාධක බලකායේ (අයිපීකේඑෆ්) ක්‍රියාකාරකම් හේතුවෙන් ගම්වාසීන් අවතැන් විය. කුට්ටුකුම්බම් කිරාම් හි දී ඔවුන්ගේ ඉඩම්වලට ඔවුන් නැවත පැමිණි පසු එල්ටීටීඊය විසින් ඔවුන්ගේ ඉඩම්වල දෙමළ ප්‍රජාවක් පදිංචි කිරීමට උත්සහ කළ නිසා මුස්ලිම් ප්‍රජාව යළි පලවා හැරීමට ලක් විය. මුස්ලිම් නායකයින්ගේ මැදිහත් වීමෙන් මෙය වළක්වනු ලැබීය. ඔවුන් නැවත පදිංචි කරවීමෙන් පසුව, තමන් අත්පත් කරගෙන සිටින ඉඩම් ඇත්ත වශයෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් යැයි දේශපාලනඥයෙකු විසින් කරන ලද පැමිණිල්ලක් හේතුවෙන් මෙම ප්‍රජාව තවත් ගැටලුවකට මුහුණ දී සිටී. වවුනියාවේ දී, දෙමළ විමුක්ති සංවිධානය (ටෙලෝ) 1998 දී මුස්ලිම් ප්‍රජාවෙන් ඉඩම් බලහත්කාරයෙන් පැහැර ගෙන එහි වන්නි සිට පැමිණි දෙමළ ප්‍රජාවක් සඳහා සරණාගත කඳවුරක් පිහිටුවීම සඳහා යොදා ගෙන තිබේ. අවතැන් වූ මුස්ලිම් ප්‍රජාව තවමත් ඉඩම් අහිමිව සිටින අතර, ඔවුන් වෙනත් ප්‍රජාවක් දැනට වාසය කරන තමන් විසින් පොල් හා අඹ ගස් රෝපණය කළ ඉඩම්වලට තමන්ට ප්‍රවේශය නොමැතිකම හේතුවෙන් මුහුණ දීමට සිදුව පවත්නා අසාධාරණය පෙන්වා දුන්හ.

### හමුදාව විසින් ඔවුන්ගේ අත්පත් කර ගැනීම් පුළුල් කිරීම

වර්තමානයේ හමුදාව පදිංචි වී සිටීම ජීවනෝපායන් කෙරෙහි බලපාන අතර, පශ්චාත් යුධ සමයේ දී හමුදාව සිය පදිංචි ප්‍රදේශය පුළුල් කරමින් සිටින බැවින් එම තත්ත්වය වඩාත් නරක අතට හැරෙමින් තිබේ[3]. මෙය මුලතිව් හා ත්‍රිකුණාමලයේ (සහ ඒ අතර ඇති ප්‍රදේශයේ දී ද සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ) සහ කෙපපිලාවු හි දී නිරීක්ෂණය කරන ලදි. මුලතිව් හි, අත්පත්කරගෙන සිටින ඇතැම් නිශ්චිත ප්‍රදේශවල ධීවර ප්‍රජාවන්ට ඔවුන්ට වැදගත් අවකාශයන් වෙත ප්‍රවේශ වීම සීමා කර තිබේ. හමුදාව විසින් ඉඩම් (මුහුදු වෙරළේ වාඩි (මසුන් අල්ලන්නන්ගේ මඩු) සහ මත්ස්‍ය බිම්වලට ප්‍රවේශය) අත්පත් කර ගැනීම සහ පසුව සිංහල ප්‍රජාවකට එහි අයිතිය පැවරීම පිළිබඳව මුලතිව් සිට පැමිණි ධීවර ප්‍රජාවක් විසින් හමුදාවට චෝදනා එල්ලකරන ලදී. මෙම සිංහල ධීවරයින් බාධාවකින් තොරව නීති විරෝධී ධීවර කටයුතුවල නියැළී සිටින බව ද, ප්‍රජාව විශ්වාස කරයි. යාපනයේ දී අනාවරණය වූ අත්දැකීම් වලට අනුව මීට ප්‍රථම ප්‍රජාවට අයත් වූ ඉඩම් 'පදිංචිවීම සඳහා අනාරක්ෂිත' යැයි නම් කර පසුව හමුදා කඳවුරු ඉදිකිරීම වෙනුවෙන් හමුදාව විසින් අත්පත් කර ගන්නා ලද සිද්ධීන් පිළිබඳ ව හෙළිදරව් විය. මයිලිඩි (යාපනය) හි දී හමුදාව විසින් අත්පත් කරගත් ඉඩම්වලට අයිස් කම්හලක් ද ඇතුළත් වී තිබීම එක් නිදසුනකි.

---

3. හියුමන් රයිට්ස් වොච්, "ඇයි අපිට ගෙදර යන්න බැරි?" - ශ්‍රී ලංකාවේ ඉඩම් හමුදාව විසින් අත්පත්කර ගැනීම පිළිබඳව - pg. 37 - https://www.hrw.org/sites/default/files/report_pdf/srilanka1018_web2.pdf

පානම දී හමුදාව විසින් ප්‍රජාව විසින් භාවිත කළ ගම්මාන තුනක ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබේ. ප්‍රජාව ඊට විරෝධය පළ කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩමෙන් කොටසක් නිදහස් කර තිබේ. ඉතිරිය නාවික හා ගුවන් හමුදා කඳවුරක් සඳහා වෙන්විය යුතු නමුත් හමුදාව ඒ වෙනුවට එහි හෝටලයක් ඉදිකර තිබේ.

"නාවික හමුදාව අපේ ඉඩම්වල ගොවිතැන් කර ඒවා අපටම විකුණනවා. මේ අය වැටුප් ලබාගෙන ඒ සමගම ව්‍යාපාරත් කරනවා, අපට ඒ කිසිම විකල්පයක් නැහැ."

- සිලාවතුරෙයි සිට පැමිණි සහභාගීවන්නන්

තල් ගස් වැනි සම්පත් වෙත ප්‍රජාවට ඇති ප්‍රවේශය අහිමි කරමින් ප්‍රාදේශීය ආර්ථිකයට හමුදාව සහභාගී වීම පිළිබඳ ව මුලතිව් හි ප්‍රජාවන් ද පැමිණිලි කර තිබේ. හමුදාව විසින් ගවයින් විකිණීම පිළිබඳ ව ද සහභාගී වූවෝ කතා කළහ. යාපනයේ, මීට ප්‍රථම වී ගබඩාවක් පැවති සහ ප්‍රජාව ඔවුන්ගේ ධීවර බෝට්ටු දියත්කළ වෙරළබඩ භූමියක හමුදාව විසින් හෝටලයක් පවත්වාගෙන යයි. සිලාවතුරෙයි සහ මුල්ලිකුලම් හි දී හමුදාව විසින් ගොවිතැන් කිරීම සහ ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රජාවට විකිණීමේ නියැළී සිටින අතර, ඒ සඳහා ඔවුන් වෙළෙඳපොළේ ස්ථිර ඉඩක් ද අත්පත් කර ගෙන සිටියි. කිලිනොච්චි හි දී විමර්ශනයට සහභාගී වූ අය පෙන්වා දුන් පරිදි ජනතාවගේ ඉඩම්වල ඉදිකරන ලද නව හෝටලයක් ද සමග කිලිනොච්චි හි ප්‍රාදේශීය ආර්ථිකයට ද හමුදාව සහභාගී වෙමින් සිටිති.



### 2.2.2 නිලධාරීවාදයේ අසමත්වීම්

නිලධාරීවාදය තුළ සිදුවන බොහෝ අක්‍රමිකතා හේතුවෙන් ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවනෝපායන් සඳහා ඉඩම්වලට ප්‍රවේශය අහිමි කර තිබේ. ප්‍රජාවන්ට ඉඩම් ලබා දී ඇති ස්ථානවල දී වුව ද, තවදුරටත් නිලධාරිවාදී ක්‍රියා පටිපාටි මගින් එවැනි ඉඩම්වල සන්තකය සහ හිමිකාරිත්වය පිළිබඳ ව අවිනිශ්චිතතාවන් ඇති වී තිබේ.

#### නොදැනුවත්බව හා සූරාකෑම

බොහෝ විට රජයේ ඉඩම් සන්තකයේ තබා ගැනීම සම්බන්ධ තාක්ෂණික කරුණු පිළිබඳ ව ප්‍රජාවන් අතර දැනුමක් නොමැතිකම නිසා පරිපාලන ආයතන විසින් ඔවුන්ව සූරාකෑමට ලක් කෙරේ. පසුව ඔප්පුකළ නොහැකි වාචික පොරොන්දු ලබාදීම මගින් ජනතාව නොමඟ යවනු ලැබේ. ප්‍රජාවන්ට ඔවුන්ගේ සාම්ප්‍රදායික ඉඩම් හිමිකම් සඳහා වලංගුභාවයක් ලබා ගැනීමට උත්සහ කරන විට දී ද, ඒ හා සමාන දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවේ.

නාච්චදූව, වැල්ලවාය, මොණරාගල සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල ජනතාව කියා සිටියේ තමන් වැඩ කරමින් සිටින ඉඩම් සඳහා තමන්ට නීත්‍යානුකූල හිමිකමක් තිබේද, නැද්ද යන්න පිළිබඳ ව තමාට දැනුමක් නොමැති බවයි. මන්නාරම දී 2004 දී අවතැන් වූ ප්‍රජාවක් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් භෝග වගාකොට, අස්වැන්න ලබා ගැනීම සඳහා වෙන්කර දී තිබේ. කෙසේ වෙතත්, ඔවුන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම්වල පදිංචි වී සිටීමේ පදනම මත, ඔවුන්ට නිවාස යෝජනා ක්‍රමයක් ලබා දී නැත. කෙසේ වෙතත්, හිමිකාරිත්වය ලබා ගැනීම වෙනුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීම් සිදුකරන ලෙස ඔවුන්ට (ග්‍රාමීය සංවර්ධන සමිති මගින්) උපදෙස් දී ඇති අතර, ඉඩම් අයිතිය පිළිබඳ ගැටලූව විසඳීම සඳහා නිලධාරිවාදී ක්‍රියාදාමයන් අතර සැරිසැරිය යුතු ආකාරය පිළිබඳ ව ප්‍රජාව අවිනිශ්චිතව සිටී.

#### අනුග්‍රහවාදීබව

ඉඩම් ගැටලූ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඔවුන්ගේ සබඳතා සහ හිතවතුන් කෙරෙහි අනුග්‍රහය දැක්වීම සම්බන්ධයෙන් නිලධාරීන්ට චෝදනා එල්ල වී තිබේ. මිනිසුන්ගේ හිමිකම් කැපකරමින් ව්‍යාපාර හා සමාගම්වල ඉඩම් සම්බන්ධ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් ද මෙම චෝදනා අදාළ ය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රැකවරණය යටතේ ඇති ඉඩම්, පුරාවිද්‍යාත්මක ස්ථාන සහ මහවැලි යෝජනා ක්‍රමය යටතේ වෙන් කර ඇති ඉඩම් විනිවිදභාවයකින් හා නිසි ක්‍රියාවලියකින් තොරව ආර්ථික සූරාකෑම වෙනුවෙන් ලබා දී තිබේ. වෙරළබඩ ඉඩම් සඳහා ප්‍රවේශය ලබා දීමේ දී ධීවර ප්‍රජාවන්ට වඩා සංචාරක කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරවලට පරිපාලනය විසින් ප්‍රමුඛත්වය ලබා දෙයි. එවැනි ප්‍රජාවන්ට ඔවුන්ගේ සාම්ප්‍රදායික ඉඩම් හා වරායන් වෙත පිවිසීම තහනම් කර තිබේ. ඒ හා සමානව, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිවල දී ජනතාවගේ අදහස් බොහෝ විට නොසැලකෙන අතර, යම් අර්ථවත් ආකාරයකින් එවැනි ක්‍රියා පටිපාටිවලට සහභාගී වීම සඳහා ජනතාවට ලබා දී ඇත්තේ ඉතා අල්ප අවස්ථාවකි.

#### හිමිකාරිත්ව ආකෘතියේ වෙනස්වීම් වලින් පැන නඟින ගැටලූ (ආයතන මගින්)

කෝරලෙයි පත්තු, එරාවූර් පත්තු, වවුනතිව් සහ මන්මුනාල් දකුණ (මඩකළපුව) යන ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ දිසාපතිවරයා විසින් (තණබිම් සඳහා) වෙන් කර ඇති ඉඩම් සඳහා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ මහවැලි ව්‍යාපෘතිය වැනි වෙනත් ආයතන විසින් හිමිකම් පෑමේ ගැටලූ තිබේ. පල්ලිමුනේ, තලෙයිමන්නාරම, සහ සනාර්වල සිදුකරනු ලැබූ විමසීම්වල දී කියවුනු පරිදි, අතීතයේ ගොවිතැන් හා ගව පාලනය සඳහා භාවිත කළ ඉඩම්වලට ඇතුළු වූ පුද්ගලයින්ගෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දඩ මුදල් අයකර තිබේ.

නීතිවිරෝධී ලෙස ගවයින්ට තණ කෑමට ඉඩහැරීම, පැල්පත් හා ගව පට්ටි සෑදීම සහ 'අදාළ' බලධාරීන්ගේ අවසරයකින් තොරව මාවත් භාවිත කිරීම වැනි විවිධ වැරදි සඳහා මඩකළපුව දිස්ත්‍රික්කයේ ගව පාලනයේ යෙදෙන ගොවීන් අත්අඩංගුවට ගෙන තිබීම මීට නිදසුනකි. ගවයින්ට තණ කෑමට ඉඩහැරීම පිළිබඳ ගැටලු මඩකළපුව දිස්ත්‍රික්කයේ මායිමේ පිහිටි මාන්තලෙයි ගඟ ඇතුළු අසල්වැසි දිස්ත්‍රික්ක දක්වා විහිදෙන අතර, සමහර ගව ගොවීන් පොළොන්නරුව සහ අම්පාර දිස්ත්‍රික්කවල දී අත්අඩංගුවට ගැනීමට ද, එම තත්ත්වයන් හේතු විය. ගම්වල ගවයින් මෙම ඉඩම්වල තණ කෑමට ඉඩහැරීම සඳහා ගෙන ඒම පිළිබඳ ව ද ගැටලු ද ඇති වී තිබේ. තව ද, රුගම් කිතුල් ව්‍යාපෘතිය[4] අනාගතයේ දී තණබිම්වලට බලපෑම් කිරීමේ හැකියාවක් ඇති බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබේ. විදේශීය ගව විශේෂ මගින් තම ගවයින්ට නව රෝග හඳුන්වා දී ඇති බවක් පෙනෙන්නට ඇතැයි ජනතාව චෝදනා කළ අතර, දෙමළ කතා කරන ගොවීන් සහ පශු වෛද්‍යවරුන් (සිංහල කතා කරන) අතර පවත්නා සන්නිවේදන බාධාවන්ද, මෙම ගැටළුව තවදුරටත් සංකීර්ණ කර තිබේ.

මෙම ගව පාලනයේ යෙදෙන ගොවීන් මුහුණ දෙන විශාලතම ගැටලු අතර නියඟය ද වන බැවින් ගොවීන් මුහුණ දෙන නියඟ වැනි ස්වාභාවික විපත් වෙනුවෙන් වන්දි වෙන්කර ලබාදීමේ යන්ත්‍රණයක් අවශ්‍ය වේ. 2013 සිට ප්‍රදේශයේ ජලාශ දෙකක අවශ්‍යතාවක් ද තිබේ (ගොවීන් බලධාරීන්ගෙන් එය ඉල්ලා සිටියි).

යුද්ධයේ දී අවතැන් වූ කොකුතෝඩුවායි (මුල්ලයිතිව්) දෙමළ ප්‍රජාවක් 2012 දී ආපසු පැමිණි විට, බිම් බෝම්බ නිසා ඔවුන්ගේ කෘෂිකාර්මික ඉඩම් අනතුරුදායක ප්‍රදේශයක් ලෙස නම් කර ඇති බව දැන ගෙන තිබේ. මෙම ඉඩම් පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගන්නා ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩමෙන් අක්කර 25 ක අයිතිය අත්හැර දැමූ විට ඔවුන් එය සිංහල ජාතිකයෙකුට මාරු කර තිබේ. යුද්ධය සහ සුනාමිය හේතුවෙන් හිමිකාරිත්වයේ ලියකියවිලි (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවා) අහිමි වීම නිසා මෙම විශේෂිත දෙමළ ප්‍රජාවට මෙම තත්ත්වයට එරෙහිව අරගල කිරීමේ හැකියාව සීමා වී තිබේ.

බටහිර සාම්පූර්හි ප්‍රජාවක් යුද්ධය නිසා ඔවුන්ගේ ඉඩම්වලින් අවතැන් වී තිබේ. 2015 දී ආපසු පැමිණි විට, හමුදාව විසින් මෙම ඉඩම් අත්පත් කර ගෙන ඇති බවත්, තවද, යුද්ධයේ දී ඔවුන්ගේ සියලූම ගවයින් අහිමි වී ඇති බවත් ඔවුහු දැන ගත්හ. ජීවනෝපාය විකල්පයන් නොමැති නිසා ගෘහ සේවිකාවන් ලෙස රැකියාවක් සොයමින් කාන්තාවන්ට අවට නගර කරා යාමට සිදු වී තිබේ. ඔවුන්ට විකල්ප කෘෂිකාර්මික ඉඩම් සහ නිවාස යෝජනා ක්‍රමයක් ලබා දෙන බවට පොරොන්දු වුවද (ඇත්ත වශයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සඳහා අවශ්‍ය ලියකියවිලි මෙම ප්‍රජාවෙන් එකතු කරගෙන තිබේ), එය ක්‍රියාත්මක නොවන බව පසුව ඔවුන්ට දැනුම් දී ඇත.

### හිමිකාරිත්වය පිළිබඳ පරස්පර විරෝධී අයිතීන් ඉල්ලා සිටීම

යුද්ධයෙන් සහ ප්‍රචණ්ඩ ගැටුම්වලින් පලා යන ප්‍රජාවන්ට සිදු වූ ඉඩම් භුක්තිය අහිමි කිරීම, හිමිකාරිත්වය පිළිබඳ පරස්පර විරෝධී හිමිකම් ඉල්ලා සිටීම් වර්ධනය කිරීමට හේතු වී තිබේ. කිලිනොච්චියේ ප්‍රජාවක් කියා සිටින්නේ තමන් සෙන්චොලෙයිපුරම් හි එල්ටීටීඊයෙන් ඉඩම් මිල දී ගත් බවයි. එම ඉඩම් තවත් ප්‍රජාවක් විසින් තමන්ගේ යැයි පවසයි. එල්ටීටීඊය විසින් මෙම ප්‍රජාවෙන් බලහත්කාරයෙන් අත්පත් කරගත් ඉඩම්වල අනාථ නිවාසයක් ද පිහිටුවා තිබේ. පසුව, අනාථ නිවාසය තිබූ (පසුගිය වසර දක්වා) මෙම ඉඩම් හමුදාව විසින් අත්පත් කර ගත් නමුත්, මුල් අයිතිකරුවන් විසින් මෙම ඉඩම් ආපසු ඉල්ලා

4. This multi-million Euro river basin project is designed to increase water storage capacity for irrigation and drinking purposes, to increase and improve irrigation and drainage schemes and, to provide the tools and capacity building to improve practices in water resources' management and to promote climate smart agriculture in the watershed. - https://www.hydropower-dams.com/news/design-and-supervision-contract-tendered-for-sri-lankan-river-basin-project/

සිටීමට පටන් ගෙන තිබේ.

ත්‍රිකුණාමලයේ දී, යුද්ධය හේතුවෙන් මිනිසුන් විසිරී ගිය විට, පලාගිය අයගේ ඥාතීන් තම ඉඩම් සඳහා හිමිකම් ඉල්ලා සිටීමට පටන් ගත් අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, කිසිදු ලියවිල්ලක් නොමැති ඉඩම් සඳහා විවිධ පාර්ශ්වයන් විසින් තම හිමිකාරිත්වය පිළිබඳ පරස්පර ප්‍රකාශයන් ඉදිරිපත් කර තිබේ. මුල් අයිතිකරුවන්ට ඉඩම්වල විධිමත් අයිතිය ලබා දීමට රජය අපොහොසත් වූ විට ඔවුන්ට සරණාගත කඳවුරුවල ජීවත් වීමට සිදු වූ බව සහභාගී වූවෝ චෝදනා කළහ.

වේවෙලි (ත්‍රිකුණාමලය) හි ප්‍රජාවක් 1983 සිට ඔවුන්ගේ ඉඩම් වෙත නැවතත් නොපැමිණ ඇත්තේ ඔවුන්ගේ ඉඩම්වල අයිතිය පිළිබඳ ලියකියවිලි කච්චේරියේ දී පිළිස්සී ඇති බැවිනි. ඔවුන් සතුව නැති විධිමත් ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටි ඇති අතර, එතැන් සිට ඉඩම වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා වෙන් කර තිබේ.

කොමිසම වෙත කතාකරන ලද ප්‍රජා සාමාජිකයින්ට අනුව, 1987 දී ජේවීපී ප්‍රචණ්ඩත්වයෙන් පලා යන පුද්ගලයින්ට ඉඩම් ලබා දීම සඳහා එල්ටීටීඊය විසින් පනම්කණ්ඩි (කිලිනොච්චි) ගම්මානය පිහිටුවන ලද බව පැවසේ. මොවුන් මහනුවර, ගාල්ල, රත්නපුර සහ මෙන්ම වෙනත් ප්‍රදේශවලින් ද පැමිණි අයයි. යුද්ධය අවසන් වීමෙන් පසුව, මෙම ඉඩම්වල මුල් අයිතිකරුවන් ඔවුන්ගේ ඉඩම් ආපසු ඉල්ලා සිටීමට පටන් ගෙන ඇති අතර සමහර අය ඔවුන් සතු දේ විකිණීමෙන් හා උකස් කිරීමෙන්, ඉල්ලූ මුදල ගෙවා තිබේ (ඔවුන්ට ණය සඳහා ප්‍රවේශයක් නොමැති නිසා).

සෑම වසරකම නත්තල් සමයේ දී මීගමුවට යාම හැරුණු විට, යුද්ධයේ දී පවා අඛණ්ඩව ජීවත් වූ බව කියා සිටින කෝකිලායි (මුලතිව්) හි සිංහල ප්‍රජාවට තමන් ජීවත් වන ඉඩම විධිමත් ලෙස හිමිව නැත. සුනාමියේ දී ඔවුන්ගේ ධීවර බලපත්‍ර අහිමි වූ බව කියා සිටින ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ ඉඩම් අයිතිය පිළිබඳ ලියකියවිලි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබූ පිටපත් ද අහිමි වී තිබේ.

> “කුමන ප්‍රතිපත්ති හා නීති ගෙන ආවත් සියල්ලක්ම පදනම්වෙන්නේ ඒවා ක්‍රියාත්මක කිරීම මත යි”
>
> \- මුලතිව් සිට පැමිණි සහභාගිවන්නන්

මුරිප්පු (කිලිනොච්චි) හි, දැනටමත් විසඳා ඇති ගැටලු යැයි ජනතාව විශ්වාස කරන තාක්ෂණික කරුණු රජයේ නිලධාරීන් විසින් උපුටා දක්වමින් සිටින බව කියයි (ඔප්පුවකට හිමිකාරිත්වය වෙනස් කිරීමට පෙර ජනතාව සතුව ඇති බලපත්‍රයට අනුරූප වන ඉඩම් කැබැල්ලක් හඳුනා ගැනීම වැනි). ඇත්ත වශයෙන්ම, ප්‍රාදේශීය දෙමළ දේශපාලනඥයින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට බාධා කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහය දෙන බව කියනු ලැබේ. මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන අසාධාරණය සම්බන්ධයෙන් සඳහන් කළ තවත් උදාහරණයක් නම් මුරිප්පු හි ගොවීන්ට ළිං 25 - 30 ප්‍රමාණයක් ලබා දීමේ ක්‍රියාව යි. ළිං ලබාගත් ඔවුන්ගෙන් කිසිවෙකු මුස්ලිම් නොවූ අතර, එල්ටීටීඊය ද, මෙම ප්‍රජාවට වෙනස් කොට සැලකීම නිසා, මෙය කලාපයේ මුස්ලිම් ප්‍රජාව මුහුණ දුන් වෙනස්කොට සැළකීමේ රටාවකි.

මඩකළපුවෙහි, යුද්ධය හේතුවෙන් ඉන්දියානු සාම සාධක හමුදාවේ මෙහෙයුම් සහ සුනාමිය මගින් අවතැන් වූ ජනතාව, චෝදනා කරන්නේ එක් කණ්ඩායමකට අයත් ඉඩම් වෙනත් ප්‍රජාවක් අතර බෙදා හරින ලදුව ඇති බවයි. අම්පාරේ ද 1983 සිට 1990 දක්වා කාලය තුළ පලාගිය ගල් ඔය ඉඩම් සඳහා බලපත්‍ර තිබූ සමන්තුරේ ජනතාව ආපසු පැමිණි විට තමන්ගේ කෘෂිකාර්මික ඉඩම් සිංහල ගොවීන් අතර බෙදා හැර ඇති බව දැන ගන්නා ලදී. ඒ හා සමානවම, අම්පාරේ පොන්නම්වේලි හි, යුද්ධයේ දී විශාල අක්කර ගණනක් කුඹුරු ඉඩම් අහිමි වූ දෙමළ ප්‍රජාවන්ට, (1990 දී යුද්ධය හේතුවෙන් පලා ගිය) අයත් විශාල ඉඩම් ප්‍රමාණයක් ඔප්පු සහ ගල් ඔය බලපත්‍ර ලැබුණු සිංහල ගොවීන් අතර බෙදා දී තිබුණි.

## නැවත පදිංචි කරවීම සම්බන්ධ ගැටලු

අනුරාධපුරයේ, නැවත පදිංචි කළ සමහර ප්‍රජාවන් පැමිණිලි කරන්නේ තමන්ට ලබා දී ඇති ඉඩම ඵලදායී නොවන බවයි. තායිඩ් (යාපනය) හි නැවත පදිංචිකළ කුලී වැඩ කරන බොහෝ දෙනෙකුට, පැමිණෙන අයට ජීවනෝපායන් නොමැත.

සුනාමියෙන් පසුව, මඩකළපුවේ ධීවර ප්‍රජාවට ධීවරයින් මුහුණ දෙන දුෂ්කරතා නොසලකා වෙරළේ සිට මීටර් 500 ක් පමණ ඈතට යන ලෙස ඉල්ලා ඇති අතර, එහි දී ඔවුන්ගේ ස්වල්ප දෙනෙකු පමණක් රැකියාව පෙදරේරු වැනි වෙනත් විකල්ප වෙත මාරු වුණද, සෙස්සවුන් සිය ජීවනෝපාය තවදුරටත් කරගෙන යයි. මෙයට අර්ධ වශයෙන් හේතු වන්නේ විශේෂයෙන් වෙරළට සමීපව ක්‍රියාත්මක වන ධීවරයින්ට ප්‍රදේශයේ විකල්ප ජීවනෝපායන් නොමැතිකම යි.

යුද්ධයෙන් පසු නැවත පදිංචි කරවීම සඳහා ඔවුන්ට ඉඩම් වෙන් කළ මලයාලාර්කුලම්/අයියර්කුලම් (කිලිනොච්චි) හි ප්‍රජාවට ඒවා තමන්ගේ භාරයේ ඇතැයි මුලතිව් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හිමිකම් පෑම නිසා පදිංචි වීම තහනම් කර තිබේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කලෙක දී ඉඩම් පෞද්ගලික අයිතියක්ව තිබූ බව පිළිගැනීම සහ එම අයිතිය ඉල්ලා සිටීම ප්‍රතික්ෂේප කිරීම නිසා පලාලි හි දී තමන්ට වෙන් කළ ප්‍රදේශවල නැවත පදිංචි කරවීමට උත්සහ කළ ප්‍රජාවක් ද, එවැනිම අත්දැකීමකට මුහුණ දී තිබේ.

## වන්දි ගෙවීමකින් තොරව ස්වාභාවික සම්පත් ප්‍රජාවන්ගෙන් වෙන් කිරීම

ස්වාභාවික සම්පත් ඊට අදාළ ප්‍රදේශයේ ප්‍රජාවන්ගෙන් පිටතට ගලායාම පිළිබඳ අවස්ථා කිහිපයකදීම පැමිණිලි මතුවිය. මුසාලි හි ප්‍රජාව විසින් නීති විරෝධී වැලි කැණීම් පිළිබඳ සහ ඒවා කොළඹට ප්‍රවාහනය කිරීම පිළිබඳ පැමිණිලි කළහ. දිවයිනේ වෙනත් ප්‍රදේශවලින් පැමිණි ධීවරයින් විසින් තමන්ගේ ජලයේ නීති විරෝධී ට්‍රෝලර් යාත්‍රා මගින් මසුන් ඇල්ලීම සිදුකරන බවට යාපනයේ ධීවරයෝ චෝදනා කළහ. මසුන් ඇල්ලීම සහ වවුනියාවේ කර්මාන්ත ශාලාවක වැඩ කිරීම හැරුණු විට මුසාලි හි ප්‍රජාවට ජීවනෝපායන් නොමැතිකම පිළිබඳ ව ඔවුහු පැමිණිලි කළහ. ප්‍රජාවට අයත් නොවන ධීවරයින් තම ධීවර භූමියට පැමිණෙන බව ද ඔවුහු පෙන්වා දුන්හ. මයිලිඩි හි දෙමළ ධීවරයින්ට විශාල මසුන් අල්ලා ගත හැකි විශාල බෝට්ටු සහ දැල් සඳහා ප්‍රවේශය සහිත සිංහල ධීවරයින් සමඟ තරඟ කිරීමට සිදුවීම පිළිබඳ ව සිය කනස්සල්ල පළ කළහ.

"මම සමෘද්ධි සහනාධාරය සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ලියූ ලිපියත් අරන් ගිය විට, ඔහු කීවේ, 'ඔබ සිලවතුරෙයිහි කෙනෙක් නේද, ඒ මිනිස්සු හොඳ පෙනුමක් තියෙන, හොඳින් ඉන්න අය.' මම පිළිවෙළට ඇඳගෙන කණ්නාඩි දාගෙන ගියාම මම හොඳින් ඉන්න කෙනෙක් වෙනවා ද?"

- සිලාවතුරෙයි සිට පැමිණි සහභාගිවෙන්නෙක්

ඉනුවිල් නැගෙනහිර (යාපනය) අවතැන් කඳවුරුවල සිටින පුද්ගලයින් සමෘද්ධි වැනි ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කළ හැකි බව නොදැනීම ආදිය මගින් සමහර පුද්ගලයින්ට අවශ්‍ය ආධාර ලැබීම වළක්වයි. කෙසේ වෙතත්, සමෘද්ධි වැඩසටහනට ප්‍රතිලාභියාගේ ස්ථිර ලිපිනයක් අවශ්‍ය වීම, මහජනතාවට සේවය ලබාදෙන මහජන සුභ සාධන වැඩසටහන් කෙරෙහි ඇති තවත් බාධාවකි. සමෘද්ධි ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ අනෙකුත් කරුණු අතර, එවැනි වැඩසටහන් වලින් සහය අවශ්‍ය අයගේ ජීවන තත්ත්වය විමර්ශනය කිරීමට රාජ්‍ය නිලධාරීන්ගේ උනන්දුව නොමැතිකම ද කැපී පෙනෙයි. අයදුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ විට පවා, අයැදුම සැකසීම ඉතා මන්දගාමී වන අතර ඇතැම් විට ඒ සඳහා අවුරුදු පහකට වඩා වැඩියෙන් ගතවිය හැකිය. සමස්තයක් ලෙස ගත් කල, සමෘද්ධි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ප්‍රජාව විසින් විවේචනයට ලක් කර ඇති අතර, ප්‍රතිලාභ වඩාත්ම අවශ්‍ය

පුද්ගලයින් වෙත ගලා ඒම සහතික කිරීම සඳහා අඛණ්ඩව උත්සහ කළ යුතු බව ඔවුහු විශ්වාස කරති. රජයේ ප්‍රතිලාභ ලබා ගැනීම, ණය සඳහා ඉල්ලුම් කිරීම අවශ්‍යවන කඳවුරුවල ජීවත්වන ජනතාවගේ පදිංචිය සහතික කිරීම සඳහා රජයේ නිලධාරීන්ගේ අකමැත්තක් ඇති බවත් වාර්තා විය. කලාපය තුළ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන විට පවා, වගවීමේ අඩුපාඩුකම් සහ අල්ලස් ලබා ගැනීමේ අවස්ථා ද පෙනෙන්නට තිබේ. වැඩසටහන ප්‍රතික්ෂේප කිරීමට ලක්වන පරිදි සපයන ලද සහයෝගය සහ ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනවත් වන සහයෝගය අතර දැකියහැකි නොගැළපීමක් ද තිබේ.



### 2.2.3 මහා පරිමාණ සංවර්ධනය, කෘෂිකාර්මික ව්‍යාපෘති සහ ආරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම

අනුරාධපුර, පොළොන්නරුව සහ මඩකලපුව යන ප්‍රදේශවල නාගරික ව්‍යාප්තිය හා කෘෂිකාර්මික ඉඩම් පෞද්ගලික ව්‍යවසායයන් සඳහා වෙන් කිරීම සහ විවිධ අමාත්‍යාංශ විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම හේතුවෙන් ගොවීන් සතු ඉඩම් කැබලි ප්‍රමාණයෙන් හැකිළීමට හේතු වී ඇති බවට ප්‍රජාවන් චෝදනා කරති. ගොවීන්ට සාම්ප්‍රදායික ක්‍රම උපයෝගී කරගනිමින් තම ඉඩම් කළමනාකරණය කිරීම ද, මෙමගින් දුෂ්කර වී තිබේ (උදා: ආසන්න කාලවල දී විවිධ කෘෂිකාර්මික බිම් කොටස් අතර මාරු වීම). මෙය ප්‍රජාවන්ගේ ජීවනෝපාය පැතිකඩවලට ද බලපා තිබේ. ඒනිසා සමහරුන් කෘෂිකර්මාන්තයේ යෙදීමට වඩා වෙළෙඳසැල් විවෘත කිරීම තෝරාගෙන තිබේ. කෙසේ වෙතත්, අනුරාධපුරයේ සංචාරක කර්මාන්තයේ නැඟී ඒමක් දක්නට ලැබුණ ද, ගම්වාසීන් තවමත් තම ඉඩම් වාණිජ බිම් බවට පරිවර්තනය කිරීමට සහය දෙනවාට වඩා ගොවිතැන් කිරීමට කැමැත්තක් දක්වයි. උකස් කිරීම හෝ විකිණීම වෙනුවෙන් ප්‍රජාවන්ට තම ඉඩම් පිළිබඳ වැඩි ස්වාධීනත්වයක් අවශ්‍ය වී ඇති පොළොන්නරුවෙහි, වර්තමානයේ දෛනික ශ්‍රමය යෙදවීමට හා ත්‍රී රෝද රථ මෙහෙයවීමට කැමති තරුණ තරුණියන් සඳහා ගොවිතැන වඩාත් ලාභදායී කිරීමේ අවශ්‍යතාවක් තිබෙන බව ඔවුන්ගේ මතය විය.

ජීවනෝපායන් සඳහා වැදගත් වන ඉඩම් අත්පත් කරගත් වෙනත් පෞද්ගලික අංශයේ ආයතන අතරට ඇතුළත් වන්නේ, මුහුදු වෙරළේ කොටසක් අත්පත් කර ගත් ගාල්ල දිස්ත්‍රික්කයේ රියූ හෝටලයx වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රජාවට ලබා දී ඇති ඉඩම් අත්පත් කරගත් හම්බන්තොට බාර් විලේජ් හෝටලය; හම්බන්තොට කෙසෙල් සහ අඹ වතු සමාගම්; අන්දරවැව වනාන්තරයට අයත් ඉඩමක ඉදිකරන ලද ෆොරස්ට් රොක් හෝටලය, එහි කුඩා වැවට ද හානි කරයි. කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීමේ යෙදී සිටින කොස්ගොඩ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන, සහ ත්‍රිකුණාමලයේ හෝටල් සහ පෞද්ගලික ව්‍යාපාර, මෙන්ම මඩකළපුවේ සමහර ධීවරයින් ප්‍රදේශයේ හෝටල් සලකන්නේ තම මසුන් විකිණීමට ඇති අවස්ථාවක් ලෙසයි. ත්‍රිකුණාමලයේ ධීවරයින් භාවිත කරන ආම්පන්න වර්ග සහ නාවික හමුදාව විසින් සපයනු ලබන සහයෝගය නිසා තම ජීවනෝපායන් සඳහා ඔවුන්ගෙන් වඩා වැඩි තර්ජනයක් එල්ලවන බව ඔවුන්ගේ හැඟීමයි. ඇතැමුන් මෙම ආයතන තම ජීවනෝපාය මාර්ගයට පිවිසීමට බලපෑම් කරන ආක්‍රමණිකයන් ලෙස සලකති. පානම (අම්පාර), ප්‍රජාව මා දැල් මගින් මසුන් ඇල්ලීමට බාධා කරන වෙරළබඩ දේපොළ අත්පත් කරගත් වාණිජ ආයතන සහ හෝටල් පිළිබඳව පැමිණිලි කරති (සහශ්‍ර සංවර්ධන ඉලක්ක සහ ලෝක බැංකු ප්‍රතිපත්ති[5] ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය වේගයෙන් වර්ධනය වීමට හේතු වේ). පොළොන්නරුවේ, සීඅයිසී හෝල්ඩින්ග්ස් සමාගම සඳහා බීජ පර්යේෂණ වෙනුවෙන් භාවිතා කිරීමට අක්කර 2000 ක් සඳහා වසර 50 ක බද්දකට ලබා දී තිබුණත්, අසල්වැසි ගොවීන්ට පවසන්නේ, සීඅයිසී සමාගම විසින් එම ඉඩම තුළ බෝග වගා කරමින් සිටින බවයි. ඔවුන් පළිබෝධනාශක අධික ලෙස භාවිතා කරන බවටත්, සමාගමක් ලෙස සීඅයිසී ය මගින් පරිසරයට සිදුවන බලපෑම නොසලකන බවටත් ජනතාව මැසිවිලි නඟති.

ජනතාවගේ ජීවනෝපායන් කෙරෙහි බලපාන නීති විරෝධී අත්පත් කර ගැනීම් ද පෞද්ගලික පාර්ශවයන් විසින් සිදු කර ඇති අතර එහි දී ප්‍රජාවගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට රජය අසමත් වී තිබේ. නිදසුනක් වශයෙන්, වවුනියාවේ මහාරම්බයි කුලම් ගම්මානයේ උදය රම්බායි වැව ගොවිජන සේවා නිලධාරියා ලෙස හඳුනාගත් පුද්ගලයෙකු විසින් පවරා ගෙන තිබේ. මෙය අක්කර 25 ක භූමියක සිදුවන කෘෂිකාර්මික කටයුතුවලට බාධාවක් වී ඇති අතර ප්‍රදේශයේ පානීය ජලය ලබා ගැනීමට ද බලපා තිබේ. නෙලූන්කුලම් කිල්විල්කුලම්, පණ්ඩාරි කුලම්, ත්‍රිනුනවකුලම්, තාරානි කුලම්, රම්බායි කුලම්, සමනම් කුලම්, කල්නාටිනා කුලම් වැනි වැව් ද මිනිසුන් විසින් කෘෂිකාර්මික ඉඩම් බවට පරිවර්තනය කර හෝ විනාශ කර තිබේ.

---

5. තර්ජනයට ලක්වූ පුද්ගලයින් සඳහා වූ සමාජය, හිරු එළිය පාරාදීසයට ඉහළින් අඳුරු වලාකුළු - ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හා මානව හිමිකම්, පි. පි. 55 - https://www.gfbv.ch/wp-content/uploads/pdf-e.pdf

මහවැලි L යෝජනා ක්‍රමය, යුද්ධය සහ වනජීවී සංරක්ෂණය හා සම්බන්ධ උත්සහයන් හේතුවෙන් කෝකිලායි (මුලතිව්) හි දෙමළ ප්‍රජාව අවතැන් වී ඔවුන්ගේ ඉඩම් අහිමි වී තිබේ. සමෘද්ධි ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමට ද ඔවුන්ට නොහැකිය. මහවැලි L යෝජනා ක්‍රමයෙන් කොකතොඩුවායි (මුලතිව්) හි ජනතාව ද පීඩාවට පත්ව සිටින අතර ඔවුන් සමෘද්ධි යනු කුමක්දැයි පවා නොදැන සිටිති. ප්‍රදේශයේ කුරුලු අභයභූමියක් පිහිටුවීම නිසා කොකුතොඩුවායි සහ වැලි ඔය ප්‍රජාව ද පීඩාවට පත්ව සිටිති.

පෙරියමඩු (මන්නාරම) ගම්මානවල ගොවීන් මැසිවිලි නගන්නේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් නොමැති බවයි.

කල්මුණේ සිදුවිය හැකි වරාය සංවර්ධනයක් මගින් ධීවර ජීවනෝපායන් සඳහා වැදගත්වන අවකාශයන් සඳහා ප්‍රවේශය අඩු කෙරන නිසා එවැනි ව්‍යාපෘතියක් ප්‍රාදේශීය ප්‍රජාවගේ අවධානයට ලක් වූ කරුණක් වී තිබේ.

මීට පෙර දී යුද හමුදාව විසින් බලපත්‍රලාභී ගොවීන්ගෙන් අත්පත් කර ගත් කිරන්කෝමාල්, කෝමරිමානල්, කනගර් කිර්මාම් (පොතුවිල් ප්‍රාදේශීය ලේකම් අංශය) පල්ලට්ටවත්ත (අම්පාර ප්‍රාදේශීය ලේකම් අංශය ඉරාක්කම්) යන ප්‍රදේශවල ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගෙන තිබේ.

අම්පාරේ වෙගාමම් හි 1990 දී යුද්ධය අතරතුර පලා ගිය ගොවි ප්‍රජාවක්, 2010 සහ 2011 අතර ආපසු පැමිණි විට, ඔවුන්ගේ ඉඩම් ලාහුගල ජාතික වනෝද්‍යානය සඳහා කොටු කර ඇති බව දැන ගන්නා ලදි.

1987 දී යුද්ධය හේතුවෙන් තම ඉඩම් අතහැර ගිය ඉඳයපුරම් සහ කරන්කෝවායි බටහිර, අමවෙට්ටන් සහ වේගමාම්, මතුරන් වේලි (අම්පාර) ප්‍රජාවන්ගෙන් ඉඩම් (ඔවුන්ට බලපත්‍ර ඇති) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්පත් කරගෙන තිබෙන බව ඔවුන් නැවත පැමිණි පසුව ඔවුන්ට දැනග ත්නට ලැබුණි. පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තුක්වෙල්ල සහ සෙම්බාවෙලි සහ වෙල්වරි (ත්‍රිකුණාමලය අසළ) වැනි ගම්මානවල ජනතාවට ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ අත්පත් කර ගැනීම නිසා තම ගොවි ජීවනෝපායන් කරගෙන යාමට දැන් අපහසු වී ඇති බව දැන ගෙන තිබේ.


තෝනිකල් දකුණු කන්දම් (තිරුකොවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ), වට්ටමඩු (ත්‍රෘකෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ) සහ කෝමාරි (පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ) 80 කට වැඩි කාලයක් (යුද්ධයේ දී පවා) ගොවිතැන් කරමින් සිටි අම්පාර ගොවීන්ගේ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරාගෙන ඇති බව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පොලිසිය ඔවුන්ව බලහත්කාරයෙන් ඉවත් කර ඔවුන්ට එරෙහිව නඩු පවරන විට දී දැන ගන්නා ලදී. චුන්දිකුලම් හි ජාතික වනෝද්‍යානය පිහිටුවීම මගින් ද තමන් වැඩ කරන කෘෂිකාර්මික ඉඩම්වලට ප්‍රවේශ වීමට බාධා වීමෙන් ප්‍රජාවේ ජීවිතවලට බලපා තිබේ.

උමා ඔය ව්‍යාපෘතියෙන් අවතැන් වූ ජනතාවට අක්කර 2 ක කුඹුරු ඉඩමක් ලබා දෙන බවට පොරොන්දු විය. කෙසේ වෙතත්, වැලිමඩ, ඌව සහ බණ්ඩාරාවල යන ප්‍රදේශවල ජනතාව තම කුඹුරුවල ඇති වූ ගිලා බැසීම් සහ භූගත ජල මට්ටම් සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් අවට ඉඩම්වල ළිං වියළී යාම නිසා මෙම ව්‍යාපෘතිය ඔවුන්ගේ ඉඩම්වලට බලපා ඇති බව දැනගෙන තිබේ. බණ්ඩාරවෙල ප්‍රදේශයේ භූ සැකැස්මට ව්‍යාපෘතියෙන් වූ බලපෑම හා සම්බන්ධ දේපළ හානි ද සිදු වී තිබේ.

උමා ඔය යෝජනා ක්‍රමය මඟින් මෙම ප්‍රජාවන්ට ලබා දී ඇති වන්දි මුදල ඇත්ත වශයෙන්ම ඊට වෙන් කරන ලද මුදලින් ඉතා සුළු ප්‍රමාණයකි. වතු වලින් ඉඩම් අත්පත් කර ගන්නා මාර්ග යටිතල පහසුකම් සඳහා ව්‍යාපෘතිය මගින් වතු සමාගමට වන්දි ලබා දී ඇති නමුත් එයින් පීඩාවට පත් ප්‍රජාවට එසේ වන්දි ලබා දී නැත. වෙළෙඳසැල් ආරම්භකරමින් ප්‍රාදේශීය ස්ථාපිත සමාජය සමඟ තරඟ කරන,

දේශපාලනික වශයෙන් මනා සම්බන්ධතාවයන් ඇති සහ ප්‍රජාවේ කොටසක් ද නොවන පුද්ගලයෝ සිටිති. නායයෑම් සඳහා වූ වන්දි වැඩසටහන්වල දී, ව්‍යසනයට ගොදුරු වූවන්ට විධිමත් ඔප්පු නොමැති විට සමහර පුද්ගලයින්ට වන්දි ලබා ගත නොහැක. උමා ඔය වන්දි යෝජනා ක්‍රමයට එල්ල වූ තවත් විවේචනයක් නම්, වන්දි ලබා ගැනීම සඳහා දීර්ඝ කාලයක් හා වෙහෙසකර නිලධාරිවාදී ක්‍රියාවලියක් අවශ්‍ය වන අතර ඒ සඳහා විශාල මුදලක් වැය වන බවයි. විකල්ප ඉඩම් බෙදා දෙන ලද කුහුල්පොල දී, වඩාත් බලපෑම් සහගත පුද්ගලයින්ට විශාල ඉඩම් කැබලි ලැබුණි.

කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ ඉඩම් අහිමි වූ නාගරික දිළිඳු පවුල් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද දෙමටගොඩ පිහිටා ඇති මහල් නිවාස සංකීර්ණයක් වන සිරිසර උයනේ වෙසෙන ප්‍රජාවන්ට බොහෝ දුරට අවිධිමත් අංශයේ වූ ඔවුන්ගේ ජීවනෝපාය කටයුතු කරගෙන යාමට මෙම ගොඩනැගිලි තුළ ඉඩ පහසුකම් ලබා නොදේ. මුල දී, කළමනාකාරිත්වය විසින් මහල් නිවාස තුළ කිසිදු ජීවනෝපාය කටයුත්තක් සිදු කිරීම තහනම් කරන ලද නමුත් වෙළෙඳසැල් අවකාශයක් නොමැතිකම හෝ නැවත පදිංචි වූවන්ට කිසිදු ආකාරයක ආදායම් උත්පාදනයක් සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැති වීම හේතුවෙන් කාලයත් සමඟ මෙම රීතිය වෙනස් වී තිබේ. සමහර පදිංචිකරුවන් නැවත පදිංචිකරවීමට පෙර තවත් බොහෝ අවිධිමත් ජීවනෝපාය විකල්පයන් වෙත ප්‍රවේශ වූ ආකාරයත්, තවද, එම ජීවනෝපායන් (උදා: වෙළෙඳසැල් සඳහා ආහාර ද්‍රව්‍ය පිසීම) සඳහා ප්‍රවේශ වීමට ඔවුන් දැන් තමන් විසින් සැපයුම්කළ අයගෙන් තවත් දුරින් ජීවත්වන බැවින් අමතර පිරිවැයක් අවශ්‍යවන බවත් සිහිපත් කරමින් සිටිති.



## 2.2.4 වැවිලි අංශය

තේ වතු සහ උක් වගාවන්හි වෙසෙන ප්‍රජාවන්ගෙන් කොමිසම විමසීම් කොට තිබේ. තේ වතු වල දකුණු ඉන්දියාවේ පීඩිත කුලයක දෙමළ ජනයා වාසය කරන අතර, බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ තේ වතු වල වැඩ කිරීම සඳහා ගිවිසුම්ගත කම්කරුවන් ලෙස ඔවුන්ව ගෙන එන ලද අතර, පුළුල් ලෙස පැතිරුණ වෙනස් කොට සැලකීම, සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය හා බැඳුණු දීර්ඝ ඉතිහාසයක් ඔවුන්ට තිබේ. ප්‍රජාවේ බහුතරයක් 1948 පුරවැසි පනත මගින් රාජ්‍යයක් අහිමි සහ ඡන්ද බලය අහිමි තත්ත්වයට පත්කරවන ලද අතර ඔවුන්ගේ පුරවැසිභාවය පිළිගැනීමට ලක් වූයේ 2009 තරම් මෑත කාලයක දී ය. මෙම ප්‍රජාව රටේ දිළිඳුම හා වඩාත්ම බැහැරකොට ඇති වූවන් වුව ද, අහිතකර ප්‍රතිඵල පරාම්පරාගතව ඇදී යන විටත් ඔවුහු සෑමදාමත් රටේ වැදගත්ම ආර්ථික අංශවලින් එකක කේන්ද්‍රයේ සිටියෝ ය.

හිඟුරණ සහ පැලවත්ත උක් වගාවන් රජයට අයත් ඒවා වේ. රජය විසින් ඉඩම් භුක්තිය අහිමිකරන ලද ප්‍රජාවන් මෙම වතු ඉඩම්වල ජීවත්වන අතර, ඔවුන්ගෙන් සමහරුන්ට ඉඩම කළමනාකරණය කොට පවත්වා ගෙන යාම සහ වගා කිරීම සඳහා සීනි සංස්ථාව විසින් අවසර ලබා දී තිබේ. මෙම ප්‍රජාවන් විසින් ඔවුන්ගේ ජීවිත සීනි සංස්ථා විසින් පාලනය කළ ආකාරය සහ එම සම්බන්ධතාවය මගින් ඔවුන්ගේ පුරවැසි හිමිකම් ඉල්ලීම්වල සමහර අංශ පැහැරගත් ආකාරය පිළිබඳ ව ද කතා කළහ

ඒ හා සමාන පොදු කාරණයක් වූයේ වතු කම්කරුවන්ට ද නිවාස සඳහා වූ තමන්ගේ ප්‍රවේශය වත්තේ ඔවුන්ගේ රැකියාව සමඟ සම්බන්ධවීම යි. ඉඩම් කළමනාකරණය රාජ්‍ය හෝ පෞද්ගලික වුව ද, ආදායම ඉතා අඩු ඔවුන් දරිද්‍රතා චක්‍රයේ සහ සමාගම මත යැපුම් පද්ධතියක සිරවී සිටිති. පුද්ගලික සමාගම් සාමාන්‍යයෙන් රජයෙන් දීර්ඝ කාලීනව ඉඩම් බදු ගෙන තිබේ. මේ ප්‍රජාවන්ගේ ඉඩම් හා නිවාසවල හිමිකාරීත්වය ඔවුන්ගේ ස්වයං රැකියා, වෙනත් ආදායම් උත්පාදන වැඩ සහ ඇතැම්විට පෞද්ගලික පරිභෝජනය සඳහා වගා කිරීම යනාදිය සීමා කිරීම සමඟ බැඳී තිබේ. ඉඩම් හිමිකාරීත්වයේ ස්වභාවය යන්නෙන් ඔවුන් සතුව නිල වශයෙන් ඉඩම් නොමැති නිසා සන්තකයේ ඇති ඉඩම ඇපයට තැබීමෙන් ඔවුන්ට ණය ලබා ගත නොහැකි බව ද අදහස් කෙරේ.

මෙම ප්‍රජාවන් විසින් ඉස්මතු කර ඇති ගැටලු කිහිපයක් වර්ගීකරණය කර පහත විස්තර කර තිබේ.

### සමාජ සුභසාධන ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය නොමැතිකම

වතු නේවාසික ප්‍රදේශ වතු ව්‍යාපාර ව්‍යවසායයන්හි කොටසක් ලෙස පෞද්ගලික ආයතන වශයෙන් සලකනු ලබන නිසා ප්‍රදේශීය සභාව වැනි පළාත් පාලන ආයතනවලට ඔවුන් වෙත සහාය දැක්විය හැකි ආකාරය පිළිබඳ පැහැදිලි පරාමිතීන් නැත. මේවා වතු ව්‍යවසායයන්හි ගොඩනඟන ලද ප්‍රදේශ ලෙස සැලෙකෙන නිසා වතුකරයේ පදිංචිකරුවන්, නේවාසික ගොඩනැගිලි සහ ඔවුන්ගේ දේපළ සඳහා ගාස්තු සහ බදු පැනවීමට ප්‍රදේශීය සභාවන්ට බලයක් නැත. කෙසේ වෙතත්, වතු ජනාවාස පදිංචිකරුවන් ඉඩම් බදු සහ උසාවි ගාස්තු වැනි වෙනත් බදු මගින් ප්‍රදේශීය සභාවට දායක වේ. වර්තමාන ප්‍රදේශීය සභා (PS) පනත, වතුකරයේ පදිංචිකරුවන් සඳහා එහි අරමුදල් වලින් සේවා සැපයීම බැහැර කරන 1871 අංක 0 දරණ පෙර පැවති ගම් සභා පනත මත පදනම් වේ. එබැවින්, වතු ජනාවාස පදිංචිකරුවන් තවමත් පළාත් පාලන ආයතනවල බොහෝ සේවාවන් සඳහා හිමිකම් නොමැති හුදු ඡන්දදායකයින් ලෙස පමණක් සලකනු ලැබේ.

### ප්‍රතිලාභ නොමැතිව ඉඩම් අත්පත් කර ගැනීම සහ භාවිතයට ගැනීම

මොණරාගල පැලවත්ත සීනි සමාගම සඳහා උක් වගා කරන බොහෝ ගොවීන් විසින් සෞඛ්‍ය සේවා පහසුකම් ඇතුළුව ඔවුන්ට පොරොන්දු වූ කිසිදු ප්‍රතිලාභයක් ලබා නොදී සමාගම විසින් ඔවුන්ව සූරාකනු ලබන ආකාරය පිළිබඳ ව පැමිණිලි කරති. තවද, ස්වාභාවික ව්‍යසනයකින් යථාතත්වයට පත්වෙමින් සිටින ගොවීන්ට ද එයින් බෝග සඳහා සිදු වූ බලපෑම නොසළකා දඬුවම්කිරීම ද කරනු ලැබේ.

අම්පාරේ දී, ගල් ඔය බලපත්‍ර ලබා ඇති පුද්ගලයින්ගේ ඉඩම් හිඟුරාණ සීනි සංස්ථාව විසින් අත්පත් කර ගෙන ඇත්තේ, උත්සහය අසාර්ථක වුවහොත් එම ඉඩම් ආපසු ලබා දෙන බවට පොරොන්දුව පිට ය. වෙල්ලකල්තොට්ටම් සහ වර්නතාවතේ යනු එවැනි ප්‍රදේශ දෙකකි. වෙල්ලකල්තොට්ටම් හි අත්පත් කරගත් ඉඩම් සමහරක් ඒවායේ වී වගාකරන සිංහල ගොවීන් අතර බෙදා දී ඇති බව පෙනේ. කනත්තියන් මුන්මාරි (අම්පාර) හි වෙසෙන ප්‍රජාවට අයත් ඉඩම, ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ප්‍රජාව විශ්වාසය තැබූ ජල මාර්ගය අවහිර කිරීමෙන් පසු බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබේ. සීනි සංස්ථාව මේ වන විට භූමියේ වැඩි කොටසක උක් වගා කරනු ලබන අතර, සෙසු ඉඩම්වල අයිතිය වෙනත් විවිධ කණ්ඩායම්වලට අයත් ගොවීන් පිරිසක් අතර බෙදා හැර තිබේ. පැලවත්ත සීනි සංස්ථාවේ දී, එම වතුයායේ වැඩ කිරීම වෙනුවෙන් මිනිසුන් එකඟ වී ඇත්තේ නොමිලේ ප්‍රවාහනය, ජීවනෝපාය දීමනා, උක් වගාව පුහුණු කිරීම, සහන මිල ගණන් යටතේ පොහොර ලබා දීම වැනි පොරොන්දු වූ නොමිලේ ලබාදෙන සේවාවන් හේතුවෙනි. කෙසේ වෙතත්, මෙම පොරොන්දු ඉටු වී නැත.

පරිපාලන ව්‍යුහය අනුව, වතු ප්‍රජාවට තමන් පදිංචි වී ඇති ඉඩම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම වෙනුවෙන් ඒ සඳහා ඇති පාලනය සීමා කරවන පරිදි, පළාත් සභාවේ සහ වැවිලි සමාගමේ යන දෙකේම අනුමැතිය අවශ්‍ය වේ. වතු සමාගම්වල කළමනාකරණ පරිචයන් විස්තර කර ඇත්තේ, වතු ජනාවාස ප්‍රජාවන් පදිංචි වී සිටින ඉඩම්වල සිදු කෙරෙන සංවර්ධන කටයුතු අධෛර්යමත් කරවන, ආඥාදායක ස්වරූපයේ ඒවා වශයෙනි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ නිලධාරීන් නිර්දේශ කර ඇත්තේ ඉඩම මැනීමට පෙර පවා වතු සමාගමෙන් ලිපියක් ලබා ගන්නා ලෙසයි. ඉඩම් හා ජීවනෝපාය සම්බන්ධ තීරණ සම්බන්ධයෙන් සමාගම පාලනය සහ බලය රඳවා තබා ඇති අතර, ඉඩම් සම්බන්ධ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වතු කළමනාකරුවන් කේන්ද්‍රීය වීමේ උදාහරණ මගින් මෙය පෙන්නුම් කෙරේ.

## වතු කම්කරුවන්ගේ හිමිකාරීත්වයේ තවදුරටත් ඇති සීමාවන්

බදුල්ලේ භෝග වගා කිරීම සඳහා ජනතාව අතර බෙදා හැරීමට තරම් ඉඩම් ප්‍රමාණවත් නොවන අතරතුර, විශාල සමාගම්වලට ඔවුන්ගේ වාණිජ කටයුතු වෙනුවෙන් ඉඩම් ලබා ගැනීමට හැකි වී තිබේ. ප්‍රදේශයේ නාය යෑමේ අවදානම වැඩිකරවමින් කපා දැමූ ගස් වැනි සම්පත් ප්‍රදේශයෙන් කොළඹ දෙසට ගලා යන ආකාරය කොමිෂන් සභා විභාගයට සහභාගී වූවන් විස්තර කරනු ලැබී ය.

වතු ඉඩම්වල හිමිකාරීත්වය පිළිබඳ ගැටුම්කාරී හිමිකම් සම්බන්ධයෙන් උසාවි නඩුවල දී වතු කම්කරුවන්ගේ අදහස් සලකා බලන්නේ නැත. නිදසුනක් වශයෙන්, නාවලපිටිය බහරන්ද වත්ත මුල් හිමිකරුගේ මුනුබුරු මිනිබිරියන් විසින් රජයට එරෙහිව කරන ලද හිමිකම් පෑම සම්බන්ධ අධිකරණ නඩුව ප්‍රජාවගේ අනුදැනුමකින් තොරව සිදුවිය. තවද, උසාවියෙන් වාසිදායක තීන්දුවක් ලැබීමෙන් පසුව, පැමිණිලිකරුවන් විසින් පිස්කල් නියෝගයක් සහ හමුදාමය මැදිහත්වීමකින් වතුයායේ පදිංචිකරුවන් බලහත්කාරයෙන් ඉවත් කිරීමට උත්සහ කළහ. නෙරපා හැරීම වැළැක්වීම සඳහා පදිංචිකරුවන් විසින් නඩුවක් ගොනු කර ඇතත්, ප්‍රජාවෙන් කොටසක් පමණක් වතුයායේ වැඩ කරන නිසා, ඔවුන්ගේ භුක්තිය අවිනිශ්චිතවන අතර, ඉඩම් අයිතිය නිසි ලෙස ඔප්පු කිරීම සඳහා ප්‍රජාවට ඉඩම් කච්චේරියක් මත විශ්වාසය තැබිය යුතුව තිබේ.

ෂෝලන්ස් වතුයාය, ලුණුගල වතුයායේ ඇති පත්තිනි අම්මා කෝවිල සහ ලුණුගල බස්නායක නිලමේ අතර ඉඩම් අයිතිය පිළිබඳ පරස්පර ප්‍රකාශ තිබේ. වතු කම්කරුවන් වෙත ගිය කෝවිල් අධිකාරිය ඔවුන් ඇත්ත වශයෙන්ම කෝවිල වෙනුවෙන් වැඩ කළ යුතු බව කියා තිබේ. කෝවිලේ ප්‍රකාශය නීත්‍යානුකූල නම්, වතු සමාගම විසින් සපයනු ලබන සේවාවන් ඔවුන්ට අහිමි වන බවට ජනතාව දැනුම්වත් ය. කෙසේ වෙතත්, මෙම වතුයායේ සේවය කරන ජනතාවගේ ජීවනෝපායන් සූරාකෑමට ලක්වන බව සැලකිල්ලට ගත යුතු වේ. ක්ෂේත්‍රයේ සේවය කරන සේවකයින්ගේ ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු කාර්ය මණ්ඩලයක් එහි සිටින අතර බොහෝ දෙනෙක් තාවකාලික පදනමින් EPF හෝ ETF හෝ

කිසිදු අනතුරකට වන්දි හෝ නොමැතිව රැකියාවේ යෙදී සිටිති. තම භූමියේ තමන්ට කළ හැකි දේ පිළිබඳ තීරණ සම්බන්ධයෙන් ඇති හිමිකාරීත්වයේ ඌනතාවය පිළිබඳ ව ද, ඔවුහු මෙහි දී පැමිණිලි කළහ. ඔවුන් විදුලිබල ජාලය සඳහා සම්බන්ධතාවයක් වෙනුවෙන් ඉල්ලූම් කිරීමට පවා සමාගමේ අවසරය ලබා ගත යුතු ය. සුමුදුගම ගම්වැසියන් විසින් තම ඉඩම් ආක්‍රමණය කරන ආකාරය ද ෂෝලන්ස් වතුයාය ප්‍රජාව විසින් තවදුරටත් විස්තර කරයි. බොහෝ පුද්ගලයින් විවිධ මිනිස්බල සමාගම් යටතේ සේවය කරන ආකාරය ගැන ද ලූණුගල සහභාගී වූවන් විසින් විස්තර කළහ. එපමණක් නොව, තේ සමාගම්වලට තේ භූමියෙන් කොටසක් සංචාරක හෝ ගොවිතැන සඳහා යොදා ගැනීමට ඔවුන්ට හැකිවන පරිදි ලාභ අඩුවීමක් ද ඉල්ලා සිටිය හැකි නමුත්, එය ඔවුන්ගේ ජීවනෝපාය තවදුරටත් දුෂ්කර කරවයි.



## 2.3 පාරිසරික හායනය

කොමිෂන් සභා විභාගය අතරතුර දී, සහභාගී වූ බොහෝ දෙනා ඔවුන්ගේ ජීවනෝපායන් අවට පරිසර පද්ධති සමඟ සම්බන්ධ වී ඇති බවත්, අවට ස්වාභාවික සම්පත් මත යැපෙන බවත් දැන සිටියහ. රජයේ ප්‍රතිපත්ති, රාජ්‍ය අරමුදල් සහිත සංවර්ධන ව්‍යාපෘති සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් සහ ප්‍රජාවන්ගේ ඉඩම් පරිහරන ක්‍රියාකාරකම් අවට පරිසර පද්ධතියට අහිතකර ලෙස බලපාන අවස්ථා බොහොමයක් කොමිසමට හඳුනාගත හැකි විය. . කොමිෂන් සභා විභාගය මත පදනම්ව පහත සඳහන් ප්‍රධාන ඉඩම් පරිහරණ ආකාරයන් පරිසරයට අහිතකර බව හඳුනාගනු ලැබිණි.

### 2.3.1 මහා පරිමාණ ව්‍යාපෘති

මේ වන විට වාරිමාර්ග ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ඇතුළු විවිධ සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘති බොහොමයක් සිදුවන්නේ එය පරිසරයට ඇති කරන බලපෑම පිළිබඳ ව නිසි සැලකිල්ලකින් තොරව ය. වර්තමාන පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ (EIA) ක්‍රියා පටිපාටිය ජනතාව විසින් දැඩි ලෙස විවේචනයට ලක් කරන ලදී. ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගනු ලබන්නේ නිශ්චිත ව්‍යාපෘති සඳහා සැලසුම් කිරීම අවසන් වූ පසුව පමණක් බව ඔවුහු කියා සිටිය හ. විවිධ ප්‍රදේශවල සිදුවන විවිධ සංවර්ධන ව්‍යාපෘතිවල ස්වභාවය අනුව පරිසරයට සිදුවන බලපෑමේ ස්වභාවය හා පරිමාණය වෙනස් වේ. වරාය නගර ව්‍යාපෘතිය සහ ත්‍රිකුණාමලයේ ඛනිජ වැලි කැටම් ව්‍යාපෘති වැනි ව්‍යාපෘති වෙරළබඩ හා සාගර පරිසර පද්ධතියට හානි කර තිබේ. එලෙසම, හම්බන්තොට තිස්සපුර හා බුරුතන්කන්ද යන ප්‍රදේශවල යෝජිත කළමනාකරණය කරන ලද අලි රක්ෂිතයේ අක්කර හයසියයක වනාන්තර ඉඩම් අත්පත් කර ගත් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය වැනි ක්‍රියාකාරකම් මගින් භෞමික පරිසර පද්ධති කෙරෙහි බලපෑම් ඇති වී තිබේ.

කොමිෂන් සභාවේ බදුල්ල සංචාරයේ දී සහ උමා ඔය ව්‍යාපෘතියේ අහිතකර බලපෑම් රාශියක් සහ ව්‍යාපෘතියෙන් හානියට පත් ප්‍රදේශ පිළිබඳ ව අනාවරණය විය. උමං මාර්ග මෙහෙයුමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ කාන්දුවීම් හේතුවෙන් ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයට අත්‍යවශ්‍ය ජල මූලාශ්‍ර ගණනාවක් වියළී ගොස් තිබුණි. ඉඩම් හා කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (මොන්ලාර්) විසින් සිදුකරන ලද අධ්‍යයනයකින් නිගමනය වූයේ[6] මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 37 ක ළිං 3,090 ක් සහ ජල ප්‍රභව 45 ක් පමණ වියළී ගොස් ඇති බවයි. එවැනි වාරිමාර්ග ව්‍යාපෘති (යාන් ඔය, මොරගහකන්ද සහ කළු ගඟ ව්‍යාපෘතිය ද ඇතුළුව) ද ජෛව විවිධත්වය පිරිහීමට දායක වී තිබේ.

> "උමා ඔය ව්‍යාපෘතියෙන් මගේ නිවස සම්පූර්ණයෙන්ම විනාශ වුණා. ඉඩම ඉරිතලා, කුඹුරු ගිලී ගියා. අවුරුදු 3 ක් තිස්සේ අපි වී වගාව කළේ නැහැ. දෙමළ, සිංහල හෝ මුස්ලිම්, අපි ඔක්කොම මිනිස්සු, මේ අසාධාරණය කිසිවෙකුටවත් වෙන්න ඕනෑ නැහැ. නිවසින් පිට වී කුලී පදනම මත ජීවත් වන ලෙස ඔවුන් අපෙන් ඉල්ලා සිටියා, නමුත් වසරකට පසුවවත් ඔවුන් නිවස බැලීමට පැමිණියේ නැහැ."
>
> \- බදුල්ලේ සිට පැමිණි සහභාගීවන්නන්

6. උමා ඔය, ඊයේ, අද සහ හෙට සජීව චාමිකර විසිනි, ලබාගත හැක්කේ: https://monlar.lk/umaoyadisaster-Eng.html

මේ අතර, වෙරළබඩ ප්‍රදේශවල, අලුතින් ඉදිකරන ලද වරාය හේතුවෙන් හම්බන්තොට ගොවීන් වෙත ලූණු වතුර ගලා ඒමක් සිදු වී තිබේ. ඔළුවිල් වරාය ඉදිකිරීම, අම්පාරේ නින්ටාවූර් හි කට්ටුපල්ලි ගම්මානයේ වන්නන්වෙනයි සහ කඩරකරෙයි වෙට්ටායි ප්‍රදේශවල වෙරළ ඛාදනයට දායක වී තිබේ.



### 2.3.2 සංචාරක කර්මාන්තය

"පරිසර හානිය වැඩි වෙමින් තිබේ. වෙරළේ සිට මීටර් 300 ක් ඇතුළත ඉඩම් විකිණීමට නොහැකි නමුත් නීතිය පිළි නොපදින අතර, හෝටල් තැනීම සඳහා විකිණීම සිදුකරනු ලැබේ. මෙම ගනුදෙනු සඳහා පරිසර අධිකාරිය අවසර ලබා දී තිබේ."

- මාතර සිට පැමිණි සහභාගීවන්නන්

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් සහ අනාගත සංචාරක ව්‍යාපෘති සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් වෙන් කර තිබේ. කෙසේ වෙතත්, මහා පරිමාණ සංචාරක කර්මාන්තය කඩොලාන සහ වැලි කඳු සහ කොරල් පර වැනි වෙරළබඩ පරිසර පද්ධති විනාශ කරමින් රටේ වෙරළ පරිසර පද්ධතියට විශේෂයෙන් කල්පිටිය, නිලාවේලි සහ කුච්චවේලි වැනි ප්‍රදේශවල බලපා තිබේ. තවද, අනුරාධපුරයේ ගංගා රක්ෂිතයේ කොටසක් ලෙස නම් කර ඇති ප්‍රදේශවලට යාබද ව හෝ ඒ ඇතුළත ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් ගංවතුර සහ සතුන්ගේ ස්වාභාවික වාසස්ථාන විනාශ වීම සිදු වී තිබේ.

අනුරාධපුරයේ 'ෆොරස්ට් රොක් ගාඩ්න් රිසෝට්' හි පාරිසරික බලපෑම් පිළිබඳ ව ප්‍රජාව විසින් විස්තර කරන ලදී. මෙම හෝටලය ඉදිකිරීමට පෙර විධිමත් පාරිසරික බලපෑම් තක්සේරුවක් පැවැත්වීමට අපොහොසත් වී ඇති අතර, ඉදිකිරීම් ක්‍රියාවලියේ දී වනාන්තර ඉඩම් හෙක්ටයාර 1 කට වඩා ඉවත්කර[7] තිබීම සැලකිල්ලට ගැනීමේ දී එවැන්නක් සිදුකළ යුතුව තිබුණි. එය ඉදිකිරීමෙන් පසුව අවට ප්‍රදේශවල මිනිස් - අලි ගැටුම වැඩි වූ බව කියැවේ. කළුවරගස්වැව ප්‍රදේශය සහ විල්පත්තු ජාතික වනෝද්‍යානය අතර අලි ඇතුන් ගමන් කරන පොදු මාර්ගවල හෝටලය තිබීම යන කාරණය මෙයට හේතුව යැයි කිව හැකිය.

### 2.3.3 මහා පරිමාණ-වාණිජ කෘෂිකර්මාන්තය

වියලි කලාපයේ ක්‍රියාත්මකවන මහා පරිමාණ කෘෂිකාර්මික සමාගම් වන ඩෝල් ලංකා (පුද්ගලික) සමාගම, බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පනි පීඑල්සී, සීඅයිසී හෝල්ඩින්ග්ස් පීඑල්සී යනාදිය සමග තෙත් කලාපයේ ක්‍රියාත්මකවන ප්‍රාදේශීය වැවිලි සමාගම් අදාළ පරිසර පද්ධති විනාශ කිරීමට දායක වේ. වාණිජ කෘෂිකර්මාන්තය විසින් මහා පරිමාණයෙන් සිදුකරන භූගත ජලය නිස්සාරණය සහ වන විනාශය මගින් භූගත ජලධරයන් ක්ෂය වීමට ලක්වේ. එපමණක් නොව, මෙම සමාගම් විසින් මැණික් ගඟෙන් සහ කිරිඳි ඔයෙන් විශාල ජල ප්‍රමාණයක් භාවිතයට ගන්නා බැවින්, අලි ඇතුන් ඇතුළු ලුණුගම්වෙහෙර සහ යාල යන වනෝද්‍යානවල වෙසෙන සතුන් දැන් දැඩි ජල හිඟයකට මුහුණ දී සිටිති. පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල දක්නට ලැබෙන පරිදි, කෘෂිකර්මාන්තය හා ගොවිබිම් මගින් රසායනික ද්‍රව්‍ය අධික ලෙස භාවිත කිරීම ද ජෛව විවිධත්වයට විපත්තිකාරීවන අතර, එය පස නිසරුවීම සහ ජල සම්පත දූෂණය වීමට ද හේතු වේ. අලි ඇතුන් ප්‍රදේශයට ආකර්ශනය කර ගැනීම සහ වගාවන් වැටවල් ගසා ආවරණය කිරීම හේතුවෙන් අලි ඇතුන් ගම්මාන දෙසට යොමු කරවීම පිළිබඳ ව වැල්ලවායේ, ප්‍රජාවන් විසින් ඩෝල් ලංකා (පුද්ගලික) සමාගම විවේචනයට ලක් කරයි. කෘෂි රසායන අධික ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් ද සමාගමට චෝදනා එල්ල වී තිබේ.

7. ජාතික පරිසර පනත යටතේ 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරණ ගැසට් නිවේදනය මගින්.

### 2.3.4 හමුදාකරණය

මිලිටරිය විසින් ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රදේශයේ පරිසරයට අහිතකර ලෙස බලපා ඇති අවස්ථා බොහොමයක් කොමිසමට අනාවරණය විය. ඔවුන් ප්‍රජාවන්ට සේවය ලබාගත හැකි හිඟ පරිසර සම්පත්වල ඒකාධිකාරීත්වය පවත්වාගෙන යයි. උදාහරණයක් ලෙස, ප්‍රජාව විසින් භාවිත කරන මිරිදිය දිය උල්පත නාවික හමුදාව පාලනය යටතේ තිබීම හේතුවෙන් කයාන්කුලි සහ මුල්ලිකුලම් හි, ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන්නන්ට ජලය ලබාගත නොහැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස සෑම දින දෙකකට වරක් ජලය ලීටර් 20 ක් මිලදී ගැනීමට ඔවුන්ට සිදු වේ. මුල්ලිකුලම් සහ පානම කඩොලාන වනාන්තර සහ කළපු පරිසර පද්ධතිය විනාශකර පරිසරයට දැඩි බලපෑම් ඇති කරමින් හෝටලයක් ඉදිකරමින් සිටින හමුදාව නීතිවිරෝධී ලෙස ඉඩම් අත්පත් කරගෙන සිටියි. චුන්දිකුලම් අභයභූමිය හමුදා පාලිත ප්‍රදේශයක ද පිහිටා ඇති බව සඳහන් කිරීම ද වැදගත් වේ.



## 2.4 අනන්‍යතාවය වියැකීයාම

"මගේ අනන්‍යතාවය සඳහා මගේ හැඳුනුම්පත වැදගත් වනවා සේම, මගේ ඉඩම මගේ අනන්‍යතාවයයි. මේ මමයි."

- වටුවාල් සිට පැමිණි සහභාගීවන්නෙක්

ප්‍රතිපත්ති සම්පාදනයේ දී හෝ නීතියට අනුව, ඉඩම් හා සම්බන්ධ කිරීම දකින්නේ ලේඛන හරහා ය - ඔප්පු, බලපත්‍ර, බලය පැවරීමේ ෆෝරම, ගාස්තු සහ බදු. කෙසේ වෙතත්, රට පුරා ජනතාවගේ විමසීම්වල දී, මිනිසුන් ඉඩම් හා සම්බන්ධවීම හා සම්බන්ධය ඇතිවන විවිධ ආකාර පිළිබඳ ව සහ එය ඔවුන්ගේ අනන්‍යතාවය හා ප්‍රජාව හැඩගස්වන ආකාරය පිළිබඳ ව පැහැදිලි ව විස්තර කළහ. ඉඩම් ගැටලු විසඳීමේ ක්‍රියාවලිය මගින් මිනිසුන්ගේ කතාන්දර සහ ඔවුන්ගේ අභිලාෂයන් පිළිගත යුතු අතර, ඒවා බොහෝ විට ඔවුන්ගේ පුද්ගල හා වාර්ගික සංදර්භයන් අනුව හැඩගැසී තිබේ.

එහෙත් ඉඩම් සමඟ එවැනි සම්බන්ධතාවයක් මගින් සැමවිටම අදහස් කරන්නේ ඔවුන් සිටින තැන රැඳී සිටීමට ඔවුන්ට අවශ්‍ය බව නොවේ. පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට යාන්ත්‍රණයක් නොමැති බැවින් මිනිසුන් තම ජීවිතයේ ප්‍රගතිය, තම දරුවන් සඳහා වඩා හොඳ ජීවිත සුරක්ෂිත කිරීම, අනාගතය සඳහා පරිසරය ආරක්ෂා කිරීම සහ ස්වාභාවික විපත් වලින් ආරක්ෂා වීම සඳහා ඉවත්වීම ගැන කතා කළහ.

### 2.4.1 පවුල් අනන්‍යතාවය

"සිංහල පදිංචිකරුවන් විසින් වසර 30 ක් තිස්සේ ඉඩම භාවිත කළ බව සාධාරණීකරණය කරන අය අවුරුදු 300 ක් තිස්සේ අප භාවිත කළ දේ ගැන සිතා බැලිය යුතුයි."

- කොක්කුතොඩුවායි, මුලතිව් සිට පැමිණි සහභාගීවන්නන්

"රජය විශ්වාස කරන්නේ, තම භූමියෙන් අවතැන් වූවන් වයස්ගත වී මිය ගිය විට, ඔවුන්ගේ දෙවන පරම්පරාවට තම ඉඩම් වෙනුවෙන් සටන් කිරීමේ අධිෂ්ඨානයක් නොතිබෙනු ඇති බවයි."

- පලාලි, යාපනය සිට පැමිණි සහභාගිවන්නන් විසින් උපහාසයෙන් යුතුව සඳහන් කර තිබේ

පරම්පරාවෙන් පරම්පරාවට ඉඩම් අත්පත් කර ගැනීම මත පදනම් වූ ශක්තිමත් බැඳීම් පිළිබඳ ව ජනතාව කතා කළහ. නිදසුනක් වශයෙන්, ගල් ඔය ජනයා තම මුතුන් මිත්තන් විසින් වනාන්තරය එළිකිරීමට සහ ඉඩමේ නිවාස ඉදිකිරීමට වෙහෙස මහන්සි වී වැඩ කිරීම ගැන කතා කළ අතර, ඔවුන් හෝ ඔවුන්ගේ දෙමාපියන් විසින් රෝපණය කළ ගස් සමඟ වූ ඔවුන්ගේ සම්බන්ධතා පිළිබඳ ව ද කතා කළහ.

මිනිසුන් තම භූමියට සම්බන්ධ කරන වෙනත් ආකාරයේ පිළිගැනීම් මත පදනම්ව බරපතළ ජීවිත තීරණ සහ ආයෝජන කිරීම් ද සිදු කරති. කොළඹ, බොහෝ නාගරික දුප්පත් ප්‍රජාවන් පරම්පරා ගණනාවක් තිස්සේ ඔවුන් පදිංචි වී සිටින භූමිය සමඟ වූ ඔවුන්ගේ චිත්තවේගීය හා මූල්‍යමය ආයෝජනය ගැන කතා කළ අතර, හිමිකම් ඔප්පු නොමැති වුවද මෙම සම්බන්ධතාවය වලංගු වේ. උපයෝගිතාවයන් ලැබීම, මැතිවරණ ලියාපදිංචිය සහ ළමුන් වෙනුවෙන් පාසල් සඳහා ප්‍රවේශය වැනි කාලයත් සමඟ ලැබුණු දේ හේතුවෙන් රාජ්‍ය මට්ටමින් ඔවුන්ව පිළිගැනීම මගින් මෙම සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් වී තිබේ. මෙම පිළිගැනීම මගින් කාලයත් සමඟ මිනිසුන් තම නිවාස වැඩිදියුණු කර ඇති අතර වර්ධනීය වෙනස්කම් සඳහා ආයෝජනය කිරීම සිදු කර තිබේ. අනුරාධපුර වැනි දිස්ත්‍රික්කවල රජයේ ඉඩම් සම්බන්ධයෙන් ද මේ හා සමාන ඉඩම් සම්බන්ධතා දක්නට ලැබුණි.

### 2.4.2 ආගමික සහ ප්‍රජා අනන්‍යතාවය

"අවතැන් වූවන් සංසිඳවීම වෙනුවෙන් හමුදාව භාවිතා කරන උපක්‍රමය වන්නේ, හමුදාව පදිංචි වී සිටින ප්‍රදේශවල සමහර ආගමික ස්ථානවලට පිවිසීමට ජනතාවට ඉඩ දීමයි. එවිට ඉඩම් මුදා හැරීම්වල යම් ප්‍රගතියක් ඇතැයි ලෝකයා සිතනු ඇත"

- යාපනය, පලාලි සිට පැමිණි සහභාගිවන්නන්

ඔවුන්ගේ ඉඩම පිහිටීම පූජනීය ස්ථානයට දක්වන සම්බන්ධය මගින් ද, මිනිසුන් සහ ඔවුන් වාසය කරන/වාසය කළ විශේෂිත ඉඩම් අතර ශක්තිමත් බැඳීමක් ඇති කර තිබේ. පුද පූජා කිරීම හා චාරිත්‍ර වාරිත්‍ර වලට ප්‍රවේශ වීම සහ ඒවා භාවිත කිරීම ද මිනිසුන්ව භූමියට බැඳ තබන අතර, රටේ ඇතැම් ප්‍රදේශවල පූජනීය ඉඩම් සඳහා ඇති ප්‍රවේශය අහිමිවීම ද, පවත්නා ඉඩම් ගැටලු වටා ඇති ආතතීන් උත්සන්න කරයි.

නිදසුනක් වශයෙන්, 1985 අප්‍රේල් 15 වන දින එල්ටීටීඊ හි ප්‍රචණ්ඩත්වය[8] හේතුවෙන් පොතුවිල් හි ජලාල්දීන්පුරම් හි පුටම්බායි නම් පැරණි මුස්ලිම් ගම්මානයක් අත්හැර දමන ලදී. පසුව ඔවුන් ස්වකීය ඉඩම් අඩු මිලට විකුණා දැමීම මගින් හෝ විවිධ ආකාරවලින් අහිමි කර ගත්හ. මීට වසර තුනකට පෙර ඔවුන් නැවත එම ප්‍රදේශයට පැමිණ පල්ලිය යළි ගොඩනගා ඇති අතර එය නැවත වරක් කවුරුන් හෝ විසින් විනාශ කර තිබේ. ඔවුන් මුලින් අවතැන් වූ විට සහ ඔවුන්ගේ දේපළවලට හානි සිදු වූ පසුව ඔවුන්ට කිසිදු වන්දියක් ලැබී නැත. මේ වන විට දෙමළ ජනයා මෙම ඉඩම්වල ගොවිතැන් කරන අතර ඔවුන් අවට පෙනෙන මානයේ ජීවත් වෙති. ජනවාර්ගිකත්වය මත පදනම් වූ නෙරපා හැරීම්, වෙනස් කොට සැලකීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන්ගේ අනන්‍යතාවයට බලපාන ආතතීන් ඇතිවීම අම්පාර - තොට්ටවුරුංගිකන්දම්, පුත්තම්බායි - ජලල්දීන්පුරම්, සෙල්වාතුරෙයි, මුලතිව් (මුරිප්පු) සහ වවුනියා යන ප්‍රදේශවල දක්නට ලැබුණි. යාන් ඔය ප්‍රදේශයේ ප්‍රජාවන් විසින් පැමිණිලි කරනු ලැබුවේ පහසුකම් නොමැති ප්‍රදේශවල ඔවුන් නැවත පදිංචි කර ඇති බවයි.

### 2.4.3 ජීවනෝපාය අනන්‍යතාවය ලෙස

"අපි කුලියට ගත් ඉඩමක අපේ වී වගා කරන විට, වර්ෂාව කෙරෙහි විශ්වාසය තබන විට සහ එක් වේලාවක සෑම දෙයක්ම අහිමි වන විට, කුසගින්නෙන් පෙළෙමින් වසරකට සෘතු 3 ක් වගා කරනු ලබන අපේම භූමිය පසුකරන විට අපගේ මනස හරහා කුමක් වේදැයි සිතා බලන්න."

- මුලතිව් කොක්කුතොඩුවේ සිට පැමිණි සහභාගිවන්නන්

පාසල් වැනි පහසුකම් සඳහා අතිශයින් සීමිත ප්‍රවේශයක් තිබූ ප්‍රදේශයකට නැවත පදිංචියට යාමට හේතු වූ ඉඩම් භුක්තිය අහිමි කිරීමක් පිළිබඳ ව අනුරාධපුරයේ දෙමළ ප්‍රජාවක් අනාවරණය කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ළමුන්ට පාසල් අහිමිවී ගොස් තිබූ අතර පසුව ඔවුන්ට රැකියාවක් ලෙස ලබා ගත හැකි වී ඇත්තේ ගෘහ සේවය පමණි. 'බැහැර කිරීම' නිශ්චිත රැකියාවකට සම්බන්ධ අනන්‍යතාවයක් නිශ්චයවීම පිළිබඳ සෘජු ව තීරණය වන බවට මෙය නිදසුනකි. පාලාලි හි, විමසීමට සහභාගී වූවන් පෙන්වාදුන් පරිදි, තල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම, මසුන් ඇල්ලීම සහ ගොවිතැන් කිරීම වැනි සාම්ප්‍රදායික ජීවනෝපායන් ඔවුන්ට අහිමි වී ඇති අතර ඊට හේතුව මෙම ක්‍රියාකාරකම්වල යෙදීමට තරුණයින් දක්වන අකැමැත්තයි.

---

8. 1985 අප්‍රියෙල් 15 වන දින එල්ටීටීඊය තම ගම ගිනිබත් කර ගම්වැසියන් 4 දෙනෙකු ඝාතනය කළ බව ගම්වාසීහු කියති. මෙම ප්‍රහාරයෙන් පසු මුළු ගමම අත්හැර දමන ලදී.

### 2.4.4 ඉඩම් භුක්තිය අහිමි කළ අයගේ අනන්‍යතාවය

අනන්‍යතාවයේ ප්‍රතිඵලයක් ලෙස කෙනෙකුගේ ඉඩමෙන් ප්‍රචණ්ඩ ලෙස බලහත්කාරයෙන් ඉවත් කිරීම හෝ පැහැදිලිවම වෙනස් අනන්‍යතාවයකින් යුත් කණ්ඩායමක් විසින් තමන් ඉඩමෙන් පිටත තබා ගැනීමේ, ප්‍රතිඵලය වන්නේ අනන්‍යතාවය පදනම් කරගත් දුක්ගැනවිල්ලකි. එය ඉඩම් සමඟ නොවැළැක්විය හැකි ලෙස බැඳී ඇති, ඉඩම් අහිමි වීම සම්බන්ධයෙන් කථා කෙරෙන දුක්ගැනවිල්ලකි. අවදානමට ලක්විය හැකි, පිටස්තර හා අයිතීන් අහිමි පුද්ගලයින්ගේ කණ්ඩායම් දැක්වීමට හෝ ඉදිරිපත් කිරීමට භාවිතා කර ඇති බොහෝ යෙදුම් පිළිබඳ ව මිනිසුන් කතා කළහ. ඔවුන් 'ආදිවාසී', 'බෝඩිං කාරයෝ', 'පිටගම් කරයෝ, 'ත්‍රස්තවාදීන්', 'බ්ලොක් ළමයි' ලෙස හැඳින්වීමට ලක් කර තිබේ.

භූමියේ අන්‍යතාවය වෙනස් වන පරිදි ඉඩම්වල භෞතික ගුණාංග එතරම් දුරට වෙනස් කිරීමට උත්සහ කිරීම නිසා ජනතාව ද, කලකිරීමට පත්ව තිබේ. මෙය ඔවුන්ගේ භූමිය සමඟ ඇති සම්බන්ධතාවට බලපා ඇති අතර, 'අයිති නැත' හෝ 'අවශ්‍ය නැත' යනා දී අහිමිකළ හැඟීමක් ඇතිකර තිබේ. නව විහාරස්ථාන හෝ ආගමික විශ්වාස මත පදනම් වූ ගොඩනැගිලි ඉදිකිරීම, ආගමික අනන්‍යතා පදනම් කරගත් ප්‍රතිමා ඉදිකිරීම සහ දෙමළ භාෂාවේ සිට සිංහල භාෂාවට ස්ථාන සහ මාර්ග නම් වෙනස් කිරීම හෝ ජනතාව අතර කිසිදු සම්බන්ධයක් නොමැති පුද්ගලයින් සැමරීම පිළිබඳ ව ජනතාව විස්තර කළහ.

රටේ නැගෙනහිර ප්‍රදේශවල පරිපාලන ප්‍රදේශ සඳහා ජනයා දෙමළ සහ සිංහල යනුවෙන් පැහැදිලි ලෙස ලේබල් කර තිබේ. මෙම මතය ඇතැම් ප්‍රජාවන් වෙත ව්‍යාප්ත වී ඇත්තේ ඔවුන්ට පදිංචි වීමට අවසර ලබා දිය හැක්කේ ඇතැම් භූගෝලීය ප්‍රදේශවලට පමණක් බව විශ්වාස කරන ආකාරයෙනි. ජනගහනය නොසලකා මුස්ලිම් ප්‍රජාවගේ භූගෝලීය පදිංචිවීම පරිපාලනමය වශයෙන් සීමා කිරීම ගෙටෝකරණයට දායක වූ බව හැඟී යයි. කාත්තන්කුඩි එයට කදිම නිදසුනකි.



### 2.4.5 අනන්‍යතාව සහ රාජ්‍ය අනුග්‍රහයලත් ජනපදකරණය

ඓතිහාසික වශයෙන්, ප්‍රධාන වශයෙන් දෙමළ හා මුස්ලිම් ප්‍රදේශවල/කලාපවල ජනවාර්ගික ජන විකාශනය වෙනස් කිරීම වැනි ජාතිවාදී රාජ්‍ය න්‍යායපත්‍ර ඉදිරියට ගෙන යාම සඳහා මෙවලමක් ලෙස රාජ්‍ය අනුග්‍රහය දක්වන ජනපදකරණ යෝජනා ක්‍රම භාවිත කර තිබේ. වැලිඔය (මුලින් මානෙල් ආරු[9] ලෙස හැඳින් වූ) සහ ගල් ඔය[10] වැනි යෝජනා ක්‍රම පැරණි යෝජනා ක්‍රම වූවත්, බොහෝ දුර ට මහවැලි ජනපදකරණ ක්‍රමය යටතේ ජනපදකරණය අදටත් සිදු වේ. දීර්ඝ කාලයක් තිස්සේ මතභේදාත්මක කාරණයක් වී ඇති භූමිය[11] (සාම්ප්‍රදායික නිජබිම් පිළිබඳ සංකල්පය) ශ්‍රී ලංකාවේ දශක තුනක ජනවාර්ගික ගැටුම ට මූලික හේතුවක් වූ අතර එය අද දක්වා ම විසඳී නැත.

ඉඩම් අනන්‍යතාවයට සහ රටට අයත් බවට නෛසර්ගිකවම බැඳී ඇති අතර, එම නිසා එය නාගරික/නගර වැසියන්ගේ අදහස හා ඉඩම් හා හිමිකාරිත්වය අතර සම්බන්ධයට වඩා බෙහෙවින් වෙනස් ය. විශේෂයෙන් රටේ ජනවාර්ගික සුළුතරයන් සම්බන්ධයෙන් ගත් කල, භූමිය ඔවුන්ගේ සාමූහික ඉතිහාසය හා අනන්‍යතාවන්හි අනිවාර්ය අංගයකි. ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමේ දී හා සැලසුම් කිරීමේදී මේ කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය.

අනාගත වාරිමාර්ග ව්‍යාපෘති සකස් කිරීමේ දී හා සැලසුම් කිරීමේදී තිබිය යුතු පැහැදිලි මාර්ගෝපදේශ වන්නේ:

- ප්‍රශ්නයට ලක්ව ඇති ප්‍රජාව සමග සාකච්ඡා කළ යුතු අතර ඔවුන්ට අපේක්ෂිත සංවර්ධන හා නැවත පදිංචි කිරීමේ සැලසුම් සඳහා ඇතුළත් කිරීම් කළ හැකි විය යුතුය.
- නැවත පදිංචි කරවීම සම්බන්ධයෙන් ගත් කළ, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත කලාපය/දිස්ත්‍රික්කය තුළ සිටින එකම ජනවාර්ගික ප්‍රජාවට අයත් දිළිඳු හා ඉඩම් නොමැති ප්‍රජාවට ඔවුන් හා සමාන නිර්ණායක සපුරාලන බාහිර ජනගහනයට වඩා ප්‍රමුඛතාව දිය යුතුය.
- ප්‍රාදේශීය හා පදිංචිකරුවන්ගේ ප්‍රජාවන් අතර ගැටුම් ඇති නොවීම සහ ප්‍රදේශයේ ජනවාර්ගික සැකැස්ම කඩාකප්පල් නොවීම වෙනුවෙන් බාහිර ප්‍රජාවන් (යාබද දිස්ත්‍රික්කවලින් ඉතා මැනවින්) රැගෙන ඒමේ දී ප්‍රශ්නය ඇති කලාපයේ/දිස්ත්‍රික්කයේ ජනවාර්ගික සංයුතිය බැරෑරුම් ලෙස සැළකිල්ලට ගත යුතුය.
- ප්‍රාදේශීය/පළාත් සහ මධ්‍යම/ජාතික රජයේ දෙපාර්තමේන්තුවල කාර්යභාරය පැහැදිලිව වෙන්කර හඳුනාගෙන ඒ අනුව වගකීම පැවරීම (එනම්, කුමන ප්‍රජාව නැවත පදිංචි කරවිය යුතු ද යන්න පිළිබඳ තීරණ ආදිය.)

---

9. මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාල ගුරුවරුන් යාපනය (යූටීඑච්ආර් (ජේ), විශේෂ වාර්තාව 5 - මානෙල් ආරු සිට වැලිඔය දක්වා සහ 1983 ජූලි මස ආත්මය, 1993 සැප්තැම්බර් 15 - http://www.uthr.org/SpecialReports/spreport5.htm#_Toc512569422

10. අජිත් කනගසුන්දම්, ගල්ඔය ව්‍යාපෘතිය වසර 60 ක් - 1 කොටස - http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=152657

11. මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාල ගුරුවරුන් යාපනය (යූටීඑච්ආර් (ජේ), වාර්තාව 11, උපග්‍රන්ථය II ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනපදකරණය හා ජන විකාශන වෙනස්කම් සහ දෙමළ කතා කරන ජනතාවට එහි බලපෑම් - http://www.uthr.org/Reports/Report11/appendix2.htm

## 2.4.6 අනන්‍යතාවය සහ නැවත පැමිණෙන මුස්ලිම් ජනයා

යුද්ධයෙන් වසර 10 කට පසුවත්, උතුරේ මුස්ලිම්වරුන් තමන්ට ඡන්දය පවා නොමැතිව ඔවුන්ගේ නිවෙස් සහ අවතැන් වූ ස්ථාන අතර රැඳී සිටින නිසා 1990 දී එල්ටීටීඊය විසින් උතුරෙන් නෙරපා හරින ලද මුස්ලිම් ජාතිකයින්ගේ ප්‍රශ්නය විශේෂ වැදගත්කමක් දරයි. යුද්ධය පැවති සමයේ දී කඳවුරුවල ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් ඔවුන්ට විශේෂ විධිවිධාන පනවා තිබූ අතර, තවමත් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුත්තලම සිට ඔවුන්ගේ උපන් ස්ථාන දක්වා "බස් රථ" වලින් ගෙනයනු ලැබේ. බොහෝ විට ඡන්දය ප්‍රකාශ කිරීමේ දී කුමන හෝ වෙනත් දේශපාලන පක්ෂයක මැරයන්ගේ ගල් ප්‍රහාර හා වෙනත් හිරිහැරවලට ලක් වේ. මන්නාරමේ හෝ මුලතිව්වලින් පැමිණි බොහෝ මුස්ලිම්වරුන්ට, 1990 සිට පුත්තලම වැනි ප්‍රදේශවල නැවත මුල සිට ජීවිතය ආරම්භ කිරීමට සිදු විය. කෙසේ වෙතත්, යුද්ධය අවසන් වූ දා සිට සත්‍යවශයෙන්ම මුස්ලිම්වරු නැවත දෙමළ ජාතිකයින් පදිංචි ව සිටින සිය උපන් ප්‍රදේශ කරා යාමට උත්සහ කරමින් සිටිති. නෙරපා හරින ලද මුස්ලිම්වරුන් ඔවුන්ගේ නිවෙස්වලින් සහ ඔවුන්ට හුරුපුරුදු සියල්ලෙන් ඈත්වී සිටින අතර, ඔවුන් නැවත පදිංචි කරවන ලද සත්කාරක ප්‍රජාවන් විසින් "සරණාගත බල්ලන්"[12] වැනි නින්දිත අපවාදයන්ට ද ලක් වෙමින් සිටියි. මෙම දීර්ඝකාලීන අවතැන් වූ මුස්ලිම්වරු පැමිණිලි කරන්නේ තමන්ට කිසි විටෙකත් රජය විසින් නිවාස ලබා නොදුන් බවත් ඔවුන්ට අවශ්‍ය නම්/ලබා ගත හැකි නම් ඔවුන්ගේම ඉඩම්/නිවාස මිල දී ගත යුතු බවත් ය.

ඉඩම් ප්‍රතිපත්තියට මුස්ලිම්වරුන්ට නැවත තම ඉඩම්වලට යාමට අවසර දීම හෝ ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදීම සහ ඔවුන් කැමති ප්‍රදේශයක විකල්ප ඉඩම් ලබා ගැනීම ඇතුළත් විය යුතුය.



12. මුලතිව් හි නැවත පැමිණි මුස්ලිම් ප්‍රජාව සමඟ PARL කොමිෂන් සභා විභාගය - https://twitter.com/ParlSl/status/1113318513437958144

## 2.5 ඉඩම් සන්තකය, ඉඩම් අයිතිවාසිකම් සහ මානව ආරක්ෂාව සඳහා කාන්තාවන්ගේ අරගල

මහජන ඉඩම් කොමිෂන් සභා රැස්වීම්වල දී, අපි සෑම දිස්ත්‍රික්කය ක ම බොහෝ කාන්තාවන් සමඟ සාකච්ඡා කළෙමු. කාන්තාවන් බොහෝ ඉඩම් අරගලවල කොටස්කරුවන් වී එහි නායකත්වය ගෙන තිබේ. හමුදාව විසින් අත්පත් කරගනු ලැබූ ඔවුන්ගේ ඉඩම් ආපසු ලබා ගැනීම සඳහා වූ මුලතිව් හි කෙප්පපිලාවු ප්‍රජා අරගලයේ සිට මුස්ලිම් ප්‍රජාවන් තවමත් සුනාමි නැවත පදිංචි කිරීමේ නිවාස ලබා ගැනීමට අරගල කරමින් සිටින අක්කරපත්තුවල නොරචෝලේ දක්වා ම එය අත්දැකිය හැකි ය. සමහර අවස්ථාවල දී කාන්තාවන් තම ප්‍රජාවන්ට ඉඩම් අයිතිවාසිකම් සහතික කිරීම වෙනුවෙන් හඬ සහ බලය ලබාගැනීමේ අපේක්ෂාවෙන් මහජන දේශපාලනයට අවතීර්ණ වී තිබේ. කාන්තාවන්ගේ අනන්‍යතාවන් හා සමාජ ආර්ථික සුරක්ෂිතතාවට සමීප ව ඉඩම් සම්බන්ධ වී ඇති බව පැහැදිලි ය. රැස්වීම් කිහිපයක දී කොමිසමේ සමාජිකයින් කාන්තාවන්ට වඩාත් නිදහසේ කථා කිරීමට අවස්ථාව ලබා දීම සඳහා ඔවුන් වෙන ම කණ්ඩායම්වලට බෙදා කාන්තාවන් සමඟ කතා කළහ. ඉඩම් භුක්තිය අහිමි කිරීම සහ එහි ප්‍රතිඵල ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ අත්දැකීමක්ය යන කාරණය විද්වත් සාහිත්‍යයේ මෙන් ම ශ්‍රී ලංකාවේ සහ වෙනත් තැන්වල[13] එවැනි ක්‍රියාදාමයන්ගේ ඉතිහාසය තුළ ද තහවුරු වේ. මෙම ස්ත්‍රී පුරුෂ යථාර්ථයට ගැඹුරින් සවන්දීම, ලේඛනගත කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා මහජන විමසීම් මාදිලිය මුළුමනින් ම හිතකර නොවූවත්, කාන්තාවන්ගේ සාක්ෂි අනිවාර්යයෙන් ම මෙම අත්දැකීම් තුළ දෘශ්‍යමාන විය.

### 2.5.1 ඉඩම් භුක්තිය අහිමි කිරීම අවතැන්වීම සහ අනන්‍යතාව

කාන්තාවන් අවතැන්වීම හෝ නෙරපා හැරීම පිළිබඳ අත්දැකීම් බෙදාගත් විට, ඔවුන් බොහෝ විට කතා කරනු ලැබුවේ 'අනෙකා' ලෙස සැලකීම හා බැඳී ඇති අපකීර්තිය පිළිබඳ ව ය. අවතැන් වූ සහ බැහැර කරන ලද ප්‍රජාවන් බොහෝ විට හැඳින්වූයේ අවතැන්වූවන් හෝ සරණාගතයින් යන අර්ථය ඇති 'අහඩි' වැනි නින්දා සහගත නම් වලින් ය. රාජ්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට උත්සහ කරන විට හෝ සත්කාරක ප්‍රජාවන්හි පදිංචියට යන අතරතුර කාන්තාවන් බොහෝ විට මෙම සමාජ අපකීර්තියට මුහුණ දෙන බවක් පෙනෙන්නට තිබුණු අතර, තව ද පාසැලේ දී වෙනස්කොට සැළකීම් වලට මුහුණ දුන් ඔවුන්ගේ දරුවන් හරහා ද ඔවුන් විසින් මෙම වේදනාව අත්විඳ තිබේ. යාපනයේ තරුණියක් ඔවුන්ගේ නිවෙස් සනීපාරක්ෂාවට අහිතකර හා අපිරිසිදු ලෙස පෙනෙන, සෑම තැනකම අපද්‍රව්‍ය හා කුණු කසළ ඇතැයි සළකා තම පංතියේ ළමයින් කිසිවෙකුත් තම නිවසට උපන්දිනයකට හෝ නොපැමිණි ආකාරය පිළිබඳ අත්දැකීම් බෙදා ගත්තා ය. මෙම ප්‍රජාව අවතැන් වී වසර 30 කට ආසන්න කාලයක් මෙම තාවකාලික ජනාවාසවල වාසය කර තිබේ. මෙවැනි පසුබිමක මුළු පරම්පරාවක් ම හැදීවැඩී තිබුණි. අවතැන් වූ ප්‍රජාවන්හි ළමයින්ට පන්ති කාමරවල වෙන වෙනම වාඩි වී සිටින ලෙස ඉල්ලා සිටි අත්දැකීම් තවත් සමහරු බෙදා ගත්හ.

---

13. A study on Women's Land Rights in the Post-Tsunami Resettlement Process in Batticaloa documents through in depth case studies, women's experience of domestic violence in relation to loss of land and property in the post tsunami rettlemment process. Not only did women lose their claims to dowry land in the resettlement process but women spoke of violence in the home as they were trying to negotiate the power relations in the households as the new post-tsunami housing were given in the man's name. Maunaguru, Sitralega & Emmanuel Sarala (2010), in Penkalin Nilam: A study on Women's Land Rights in the Post-Tsunami Resettlement Process in Batticaloa, published by Suriya Women's Development Centre Batticaloa.

අක්කරයිපත්තුවේ කාන්තාවන් 'අහඩි' හෝ අවතැන් වූවන් විවාහ කරගැනීම වටා ඇති, විශේෂයෙන් මෙම ප්‍රජාවන්හි කාන්තාවන් විවාහ කර ගැනීමේ අපකීර්තිය පිළිබඳ ව කතා කළහ. එය තදින් හෝ ඍජුව ප්‍රකාශ කර නොතිබුණ ද, මෙම වෙනස්කම් කිරීමේ අත්දැකීම්වල දී කුලය මෙන්ම ජනවාර්ගික අනන්‍යතාවන් සමඟ ද අපකීර්තිය සම්බන්ධ බව පැහැදිලිය. කාන්තාවන් බොහෝ විට පුරුෂාධිපත්‍ය සමාජවල ප්‍රජා අනන්‍යතාවය විසින් සදා නිම කළ වාහකයන් වන අතර පසුව ප්‍රජාවට එරෙහි අපකීර්තියේ බර ද අසමාන ලෙස දරන්නෝ වෙති. මෙම අපකීර්තිය සමහර විට කාන්තාවන්ගේ සිරුරු මත පෞද්ගලික හා පොදු ක්ෂේත්‍රයන්හි විවිධ ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් හරහා ප්‍රකාශ වේ.

### 2.5.2 විවාහය සහ දෑවැද්ද

"දොර කැඩිලා, හෙල්ලෙනවා, මම එය බැඳලා තියන්න ඕනෑ. මා සතුව ලියකියවිලි නැති නිසා, නිවස අලුත්වැඩියා කරන්න මට බැහැ. මගේ බලපත්‍රය ලබා ගන්න මම 18,000/- ක් ගෙවන්න ඕනෑ වුණත්, ඒ මුදල් මට නැහැ. මම මේ නිවස මගේ වැඩිමහල් දුවට දෑවැද්දක් විදිහට ලබා දුන්නා, ඒත් මට ලියකියවිලි නැහැ."

- 1983 ප්‍රේමදාස නිවාස යෝජනාක්‍රමය යටතේ නිවාස ලැබූ කන්නකිරිකාමම් සිට පැමිණි සහභාගිවන්නියක්,

පුරුෂාධිපත්‍යයේ දෑවැද්ද පුරුද්ද පවුලේ සියලුම සාමාජිකයින්ට බරක් වුව ද, පිරිමින් දෑවැද්ද පිළිබඳ ප්‍රශ්නය මතු කරනු ලැබුවේ ඉතා කලාතුරකිනි. තම දරුවන් විවාහ කර දීම සඳහා දෑවැද්දෙහි ඇති පීඩනය සහ දෑවැද්දට සම්බන්ධ සමාජ තත්ත්වය හා අර්ථය පිළිබඳ ව කාන්තාවෝ සෑම විටම සඳහන් කළහ. උතුරු හා නැගෙනහිර කාන්තාවන්ට දෑවැද්ද ලෙස ඉඩම් උරුම කර දීම සාමාන්‍ය සිරිතක් වූ බැවින් මෙය විශේෂයෙන් අදාළ විය. ප්‍රමාණවත් දෑවැද්දක් ලබා දීමට නොහැකි වීම නිසා විවාහ ගනුදෙනුවල දී තම ගැහැනු දරුවන්ට ආරක්ෂාව සහ ගෞරවය ලබා දීමට ඇති නොහැකියාව, කනගාටුව සඳහා ප්‍රබල හේතුවකි.

අවතැන් වූ ප්‍රජාවන්ට රජයේ ඉඩම් ලබා දී ඇති සංදර්භයන් තුළ පවා, නව බිම් කැබලි ඉතා කුඩා වූ අතර ඒවා ප්‍රමාණවත් වූයේ එක් නිවසක් සඳහා පමණි. මෙම ඒකකය එක් දරුවෙකුට පමණක් ලබා දිය හැකි අතර අනෙක් දියණියන් සඳහා හොඳ විවාහයක් පිළිබඳ සාකච්ඡා කිරීම ඉතාම අපහසු ය. තවද, බොහෝ විට රජයේ ඉඩම් බෘධ යටතේ ලබා දී ඇති අතර, එහි දී පිරිමි ගෘහ මූලිකයාට සහ වැඩිමහල් පුතාට පමණක් උරුමය පිළිගෙන තිබේ. බැහැර කරන විට හෝ අවතැන් වනවිට මෙම පවුල් බොහොමයකට විශාල ඉඩම් ප්‍රමාණයක්, අතැම්විට විට ඉතා වැදගත් කුඹුරු ඉඩම් අහිමි වී ඇති නිසා මෙම සාධක සියල්ලම එකසේ වැදගත් ය.

"මගේ පියා නැවත විවාහ වුණා, අපි ඔහුගේ කුලුදුල් දරුවන්, නමුත් අපි දියණියන්. ඔහුගේ දෙවන විවාහයේ දී ඔහුට පුතෙකු සිටියා, නීතියට අනුව ඉඩම පුතාට හිමිවෙනවා."

- මුල්ලිකුලම් සිට පැමිණි සහභාගීවන්නියක්

"පිරිමියාගේ මරණයෙන් පසු ඉඩම ස්වයංක්‍රීයවම වැඩිමහල් පුතාට පැවරෙනවා. ප්‍රධාන පදිංචිකරුගේ මරණයෙන් පසු හිමිකම ඉල්ලා සිටීම හරීම සංකීර්ණ යි. නිලධාරිවාදය අකාර්යක්ෂමයි."

- අනුරාධපුරයේ සිට පැමිණි සහභාගීවන්නෙක්

ඉඩම් හිමිකාරිත්වයේ පීතෘමූලික භාවිතයන් සඳහා මැදිහත් වීම සම්බන්ධයෙන්, මුලතිව් හි පැවති මහජන විභාගයේ දී, දියණියක සතු සියලු වත්කම්/දේපළ විවාහයේ දී ඇයට ලබා දෙන බව අපට පැහැදිලි කරන ලදී. පසුව, පවුලේ වත්කම් හා ඉඩම් වලින් සමාන කොටසක් සඳහා හිමිකම් පෑමට ඇයට නොහැකි ය. කණ්ඩායම තුළ මෙම භාවිතය පිළිබඳ ව යම් සාකච්ඡාවක් පැවතුණ ද, මෙය ප්‍රදේශයේ පොදු භාවිතයක් බව පැහැදිලි විය. එබැවින්, ප්‍රජා ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ව සහ හමුදාව විසින් අල්ලා ගැනීමට එරෙහි වීම පිළිබඳ ව ප්‍රබල ව්‍යාපාරයක් පැවතුණ ද, කුටුම්භ හා ප්‍රජාව තුළ වෙනස් කොට සැළකෙන ඉඩම් හිමිකාරිත්වයේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ගතිකත්වයන් අඛණ්ඩව නොඅඩුව පවතී. පුළුල් අරගලවල දී ඉඩම් අයිතිවාසිකම් සඳහා වන ඉල්ලීම් ප්‍රකාශ කිරීමේ දී මෙම වෙනස්කම් කිරීම දැඩි ලෙස හඳුනාගෙන නැත.

තම අනාගත බෑණා සහ ඔහුගේ පවුලේ අය විසින් ඔහුගේ නමින් ඉඩම සහ නිවස ලියා ඇත්නම් මිස විවාහයෙන් ඉවත් වන බවට තර්ජනය කළ අත්දැකීමක් ත්‍රිකුණාමලයේ එක් කාන්තාවක් අප හා බෙදා ගත්තාය. දේපළ ඔහුට ලියන්නේ නම්, ඇයගේම ආරක්ෂාව සහ දියණිය පිළිබඳ ව ඇය කනස්සල්ලට පත් ව සිටියා ය. නිවස තුළ ඉඩම් සම්බන්ධ ගැටුම් හේතුවෙන් කාන්තාවන්ට තර්ජනයට ලක්වීම හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීම පිළිබඳ බොහෝ අත්දැකීම් සඳහා මෙය එක් උදාහරණයක් පමණි.

2019 ඔක්තෝම්බර් මාසයේ PARL ජාලය සහ LSඔ විසින් සංවිධානය කරන ලද '10 වසරක ජනතාවගේ ඉඩම් අරගලඃ පරාවර්ථනයන් සහ ඉදිරියට යන මාර්ග' යන මාතෘකාව යටතේ කොළඹ පැවති මහජන රැස්වීමේ දී තේසවලාමේ නීතිය යටතේ කාන්තාවන්ට ස්වාමිපුරුෂයාගේ අවසරයකින් තොරව, ඔහු මිය ගොස් නොමැති නම් දේපළ පිළිබඳ තීරණ ගැනීමට නොහැකි නිසා අතුරුදහන් වූවන්ගේ පවුල්වල කාන්තාවන්ට දේපළ උකසට හෝ බද්දට භාවිත කිරීම පවා විශාල අභියෝගයක් වන බව, උතුරේ ඇතැම් සහභාගිවූවෝ පැවසුහ. මේ අනුව, නීත්‍යානුකූල ව මෙන් ම සමාජීය වශයෙන් කාන්තාවන්ගේ ඉඩම් අයිතිවාසිකම් අවාසනාවන්ත ලෙස දැවැද්ද සහ විවාහය පිළිබඳ අයුක්ති සහගත භාවිතයන්ට සම්බන්ධ වේ. මෙම භාවිතය නිසා අනෙක් අතට කාන්තාවන් තම විවාහක නිවසේ ආරක්ෂාවේ ප්‍රභවයක් ලෙස සලකනු ලැබේ. එවැනි ආරක්ෂාවක් යනු සමාජ-ආර්ථික සුරක්ෂිතතාව පමණක් නොව, විවාහක නිවස තුළ ප්‍රචණ්ඩත්වයේ තර්ජනයෙන් ද ගැලවුණු ආරක්ෂාවකි. මෙම සංකීර්ණ කාරණය කාන්තාවන්ගේ ජීවිතවල ඉඩම් අයිතිවාසිකම් විසින් ඉටු කරනු ලබන කාර්යභාරයට කේන්ද්‍රීය වේ. ඉඩම් හා දේපළ පිළිබඳ සාකච්ඡා තුළ විවාහයේ කේන්ද්‍රීයභාවය සැලකිල්ලට ගෙන, සමස්තයක් වශයෙන් සමාජයට ඉඩම් අයිතිවාසිකම්වල බලපෑම සළකා බැලීමේ දී මෙම දැක්ම නොවැළැක්විය හැකිය.

### 2.5.3 ඉඩම් හා ගෘහ කටයුතු

ඉඩම් සඳහා වන්දි ගෙවීම පිළිබඳ ඔවුන්ගේ අදහස තුළ බොහෝ කාන්තාවන් මූලික අවශ්‍යතාවල වැදගත්කම ගැන කතා කළහ. එය ඔවුන්ගේ ඉඩම හුදකලා ලෙස ආපසු ලබා දෙන ලෙස ඉල්ලා සිටීම පමණක් නොවේ. ආරක්ෂාව, මාර්ග, ගුණාත්මක පාසල් සහ සෞඛ්‍ය පහසුකම් ආසන්නයේ තිබීම පිළිබඳ ව ඔවුහු ඉතා පැහැදිලිව ප්‍රකාශ කළහ. බොහෝ විට ඔවුන්ගේ ආර්ථික කටයුතුවල නිරත වීම සඳහා ගෘහස්ථ අවකාශය හා රැකවරණය සමඟ සම්බන්ධ වී ඇති අවකාශයක් ද කාන්තාවෝ ඉල්ලා සිටිය හ. උපකාරක පන්ති, වෙළෙඳපළ සහ වෙනත් සේවාවන් පහසුවෙන් ලබා ගත හැකි නාගරික ස්ථානවලට සමීප වීමට ඇතැම්විට කාන්තාවන් කැමැත්ත පළ කළහ. ඔවුන්ගේ මුල් ඉඩම් ආපසු ඉල්ලා සිටීමේ විශාල අරගලවල ඔවුන් කොටසක් වුව ද, ඔවුන් නිහඬව හා ස්ථිරව කේන්ද්‍රීයව ඉඩම් සමඟ සම්බන්ධ ජීවිතයේ සියලු අංශ ගැන කතා කළහ.

කොළඹ, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද උස් මහල් නිවාස වෙත බලහත්කාරයෙන් නැවත පදිංචිකළ කාන්තාවන්, ආහාර නිෂ්පාදනය හෝ මැහුම් වැනි ගෘහස්ථ අවිධිමත් ජීවනෝපායන් අහිමි වීම පිළිබඳ ව කතා කළහ. මෙයින් අදහස් කරනු ලැබුවේ ආදායම් අහිමිවීම සහ වියදම් වැඩිවීම

හේතුවෙන් ඔවුන්ගේ ගෘහ ණය වැඩි වෙමින් ඇති බවයි. ගොඩනගන ලද පරිසරය වෙනස් වීම සහ රෙදි සේදීමේ සිට ළමා රැකවරණය දක්වා මීට පෙර ගෘහස්ථ කාර්යයන්ගෙන් වැඩි ප්‍රමාණයක් බෙදාගෙන තිබූ ප්‍රජා ජාලයන් අහිමි වීම හේතුවෙන් ඔවුන්ගේ වගකීම් සහ නිවසේ දෛනික ක්‍රියාකාරකම් කෙරෙහි වැය කළ කාලය ද වැඩි වී තිබේ. ගොඩනැගිලි අතර ප්‍රජාවන් විසිරී යාමෙන්, අසල්වැසියන් කිසිවෙකුත් නොදන්නා පරිසරයක ගෘහ හා ළමා රැකවරණය පවත්වාගෙන යාමේ අමතර අභියෝග භාර ගැනීමට ද කාන්තාවන්ට සිදු වී තිබේ. තව ද, ඇඳුම් වියළන ස්ථානයක් සෙවීමේ සිට ළමයින්ගේ ආරක්ෂිතභාවය සහ පාසැල් යාමට හැකියාව ඇති බව සහතික කිරීම දක්වා, මෙන්ම පාසලෙන් පසුව ඔවුන් විසින් කාලය ගතකරන අකාරය අධීක්ෂණය කිරීම ආදී තට්ටු ගොඩනැගිලිවල ජීවත්වීමට අනුවර්තනය වීමේ දී ඇතිවන බර ද කාන්තාවන් විසින් දරා ගත යුතු වේ.

නිවසේ දී කරනු ලබන සුරැකුම් කටයුතු රාජ්‍යයේ සමාජ ආරක්ෂණ පියවරයන් සමඟ ගැඹුරින් සම්බන්ධ වේ. ඉන්පසු අපේක්ෂිත පරිදි ම, සමෘද්ධි වැනි සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා ලියාපදිංචි නොවීමට හේතු වූ ඉඩම්වලින් අවතැන්වීම සහ ඉඩම් භුක්තිය අහිමි කිරීම අතර සම්බන්ධය පෙන්වා දුන්නේ කාන්තාවන් ය.

සමාජ සුරක්ෂිතභාවයට ප්‍රවේශවීමට නොහැකිවීමේ භෞතික ප්‍රතිඵල කාන්තාවන් වෙත පැමිණියේ රාජ්‍ය නිලධාරීන් සහ අනෙකුත් ප්‍රජා සාමාජිකයින් විසින් එවැනි සේවාවන් සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට උත්සහ කරන අතරතුර ඔවුන් මුහුණ දුන් සමාජ අපකීර්තියේ අමතර බරද සමඟ ය. වැඩිහිටියන්, දරුවන් සහ රෝගීන් රැකබලා ගැනීම සඳහා ද කාන්තාවන් මූලික වශයෙන් වගකිව යුතුය. සමාජ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් කාන්තාවන්ට ඇති අනියතභාවය ගෘහයේ වඩාත් අවදානමට ලක්විය හැකි යැපෙන්නන් කෙරෙහි ප්‍රබල ලෙස අහිතකරව බලපායි. මේ නිසා, අයෙකු තම ඉඩමෙන් අවතැන් වීම නිසා ළමයින්, වැඩිහිටියන් සහ පවුලේ අනෙකුත් සියලුම සාමාජිකයින් රැකබලා ගැනීමේ කාර්යයන් බොහෝමයක් ඉටුකරන, සමාජයේ ප්‍රධානම පුද්ගලයින්වන තමන්ම අවදානමට ලක්විය හැකි තත්ත්වයක සිටියි.

උමා ඔය ව්‍යාපෘතියෙන් පීඩාවට පත් කාන්තාවන් කියා සිටියේ ජලය නොමැතිකම නිසා ආර්ථික දුෂ්කරතාවන් ඇති වී ඇති බවත්, කාන්තාවන්ට තම ප්‍රජාවන්ගෙන් හා පදිංචි ප්‍රදේශවලින් පිටත රැකියා ලබා ගැනීමට සිදු වී ඇති බවත් ය. මෙය ඔවුන්ගේ පුද්ගලික ආරක්ෂාව බෙහෙවින් අඩපණ කරයි. බදුල්ලේ කාන්තාවක් අදහස් දක්වමින් කියා සිටියේ "කාන්තාවන්ගේ ආරක්ෂිත ගැටලූ, හැම වේලාවේම සළකා බලන්නේ ප්‍රශ්නයක් තියෙන වෙලාවට නෙවෙයි දෙවෙනුවයි". කාන්තාවන්ගේ ආරක්ෂාව, සුරක්ෂිතබව, සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ ගැටලූ මතු කිරීමේ දී කාන්තාවන්ට ඇති දුෂ්කරතා පිළිබඳ ව ඔවුහු කතා කළහ.

වතුකරයේ දී, ඉඩම් සඳහා ඇති හිමිකම්වල අස්ථිර ස්වභාවය සහ අතරමැදියන් විසින් ඉටු කරන ලද භූමිකාව නිසා, කාන්තා සේවිකාවන් මුහුණ දෙන හිරිහැර හා වෙනත් ආකාරයේ හිංසනයන්ට එරෙහි ව පැමිණිලි කිරීම අතිශයින් දුෂ්කර ය. එවැනි කාරණා ඔවුන්ගේම ප්‍රජාව තුළම මෙන්ම ඉඩම් සඳහා වන අරගල තුළ පවා ද්විතියික ලෙස දැකීම හේතුවෙන් ඔවුන්ගේ අනාරක්ෂිතභාවය පිළිබඳ හැඟීම තවදුරටත් උග්‍ර වේ. ඉඩම් සම්බන්ධ ගැටලූ සහ නිවස තුළ හිංසනය අතර සම්බන්ධය මෙන්ම, වැඩබිම තුළ ඉඩම්, අවතැන්වීම සහ ලිංගික හිරිහැර හා ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධය ද කාන්තාවන්ට ඇති සැබෑ ගැටලූ ය.

මේ අනුව ඉඩම් හා අවතැන්වීම සම්බන්ධ සියලූ ගැටලූ හුදෙක් භෞතික භූමිය ගැනම පමණක් නොව, එම භූමිය මත පදනම් වූ සමස්ත ජීවන ආකාරයන් පිළිබඳ ව ද වේ. ජීවනෝපායන් පිළිබඳ සාකච්ඡාවල දී සාමාන්‍යයෙන් නොපෙනෙන රැකවරණ කටයුතු ඇතුළුව විශේෂයෙන් කාන්තාවන්ගේ කාර්යයන් ගැන අපි විමසුවෙමු. ළමා රැකවරණය, දරුවන්ගේ අධ්‍යාපනය, වැඩිහිටියන් හා ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම, ආහාර පිසීම, ජලය එකතු කිරීම යනාදිය සමඟ ඇති අභියෝග හා අරගල හැරුණු

විට කාන්තාවන් බොහෝ විට විරෝධතා සඳහා ද සත්කාර සපයන්නන් වේ. දිගුකල් ඇදෙන සත්‍යග්‍රහ විරෝධතා ගැනීම් පවත්වා ගැනීම වෙනුවෙන් ඔවුන් ආහාර සහ වෙනත් සත්කාර සපයයි. මෙම ජීවන රටාව නඩත්තු කිරීම හා නොනැසී පවත්වාගැනීමට මෙන් ම, ගෘහස්ථ අවකාශය තුළ හා මහජන අවකාශයේ දී මෙම ජීවන රටාව නැවතත් ලබා ගැනීම වෙනුවෙන් වූ අරගලයේ දී ද කාන්තාවන් විසින් ඉටු කරනු ලබන කේන්ද්‍රීය කාර්යභාරය සැලකිල්ලට ගැනීම මගින් ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ මෙම පුළුල් ප්‍රකාශනය ඉතා යථාර්ථවාදී ය.

මේ සියල්ල හැරුණු විට, අපට හමු වූ බොහෝ දෙනෙක් වසර ගණනාවක් තිස්සේ ඔවුන්ගේ ඉඩම් අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරමින් සිටිය හ. බොහෝ කාන්තාවෝ සහ පිරිමි පිරිස් වෙහෙසට පත්ව රෝගාතුරව සිටිති. වයස්ගත වීම සහ දරුවන් මත යැපෙන්නට සිදුවීම පිළිබඳ ව වූ ඔවුන්ගේ කනස්සල්ල පිළිබඳ කාන්තාවෝ කතා කළහ. ඔවුන්ගේ මුල් ඉඩම් ආපසු ලබා ගැනීමේ අභිලාෂය වූයේ ගෞරවාන්විතව මියයාම සහ කිසිවෙකු මත යැපී නොසිටීමයි. අනුරාධපුරයේ දී, වැඩිහිටි කාන්තාවන්ට වැඩිහිටි නිවාසවලට යාමට සිදු වූයේ රජයේ ඉඩම් ලෙස ලබා දී ඇති තම ඉඩම ඔවුන්ගේ පුතුන්ට පැවරීමෙන් පසු ඔවුන්ට ජීවත් වීමේ අයිතිය අහිමි වීම හේතුවෙනි. පුරුෂාධිපත්‍ය සමාජ ව්‍යුහයන් තුළ සිටින කාන්තාවන්ට අභිමානය, ආරක්ෂාව හා ගෞරවය සහතික කර නොමැති හෙයින්, දැඩි අරගලයක ජීවිතයක් ගත කිරීමෙන් පසු මහලු වියේ දී සහ මරණයේ දී තමන්ටම ගෞරවය සහතික කළ හැකි එක ම ක්‍රමය ලෙස ඔවුන් දකින්නේ තම භූමියට ඇති අයිතිය යි.

### 2.5.4 ආරක්ෂාව සහ ගෞරවය පිළිබඳ කාන්තාවන්ගේ සංකල්පීයකරණය

"අපට අපේ ඥාතීන් හා සමීපව ඉන්න ඕන. ඕනෑම අසනීපයක දී අපට ඔවුන්ගේ උදව් අවශ්‍යයි. අප අවට පරිසරය ආරක්ෂිත වෙන්න ඕන, අපගේ රැකියාවන්ට උපකාරී වෙන්න ඕන. අපේ සමාජ සබඳතා පවත්වා ගන්නට අපිට පුළුවන් වෙන්න ඕන."

- අක්කරේපත්තුවේ සිට පැමිණි සහභාගීවන්නෙක්

ඔවුන්ගේ මුල් ඉඩම් වෙත ආපසු යාමේ දී හෝ නැවත පදිංචි කරවීමේ දී ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් වන දේ පිළිබඳ පැහැදිලි යෝජනා කාන්තාවන්ට තිබුණි. මුලතිව් හි කාන්තාවෝ එහි හමුදාව සිටීම සහ ඔවුන් මිනිසුන්ගේ ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව දැඩි ලෙස කතා කළහ.

"අපට ආරක්ෂාවක් දැනෙන්න හමුදාව අවශ්‍ය නැහැ. ජාතික ආරක්ෂාව යනු හමුදාව නොවේ. එය අපට නොමිලේ අධ්‍යාපනය ලැබීම, අපට අපේ ඉඩම් තිබීම, කාන්තාවන්ට දවසේ ඕනෑම වේලාවක නිදහසේ ජීවත්වීමට සහ නිදහසේ ගමන් කිරීමට හැකිවීම යි. ජාතික ආරක්ෂාව යනු එයයි".

හමුදාව පැමිණීම, පරීක්ෂා කිරීම සහ ඔවුන්ගේ එදිනෙදා ජීවිත පාලනය කිරීම තුළින් නොව ආරක්ෂාව සඳහා ගෞරවාන්විතව ජීවත්වීමේ නිදහස තිබිය යුතු බව කාන්තාවෝ නිශ්චිත ලෙස ප්‍රකාශ කළහ. කිලිනොච්චි, සෙන්චොලේ හිටපු එල්ටීටීඊ කාන්තා ළමා නිවසෙන් පැමිණි කාන්තාවන් සමග ඉඩම් කොමිෂන් සභාව පැවැත් වූ සිත්ගන්නාසුලු රැස්වීම නිවැරදිවම මේ ආකාරයේ නිදහස හා ගෞරවය ප්‍රකාශ කිරීම පිළිබඳ නිදර්ශනයක් වේ. කාන්තාවන්ට පවුලක් නොමැති නිසාත්, කාන්තා ළමා නිවාසයේ හැදී වැඩුණු නිසාත්, ඔවුන් නැවතත් ළමා නිවාසය තිබූ ඉඩමටම පදිංචියට ගොස් තිබූ අතර, දැන් ඔවුන් නිවාසයේ සිටම සාමූහිකව වැඩ කරමින් සිටින්නේ නිවස පිහිටා ඇති ඉඩම සහ එහි නිවාස සඳහා ඔවුන්ගේ අයිතිය ඉල්ලා සිටීමට ය. මෙය වඩාත් සිත් ඇදගන්නා සුලු වූයේ මෙම තරුණියන්ගේ ස්ථිර විශ්වාසය නිසා පමණක් නොව, එය වෙනත් නිවසක් පිළිබඳව නොදන්නා කාන්තාවන් පිරිසක් විසින් ඉල්ලා සිටින ඉඩම් හිමිකමක් නිසාය. එය පදනම් වී ඇත්තේ පරම්පරාව, ඥාතිත්වය, කුලය හෝ ප්‍රජාව මත නොව, හැදී වැඩුණු භූමියේ ජීවත්වීම තුළින් ඇති වූ ගැඹුරු සම්බන්ධතාවයන් මත ය.

කාන්තාවන් සඳහා ඉඩම් පිළිබඳ ප්‍රශ්නය හුදෙක් වත්කමක් හෝ දේපළක් හෝ වෙනත් භෞතික වස්තුවක් පිළිබඳ ව කරුණක් පමණක් නොවන බව පැහැදිලිය. එය සංස්කෘතික මූලාරම්භය හෝ පෙළපත පිළිබඳ වියුක්ත සංකල්ප ගැන ද නොවේ. පිරිමින්ට සමානව, ඔවුන්ගේ ඉඩම් අයිතිවාසිකම් භාෂාවට කේන්ද්‍රීය නොවූවත් මෙම පාර්ශව දෙක ම කාන්තාවන්ට ද අත්‍යවශ්‍ය ය. කාන්තාවන් නිරන්තරයෙන් ඉඩම් අයිතිවාසිකම් ගැන කතා කරන්නේ නිසඟයෙන් ම වූ පරිපූර්ණ දෘෂ්ටිකෝණයකින් වන අතර එයට ජීවිතයේ සියලු අංශ හා විෂයයන් ඇතුළත් වේ. කාන්තාවන් විසින් ඉඩම් අහිමිවීම අත්දකින්නේ ජනවාර්ගික හෝ ප්‍රජාවේ පදනම මත ගැටුම් හා වෙනස්කොට සැළකීම් අනුව ලෙස පමණක් නොවේ. මෙම අංගවලට අමතර ව, නීතිය තුළ, සම්ප්‍රදායික සමාජ භාවිතයන් තුළ සිදුවන අයුක්තිය හේතුවෙන් ඔවුන් එහි බරපතළකමකට මුහුණ දෙයි. ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ කාන්තාවන්ගේ දැක්ම මගින්, නොවැළැක්වියහැකි ලෙස, සමස්තයක් වශයෙන් ගැටලුව සම්බන්ධයෙන් වඩාත් පරිපූර්ණ, බහුකාර්ය ඉදිරි දර්ශනයක් සපයයි.

## සමාජ ආරක්ෂාව සැපයීම

- සමාජ ආරක්ෂණ හා සමෘද්ධි යෝජනා ක්‍රමය වැනි සුභසාධන වැඩසටහන් සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය වඩාත් ඇතුළුකරගන්නාසුලු විවෘතභාවයකින් යුතු විය යුතුය. එවැනි වැඩසටහන් පිළිබඳ තොරතුරු මහජනයාට පහසුවෙන් ලබා ගත හැකිවිය යුතුය.
- ස්ථිර ලිපිනයක් නැතිවීම වැනි ව්‍යුහාත්මක ගැටලුවක් පවතින විට, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සමාජ ආරක්ෂණ හා සුභසාධන වැඩසටහන්වලට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම සඳහා රජය විසින් විකල්ප යන්ත්‍රණ සොයා ගත යුතු ය. ස්ථිර ලිපිනයකට බැඳී ඇති සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් මිනිසුන් ඉවත් කිරීමට හේතු ලෙස අවතැන්වීම සහ බැහැර කිරීම භාවිත කළ නොහැකි විය යුතු ය.
- සමාජ සුරක්ෂිතතාවය යනු කාන්තාවන් සහ කුටුම්භයන් දිගු කාලීනව පවත්වා ගෙන යාමයි - ඔවුන්ගේ ඉඩම් අරගලවල දී ඔවුන්ව පවත්වා ගෙන යාම සහ ජීවිත නැවත ගොඩනැංවීම යි. එසේම, සමාජ ආරක්ෂණ හා සුභසාධන වැඩසටහන් මගින් යුද්ධයේ හා අහිමිවීමේ දිගු කාලීන බලපෑම්, විශේෂයෙන් ඉඩම් හා ජීවනෝපාය අහිමිවීම හඳුනාගත යුතු ය.
- සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම මගින් යුද්ධයෙන් පීඩාවට පත් පවුල් එකට තබා ගැනීමේ දී කාන්තාවන්ගේ රැකවරණ කටයුතු සහ ඔවුන්ගේ ඉඩම්වලින් පිටුවහල් කිරීම අත්විඳ ඇති අය හඳුනාගත යුතු ය.



# නිර්දේශ

## මාර්ගෝපදේශන මූලධර්ම

ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය, ඉඩම් පරිහරණය, ඉඩම් හිමිකාරත්වය, ජනතාවගේ ඉඩම්වලට බලපාන සංවර්ධන කටයුතු හෝ ඉඩම් පරිහරණ කටයුතු පහත දැක්වෙන මඟ පෙන්වීමේ මූලධර්මයන්ට අනුකූලව සැකසීමටත්, පරිපාලනය කිරීමටත් විනිශ්චය කිරීමටත් සුදුසු බව නිර්දේශ කෙරේ:

- දේශීය ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ ස්වාභාවික පරිසර පද්ධතිවල යහපැවැත්ම සහතික කිරීම ඉඩම් ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවන් විය යුතු ය.
- පුද්ගලයින්ට ගරුත්වයෙන් යුතුව අභිමානය ආරක්ෂා වන අන්දමින් සැළකීම.
- ඉඩම් සමගින් පුද්ගලයින්ට ඇති සම්බන්ධතා, විශේෂයෙන්ම එම සම්බන්ධතාවල පවතින ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය ස්වභාවය අගයකොට සැලකීම.
- ප්‍රදේශයේ සිටින ප්‍රජාවන් අගයකොට සැලකීම සහ ඔවුන් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම.
- ප්‍රාදේශීය සහ කලාපීය මට්ටමින් ඇතිවිය හැකි කෙටිකාලීන සහ දීර්ඝකාලීන දේශගුණ සහ පරිසර බලපෑම් පිළිබඳ අවබෝධයක් සහිත ව තීරණ ගැනීම.
- ඉඩම් සඳහා වන සියලූම ආයෝජන මගින් භූමියේ හා පරිසර පද්ධතිවල පුනර්ජනනීය ධාරිතාවයන් ඉහළ නැංවෙන බව සහතික කිරීම.
- කාන්තාවන් සහ ආන්තීකරණයට ලක් වූ අනෙකුත් කණ්ඩායම්වල සහභාගීත්වය සහතික කර ගනිමින්, තීරණ ගැනීම් සඳහා බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ දැනුවත් සහභාගීත්වය ලැබෙන බව සහතික කර ගැනීම.
- සාධාරණ සහ යුක්තිසහගත තීරණ ගැනීමක් සඳහා ශක්තිය ලබා දීම.
- සෑම ක්‍රියාමාර්ගයක් මුළුල්ලේ ම වෙනස්කොට නොසැළකීම සහ සමානාත්මතාවය සඳහා ශක්තිය ලබා දීම.
- ඉඩම් යනු වර්තමාන සහ අනාගත ශ්‍රී ලාංකිකයන් සියලූදෙනාටම අයිතියක් ඇති සීමිත ජාතික සම්පතක් වන බව හඳුනාගැනීම.
- මානව ආරක්ෂාව අගය කොට සැලකීම.
- වගවීමෙන් යුත්, විනිවිදභාවයෙන් යුත්, සහ ජනතාව කේන්ද්‍ර කරගත් රාජ්‍ය ආයතන සහ රාජ්‍ය සේවා පවතින බව සහතික කර ගැනීම.

තමන්ගේ අත්දැකීම් සහ අපේක්ෂා පිළිබඳ ව කතා කිරීමේ දී පුද්ගලයින් විසින් සඳහන් කළ මූලධර්ම මෙලෙස කැටි කොට දැක්විය හැකිය. බොහෝ දෙනා ලබා තිබූ ඍණාත්මක අත්දැකීම් අතරේ බොහෝ සමානකම් තිබූ බව අවධානයට ගැනීම මෙහි දී ප්‍රයෝජනවත් වනු ඇත. එමෙන්ම පුද්ගලයින් විසින් පළ කළ ධනාත්මක අපේක්ෂා අතරේ ද, බොහෝ සමාන ලක්ෂණ තිබුණි. එකම ප්‍රශ්න සම්බන්ධයෙන් විවිධාකාර ඓතිහාසික, සමාජ, පාරිසරික, දේශපාලනික හා වෙනත් පසුබිම් තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඒවා සඳහා විවිධ විසඳුම් ඉස්මතු වන බව අවබෝධ කර ගැනීමට මෙය අපට උපකාරී වේ. විසඳුම්, ප්‍රාදේශීය පසුබිම් වලට සහ එම ප්‍රදේශ වල ප්‍රායෝගික යථාර්ථයන් ට විශේෂිත වේ. ඇතැම් අවස්ථාවල ප්‍රශ්නය එක හා සමාන බවක් පෙන්නුම් කළද, ඒ සඳහා ජනතාව ඉල්ලා සිටින හෝ යෝජනා කරන විසඳුම් එකිනෙකට වෙනස් බවක් හෝ පරිසර විරෝධී බවක් පෙනෙන්නේ ඇයිදැයි යන්න මෙයින් පැහැදිලි කර දෙනු ලැබේ.

## ජනතා නිර්දේශ

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් මුළුල්ලේම ඉඩම් ගැටලු වලින් බලපෑමට පත් පුද්ගලයින්ගේ අදහස් සහ ඉල්ලීම් පහත නිර්දේශ තුළින් පිළිබිඹුවේ. ඉඩම් ප්‍රතිපත්ති පිළිබඳ ව කෙදිනක හෝ අදහස් විමසනු නොලැබූ, සෘජුව ම තමන්ගේ ඉඩම බලපෑමට ලක්වන අවස්ථාවල දී පවා අදහස් විමසනු නොලැබූ පුද්ගලයින්ගේ හඬ ද, ප්‍රතිපත්ති සම්පාදකයින් හා තීරකයන් විසින් නිතරම ප්‍රමාණවත් තරමකින් සැළකිල්ලට ගනු නොලැබූ පුද්ගලයින්ගේ අදහස් ද මෙම වාර්තාව තුළ ගැබ් වී තිබේ. ජනහිතකාමී ඉඩම් ප්‍රතිපත්තියක් කරාඃ පෙර අවස්ථාවල දී ජනතාව කේන්ද්‍ර කරගනිමින් සිදුකළ අදහස් විමසීම්[14] සහ පොදුවේ පිළිගත් සම්මතයන් ඇසුරින් මෙම නිර්දේශ වලින් ඇතැම් ඒවා හැඩගස්වාගෙන ඇති අතර තවත් ඒවා මෙම අදහස් විමසීමට ම සුවිශේෂී ය.

### 1. ඉඩම් කරා ප්‍රවේශවීමට, ඉඩම් භුක්ති විඳීමට, පරිහරණයට හා හිමිකරගැනීමට ඇති අයිතිවාසිකම

හමුදාකරණය, සංවර්ධනය සහ බලවත් හා පොහොසත් පුද්ගලයින්ගේ යහපත පමණක් සළකන පද්ධතීන් ඇතුළු බොහෝ සාධක මගින් ඉඩම් හිමි කරගැනීමටත් ඉඩම් වලට ප්‍රවේශ වීමටත්, ආරක්ෂිත සහ ජීවත්විය හැකි නිවාස ලබා ගැනීමටත් පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම් වෙත තර්ජන එල්ල කරනු ලැබේ. තමන්ට ඉඩම් අහිමි වූ සහ නිවාස අහිමි වූ විවිධාකාර විධි පිළිබඳ ව බොහෝ පුද්ගලයෝ විස්තර කළහ. තමන්ගේත් තම පවුල්වලත් මූල්‍ය සහ භෞතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ට ඇති බිය සහ අපේක්ෂාභංගත්වය පිළිබඳ ව ඔවුහු විස්තර කළහ. වඩාත් දීප්තිමත් අනාගතයක් කරා පෙරමඟ බැලීමට ඔවුනට හැකියාවක් නොමැත. ඉඩම් බලපත්‍ර ප්‍රවේණියෙන් උරුම කරගැනීමට කාන්තාවන්ට අවසර නොමැති වීම තුළ සිදුවන වෙනස් කොට සැළකීම පොදුවේ ඇසුණු එක් පැමිණිල්ලකි.ඇතැම්හු, පැතිර පවතින දුගීභාවය පිළිබඳ ව සහ තමන් තනිවී ඇතැයි සිතේ ගැඹුරට කාවැදී ඇති හැඟීම පිළිබඳ ව විස්තර කළහ. පුද්ගලයින් ඉඩම්වල වාසය කරන ආකාරය සහ ඉඩම් සමඟින් අන්තර් ක්‍රියා කරන විවිධ ආකාර පිළිබඳ ව හඳුනා ගැනීමට දැනට ක්‍රියාත්මක වන ක්‍රමවේදය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාවට පැහැදිලි විය. පුද්ගලයින් ඉඩම් කරා ප්‍රවේශ වන්නේ, ඉඩම් පරිහරණය කරන්නේ සහ ඉඩම්වල හිමිකාරීත්වය දරන්නේ කුමන ආකාරයට ද යන්න නීතිමය සහ පරිපාලනමය වශයෙන් පිළිගැනීමට ලක් කිරීම වෙනුවෙන් සහ ශ්‍රී ලංකාවේ ඉඩම් විරහිතභාවය සහ නිවාස විරහිතභාවය වඩාත් හොඳින් ආමන්ත්‍රණය කළ හැක්කේ කෙසේ ද, යන්න වෙනුවෙන් පහත දැක්වෙන පොදු ප්‍රතිපත්ති තුළින් උද්දේශනය කරනු ලබයි.

1.1 තමන් තෝරාගත් ජීවනෝපාය මාර්ගයක නිරතවීම සඳහා පුද්ගලයින්ට ඇති අයිතිය, රටේ ඇතැම් ප්‍රදේශවල මව් පරම්පරාවෙන් ඉඩම් උරුම වීම සම්බන්ධයෙන් වන ව්‍යවහාර, පරම්පරා ගණනාවක පටන් පැවතෙන ඓතිහාසික භුක්තිය සහ ඇතැම් ඉඩම්වල ඇති ආගමික හෝ සංස්කෘතික වැදගත්කම පදනම් කරගනිමින් ඉඩම් සමගින් පුද්ගලයින්ට ඇති සම්බන්ධතාව අගය කොට සැලකීම.

1.2 ඉඩම් භුක්තියට සහ පරිහරණයට පවත්නා අයිතිවාසිකම විවිධාකාර ක්‍රම වලින් ඔප්පු කළ හැකි බව පිළිගැනීම. නෛතික ලේඛනයක් තමන් සතු ව තිබීම ඉඩමක් සඳහා හෝ ඉඩම් ඉඩමක් පරිහරණය කිරීම සඳහා වන ක්‍රම අතරින් එකක් පමණක් බවත් පුද්ගලයන්ට වෙනත් ආකාර වලින් ද ඉඩම් සඳහා නීත්‍යානුකූලභාවය ලබා ගත හැකි බව පිළිගැනීම. පුද්ගලයින් විසින් සාම්ප්‍රදායික ව ඉඩම් භුක්ති විඳීම සහ පරිහරණය ඇතැම් ආඥා පනත් වලින් පිළිගෙන තිබුණ

14. ප්‍රතිසන්ධාන යන්ත්‍රණ පිළිබඳ අදහස් විමසීමේ කාර්යසාධක බලකායේ අවසන් වාර්තාව - (2016 නොවැම්බර්; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන සලකාබැලීමේ කමිටුව - 2016 මැයි); උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ විමර්ශන කොමිෂන් සභාව - 2011 නොවැම්බර්.

ද, සාම්ප්‍රදායික ඉඩම් භුක්තිය හා පරිහරණය සඳහා ඉඩ සැලසීම හෝ පිළිගැනීමට ලක් කිරීම ප්‍රායෝගික ව සිදු වී නොමැති අතර, ඇතැම් අවස්ථාවල දැනුවත්භාවයෙන් යුතු ව එය අවහිර කර තිබේ. (උදාහරණ සඳහා ස්වදේශික ජනකොටස් විසින් ඉඩම් සඳහා හිමිකම් පෑම බලන්න)

1.3 උදහරණ වශයෙන් කුලය සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය වැනි වූ සාධක සම්බන්ධ කරගනිමින් සමාජමය වශයෙන් වෙනස්කොට සලකන සුලූ ව්‍යවහාර හේතුවෙන් ඉඩම් විරහිත තත්ත්වයේ සිටින සහ ආන්තීකරණයට ලක් වී සිටින ප්‍රජාවන් හඳුනාගැනීම සහ ඔවුන්ට ප්‍රමුඛතාවය ලබාදීම.

1.4 පොදු භූමි (පොදු ඉඩම් හෝ ඉඩ අවකාශ) සහ ප්‍රජා දේපළ (සාම්ප්‍රදායික හෝ ඓතිහාසික ඉඩම් භුක්තිය හෝ පරිහරණය මත ප්‍රජාව පොදුවේ භුක්තිවිඳින) සඳහා ජනතාව කේන්ද්‍රකරගත් නිර්වචන සැකසීම.

1.5 ඉඩම් විරහිත ප්‍රජා අතර රජයේ ඉඩම් සාධාරණ ව බෙදී යන බව සහතික කර ගැනීමටත් ඒ සඳහා ප්‍රමුඛතාව ලබාදීමටත් රජය විසින් සක්‍රීය ව කටයුතු කළ යුතු වේ.

1.6 රජයේ ඉඩම් හිමිකාරිත්වය සහ රජයේ ඉඩම් බෙදාදීමේ ක්‍රියාවලි සම්බන්ධයෙන් ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අනුව බෙදා වෙන් කරන ලද දත්ත හඳුන්වාදීමට රජය විසින් කටයුතු කළ යුතු වේ.

1.7 රජයේ ඉඩම් බෙදාදීමේ ක්‍රියාවලි තුළ පවතින ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පදනම් කරගනිමින් වෙනස් කොට සැළකීමේ ව්‍යවහාර සම්පූර්ණයෙන් ම තුරන් කෙරෙන බව සහතික කර ගැනීමට රජය විසින් සක්‍රිය ව කටයුතු කළ යුතු වේ.

1.8 1.8 ඉඩම් සංවර්ධන අඥා පනතේ, ස්ත්‍රි - පුරුෂ සමාජභාවය පදනම් කරගෙන වෙනස්කොට සළකන්නා වූ වගන්ති නොපමාව සංශෝධනය කිරීමට රජය විසින් කටයුතු කළ යුතු වේ.

1.9 ප්‍රදේශයේ ජනතාව හෝ ස්වදේශික ජන කොටස් පාලනය කිරීමට හෝ පීඩාවට පත්කිරීමට හේතුවන අන්දමේ විසඳුම් ලබාදෙමින් ඉඩම් බෙදාහැරීමේ ප්‍රතිපත්ති අයුතු ලෙස යොදාගැනීමට රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය ආයතන කටයුතු නොකළ යුතු ය. මීට පෙරාතුව පැවති රජයන් විසින් දේශපාලන සහ ජනවාර්ගික න්‍යායපත්‍ර ඇතිව ලබාදුන් ඇතැම් විසඳුම් පිළිබඳ ව වැඩි අවධානයක් යොමුකළ යුතු වේ.

1.10 අනුචිත ප්‍රතිපත්ති, නීති සහ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් පුද්ගලයින්ට නිවාස විරහිත තත්ත්වයකට ඇදහෙළීම වළක්වා ඔවුන් ආරක්ෂා කිරීමට රජය විසින් සක්‍රියව ක්‍රියා කළ යුතු වේ.

"අපේ තාත්තා නැවත විවාහ වුණා, නමුත් අපි තමයි තාත්තාගේ වැඩිමහල් දරුවන්. ඒත් අපි දියණියන් නිසා තාත්තාට දෙවැනි විවාහයෙන් ලැබුණු පුතාට තමයි නීතියෙන් ඉඩම හිමිවෙන්නේ"

- මුල්ලිකුලම් ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

"අපි නෑදෑයින් අසල්වාසියේ ඉන්නවානම් කැමතියි. අසනීප වේලාවට අපට ඒ අයගේ උදවු අවශ්‍යයි. අප වටා පරිසරය සුරක්ෂිත සහ අපේ ජීවනෝපායට උදවු වන පරිසරයක් විය යුතුයි. අපේ සමාජ සම්බන්ධතා පවත්වාගෙන යන්නට හැකි විය යුතුයි"

- අක්කරෙපත්තු ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

“ස්වර්ණභූමි ඉඩම් වුණත්, ජයභූමි ඉඩම් වුණත්, මේ ඔප්පුවලට කිසිම බලයක් නැහැ. මේක සොහොන් භූමි ඉඩමකට ඔප්පුවක් දුන්නා වගේ වැඩක්. අනික තමයි කාන්තාවන්ට ඉඩම් ගන්න අයිතියක් නැහැ? ප්‍රේමදාස කාලේ විතරයි කාන්තාවන්ට ඉඩම් ලැබුණේ. තමන්ගේ නමට ඉඩම් නැතිවීමෙන් කාන්තාවන් බොහොම දුක් විඳිනවා”

- පොළොන්නරුව ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

“තමන්ගේම ඉඩමකට හිමිකම් කියන්න විශේෂ නිර්ණායක ගණනාවක් තියෙනවා - ඉඩමේ පදිංචි වෙලා සිටිය යුතුයි, ඉඩම සංවර්ධනය කර තිබිය යුතුයි, විවාහ වී තිබිය යුතුයි එහෙම කියලා. ඒත් සමාගම්වලට ඕනෑතරම් ඉඩම් දෙනවා. ඒ සමාගම් සම්පූර්ණ කරපු නිර්ණායකයක් නැහැ! පවුල් එන්න එන්නම විශාල වුණාට ඉඩම විශාල වෙන්නේ නැහැ. සමාගම්වලට ඉඩම් විකුණන්න කලින් අපිට මුල්තැන දිය යුතුයි”

- මොණරාගල වැල්ලවාය ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

“මොන ඉඩම් හිමිකමක් ද? අපේ නමට පර්මිට් එක තියෙනවා නම් ඒක ප්‍රමාණවත් විය යුතුයි. අපි වවපු ගහ කොළ, අපි එහි පදිංචි බව ඔප්පුකරන්න ප්‍රමාණවත් විය යුතුයි. අපි ඉඩම් වෙනුවෙන් විරෝධතා කරනකොට ඒ අය (හමුදාව) කිව්වෙ අපි මෙහේ පදිංචිවෙලා හිටියෙ නැති වගක්. නමුත් අපි පැළ කරපු ගහකොළ ගැන කියමින් අපි ඒ අය එක්ක තර්ක කළා.”

- මුලතිවු හි පුදකුඩියිරුප්පු ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්



## 2. ඉඩම් පාලනය

2.1 ඉඩම් පාලනය (ඉඩම් සම්බන්ධයෙන් තීරණ ගැනීම), බලපෑමට ලක්වන පුද්ගලයින්ට භූගෝලීය වශයෙන් සමීපත ම ස්ථානයක ඵලදායී අන්දමින් ප්‍රවේශ විය හැකි සහ ක්‍රියාත්මක කළ හැකි අන්දමින් සිදුවිය යුතු ය.

2.2 රජයේ ඉඩම්, ඉඩම් අන්සතුකිරීම, ඉඩම් පරිහරණය, මානව ජනාවාස සහ ඊට සම්බන්ධ අනෙකුත් කරුණු ඇතුළුව රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට බලය ඇති ජාතික ඉඩම් කොමිෂන් සභාවක් ඇතිකළ යුතු වේ. ඉඩම් පරිහරණය, පදිංචිය සහ අන්සතු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති, අදාළ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සහ අත්දැකීම් සඳහා ප්‍රමුඛතාව දෙමින් ක්‍රියාත්මක කළ යුතු වේ. එම ජාතික ඉඩම් කොමිසම, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2වැනි පරිශිෂ්ටයේ 2.4 සහ 2.5 යන මූලධර්මවලට අනුකූල විය යුතු ය. ජාතික ඉඩම් කොමිසමට පළාත් සභා සහ රජයේ ආයතන විසින් ඉඩම් අන්සතු කිරීම සහ ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පැවරිය යුතු වේ. මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඇතිවිය හැකි ඕනෑ ම ආරවුලක් මෙම ජාතික ඉඩම් කොමිසමෙන් විසඳාගත යුතු ය. කොමිසමේ තීන්දුව පිළිබඳ ව නොසතුටට පත් ඕනෑ ම පාර්ශවයකට ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට/ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විනිසුරු මණ්ඩලයට අභියාචනා කිරීමේ අයිතිය හිමි වේ. රජයේ අනෙකුත් පාලන මට්ටම්වලට යටත් ව, තමන්ගේ ක්‍රියාකාරකම් සඳහා රජයේ ඉඩම් ලබාගැනීමේ හැකියාව පළාත් පාලන ආයතනවලට හිමි විය යුතුය.[15]

## 3. ඉඩම් පරිපාලනය

3.1 ඉඩම් පරිපාලනයේ නිරතවන රජයේ නිලධාරීන්:

- ඉඩම් සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ උපරිමයෙන් අනුගමනය කළ යුතු ය.
- අදාළ වගකීම් දැරීම සඳහා ප්‍රමාණවත් මට්ටමකින් සුදුසුකම් සහිත විය යුතුය.
- පුද්ගලයින්ට ගරුත්වය සහිත ව ඔවුන් සමගින් කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් මට්ටමක පුහුණුවක් ලබා තිබිය යුතු ය.
- ඉඩම් සම්බන්ධ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබා තිබිය යුතුය.
- සිංහල දෙමළ භාෂා දෙක ම පිළිබඳ ප්‍රමාණවත් පරිදි දැනුමක් තිබිය යුතු ය.
- ජනතාව තුළ පරමාධිපත්‍ය පිහිටා ඇතැයි යන හැඟීමෙන් සහ වඩාත් සුමට, වගවීමෙන් යුත් හා තෘප්තිමත් කාර්යපටිපාටි පවතින බව සහතික කරගැනීම සඳහා තමන් ශ්‍රී ලංකාවේ ජනතාවට සේවය කරන බව සැලකිල්ලට ගනිමින් තම වගකීම් ඉටුකළ යුතු ය.
- දූෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් දේශපාලනඥයින්, දේශපාලන පක්ෂ හෝ වෙනයම් තුන්වන පාර්ශවයක යහපත තකා ක්‍රියා කිරීමෙන් හෝ නොකර සිටීමෙන් වැළකිය යුතු ය. එවැනි ක්‍රියාවක් හෝ නොකර සිටීමක් සිදුකරනු ලැබුවහොත් ඒ සඳහා නීතියෙන් අපරාධ සහ විනය ප්‍රතිවිපාක ලැබිය යුතු ය.

3.2 රජයේ නිලධාරීන්ට වෙනස්කොට සැළකීමකින් තොරව රැකියා සුරක්ෂිතතාව, ප්‍රමාණවත් වැටුප් සහ සේවා නියුක්තියේ අනෙකුත් සියලුම ප්‍රතිලාභ කරා ප්‍රවේශය පැවතිය යුතු ය. සාධාරණ හා නීත්‍යානුකූල හැසිරීම් වෙනුවෙන් ඔවුන් හිංසනයට, ස්ථානමාරුවලට හෝ දඬුවම්වලට ලක් නොවිය යුතු ය. නීත්‍යානුකූල සහ සාධාරණ අන්දමින් ඉඩම් සම්බන්ධ කරුණකදී ක්‍රියාකරන

15. 2016 මැයි දාතම් දරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන වාර්තාවේ 66 පිටුවේ දැක්වෙන නිර්දේශයෙන්

රජයේ නිලධාරියකු වෙත හිංසන සිදුකිරීම, අත්තනෝමතික ස්ථානමාරු (දඬුවමක් වශයෙන්/ නොසතුට හැඟවීම සඳහා) ලබාදීම හෝ වෙනත් ඕනෑ ම ආකාරයක අනිසි බලපෑමක් කිරීම අපරාධ වරදක් වශයෙන් සැළකිය යුතු ය

3.3 ඉඩම් සම්බන්ධයෙන් යෝජිත සංවර්ධන කටයුත්ත (හෝ රජයට ඉඩම් පවරාගැනීම) පිළිබඳ ව මහජනතාවගෙන් අදහස් විමසීමට ප්‍රථමයෙන් ඒවා පිළිබඳ ව මහජනතාවට තොරතුරු ලබාදීමට රජයේ ආයතන/නිලධාරීන් විසින් කටයුතු කළ යුතු වන අතර, අර්ථවත් අන්දමින් එම අදහස් විමසීම් සඳහ සම්බන්ධ වීමට ජනතාවට ප්‍රමාණවත් කාලයක් ලබාදිය යුතු ය. ව්‍යාපෘති මගින් පරිසරයට හෝ ඍජුව ම හෝ වක්‍රාකාරයෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවිතවලට ඇති කෙරෙන බලපෑම පිළිබඳ ව නිසි තක්සේරුවක් ලබා නොගෙන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් කිරීමට ඉක්මන් නොවිය යුතු ය

3.4 ඉඩම් අත්පත් කර ගත යුත්තේ සාධාරණ හා යුක්ති සහගත පොදු අරමුණක් හඳුනාගත් විට පමණි. එවැනි ඉඩම් රජය විසින් අත්පත් කර ගත් විට ගැසට් පත්‍රයේ නිශ්චිත අරමුණ සඳහන් කළ යුතුය. මහජන අරමුණු සඳහා අවශ්‍ය සියලූ තොරතුරු සහ සාධාරණීයකරණයන් රාජ්‍ය ආයතන/නිලධාරීන්ට ලබා දිය යුතු ය. බලපෑමට ලක් වූ සියලූ දෙනා සමඟ ඔවුන් නිශ්චිත අරමුණ පැහැදිලි ව සන්නිවේදනය කළ යුතු ය. නැවත පදිංචි කරවීම, වන්දි ගෙවීම පිළිබඳ සැලසුම් සහ මහජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ වගකීම පැවරී ඇති, නම් කරන ලද නිලධාරියෙකු සිටිය යුතු ය. රජයේ ඉඩම් අත්පත් කරගැනීම්වලින් පීඩාවට පත්විය හැකි පුද්ගලයින් අවිනිශ්චිතතාවක් අත්විඳිය යුතු නැත. ක්‍රියාවලියේ සෑම පියවරක දී ම ඔවුන් ට සහාය ලැබිය යුතු ය

3.5 රජය විසින් සිදුකරන අනෙකුත් ඉඩම් අත්පත් කරගැනීම්වල දී ඒවා සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්දීමක් සිදුකිරීමටත් විරෝධතා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීමටත් ක්‍රියාකළ යුතු වේ.

3.6 පහත දැක්වෙන මාර්ගෝපදේශ අනුව යමින් ඉඩම් පිළිබඳ තොරතුරු සක්‍රීය ව මහජනතාව අතරේ බෙදාහැරීමට කටයුතු කළ යුතු වේ:

- ඉඩම් අයිතිවාසිකම්, පරිපාලන ක්‍රියා පටිපාටි, ආයතන, ඉඩම් ප්‍රතිපත්ති සහ එහි බලපෑම් සහ ඉඩම් සම්බන්ධ ඕනෑම තීරණයක් හෝ සැලසුමක් පිළිබඳ ව ජනතාවට සහ ප්‍රජාවන්ට සරල, නිවැරදි තොරතුරු සැපයීම සඳහා වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.
- ආරවුල් විසඳීමේ යන්ත්‍රණයන් පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.
- විනිවිදභාවය වර්ධනය කිරීමටත් ඒවායේ මහජන ප්‍රවේශ්‍යතා මට්ටම තක්සේරු කිරීමටත්, ඉඩම් පිළිබඳ තොරතුරු සමාලෝචනයට ලක් කළ යුතු ය. රජයේ ආයතන තුළ අනුකූලතාව සහතික කිරීම සඳහා, මෙය සාක්ෂාත් කරගත හැකි හොඳම ආකාරය පිළිබඳ ව තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවෙන් විමසිය හැකි ය.

3.7 ඉඩම් පරිපාලනය සඳහා වගකිවයුතු රජයේ නිලධාරීන් එකී ක්‍රියාවලි සම්බන්ධයෙන් ජනතාවට නිසි කාලයට තොරතුරු ලැබෙන බව සහතික කරගනු පිණිස නීතියෙන් නියම කර ඇති කාල සීමාවන්ට අනුකූල වෙමින් කටයුතු කළ යුතු ය. පුද්ගලයින්ට තමන්ගේ ලේඛන අලූත් කරගැනීම සඳහා ප්‍රමාණවත් දැනුම්දීමක් සහ අවස්ථාවක් ලැබෙන බව සහතික කරගනු වස් බලපත්‍ර, අවසර පත්‍ර යනාදිය අලූත් කිරීමට කාලය එළඹෙන කළ සක්‍රීය ව ඒ පිළිබඳ ව ජනතාව දැනුම්වත් කිරීමට ඔවුන් විසින් කටයුතු කළ යුතු වේ.

3.8 ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ දත්ත ඇතුළු ව ඉඩම් සම්බන්ධ සුරක්ෂිත, නිවරද්‍ය හා ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීම සඳහා සුදුසු තාක්ෂණය ඉඩම් පරිපාලන ආයතන සතු ව තිබිය යුතු ය.

3.9 ඉඩම් සම්බන්ධ කාරණා පිළිබඳ ව කටයුතු කරන සියලුම රාජ්‍ය නිලධාරීන්ට ඉඩම් සම්බන්ධ නිල තොරතුරු කරා ප්‍රවේශ්‍යතාවය තිබිය යුතු ය. ඉඩම් කටයුතුවලට සම්බන්ධ විවිධ රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය ආයතන අතර වඩාත් ඵලදායී සම්බන්ධීකරණයක් තිබිය යුතු ය.

3.10 (මුල් ලේඛන ඇතුළු ව) පොදු වාර්තා සැපයීම/තොරතුරු සැපයීම හෝ පොදු හෝ නිල තොරතුරු පිළිබඳ ව පැහැදිලි කිරීම් ලබාදීම මහජනතාව මත පැටවීමෙන් වැළකිය යුතු ය. අදාළ සියලුම පොදු වාර්තා/තොරතුරු සැපයීම සහ ගැටලු පැහැදිලි කිරීම මෙන් ම අදාළ පුද්ගලයාට ඔහුගේ හෝ ඇයගේ ඉල්ලීම හෝ විමසුම සම්බන්ධයෙන් සහය ලබාදීම එම පුද්ගලයා සමගින් අන්තර් ක්‍රියා කරන රජයේ නිලධාරියාගේ වගකීම විය යුතු ය.

3.11 බලපෑමට ලක් වූ පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට තමන්ගේ ඉඩම් ගැටලු සම්බන්ධයෙන් රජයේ නිලධාරියකු විසින් සිදුකරන ලද අල්ලස් ගැනීම්(ලිංගික අල්ලස් ගැනීම් ද ඇතුළු ව) දූෂණ ක්‍රියා අනිසි පක්ෂපාතී සැලකුම් සහ නොසලකා හැරීම් පිළිබඳ ව චෝදනා කිරීම සඳහා ස්වාධීන යන්ත්‍රණයක් සඳහා ප්‍රවේශ විය හැකි විය යුතු ය. එම ස්වාධීන ආයතනවලට නඩු විභාග කිරීමට, තොරතුරු ඉල්ලා සිටීමට සහ ප්‍රතිකර්ම ලබාදීමට බලය තිබිය යුතු ය. එම යන්ත්‍රණය සඳහා සමර්ථ කාර්ය මණ්ඩලයක් සිටිය යුතු වන අතර, ඒ සඳහා ගතවන කාලය, භාෂාව, භූගෝලීය පිහිටීම සහ පිරිවැය සලකා බලන කල එය පහසුවෙන් මහජනතාවට ප්‍රවේශ විය හැකි යන්ත්‍රණයක් විය යුතු ය. ඇතැමුන් පැමිණිල්ලක් කිරීමෙන් තමන් ට අත්විය හැකි අනිසි ප්‍රතිවිපාක පිළිබඳ ව බියෙන් පසුවන බැවින් මෙම යන්ත්‍රණය වෙත නිර්නාමික ව සහ ආරක්ෂිත ව පැමිණිලි කිරීම සඳහා විධිවිධාන තිබිය යුතු වේ.

3.12 දූෂණ ක්‍රියාවන්හි නිරතවන රජයේ නිලධාරීන්ට නීතියෙන් බරපතළ දඬුවම් (අපරාධ සහ විනය) නියම කළ යුතු වේ.



## 4. ආරවුල් නිරාකරණය සහ වන්දි ගෙවීම

4.1 අධිකරණවල ගොනුකරන පෞද්ගලික ඉඩම් නඩු සාධාරණ කාලයක් තුළ විසඳා අවසන් කළ යුතු වේ. ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම වේගවත් කිරීම සඳහා, විශේෂයෙන් ම අධික පෞද්ගලික ඉඩම් නඩු සංඛ්‍යාවක් සහිත ප්‍රදේශවල 'ඉඩම් අධිකරණ' පිහිටුවීම පිළිබඳ ව රජය විසින් සලකා බැලිය යුතු වේ. මෙහි දී අරමුණ විය යුත්තේ බලපෑමට ලක් වූ සියලුම පාර්ශවයන්ට ප්‍රමාණවත් දැනුම්දීමක් කිරීමෙන් පසුව වර්ෂයක් තුළ නඩුව විභාග කර අවසාන කිරීමට ය.

4.2 නඩු පැවරීමට යොමුවීමට ප්‍රථමයෙන් කුඩා පරිමාණ ආරවුල් සඳහා සමථකරණය වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීමට රජය විසින් කටයුතු කළ යුතු වේ.

4.3 රජය විසින් ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් ගුණාත්මකබවින් ඉහළ නීති ආධාර ලබාදීමට කටයුතු කළ යුතු වේ.

4.4 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ස්වාධීන සහ උචිත යන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාකළ හැකි ආයතනික බල ව්‍යුහයක් ස්ථාපිත කළ යුතු වේ. දුක් ගැනවිලි ආමන්ත්‍රණය කිරීමටත් සාධාරණත්වයේ සංස්කෘතියක් පෝෂණය කිරීමටත් ඉඩම් අල්ලාගැනීම ආමන්ත්‍රණය කිරීම වැදගත් වේ. එය, බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රතිසන්ධානයේ නියැළීමට මෙන් ම සාමය කරා යොමුවීමටත් අත්‍යාවශ්‍ය අංගයක් වේ.

4.5 විවිධ මට්ටම්වල අසාධාරණකම් මෙන් ම විවිධ සමාජ සහ ආර්ථික බලපෑම් අනුව දුක්ගැනවිලි තක්සේරු කිරීමට මෙම යන්ත්‍රණය සවිබලගැන්වී තිබිය යුතු වේ. සංකීර්ණ අන්තර්-වාර්ගික ඉඩම් ආරවුල් ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය කරන ශක්‍යතාවය, විශේෂඥ දැනුම සහ නියෝජනය මෙම යන්ත්‍රණය සතු විය යුතු අතර, නිසි විසඳුම් නිර්දේශ කිරීම සඳහා එය සවිබලගැන්වී තිබිය යුතු ය.

4.6 ඉඩම් අල්ලාගැනීමට ලක් වූ සෑම අයෙකුට ම වන්දි ගෙවිය යුතු වේ. ඒවා, අවතැන් ව සිටි කාල සීමාවේ ආදායම අහිමිවීමට වන්දි ලබාදීම ඇතුළු ව, වන්දි වශයෙන් බෙදාහරින ඉඩම් සහ/හෝ මුදල් වලට පමණක්ම සීමා නොවිය යුතු ය. ජීවිත නැවත අරඹා ජීවනෝපාය, අධ්‍යාපනය, සමාජ සුබසාධනය, යටිතලපහසුකම් සහ අනෙකුත් පහසුකම් සපයාගැනීම සඳහා ලබාදෙන අනෙකුත් උපකාර ද ඊට ඇතුළත් විය යුතු ය.

4.7 එවන් යන්ත්‍රණයක සැලසුම සම්පාදනය කළ යුත්තේ ප්‍රජාවන්ගේ ද, එම ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ ද අදහස් විමසීමෙන් පසුව වන අතර අවසන තීරණයට එළඹීමට ප්‍රථමයෙන් නැවතත් එය ප්‍රජාවන් විසින් සමාලෝචනයට ලක් කිරීම වැදගත් වේ.

4.8 වන්දිගෙවීම තුළ 'අහිමිවීම' පිළිගැනීමට ලක් කොට ඒ වෙනුවෙන් ලබාදෙන සාමූහික සහ සංකේතාත්මක වන්දි සඳහා ප්‍රතිපාදන සැලසීම ද සිදු විය යුතු වේ.

"බදු ගත් ඉඩම්වල වී ගොවිතැන කරමින්, 'වැහි වැටේවි' කියා විශ්වාසය තබමින් සමහර කාලවලට හැමදෙයක්ම අහිමි කරගනිමින් ජීවත්වන අපි හිස් බඩින් අවුරුද්දට කන්න තුනක් වැඩ කෙරෙන අපේ ඉඩම් පහුකරලා යනකොට අපට මොනවා හිතෙනවා ඇද්ද,"

- මුලතිවු කොක්කුතුඩුවායි ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

## 5. වෙනත් ස්ථානයක පදිංචි කිරීම

5.1 වෙනත් ස්ථානයක පදිංචි කිරීම සිදුකළ යුත්තේ වෙනත් කිසිදු විකල්පයක් නොමැති විටක පමණි. එම තීරණය ගත යුත්තේ ඉඩම් සමගින් පුද්ගලයින්ට ඇති සංකීර්ණ සම්බන්ධතාවට ගරු කරමිනි (එහි දී ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග, පාසල් කරා ප්‍රවේශ්‍යතාව, සේවා වෙත ප්‍රවේශ්‍යතාව, පවුල සහ ප්‍රජාව සමගින් ඇති බැඳීම් සහ සංස්කෘතික හා ආගමික බැඳීම් ඊට ඇතුළත් වේ)

5.2 කවර හෝ ව්‍යාපෘතියකට මුලපිරීමට ප්‍රථමයෙන් ඒ සම්බන්ධයෙන් සිදු කෙරෙන සැලසුම්කරණයේ දී පුද්ගලයින් වෙනත් ස්ථානවල පදිංචි කිරීම ඇගැයුම් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු වේ. එමෙන් ම, අදාළ සංක්‍රාන්තිය නිසි පරිදි සිදු ව ඇත්දැයි සහතික කරගැනීම සඳහා, වෙනත් ස්ථානයක පදිංචි කිරීමෙන් අනතුරුව ද ඒ පිළිබඳ ව අධීක්ෂණය කිරීම වැදගත් වේ.

5.3 වෙනත් ස්ථානයක පදිංචි කිරීම සහ වන්දි ලබාදිය යුත්තේ ඉන් බලපෑමට ලක්වන ප්‍රජාවන්ගේ අදහස් විමසා, සංවර්ධනය පාදක කරගත් නෙරපාහැරීම් සහ අවතැන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ,[16] සහ ස්වේච්ඡාවෙන් නොවන වෙනත් ස්ථානවල පදිංචි කිරීම් සඳහා වන කාර්යපටිපාටි ඇතුළු ව ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් සම්මත අනුව සම්පාදනය කරන ලද නීතියක පාලනය යටතේ ය. එම නීතිය සැකසීමේ දී ස්වේච්ඡාවෙන් නොවන නැවත පදිංචි කරවීම් (NIRP) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එහි අව ම සම්මතය වශයෙන් ගත යුතු වේ. වෙනස්කොට නොසැලකීම සහ සමානාත්මතාවය පිළිබඳ මූලධර්ම සඳහා පූර්ණ අනුකූලතාවයක් දක්වමින් මෙය සිදුකිරීම වැදගත් බව අවධාරණය කෙරේ. එහි දී පහත කරුණු වෙත විශේෂයෙන් අවධානය යොමුකළ යුතු වේ:

5.4 නැවත පදිංචි කරවූවන් සඳහා ඉඩම්, නිවාස හා වෙනත් ගොඩනැගිලි, වෙනත් වත්කම් හා ජීවනෝපායන් අහිමි වීම වෙනුවෙන් වන්දි සම්පූර්ණයෙන් ම සහ ක්ෂණික ව ගෙවිය යුතු ය. වන්දි ලබා දීමේ ක්‍රියාවලියේ දී අව ම ප්‍රමිතීන් වශයෙන් NIRP හි දක්වා ඇති මාර්ගෝපදේශ භාවිත කරන්න.

5.5 (විධිමත් සහ අවිධිමත්) ජීවනෝපාය මාර්ග - අදහස් විමසීම හරහා ප්‍රජාවන්හි ජීවනෝපාය පැතිකඩ පිළිබඳ ව ද, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සඳහා පහසුකම් සැලසීමටත් ඒවා සංවර්ධනය කිරීමටත් නිර්මිත ඉඩ අවකාශ සහ අවස්ථා පිළිබඳවත් අවබෝධයක් ලබාගත යුතු වේ.

- අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ළමයින් රැකබලාගැනීම සඳහා ඇති අවස්ථා සහ ගෘහණියන්ගේ ක්‍රියාකාරකම්
- වෘත්තීය සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ඇති ඉඩ අවකාශ සහ අවස්ථා මෙන් ම වයස්ගත පුද්ගලයින් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය කරන පහසුකම්
- පදිංචි කරන ප්‍රදේශයට දැරිය හැකි මිලකට ප්‍රවාහන සේවා තිබේද යනවග

5.6 තට්ටු නිවාසවල පදිංචි කිරීම: අඩු ආදායම් ප්‍රජාවන් සඳහා තට්ටු නිවාස සංකීර්ණ සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු වන විශේෂිත සැලසුම්/සැකැසුම් අවශ්‍යතා, විධිමත් හෝ අවිධිමත් ජීවනෝපාය, පොදු ඉඩකඩ, පහසුව සහ සමාජ සුබසාධන සංවර්ධන අවශ්‍යතා යනාදිය පිළිබඳ ව අදහස් විමසා එම අදහස් පාදක කරගත් උපදෙස් තට්ටු නිවාස සැලසුම්කරුවන්ට සහ පරිපාලකයින්ට ලබාදිය යුතු වේ.[17]

---

16. https://www.ohchr.org/Documents/Issues/Housing/Guidelines_en.pdf

17. උදා: දෙමටගොඩ සිරිසර උයනේ පදිංචිකරුවන් පැවසුවේ තට්ටු නිවාසයේ ව්‍යාපාර කිරීම සම්බන්ධයෙන් පනවා ඇති සීමා හේතුවෙන් තමන්ගේ ජීවනෝපාය සම්බන්ධ ක්‍රියාකාරකම් (තමන් වාසය කරන ස්ථානයේ ම කඩයක් පවත්වාගෙන යාම වැනි) අපරාධ බවට පත් ව ඇති බවකි.

5.7 බලපෑමට ලක්වන පුද්ගලයින් සහ ප්‍රජාවන් දැනුවත් කිරීමේ වැඩසටහන්, සාකච්ඡා සහ අදහස් විමසීම් ප්‍රමාණවත් තරමින් සිදුකරමින් වෙනත් සථානයක පදිංචි කරවීම සිදුකළ යුතු වේ.

5.8 නැවත පදිංචි කෙරෙන පුද්ගලයින්ට පිරිසිදු සහ සනීපාරක්ෂිත පරිසරයක් සඳහා ප්‍රවේශය තිබිය යුතු ය.

5.9 නැවත පදිංචිය ට ලක්වන පුද්ගලයින්ට එම ස්ථානය දක්වා මාරුවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදිය යුතු වේ.

5.10 අනෙත් ස්ථානයේ පදිංචිය ට යාමට පෙර/කඩා දැමීමට පෙර තම නිවසින් තමන් ට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ලබාගැනීමටත් තමන් ට අතහැරදමා යාමට සිදුවන සම්පත් වෙනුවෙන් වන්දි ලබාගැනීමටත් පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම් වෙනත් ස්ථානයක පදිංචි කිරීම සඳහා වන සැලසුමට ඇතුළත් ව ඇති බව සහතික කරගත යුතු වේ. තව ද, අත්කරගන්නා ලද ඉඩමේ වන පොදු සම්පත් නැවත පරිහරණය සඳහා දැරිය හැකි සෑම වෑයමක් ම දැරිය යුතු වේ. (උදාඃ විදුලි කණු සහ කම්බි)

5.11 නැවත පදිංචි කිරීමෙන් පසුව සාධාරණ කාලසීමාවක් ගතවන තෙක්, නැවත පදිංචි කිරීමෙන් පසුව උද්ගතවන ගැටලු අධීක්ෂණය සඳහා සහ ඒවා සම්බන්ධයෙන් සහයෝගීත්ව තීරණ ගැනීමේ සහ ප්‍රශ්න විසඳීමේ ක්‍රියාවලීන් සඳහා යන්ත්‍රණ ස්ථානගත කර තිබිය යුතු වේ



## 6. යුදහමුදාව ඉවත් කරගැනීම සහ මානව ආරක්ෂාව

හමුදාකරණය, ඉඩම් අහිමි වීම සඳහා මංපාදන ප්‍රධානත ම සාධකයක්ව තිබේ. පුද්ගලයින්ට හිමිව තිබූ ඉඩම්වල අදිවාසයට අමතර ව, හමුදාව විසින් අදිවාසය කිරීම හේතුවෙන් තමන්ගේ ධීවර බිම්, තල්ගස් ආදිය කෙරෙහි ප්‍රවේශවීමට පුද්ගලයින් අපොහොසත්වීම තුළින් ඉඩම් පරිහරණයට සහ ජීවනෝපායයන් සඳහා එල්ල වී ඇති බලපෑම සහ ඉන් ප්‍රාදේශිය ආර්ථිකයන් ට ඇති ව තිබෙන බාධාව පිළිබඳ ව ද මෙම වාර්තාවේ සාකච්ඡා කරනු ලැබේ. තමන් අවදානම් සහගත තත්ත්වයට පත් ව ඇති අයුරු, ඇතැම් අයට නිසි ආරක්ෂාවක් නොමැති වීම, කැලෑබද ප්‍රදේශවල වාසය කරන්නට සිදුවීම, තවත් අයට තම ඥාති හිතවතුන්ගේ නිවාසවල හවුලේ පදිංචි වන්නට සිදුවීම පිළිබඳ ව පුද්ගලයින් සහ ප්‍රජා කණ්ඩායම් කථා කළහ. විශේෂයෙන් ම, දෙමළ කතා කරන පුද්ගලයින්ට එරෙහි ව ගෙන පවත්නා අත්තනෝමතික ක්‍රියාමාර්ග හේතුවෙන් තමන්ගේ වෙළෙඳ කටයුතු ඇතුළු එදිනෙදා කටයුතුවල නිරතවීමට බියක් ඇතැමුන් තුළ ජනිත කර තිබේ. හමුදාව සිටීම සහ ආවේක්ෂණ කටයුතු දිගින් දිගට ම සිදුවීම තුළ පුද්ගලයින්ගේ ගමන් බිමන් සහ සාමූහික ක්‍රියා හා සිවිල් සමාජය සමගින් සම්බන්ධ වී කටයුතු කිරීම සීමා වී තිබේ. හමුදාවන්ගෙන් සිදුවන වෙනස්කොට සැලකීම්, එදිරිවාදීකම් සහ අත්තනෝමතික නීති පැනවීම් පීඩාකාරී ය.

රජය විසින් උතුරු හා නැගෙනහිර පළාත්වලින් හමුදාව ඉවත් කරගැනීම නොපමාව සිදු කළ යුතු ය. හමුදාකරණයේ අහිතකර බලපෑම් සහ ඒ සම්බන්ධයෙන් නිර්දේශිත යෝජනා පහත දැක්වේ.

6.1 හමුදාව විසින් අත්පත් කරගත් ඉඩම් නැවතත් ජනතාව සහ ප්‍රජාවන් වෙත ආපසු භාරදීම සඳහා රජය විසින් නොපමාව වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වේ. හමුදාකරණය විවිධාකාරයෙන් ඉඩම් අයිතිවාසිකම් කෙරෙහි බලපා තිබේ. පුද්ගලයින් අවතැන්වීම; පෞද්ගලික, ප්‍රජා සහ පොදු ඉඩම් අල්ලාගැනීම, වගාකිරීම වැනි, ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් සීමා පැනවීම, ජලය වැනි ඉඩම්වල ඇති සම්පත් සම්බන්ධයෙන් සීමා පැනවීම ඊට ඇතුළත් ය. හමුදා ග්‍රහණයෙන් සිදු වූ බලපෑම පිළිබඳ ව සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් ජනතා දුක්ගැනවිලි සහ ඉල්ලීම් නිරාකරණය කිරීම සඳහා වෙන ම යන්ත්‍රණයක් අවශ්‍ය විය හැකි අතර, එසේ අවශ්‍ය වන්නේ නම් එවැනි යන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු වේ.

6.2 වන්දි, ප්‍රතිස්ථාපනය සහ හානිපූරණය සඳහා ඊට සමගාමී බල ව්‍යූහයක් පැවතිය යුතු වේ. අවතැන් ව සිටි කාලය තුළ ඔවුන් ට මුහුණපෑමට සිදු වූ ප්‍රචණ්ඩත්වය සහ අසාධාරණය සම්බන්ධයෙන් ජනතාවට ඇති දුක්ගැනවිලි ද, එමගින් ආමන්ත්‍රණය කළ යුතු වේ.

6.3 ආරක්ෂාවට ඇති තර්ජන හේතුවෙන් (හෝ ඔවුන් විසින් දක්වන වෙනයම් නීත්‍යානුකූල හේතු මත) යම් යම් පුද්ගලයින්ට තමන්ගේ මුල් ඉඩම් කරා ආපසු යා නොහැකි නම් සහ විකල්ප ඉඩමක් භාරගැනීමට ඔවුන් සූදානම් ව සිටියි නම්, එම විකල්ප ඉඩම් ලබාදීමේ දී ඔවුන්ගේ ජීවනෝපාය අවශ්‍යතා සහ අධ්‍යාපනය, පොදු ප්‍රවාහන සේවා හා මූලික සේවා සඳහා ප්‍රවේශ්‍යතාව පිළිබඳ සලකා බැලිය යුතු වේ.[18]

6.4 හෝටල්, ගොවිපළවල් සහ අනෙකුත් වාණිජ කටයුතු ඇතුළු හමුදාවෙන් පවත්වාගෙන යන ව්‍යාපාර නැවැත්විය යුතු වේ.

6.5 හමුදාව සහ සිවිල් වැසියන් අතර සිදුවන ඕනෑම අන්තර් ක්‍රියාවක් ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සමාජ සහ සංස්කෘතික සම්මතයන්ට සංවේදී අන්දමින් සිදුවිය යුතු වේ.

---

18. ගැටුම් හේතුවෙන් අවතැවීම් සඳහා කල්පවත්නා විසඳුම් පිළිබඳ ව වන ජාතික ප්‍රතිපත්තිය ද බලන්නඃ http://nirmin.gov.lk/web/images/pdf/national-policy-on-durable-solutions.pdf

6.6 විශ්‍රාමික සහ ක්‍රියාකාරී රාජකාරියෙහි යෙදී සිටින හමුදා සාමාජිකයින් සිවිල් ආයතන වන රජයේ ආයතන සහ අනෙකුත් ආයතනවලට පත් නොකළ යුතු වේ. නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතන නිර්හමුදාකරණයට පියවර ගත යුතු වේ.

"අපට ආරක්ෂිත බවක් දැනෙන්න හමුදාව අවශ්‍ය කරන්නේ නෑ. ජාතික ආරක්ෂාව කියන්නේ හමුදාව නෙවෙයි. අපට නිදහසේ ඉගෙන ගන්න, අපේ ඉඩම් ලබාගන්න, කාන්තාවන්ට දවසේ ඕනෑම වේලාව නිදහසේ යන්න එන්න ජීවත් වෙන්න පුළුවන්කම තමයි අවශ්‍ය. ඒක තමයි ජාතික ආරක්ෂාව කියන්නේ."

- මුලතිවු ප්‍රදේශයෙන් සහභාගිවූ කාන්තාවක්



## 7. ඉඩම් සහ අනන්‍යතාව

7.1 සුළුතර කණ්ඩායම් ඓතිහාසික ව පරිහරණය කරමින් සිටි ඉඩම්වලින් ඔවුන් වෙන් නොකළ යුතු ය. ව්‍යාජ ලෙස පුරාවිද්‍යාත්මක සාක්ෂි හෝ වනසතුන් ආරක්ෂා කරගැනීම හා තුරු වියන ආරක්ෂා කරගැනීම වැනි හේතු දක්වමින් මෙම ප්‍රජාවන් අවතැන් කිරීම නැවැත්විය යුතු වේ.

7.2 වාර්ගික සහ ආගමික බහුත්වවාදය අස්ථාවර කරවන අන්දමින් ඉඩම් සඳහා හිමිකම ඇත්තේ එක් පුද්ගල කණ්ඩායමකට පමණකැයි යන හිමිකම් පෑම ඔප්පු කිරීම සඳහා පුරාවිද්‍යාව සහ ඉතිහාසය අයුතු ලෙස යොදාගැනීම වැළැක්වීමට රජය විසින් නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු වේ. යම්කිසි ප්‍රදේශයක වාසය කරන සුළුතර කණ්ඩායම්වල සමාජ, සංස්කෘතිකමය සහ දේශපාලන පැවැත්මට තර්ජනයක් එල්ල කරන අන්දමින් පුරාවිද්‍යාව සහ ඉතිහාසය මෙහෙයවීම අධෛර්යමත් කළ යුතු වේ.

7.3 බුදු දහම නොඅදහන ප්‍රදේශවල බුදු පිළිම ඇතුළු බෞද්ධ සංකේත ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම වර්තමානයේ දී සිදුවෙයි. එය නැවැත්විය යුතු වේ.

7.4 අතීතයේ දී සුළුතර කණ්ඩායම් වලින් ලබාගත් ඉඩම්, ඔවුන්ට තම ඉඩම් කරා ප්‍රවේශ විය නොහැකි කාලසීමාව වෙනුවෙන් ලබාදෙන සුදුසු වන්දියක් ද සමගින් නැවතත් මුල් හිමිකරුවන් වෙත භාර දිය යුතු ය.

7.5 රජය විසින් ජනපද ඇති කිරීම හේතුවෙන් තමන්ගේ ඉඩම් අහිමි වූ මුල් හිමිකරුවන් ට, විශේෂයෙන් ම, රජය විසින් එම ඉඩම් ලබාදුන් බැවින් දැනට පදිංචි ව සිටින පුද්ගලයින් එම ඉඩම් වලින් ඉවත් කිරීමට නොහැක්කේ නම්, එවැනි ඉඩම්වල මුල් හිමිකරුවන් ට එම ඉඩම්වල වටිනාකමට සමාන වෙනත් විකල්ප ඉඩම් ලබාදීමට කටයුතු කළ යුතු වේ.

7.6 සුළුතර ජන කණ්ඩායම් සැලකිය යුතු සංඛ්‍යාවක් පදිංචි ව සිටින ප්‍රදේශවල, විශේෂයෙන් ම රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල රටේ දකුණු ප්‍රදේශවලින් ගෙනගිය සිංහල බෞද්ධ ජනතාව පදිංචි කරමින් එම ප්‍රදේශවල ජනවිකාසනය වෙනස් කිරීම නැවැත්විය යුතු ය.

7.7 එක ම භූමි ප්‍රදේශයට සහ ජල සම්පත් සඳහා විවිධ වාර්ගික සහ ආගමික පසුබිම්වලින් එන ජන කොටස් එකිනෙකා පරයමින් හිමිකම් පාන අවස්ථාවන් හි දී එම ප්‍රදේශවල තවදුරටත් වාර්ගික ආතතිය ඇති කිරීමට හේතු නොවන පරිදි සාකච්ඡා සහ සංවාද තුළින් සුහද ලෙස එම ආරවුල් විසඳාගත යුතු වේ.

7.8 කුලභේදය මත අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ ප්‍රවාහන පහසුකම් සහිත ප්‍රදේශවලින් ඉඩම් ලබාගැනීම අහිමි කිරීමට ලක් වූ ප්‍රජාවන් ට තමන්ගේ ආර්ථිකමය ජීවනෝපායන් හි නිරත වීම සඳහාත් සමාජ ප්‍රගමනය සඳහාත් එවැනි ප්‍රදේශවලින් ඉඩම් වෙන්කරදීමට ක්‍රියා කළ යුතු ය.

"මගේ හැඳුනුම්පත මගේ අනන්‍යතාවට වැදගත් වනවා වාගේ ම මගේ ඉඩම කියන්නේ මගේ අනන්‍යතාවයි. මා කවුරුන් ද යන්නයි."

- මුලතිවු හි වට්ටුවේල් ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්.

## 8. ඉඩම් සහ ජීවනෝපාය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් 80%ක්ම පරිහරණය කරනු ලබන්නේ කුඩා පරිමාණ නිෂ්පාදකයින් විසිනි. එම නිසා ඉඩම් ප්‍රතිපත්ති තුළින් ඔවුන්ගේ ජීවනෝපාය ආරක්ෂා කිරීමට සහ එහි තිරසාරත්වය සහතික කිරීමට හැකි විය යුතු ය. එසේ ම, කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් සම්පාදනය කරන ප්‍රතිපත්ති ඉඩම් ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා උපපූරකයක් විය යුතු ය. තව ද මෙම ප්‍රතිපත්ති තුළින් කාන්තාවන්, ප්‍රාථමික නිෂ්පාදකයින් වශයෙන් හඳුනාගැනීමට ලක් කළ යුතු අතර, එතුළින් ඔවුන්ගේ ජීවනෝපාය හරහා ඉඩම් හා ජල සම්පතට කාන්තවන්ගේ ඇති සමීප සම්බන්ධතාව හඳුනා ගැනීමටත් ඔවුන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමටත් කටයුතු කළ යුතු වේ.

8.1 පාරිසරික වශයෙන් උචිත හා තිරසර ක්‍රමවේද යොදාගනිමින් සෞඛ්‍ය සම්පන්න සහ සංස්කෘතිකමය වශයෙන් ගැළපෙන ආහාර නිපදවාගැනීමට ජනතාව ට ඇති අයිතිවාසිකම පිළිගනිමින් ජාතික කෘෂිකාර්මික සහ ධීවර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම:

- රසායනික භාවිත කරමින් කෘෂිකර්මාන්තයේ නියැළීම සහ පරිසරයට හානිකර අනෙකුත් ආහාර නිෂ්පාදන ක්‍රමවේද අඩුකිරීම.
- ගාවීන්ට හා ධීවර ජනතාවට ප්‍රමාණවත් යටිතලපහසුකම් (උදා: ගබඩා පහසුකම්, ශීත ගබඩා, වඩාත් හොඳ මාර්ග සහ ජලය හා විදුලිය වැනි පහසුකම්) ලබාදීම.
- ධීවරයින් ට සහ ගොවීන් ට සාධාරණ සහ යුක්තිසහගත වෙළෙපොළ කරා ප්‍රවේශය ලබාදීම.
- ගොවිතැන සහ ධීවර කර්මාන්තය සඳහා නවෝත්පාදන සහ පරිසර හිතකාමී ව්‍යවහාර යොදාගැනීමට අවශ්‍ය වන්නා වූ තාක්ෂණය, කුසලතා සහ දැනුම ලබාගැනීම සඳහා සහය ලබාදීම.
- දේශීය/සාම්ප්‍රදායික භෝග ප්‍රභේද සහ ආහාර නිෂ්පාදන ක්‍රමවේද ආරක්ෂා කරගැනීම සහ බෙදාහදාගැනීම සඳහා පහසුකම් සැලසීම.
- ගොවිතැනෙහි සහ කෘෂිකර්මාන්තයෙහි නියැළීමෙන් ජීවත්වීමට සරිලන ආදායමක් සහ ප්‍රතිලාභ උපයාගැනීමට හැකිවන බව සහතික කිරීම තුළින් එය තරුණයින්ට සුදුසු ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත්කිරීම.
- කාන්තාවන්ගේ ජීවනෝපාය සඳහා අවම වශයෙන් 30%ක ප්‍රමාණයක සම්පත් වෙන් කරන බවත්, ඔවුන් ට යටිතල පහසුකම් හා තීරණ ගන්නා ආයතන වෙත ප්‍රවේශ හැකියාව ලැබෙන බවත් තීරණ ගන්නා සෑම ආයතනයක ම අව ම වශයෙන් 30%ක කාන්තා නියෝජනයක් ඇති බවත් සහතික කරගැනීම.

8.2 රජයේ හා පෞද්ගලික ආයතනවලින් කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ලබාදෙන විවිධ සේවා පිළිබඳ ව ජනතාවට තොරතුරු සැපයිය යුතු වේ.[19]

8.3 ප්‍රදේශයේ ජල නියාමනය සහ වාරි ජලය සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ වගා කළ යුත්තේ කුමන වර්ගයක භෝග ද යනවග යනාදිය ප්‍රජා සහභාගීත්වය ඇති ව තීරණය කළ යුතු වේ. සමාගම්වල, කාර්මික කලාපවල සහ වාණිජ ව්‍යාපාරවල ජල අවශ්‍යතා සඳහා ගොවීන්ගේ අවශ්‍යතා පරයා ප්‍රමුඛතාවය ලබාදීමෙන් (උමා ඔය සහ මහවැලි ව්‍යාපෘතිවල දැකිය හැකි පරිදි) වැළකිය යුතු ය.

8.4 දේශගුණ විපර්යාස සඳහා වඩාත් හොඳින් හැඩගැසීමට අවශ්‍ය කරන කුසලතා සහ තනි වගා කෘෂිකර්මාන්තයෙන් බැහැරවී තිරසාර කෘෂිකර්මාන්තයට යොමුවීම සඳහා දිරිමත් කරවන සහය ගොවීන් වෙත ලබාදිය යුතු වේ.

---

19. උදා: දැනට රජයෙන් සහ පෞද්ගලික ආයතනවලින් ගොවීන්ට ලබාදෙන උපකාරක සහ විස්තීර්ණ සේවාවන් සම්බන්ධයෙන් දැනුවත්භාවය මද බව පොළොන්නරුවේදී අවධාරණය කෙරුණි.

8.5 කාන්තාවන් විසින් ඉටුකරන රැකබලාගැනීමේ කාර්යයන් සඳහා පිළිගැනීමක් ලබදෙන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමටත්, මාතෘ උපකාර සහ පවුලේ සිටින ආබාධ සහිත හෝ වයස්ගත වැඩිහිටියන් රැකබලාගැනීමේ කාර්යය සඳහා උපකාර කිරීම ඇතුළු (එහෙත් ඒවාට පමණක් සීමා නොවන) වන නව සමාජ ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙන බව සහතික කරගැනීමටත් රජය විසින් කටයුතු කළ යුතු වේ.

8.6 උචිත වැටුපක් ලැබීම, මාතෘ ප්‍රතිලාභ, සෞඛ්‍ය රක්ෂණය, ළමයින් රැකබලාගැනීමට සහය සහ විශ්‍රාම වැටුප් ඇතුළු අවිධිමත් ආර්ථිකයේ ශ්‍රමිකයින්ගේ කම්කරු අයිතිවාසිකම් සහතික කෙරෙන නීති පැනවීම සඳහා රජය විසින් කටයුතු කළ යුතු වේ.

8.7 වසරෙන් අඩක් පමණක් කෘෂිකර්මාන්තයේ නියැළෙන වියළි කළාපයේ ගොවීන් ට වර්ෂයේ ඉතිරි අර්ධයේ දී සමාජ සුබසාධනය සහ/හෝ විකල්ප ජීවනෝපායක නිරත වෙමින් තම ජීවිකාව සරිකරගැනීම සඳහා අවස්ථා සලසාදිය යුතු වේ. එමෙන් ම කාන්තාවන්ගේ ජීවනෝපාය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. යල්පිනූ පීතෘමූලික නීති හෝ වෙනස්කොට සලකන සුලූ සමාජ-සංස්කෘතික සම්මත හා ව්‍යවහාර හේතුවෙන් කාන්තාවෝ ඉඩම්වල හිමිකාරත්වය අහිමිවීමේ වැඩි අවදානමකට මුහුණ දෙති.

උදාහරණ වශයෙන් සිලාවතුරෙ ප්‍රදේශයේ දී කාන්තාවන් සඳහන් කරනු ලැබුවේ ඔවුන්ගේ නිවසේ සිට ම නිරතවිය හැකි ජීවනෝපාය මාර්ගවල අවශ්‍යතාවක් පවතින බවකි. ගෘහමූලික කාන්තාවන් සහ යුද්ධයෙන් වැන්දඹුභාවයට පත් කාන්තාවන් නියැළෙන ජීවනෝපාය මාර්ග අනෙකුත් ජීවනෝපාය මාර්ගවලට වඩා වැඩි අවදානමකට ලක්විය හැකි අතර එය, කාන්තාවන්ට ගෘහ සේවිකාවන් වශයෙන් විදේශගතවීමට හේතුවක් වේ. එමෙන් ම, කාන්තාවන් වැඩකිරීමට තෝරාගන්නා ඉඩ අවකාශය තුළ ඔවුන් ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සහ සෞඛ්‍ය රැකවරණයක් ලැබෙන බව සහතික කරගත යුතු වේ.

"අපි කවදත් කිසිවෙකුට අතනොපා අපේ දේවල් අපි ම කරගත්තු උදවිය. රජයෙන් කරන මේ උමා ඔය වගේ විශාල සංවර්ධන ව්‍යාපෘති නිසා අපේ පසයි වතුරයි විනාශ වෙලා. අපි දැන් අවතැන් වෙලා අපේ ජීවනෝපාය අහිමි වෙලා ගිහින්."

- බදුල්ල ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

"සංවර්ධනය කියලා අපට මෙහේ වුවමනා කරන්නේ ක්‍රිකට් පිට්වත් සම්මන්ත්‍රණ ශාලාවත් නොවෙයි. අපි ගොවියෝ. අපේ ළමයිනුත් කරන්නේ කෘෂිකර්මාන්තය. අපට කන්න දෙක ම වගාකරන්න පුළුවන්වෙන විදිහේ ජල ව්‍යාපෘතියක් තමයි අපට වුවමනා."

- හම්බන්තොට ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

"වට්ටුවාහල් ප්‍රදේශයේ පාරම්පරික සහ බලපත්‍ර ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් නාවුක හමුදාව යටතේ තියෙනවා. ගමේ මිනිස්සු ධීවර කර්මාන්තයට යොදාගත් නන්දිකඩාල් කළපුවට අද අපට යන්න අවසර නැහැ. කළපුවට යන්න ඕනෑ නම් නාවික හමුදාවෙන් අවසර ගන්න ඕනි."

- මුලතිවු ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්

## 9. ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධනය

ඉඩම් යනු ආර්ථික සංවර්ධනයේ දී කේන්ද්‍රස්ථානය ගන්නා ගැටලුවකි. එනම්, ඉඩම් පරිහරණයට, භුක්තිවිඳීමට සහ හිමිකාරත්වය දැරීමට පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම සංවර්ධන ව්‍යාපෘතිවලින් ඍජු ව ම බලපෑම ට ලක් වේ. තව ද, පුද්ගලයින් විසින් ඉඩම් පරිහරණය, භුක්ති විඳීම සහ හිමිකම් දැරීම කෙරෙහි සංවර්ධන ක්‍රියාකාරකම් බලපාන වක්‍රාකාර විධි ද ඇත්තේ ය. භූගත ජල මට්ටම, පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය සහ ජීවන රටාව, ජීවනෝපාය සහ කෘෂිකර්මාන්තය, සහ පරිසරය මත ඇතිකරන බලපෑම සහ එයින් පැනනගින මානව-වනසත්ව ගැටුම් හා මානව ආරක්ෂාව ට ඇති කෙරෙන බලපෑම යනාදිය ඊට ඇතුළත් වේ.

අදහස් විමසීමේ දී පෙනීගියේ සංවර්ධනය සම්බන්ධයෙන් බොහෝදෙනාගේ අත්දැකීම අතිශයින් ම කලකිරීමෙන් යුක්ත බවයි. නිසි දැනුම්වත් වීමක් නොමැති වීම, ඔවුන්ගේ අදහස් විමසීමක් සිදු නොකිරීම, වන්දි නොගෙවීම, ඉඩම් සමගින් පුද්ගලයින්ට ඇති සම්බන්ධතාවය සහ ඉඩම් සඳහ ඔවුන් කර ඇති ආයෝජන අවබෝධ කරගැනීමට අපොහොසත්වීම, ප්‍රදේශයේ ජන ප්‍රජාවන්ගේ ජීවිත මත ඇතිකෙරෙන බලපෑම පිළිබඳ නොසලකා සිටීම සහ අදාළ සංවර්ධන ව්‍යාපෘතිවලින් ප්‍රදේශයේ ජනතාවට ප්‍රතිලාභ නෙලාගැනීමට ඇති අවස්ථා පිළිබඳ නොසලකා හැරීම යනාදිය එහි දී බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ කණ්ඩායම් විසින් සාකච්ඡා කළ ප්‍රධාන ගැටලූ අතර විය.

9.1 ශ්‍රී ලංකාවේ ජනතාව, විශේෂයෙන්ම යෝජිත සංවර්ධන කටයුත්ත සිදුකෙරෙන භූගෝලීය ප්‍රදේශයේ වාසය කරන ජනතාව කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර ඔවුන් එම සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබිය යුතු ය. පෞද්ගලික සමාගම්, කාර්මික කලාප සහ වාණිජ ව්‍යාපාර (රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ඇතුළුව) විසින් ලබාගන්නා ආර්ථික වාසි ජනතාව වෙත හිමිවිය යුතු මෙම මූලික ප්‍රතිලාභ අභිබවා නොයා යුතු ය. රටට ලබාගත හැකි වාසි සහ ඉන් පහලට ගලාවිත් ජනතාව වෙත ළාවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන පුළුල් අදහස ඉවතලා ප්‍රදේශයේ ජනතාවට සහ ප්‍රජාවන්ට ලබාගතහැකි සැබෑ, ස්පර්ශ කළ හැකි සහ අත්පත් කරගත හැකි ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමුවිය යුතු ය.

9.2 සංවර්ධන ව්‍යාපෘති සඳහා මුලපිරීමට ප්‍රථමයෙන් ඒවා සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් බවත් සංවර්ධන සැලසුම් සඳහා ප්‍රදේශයේ ජනතාවගේ සම්බන්ධවීම සිදුවන බවත් රජය විසින් සහතික කරගත යුතු වේ. බලපෑමට ලක්වන ප්‍රදේශයේ ජනතාවගෙන් අදහස් විමසීම් සිදුකිරීම, ඔවුන් සැලකිල්ල යොමුකරන කරුණු විශ්ලේෂණය, ඒවා සම්බන්ධයෙන් ප්‍රතිකාර්මික නිර්දේශ සහ ප්‍රතිචාර සම්පාදනය සඳහා ප්‍රදේශයේ ජනතාව සමගින් සහයෝගීතා යන්ත්‍රණ ඇතිකරගත යුතුවේ. තව ද, ප්‍රදේශයේ ජනතාව සම්බන්ධ කරගන්නා ප්‍රතිපෝෂණ යන්ත්‍රණ ඇතිකිරීමට සහ ප්‍රජාවන්ට අර්ථවත් අයුරින් ප්‍රතිචාර දැක්වීම සඳහා බහු-ආංශික විද්වතුන්ගේ සහභාගීත්වය ලබාගනිමින් අවශ්‍ය තැන්හි සංවර්ධන සැලසුම් සඳහා සංශෝධන යෝජනා කිරීමට කටයුතු කළ යුතු වේ.

9.3 සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කරගැනීමේදී ඊට පහත සාධක තුළින් සහය ලබාගත යුතු වේ:

- ආර්ථික සංවර්ධන උපායමාර්ගයක්
- මානව සහ පරිසර කළමනාකරණ උපායමාර්ගයක්
- ප්‍රබල ස්ත්‍රීපුරුෂ සමාජභාවී සංරචකයක් සහිත මානව හිමිකම් බලපෑම් ඇගැයුමක්[20]

20. See https://www.ohchr.org/Documents/Issues/Development/DFI/MappingStudyontheHRRiskImplications_MegaInfrastructureInvestment.pdf

- ඉහත සඳහන් කළ උපායමාර්ග ආමන්ත්‍රණය කරන භෞතික සංවර්ධන සැලසුමක්
- රජයේ අනුග්‍රහයෙන් සිදු කෙරෙන ස්වාධීන ශක්‍යතා අධ්‍යයන වාර්තාවක්
- රජයේ අනුග්‍රහයෙන් සිදු කෙරෙන ස්වාධීන පරිසර බලපෑම ඇගැයුමක්
- කල් තියාම විරෝධතා දැක්වීමට, විකල්ප වාර්තා හා උපායමාර්ග සලකා බැලීමට සහ අදහස් විමසීමට ප්‍රමාණවත් කාලයක් වෙන්කිරීම

9.4 වෙනත් ස්ථානයක පදිංචි කරවීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු අවශ්‍යතාවක් වන්නේ නම් ඒ සඳහා අර්ථවත් අන්දමින් අදහස් විමසීමේ කාර්යයක් සපුරා තිබිය යුතු ය. එමෙන් ම, වෙනත් ස්ථානයක පදිංචි කිරීමේ සැලසුම් සහ ක්‍රියාවලින් පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට බලපෑමක් ඇතිකරවන සහ ඔවුන් අවතැන් තත්ත්වයට පත්කරන සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙරාතුව ආරම්භ කළ යුතු ය.

9.5 වෙනත් ස්ථානවල පදිංචි කළ සියලූදෙනා නිසි කලට අර්ථවත් සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා ලියාපදිංචි වන බවත්, එම ප්‍රදේශවල ඔවුන්ට ඉහළ තත්ත්වයේ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සඳහා ප්‍රවේශය ඇති බවත් රජය විසින් සහතික කරගත යුතු වේ.

9.6 ස්වභාවික සම්පත් වෙනත් අතකට හැරවීම හෝ ලබාගැනීම සිදුකෙරෙන ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්වලදී ඒවායින් අදාළ ඉඩම්වල වාසය කරන ජනතාවට ඇති කෙරෙන බලපෑම මෙන්ම පාරිසරික බලපෑම සහ එම ප්‍රදේශවල වාසය කරන ජනතාවට ප්‍රාදේශීය ස්වභාවික සම්පත් ලබාගතහැකිවීම පිළිබඳ ව සිදුකෙරෙන තක්සේරුවකට යටත් කළ යුතු වේ.[21]

9.7 ප්‍රදේශයේ ජල සම්පත ලබාගැනීම සහ අලිවැට ඉදිකිරීම වැනි, මහාපරිමාණ කෘෂි සමාගම් විසින් සිදුකරන ක්‍රියාකාරකම් සමාලෝචනය කර ආමන්ත්‍රණය කළයුතු වේ.[22] උදාහරණ වශයෙන්, බුත්තල සහ පැල්වත්තේ ඩෝල් සමාගම් ඉඩම්වල සහ සීනි සමාගමේ වැව්ලි ඉඩම්වල අලි-මිනිස් ගැටුම්වල වර්ධනයක් ඇතිවී තිබේ.

9.8 ප්‍රදේශයේ ජනතාව, ප්‍රදේශයේ සම්පත් සහ පරිසරය කෙරෙහි වාසි සැලසෙන පරිදි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතු වේ.

"උමා ඔය ව්‍යාපෘතිය නිසා මගේ ගෙදර සම්පූර්ණයෙන්ම විනාස වුණා. ඉඩම් ඉරිතලලා කුඹුර ගිලා බැස්සා. අපි අවුරුදු තුනකින් කුඹුරු වගා කරලා නැහැ. දෙමළ, සිංහල හෝ මුස්ලිම් වේවා, අපි හැමෝම මිනිස්සු. කාටවත් මෙහෙම අසාධාරණය වෙන්න හොඳ නෑ."

- බඳුල්ලේ පුරුෂයෙක්

---

21. උදාහරණ වශයෙන්, වෙරළබඩ ප්‍රදේශවල විවිධ සංචාරක කර්මාන්තය සම්බන්ධ ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබන්නේ එම ප්‍රජාවන් නොව එම ව්‍යාපෘති ක්‍රියාත්මකවන ප්‍රදේශවලට වඩා බොහෝ දුරස්ථ ප්‍රදේශවල වාසය කරන අය වේ.

22. උදාහරණ වශයෙන් උමා ඔය ව්‍යාපෘතිය යටතේ භූගත ජලය ලබාගැනීම හේතුවෙන් භූගත ජල මට්ටම අඩුවීමත් ඉඩම් ගිලාබැසීමත් සිදු ව තිබේ. පර්යේෂණ කටයුතු සඳහා සීඅයිසී සමාගම ට ලබාදුන් ඉඩම් කෘමිනාශක අධික ලෙස යොදා ගනිමින් වාණිජ කෘෂිකර්මාන්තයේ නියැළීම සඳහා යොදාගෙන තිබේ.

“ලොකු සමාගම් ඇවිත් ෆැක්ටරි හදන එක සංවර්ධනය කියලායි හිතන්නේ, ඒත් සංවර්ධනය කියාගන්න ඒවා නිසා දුක්විඳින්නේ මේ පළාත්වල ජීවත්වන අපියි”

- කුච්චවේලි හි කාන්තාවක්

“අපි සංවර්ධනයට විරුද්ධ නැහැ. ඒක වැදගත් කියලා අපට තේරෙනවා. නමුත්, පරිසරයට අව ම හානියක් සිදුවෙන විදිහට, ඒ වගේම එයින් කෙලින් ම බලපෑමට ලක්වන අයගේ අදහස් විමසලායි සංවර්ධනය කරන්න ඕනි. සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කලින් ජනතාවගෙන් ඒ ගැන විමසන පුරුද්දක් ආණ්ඩුවලට නැහැ.”

- පොළොන්නරුව ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්



## 10. වැවිලි කර්මාන්තයේ ඉඩම්: ඓතිහාසික දුක්ගැනවිලි සහ පහත්කොට තකනසුළු ශ්‍රම ව්‍යවහාර

ශ්‍රී ලංකාවේ විවිධ වතුවල සේවය කරන කම්කරුවන්ගේ ජීවන අත්දැකීම් මෙම වාර්තාවේ විස්තර කොට තිබේ.

මලෙයහ දෙමළ ජනතාවට ඓතිහාසික ව අත්විඳින්නට සිදු ව ඇති අසාධාරණකම් සහ එමගින් ඔවුන්ගේ ජීවිත සහ අනාගතය මත ඇති කෙරෙන බලපෑම කිසිවකුටත් ප්‍රතික්ෂේප කළ නොහැකි ය. පරම්පරා ගණනාවක් මුළුල්ලේ ඔවුන්ගේ ශ්‍රමය සූරා කා ඇති අතර ඡන්ද අයිතිය නොමැතිවීම, තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ක්‍රමානුකූල ව බැහැර කරනු ලැබීම, පොදු සේවාවන්ගෙන් සහයක් නොලැබීම හා ඒවා කරා ප්‍රවේශවීමට හැකියාවක් නොමැතිකම මෙන්ම ඔවුන්ගේ සුබසෙත සම්බන්ධයෙන් පොදුවේ එතරම් උනන්දුවක් හෝ සහයෝගයක් නොමැතිවීම හේතුවෙන් ඔවුන් කෙරෙහි නොපමාව අවධානය යොමුකිරීමේ අවශ්‍යතාවක් ඇත.

පැල්වත්ත සහ හිඟුරාන වතුවල සේවය කරන ශ්‍රමිකයෝ ද ඉඩම් පරිහරණය සහ භුක්තිය සමගින් බැඳුණු ශ්‍රම සූරාකෑමක පැටලී සිටින අතර එයින් අත්වී ඇති ආර්ථික, සමාජ සහ පරම්පරාමය ප්‍රතිවිපාක පිළිබඳ ඔවුහු කතා කළහ.

### 10.1 මලෙයහ දෙමළ ජනතාව සම්බන්ධයෙන් විශේෂයෙන් සිදුකරන නිර්දේශ

10.1.1 වතුකරයේ වැඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අවම වශයෙන් පර්චස් 20 ක ඉඩමක්, නිවසක් බැගින් සියලුම නේවාසික පවුල් සඳහා ලබා දිය යුතු ය. මෙම ඉඩමෙහි පූර්ණ අයිතිය ඔවුන් ට නිසි ඔප්පුවකින් ලබා දිය යුතු අතර, එමගින් ඉඩම නිවාස හා ගෘහ ආහාර ඵලදායිතාව වෙනුවෙන් යොදා ගන්නා ආකාරය පිළිබඳ ව තීරණය කිරීමට ඔවුන්ට නිදහස තිබේ. කාන්තාවන්ට ඉඩම් සඳහා සමාන අයිතියක් ලැබෙන බව සහතික කළ යුතු ය.

10.1.2 ශ්‍රී ලංකාවේ අනෙකුත් ගම්වලට සමානව පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන සේවාවන් සඳහා වතුකරයේ වෙසෙන ජනතාවට ප්‍රවේශය ඇති බව සහතික කළ යුතු ය.

10.1.3 වතු ශ්‍රමිකයින්ට ගෙවිය යුතු ප්‍රතිලාභ ඔවුන් වෙත නිසි පරිදි ලබාදීමේ දී ඔවුන් සතු ඓතිහාසික දුක්ගැනවිලි සැලකිල්ලට ගත යුතු ය.

10.1.4 ඉඩම් පරිහරණය සහ භුක්තිය හා අදාළ වන ආපදා හෝ වෙනයම් තර්ජන වේ නම් ඒවා පිළිබඳ ව අදාළ පුද්ගලයින් ප්‍රමාණවත් ලෙස දැනුම්වත් කිරීමට වතුවල කළමනාකරුවන් හා අදාළ අනෙකුත් බලධාරීන්ට නියම කළ යුතු වේ. ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිවල ස්ථිර සහ තාවකාලික සහන තීරණය කිරීමේ දී එසේ බලපෑමට ලක්වූවන් වෙනුවෙන් හදිසි අවස්ථා විධිවිධාන ඇතුළත් කළ යුතු වේ. උදාහරණ වශයෙන් ස්වභාවික ආපදා පිළිබඳ අවදානම් නිකුත් කිරීමේ දී එම තර්ජන පවතින ස්ථාන කවරේද යන්න සහ ආරක්ෂිත ස්ථාන කරා යාමට උචිත මාර්ග පිළිබඳ ව තොරතුරු ඇතුළත් කළ යුතු ය.

### 10.2 වතුවල සේවය කරන සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් සිදුකරන නිර්දේශ

10.2.1 තනි භෝගයක් වගා කරන වතු සම්බන්ධයෙන් සම්මත ප්‍රතිපත්තියක් සම්පාදනය කරගැනීම. එහි වෘත්තීයමට සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සම්මතයන් ඇතුළු ව කම්කරු අයිතිවාසිකම් විශේෂයෙන් ආමන්ත්‍රණය කර තිබිය යුතු ය. නිදසුනක් ලෙස, කම්කරුවන් සතු සමුපකාර ආකෘතියක් හෝ දිය බැස්ම පදනම් කරගත් සංවර්ධනය පිළිබඳ විවිධාංගීකරණය වූ තිරසර කෘෂි පාරිසරික පද්ධතිවල සමූහයක්.

10.2.2 වතු කම්කරුවන්ට (අව ම වශයෙන් අක්කර 1/2 ක) කෘෂිකාර්මික ඉඩම් සඳහා ප්‍රවේශය ලබා දීම සහ ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම වෙනුවෙන් පාරිසරික ගෙවතු සංවර්ධනයට ඔවුන්ට සහාය වීම.

10.2.3 තනි වගාවේ වතු ඉඩම් විවිධාංගීකරණය වූ කෘෂි වන වගා ලෙස සංවර්ධනය කිරීමට වතු කම්කරුවන්ට සහාය වීම මඟින්, වතුකරයේ කුඩා වතු හිමියන් ලෙස එකිනෙකා හා සම්බන්ධ වීමට වතු ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම.

10.2.4 වතු ශ්‍රමිකයින්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන බවත්, අනෙකුත් සමාජ සහ පාරිසරික බාහිරසාධල සැලකිල්ලට ගනු ලබන බවත් සහතික කරගැනීම සඳහා වතු කළමනාකරණයට සම්බන්ධ ප්‍රතිපත්ති නැවත සලකා බැලීම අවශ්‍ය වේ.

10.2.5 ජීවනෝපාය පාලන විධි සහ අදාළ ඉඩම්වල තම පරිභෝජනයට ආහාර භෝග වගා කිරීම සහ එම ඉඩම්වල ඇති සම්පත් පරිහරණය සඳහා අවසර ගත යුතු වීම වැනි, වාසයටත් නවාතැන් සඳහාත් වතු ශ්‍රමිකයින්ට ලබාදෙන ඉඩම් සම්බන්ධයෙන් පනවා ඇති සීමාකිරීම් ඉවත් කිරීම අවශ්‍ය වේ.

10.2.6 ජලය, විදුලිය හා අනෙකුත් පහසුකම් කරා ප්‍රවේශ්‍යතාව සීමා කිරීම වැනි, වතු ශ්‍රමිකයින්ගේ පුරවැසි අයිතිවාසිකම් මත වැව්ලි සමාගම් පනවා ඇති සීමාකිරීම් ඉවත් කිරීම

10.2.7 වතු ප්‍රජාවට නිසි ඔප්පු ලබාදීම වෙනුවෙන් ඉඩම් කච්චේරියක් වෙත උනන්දු කිරීම.

"අපේ මුතුන් මිත්තෝ මෙහේ ආවේ ඇයිදැයි දන්නේ නෑ. මේ දස ලක්ෂපතියෝ මේ විදියට ජීවත් වෙන්නේ අපි නිසායි. අපි ඒ අයගේ ගෙවල්වල පවා වැඩකරනවා. ඒත් ඒ අයට අපේ කිසිම වටිනාකමක් නැහැ. අපි කඩන තේ දළු ඒ අයට අපට වඩා වටිනවා. අපේ කිසිම වටිනාකමක් නැහැ."

"අපට කරන්න වෙන දෙයක් තිබුණා නම් අපේ ළමයි උක් වගාවේ වැඩකරන්න යවන්නේ නැහැ"

- තමන්ට මුහුණ දෙන්නට වී ඇති දුෂ්කරතා සහ සමාජමය වෙනස්කොට සැලකීම් විස්තර කළ මොනරාගල පැල්වත්ත සීනි සමාගමේ ශ්‍රමිකයෙක්

## 11. පරිසරය සහ දේශගුණ විපර්යාස

අප අදහස් විමසූ බොහෝදෙනා තමන්ගේ ජීවනෝපාය පරිසරය සමගින් බැඳී පවතින බවත්, ඒවා එකිනෙක අතර අන්තර්ක්‍රියා කරන බවත් එකිනෙකෙහි බලපෑමට යටත් බවත් දැන සිටියහ. මානව-වනසත්ව ගැටුම පිළිබඳ ව සහ කාලගුණ රටාවේ විපර්යාස පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී මෙය විශේෂයෙන් ම අවධාරණය කෙරිණි. එමෙන් ම පරිසරයේ තත්ත්වය කුමක්ද යන්න තමන්ගේ ජීවනෝපාය සඳහා බලපාන බව සහභාගිවන්නන්ට වැටහී තිබිණි. මහාපරිමාණ ව්‍යාපෘතිවලින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී පරිසරයට ඇතිකෙරෙන අහිතකර බලපෑම් පිළිබඳ ව විස්තීර්ණව විස්තර කරන ලදී.

පරිසරය ආරක්ෂා කිරීම සඳහා බලය හා වරම්ලත් ආයතන රක්ෂිත ප්‍රදේශවල සීමා නිර්ණය කිරීමේ දී (ප්‍රධාන වශයෙන් ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව) අනුගමනය කළ දැඩි පිළිවෙත මෙම සාකච්ඡා තුළ විවේචනයට ලක්විය. පරිපාලන ආයතන සහ බලපෑමට ලක්වන ප්‍රජාවන් අතර අදහස් නිසි පරිදි සන්නිවේදනය නොවීමත්, දූෂණය සහ පුද්ගලික වාසි පරිසරය පිළිබඳ දැක්විය යුතු සැලකිල්ල අභිබවා යාමත් බලපෑමට ලක්වන ප්‍රජාවන්ගේ යහපත පිළිබඳ ව සලකා බැලීම සඳහා ආයතනික වශයෙන් උනන්දුවක් නොමැතිවීම ඒ සමගින් බැඳී පැවතීමත් සමගින් අන්තර්-ආයතනික සන්නිවේදනයේ මූලික අඩුවක් පවතියි.

අදාළ ප්‍රජාවන් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් දුරස් කරවන මෙම සන්නිවේදන අඩුපාඩු පිළිබඳ ව පහත දැක්වෙන බොහෝ නිර්දේශවල සඳහන් වේ. එමෙන් ම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සහ නීති පැනවීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් අව ම පරිසර සම්මතයන් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම සම්බන්ධයෙන් ද මෙම නිර්දේශ තුළින් අවධානය යොමු කර තිබේ.

11.1 අධික පස් හා වැලි කැණීම්, ස්වාභාවික සම්පත් නිස්සාරණය, අධික කෘෂි රසායන භාවිතය සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සංවේදී පරිසර පද්ධති විනාශ කිරීම වැනි හානිකර ඉඩම් පරිහරණ ක්‍රම පාලනය කිරීම සඳහා දැඩි රෙගුලාසි පැනවිය යුතුය. මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා සහ පරිසර හිතකාමී ඉඩම් පරිහරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කළ යුතුය.

දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් සඳහා විශේෂයෙන් ගොවීන්ගේ සහ අනෙකුත් ආහාර නිෂ්පාදකයින්ගේ ජීවනෝපායන් දේශගුණික විපර්යාසයන්ගේ සෘණාත්මක බලපෑම් වලින් ආරක්ෂා කිරීම සඳහා පුළුල් ජාතික යන්ත්‍රණයක් සකස් කිරීම.

11.2 වනසත්ව රක්ෂිතයක්, වන රක්ෂිතයක්, පුරාවිද්‍යා රක්ෂිතයක්, මහවැලි සංවර්ධන ප්‍රදේශයක් හෝ සංචාරක කර්මාන්ත සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථමයෙන් පහත දැක්වෙන කාර්යපටිපාටීන් අනුගමනය කළ යුතු වේ:

a. අදාළ ඉඩම් අත්කරගැනීමට සැබෑ අවශ්‍යතාවක් පවතින්නේදැයි හඳුනාගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු වේ.

b. අත්කරගන්නට යන ඉඩමේ ප්‍රමාණ සමීක්ෂණයක් සිදුකළයුතු වේ.

c. රජයේ ගැසට් නිවේදනයක් හා සමගින් අත්කරගැනීමට යන ඉඩම සඳහන් වන නිවේදනයක් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කළ යුතු වේ.

d. ගැසට් නිවේදනයට එරෙහිව අභියාචනා කිරීම සඳහා ජනතාවට මාසයක කාලයක් ලබාදිය යුතු වේ.

e. අත්කරගැනීමට යන ඉඩම්වල හිමිකාරත්වය හෝ පරිහරණය සම්බන්ධයෙන් විවිධ ඉල්ලීම් ලැබී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා අභියාචන මණ්ඩලයක් පත්කළ යුතු වේ. (තීරණ ගැනීමේ ක්‍රියාවලියට දේශපාලන බලපෑම් එල්ල වීම අඩුකිරීම සඳහා මෙම කමිටුවට අදාළ ව්‍යාපෘතිය සඳහා සම්බන්ධවන විවිධ දෙපාර්තමේන්තු සියල්ලෙන් ම සාමාජිකයින්, සිවිල් සමාජ ක්‍රියකරුවන්, බලපෑමට ලක් වූ ප්‍රජාවේ නියෝජිතයින් සිටිය යුතු ය)

f. අදාළ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කළ යුතු වේ.

g. වන සංරක්ෂණය සඳහා සැලසුම් කළ යුත්තේ යම්කිසි වන ආවරණ ප්‍රතිශතයක් පවත්වාගෙන යාම සඳහා වන සැබෑ, යුක්ති සහගත සම්මතයන් පදනම් කරගෙන වේ. උදාහරණ වශයෙන්, මෙම වන ආවරණ ප්‍රතිශතය කුමක් විය යුතු ද යන්න විවිධ මට්ටම් වලින්, එනම් ජාතික මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සහ විශේෂිත පාරිසරික කළාපීය මට්ටමින් යනාදී වශයෙන් පවත්වාගත යුතු ප්‍රතිශතය තීරණය කළ යුතු වේ. තව ද, වනාන්තර ආරක්ෂා කිරීම සඳහා සකසන සැලසුම් ඇතැම් වනාන්තර ප්‍රදේශ එකිනෙකට යාබද ව පිහිටා තිබීම පිළිබඳ ව ද සැලකිල්ල යොමු කිරීමෙන් සංරක්ෂණය සඳහා දරන වෑයම් කොටස් වශයෙන් සිදුවීම වළක්වාගත හැකිවනු ඇත.

h. ඒ සඳහා වන නිසි ක්‍රියාදාමයකට නතු කිරීමකි තොරව රක්ෂිත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආරක්ෂාව යටතට භාර කිරීමෙන් වැළකිය යුතු වේ.

i. මනුෂ්‍ය වාසස්ථානවලට යාබද ව පිහිටා ඇති ස්වභාවික වනාන්තර වාසභූමි ආරක්ෂා කිරීම සඳහා ඒවා වටා ආරක්ෂක කලාප වශයෙන් අභයභූමි හෝ ගම්මාන ආශ්‍රිත වන ලැහැබ් ලෙස නම් කළ යුතු වේ.

j. සංවර්ධන ව්‍යාපෘතිවලින් බලපෑමට ලක් වූ ප්‍රදේශවල පරිසරය නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට පැමිණීම සඳහා ඉඩසැලසෙන බව සහතික කිරීම සඳහා ප්‍රමණවත් සැලසුම් තිබිය යුතු ය.

k. කුඩා පරිමාණ සහ ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය දිරිමත් කළ යුතුය, විශාල පරිමාණයේ ව්‍යාපෘති තුළින් පරිසරයට බලපෑමක් ඇතිකෙරෙන බව පෙන්නුම් කර ඇති බැවින් විශේෂයෙන්ම කුච්චවේලි, නිලාවැලි සහ කල්පිටිය වැනි ඉතා සංවේදී පරිසර පද්ධතිවල මේ සඳහා දිරිමත් කළ යුතු ය.

l. වන උද්‍යාන සංකල්පය සහ මිශ්‍ර භෝග වගාව (විශේෂයෙන්ම වැවිලි අංශයේ වතුවල) මගින් වන ආවරණය පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන බැවින් සහ වඩාත් වැඩි ජෛව විවිධත්වයක් සහ ජල පෝෂක ප්‍රදේශ ප්‍රමාණයක් සඳහා පහසුකම් සැලසෙන බැවින් ඒවා ප්‍රවර්ධනය කළයුතු වේ.

m. වන විනාශයට ලක්ව ඇති ජල පෝෂක ප්‍රදේශ, වන රක්ෂිත සහ ගම්මාන ආශ්‍රිත වන ලැහැබ්වල නැවත වන වගාව සඳහා රජය විසින් සක්‍රියව කටයුතු කළයුතු වේ.

n. කටුපොල් වගාව භූමි ආවරණයට අහිතකර ලෙස බලපාන බවත් එමගින් භූගත ජල මට්ටම අඩුවීමට, පස සෝදායාමට සහ නායයාමට හේතුවන බවක් කියැවෙන බැවින්, මධ්‍යම කඳුකර ප්‍රදේශයේ සහ ජල පෝෂක ප්‍රදේශවල කටුපොල් වැනි වාණිජ භෝග වගා ව්‍යාප්තිය සීමා කිරීමට පියවර ගතයුතු වේ.

o. මධ්‍යම කඳුකරයේ ජල පෝෂක ප්‍රදේශ සහ පාංශු ඛාදනයටත්, නාය යාමටත් වැඩි නැඹුරුවක් ඇති ප්‍රදේශ සංරක්ෂණ මූලධර්මවලට අනුකූලව ක්‍රමානුකූලව කළමනාකරණය කළ යුතු වේ.

p. බෝතල් කර අළෙවි කිරීම හෝ වාණිජ වගාකටයුතු සඳහා යොදාගැනීම වැනි වාණිජ පරමාර්ථ සඳහා ස්වභාවික ජල මූලාශ්‍ර යොදාගැනීම පාලනය කිරීම සඳහා රෙගුලාසි හඳුන්වා දිය යුතු වේ.

q. උපකාරක යන්ත්‍රණ සහ උචිත නෛතික රාමු සපයාදීම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතු වේ.

r. කුඩා කොටස්වලට බෙදීගොස් ඇති පරිසර පද්ධතීන් එකට සම්බන්ධ කරමින් සහ වන වගා ස්වභාවික වනාන්තර බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලියට සහය ලබාදෙමින් මනුෂ්‍යයින් සහ වනසතුන්ට තිරසර වූ සහජීවනයකින් වාසය කළහැකි පරිසරයක් සඳහා පහසුකම් සැලසිය යුතු වේ.

s. මානව-වනසත්ව ගැටුමේ අනිසි ප්‍රතිඵල සඵලදායී අන්දමින් ආමන්ත්‍රණය කිරීම සඳහා හැකියාවැති සහනදායී රක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කළයුතු වේ. අතීතයට බලපාන අයුරින් ක්‍රියාත්මක වන මෙම වන්දි යන්ත්‍රණ බලපෑමට ලක් වූ පුද්ගලයින්ගෙන් හා කණ්ඩායම් (ගොවි සමිති ඇතුළු ව) වලින් අදහස් විමසමින් සිදුකරන තක්සේරු මත පදනම් විය යුතු ය.

"ඉස්සර අපේ වතුර මොනතරම් පිරිසිදු ද කියනවා නම් කෙලින් ම ඒ වතුර බොන්නත් මුහුණ සෝදන්නත් ගන්න පුළුවන්. ඒත් දැන් අපි ඒ වතුර අල්ලනවත් බයයි. වතුරේ තියෙන විෂබීජ නිසා දැන් වතුර විස වෙලා. ඒ විෂබීජ නිසා සෑහෙන දෙනෙක්ගේ ඇගේ වණ වෙලා, තුවාල වෙලා."

- රත්ගම කසළ බැහැරකිරීමේ අංගණය හේතුවෙන් ඇති වූ බලපෑම පිළිබඳ කතා කළ හික්කඩුවේ කාන්තාවක්

"මිනිස්සුන්ට ඉඩම් ලබාදීම පමණක් ම නොවේ ඉඩම් කියන්නේ සීමිත සම්පතක් කියන කාරණාව අවබෝධ කරගත්, පරිසරය සහ කෘෂිකර්මාන්තය පිළිබඳ ව සලකා බලන ප්‍රතිපත්ති අපට අවශ්‍යයි. අනාගතය වෙනුවෙන් අපගේ පරිසරය ආරක්ෂා කරගැනීමට හැකිවන්නේ එවිටයි."

- ගාල්ල ප්‍රදේශයෙන් සහභාගිවූවෙක්



# ඇමිණුම 1

## සන්දර්භය වටහා ගැනීම සඳහා සාහිත්‍ය සමාලෝචනය

ඉඩම් පරිහරණය හා හිමිකාරිත්වය සම්බන්ධව ශ්‍රී ලංකාවේ අභියෝගයන් අනුප්‍රාප්තික රාජ්‍යය කේන්ද්‍රීය ආණ්ඩු, ආන්තික හා වාර්ගික දේශපාලනය සහ දූෂණය ඇතුළු භාවිතයන්ගේ දැඩි පාලනයට හසු වූ ඓතිහාසික හා සංකීර්ණ එකකි. ඉඩම් ගැටලු ජනතාවගේ අනන්‍යතාව, ජීවනෝපාය, ප්‍රාග්ධනය, ශ්‍රමය, ජලය, දේශගුණය සහ පරිසරය සමඟ සම්බන්ධ වී තිබේ. ඉඩම් පරිහරණයේ සහ හිමිකාරිත්වයේ පාලන නීති, ප්‍රතිපත්ති සහ පරිපාලන භාවිතයන් ගණනාවක් තුළ පැටලී ඇති විශාල විෂයකි.

මෙම සන්දර්භ විශ්ලේෂණය දැනට ඇති ලියවිලි මත පදනම් වූ සාහිත්‍ය සමාලෝචනයක් මත ගොඩනගා තිබේ. මෙම සාහිත්‍ය සමාලෝචනය මගින් ඉඩම් ගැටලු වලට අදාළ ව පැතිරුණ ප්‍රවණතාවන් කිහිපයක් පිළිබඳ ව ආමන්ත්‍රණය කරයි. ඉඩම් ගැටලු අතිශයින් ම සංකීර්ණ බවත්, එක් එක් විශේෂිත කාරණා ඒවායේ ප්‍රාදේශීය ඓතිහාසික හා වර්තමාන සන්දර්භය තුළ අවබෝධ කර ගත යුතු බවත්, විවිධ සමාජ-ආර්ථික හා දේශපාලන සාධක නිසා එක් එක් ප්‍රදේශවල පවත්නා ඉල්ලීම් හා ඒවායේ ආතතීන් වෙනස් විය හැකි බවත් සැළකිල්ලට ගෙන ගැඹුරු ඇගයීමකින් යුතු ව මෙය සිදු කර තිබේ. සමස්ත සන්දර්භයක් එකට එකතු කිරීමට උත්සාහ කිරීමේ දී, සියුම් වෙනස්කම් වැඩි ප්‍රමාණයක් මෙහි දී ග්‍රහණය නොවීමට ඉඩ තිබේ. සාහිත්‍ය සමාලෝචනයක් තුළින් සමස්ත සන්දර්භීය අවබෝධයක් ලබා ගැනීමට උත්සාහ කිරීමේ ඇති වටිනාකම වන්නේ පවතින අවශ්‍යතාවන් වටහා ගැනීම යි.

මෙම සාහිත්‍ය සමාලෝචනය මගින් රාජ්‍ය අනුග්‍රහය ලැබූ ඉඩම් කොමිෂන් සභා වාර්තා හා නීති සහ පසුගිය වසර 10 තුළ ඇති වූ ඉඩම් ගැටලු පිළිබඳ රාජ්‍ය නොවන වාර්තා විමර්ශනය කරන ලදී. ඉඩම් ගැටලු සම්බන්ධයෙන් ජනතාව සමඟ පුළුල් ලෙස සාකච්ඡා කිරීම මත පදනම් වූ සෑම වාර්තාවක් ම පාහේ යුද්ධයට ද අදාළ බව සැලකිය යුතු ය. එයින් එක් ව්‍යතිරේකයක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව යි.

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65,610 කි. ජනගහනය මිලියන 21.5 ට ආසන්න වන අතර සාමාන්‍ය ජන ඝනත්වය වර්ග කිලෝමීටරයකට 342 කි. (ශ්‍රී ලංකා මහ බැංකුව, 2018). කෘෂිකර්මාන්තය සඳහා ඉඩම් භාවිතය 65% ක්, නාගරික ඉඩම් පරිහරණය 0.6% ක් සහ වනාන්තර ඉඩම් 28.8% ක් ලෙස ගණන් බලා තිබේ (ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, 2007).

ඉඩම් යනු උපාය මාර්ගික සමාජ-ආර්ථික වත්කමකි, විශේෂයෙන් කෘෂිකාර්මික ව යැපෙන ආර්ථිකයන් හී ධනය සහ පැවැත්ම මනිනු ලබන්නේ ඉඩම් පාලන (සහ ප්‍රවේශය) හැකියාව හරහා ය (කෝර්ෆ් සහ සිල්වා, 2003). එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉඩම් පිළිබඳ ගැටුම් බොහෝ විට දැඩි ආර්ථික හා චිත්තවේගීය ඇගයීම් දෙක ම සමඟ බැඳී තිබේ (පොන්ස්-විග්නන්, එන්. සහ එච්. සොලිග්නැක් ලෙකොම්ටේ, 2004). සංකේතාත්මක ව හෝ චිත්තවේගීය වශයෙන් වැදගත් ඉඩමක් හෝ දේපොළක් ගැටළුවකට මැදිවන විට, ගැටුම් ඇතිවීමේ සම්භාවිතාව වැඩි වේ - ඉඩම් පිළිබඳ තරගකාරිත්වය බොහෝ විට, එහි හරයාත්මක ව සමාජ-ආර්ථික හා දේශපාලනික යන දෙඅංශයෙන් ම බලය පිළිබඳ ව වේ.

කෙසේවෙතත්, ඉඩම් නොමැතිකම, පීතෘමූලික ඉඩම් භාවිතයන් සහ පෞද්ගලික සංවර්ධන අවශ්‍යතා සඳහා වූ ධනවාදී ඥාති සංග්‍රහය වැනි ගැටලු විසඳීම සඳහා බොහෝ දුර යා යුතු ව තිබේ. දශක ගණනාවක යුද්ධයේ දී උත්සන්න වූ ජනවාර්ගික ජාතිකවාදයේ මුල් බැසගත් ඓතිහාසික අසමානතාවන් ගැන සඳහන් නොකළත් අදටත් එය එසේම පවතී.

පශ්චාත් යුධ සමයේ දී යථාතත්වයට පත්වීමේ හා නැවත ගොඩනැගීමේ දී ඉඩම් යනු ප්‍රධාන ම කාරණයක් වන අතර, සංකීර්ණ ඉඩම් සම්බන්ධ දුක්ගැනවිලි විසඳීමට අපොහොසත් වන ඕනෑම

පියවරක් බොහෝ විට ඓතිහාසික දුක්ගැනවිලි තවදුරටත් අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා හේතුවක් වනු ඇත. "ඉඩම් යනු හිඟ සහ නිශ්චල සම්පතක් වීම නිසා ඒවා ඉතිහාසය පුරා සමාජවල දී ගැටුම් හා බලයේ මූලාශ්‍රයක් බවට පත් වී තිබේ. ජනගහන වර්ධනය, නාගරීකරණයේ ව්‍යාප්තිය, ඉඩම් සඳහා ගෝලීය ඉල්ලුම ඉහළ යාම සහ පාංශු ඛාදනය ආදී පාරිසරික ගැටලු ඇති වීම එවැනි ගැටුම් බොහෝ ගණනකට ඉන්ධන එක්කොට තිබේ" (ලින්ඩ්බර්ග් සහ හේරත්, 2014: 890). ඉඩම් භුක්තිය පාලනය කිරීම මගින් ඉඩම් සඳහා ඇති අයිතිවාසිකම් සීමා කිරීම මගින් ඉඩම් සමඟ මිනිසුන්ගේ සම්බන්ධතාවන්වල සංකීර්ණතාවන් ඇති කරන බවත්, ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ජනතාවගේ හැඟීම් සහ අර්ථ නිරූපණයන් පවත්නා සීමිත නෛතික කාණ්ඩවලට පිළිවෙලින් නොගැලපෙන බවත් තේරුම් ගැනීම වැදගත් බව ද පෙන්වා දී තිබේ (පරණගේ, 2018). අනවසරයෙන් අල්ලා ගැනීම පිළිබඳ දේශීය කතිකාවන් තුළ නීති මගින් 'නීති විරෝධීභාවය' නිර්මාණය කළ හැකි 'උප කොටස්වලට බෙදීමේ අව ම රීතියේ' බලපෑම පිළිබඳ ව අධ්‍යයනයක් තුළ අනවසරයෙන් අල්ලා ගැනීමේ නීත්‍යානුකූලභාව පිළිබඳ තවත් ලේඛනයක දී, පරණගේ විසින් පෙන්වා දී තිබේ (පරණගේ, 2018).

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව (LLRC), ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ සඳහා උපදේශන කාර්ය සාධක බලකාය (කඝත), කලාපීය කාර්ය සාධක බලකාය (ZTF) උපදේශන කාර්ය සාධක බලකා වාර්තාවට ඇතුළු වූ විශේෂිත ස්ථානවල සිදුකළ සම්මුඛ සාකච්ඡා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව (PRC) සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) ඇතුළු විද්වතුන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ ජාත්‍යන්තර ආයතනවල දායකත්වය ඇතුළු විවිධ ආකෘතීන්ගෙන් පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ ව විශේෂයෙන් අවධානය යොමු කිරීමට උත්සාහ කර තිබේ.

කෙසේවෙතත්, ඉඩම් නොමැතිකම, පීතෘමූලික ඉඩම් භාවිතයන් සහ පෞද්ගලික සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ධනවාදී මිත්‍ර සංග්‍රහය, දශක ගණනාවක යුද්ධයේ දී උත්සන්නව අදටත් පවතින ජනවාර්ගික ජාතිකවාදයේ මුල් බැසගත් ඓතිහාසික අසමානතාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා බොහෝ දුර යා යුතු ව තිබේ.

## ඉඩම් ප්‍රතිපත්ති

අනුප්‍රාප්තික යටත් විජිත බලවතුන් විසින් විවිධාකාර ඉඩම් ප්‍රතිපත්තිමය අරමුණු ක්‍රියාවට නංවා තිබේ. බ්‍රිතාන්‍යයන්ගේ පාලනය විසින් දෙයාකාර ඉඩම් ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබේ - රජයේ ඉඩම් කළමනාකරණය සඳහා සහ මේ දක්වා ශ්‍රී ලංකාවේ ඉඩම් ලියාපදිංචි කිරීම හා කැඩැස්ට්‍රල් මැනුම් පද්ධතිය අඛණ්ඩ ව හැඩගස්වනු ලැබ තිබෙන පෞද්ගලික ඉඩම් ගනුදෙනු සඳහා වූ නීතිමය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. (එච්. දිවිතුරේ සහ සී. ටැන්ග්, 2013).

### *රාජ්‍ය කොමිෂන් සභා*

1927, 1957 සහ 1987 යන රාජ්‍ය ඉඩම් කොමිෂන් සභා වාර්තා තුනේ සොයාගැනීම් මගින් ඉතා ම වැදගත් අවබෝධයක් ලබා දෙයි. 1927 කොමිෂන් සභාව කෘෂිකාර්මික කම්කරුවා ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, එහි ප්‍රතිඵලය වූයේ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බලපත්‍ර සහ ප්‍රදානවල දක්නට ලැබෙන ඉඩම් භාවිතය හා ඉඩම් කොටස්වලට බෙදීම පිළිබඳ කොන්දේසි ඇති වීමයි (ද, සිල්වා) 2016. මෙය 1840 අනවසර ඉඩම් ආඥා පනත වැනි යටත් විජිත බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර එමගින් සියලු මුඩු ඉඩම්, වනාන්තර ඉඩම්, පදිංචි නොවූ හා වගා නොකළ ඉඩම් රජයට අයත් යැයි උපකල්පනය කෙරේ. රටේ ඉඩම්වලින් 82% ක් රජයේ ඉඩම් බවට මෙයින් තහවුරු විය. කම්කරුවන් සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් කළමනාකරණය කිරීම (සහ පාලනය කිරීම) සහ සමාගම්කරණය වූ මධ්‍යම හා ඉහළ පංතියේ අයට ප්‍රතිලාභ ලබා දීම සඳහා ඉඩම් භාවිත කිරීම වෙත මෙම ප්‍රතිපත්තිය යොමු වී තිබේ (ඊගර්, 2008). 1957 කොමිෂන් සභාව විසින් ඉඩම්

සංවර්ධන ආඥා පනතේ පරිපාලනමය ගැටලු හඳුනාගෙන ඇති අතර ඒ සමඟ ම ජනාවාස යෝජනා ක්‍රමවල වෙන් කරන ලද ඉඩම් ප්‍රතිපාදන සඳහා අව ම වූ සීමාවන් ප්‍රමාණයක් ද නිර්දේශ කර තිබේ (ඩි සිල්වා, 2016). ආඥා පනත යටතේ බෙදා දුන් ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් සතුටුදායක ලෙස සංවර්ධනය කර නොමැති බවත්, භුක්තිය සහ වගා කිරීම සඳහා එම ඉඩම්වල නුසුදුසුකම, මාර්ග නොමැතිකම සහ අලෙවිකරණ පහසුකම් වැනි වෙනත් සාධක ඊට හේතුවන බවත් වාර්තාවේ දක්වා තිබේ. 1987 ඉඩම් කොමිෂන් සභාව විසින් යෝජනා කළ පරිදි, 'ඉඩම් ප්‍රතිපත්තිය අත්‍යවශ්‍යයෙන් ම පුළුල් ජාතික සංවර්ධන උපාය මාර්ගයක අනිවාර්ය හා කේන්ද්‍රීය අංගයක් විය යුතු ය. එය හුදකලා ලෙස සැලකිය යුතු හෝ රජයේ ඉඩම්වලට පමණක් සීමා වීම සිදු නොවිය යුතුය, ඒ වෙනුවට ජාතික මට්ටමින් පුළුල් සමාලෝචනයකට ලක්විය යුතුය'. 1987 වාර්තාවෙන් පසු ඉඩම් කොමිෂන් සභාවක් පවත්වා නැත.

### *ජනපද යෝජනා ක්‍රමවල ප්‍රතිපත්තිය*

1950 දශකයේ සිට ශ්‍රී ලංකාව යටත් ජනපද යෝජනා ක්‍රම මගින් ඉඩම් නැවත බෙදාහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර ගල්ඔය සහ මහවැලි යෝජනා ක්‍රම යනු එවැනි විශාලතම යෝජනා ක්‍රම දෙකකි.[23] ජනපදකරණය 1931 සහ 1947[24] අතර කාලය තුළ මන්දගාමී ව සිදු වූ අතර නිදහසින් පසු කාලයේ දී එය වේගවත් වෙමින් පැවතුනි (බැස්ටියන්, 2009). එහි ප්‍රතිඵලයක් වශයෙන් ජන විකාශනයෙහි වෙනස්වීම්[25] පිළිබඳ පැහැදිලි සාක්ෂි සාහිත්‍යයෙහි විස්තර කර ඇති අතර, වසර ගණනාවක් තිස්සේ එක් නිවසක් සඳහා බෙදා දෙන ලද ඉඩමේ ප්‍රමාණය[26] අඩු වී ඇති බවත්, වැඩිමහල් පුතුන්ට වාසි සැලසීම ඇතුළු ව අනුප්‍රාප්තිකයන්ගේ භුක්තිය පිළිබඳ කොන්දේසි හේතුවෙන් දෙවන පරම්පරාවේ පදිංචිකරුවන්ට අහිතකර ලෙස බලපෑම් ඇති වී ඇති බවත් ඔවුන් ට ඉඩම් අහිමි වූ බවත් සඳහන් වේ (මද්දුමබණ්ඩාර, 2000).

ජනපදකරණ ප්‍රතිපත්තිවලට ප්‍රතිචාර දක්වන දේශපාලන ඉල්ලීම් ද මනාව ලේඛනගත කර තිබේ. 1944 සෝල්බරි කොමිෂන් සභාව හමුවේ දෙමළ දේශපාලනඥයින් විසින් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සිංහල ජනාවාස පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කර තිබේ. දෙමළ ෆෙඩරල්වාදී පක්ෂය විසින් ජනපදකරණය දේශපාලන ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කළ අතර, බෙදුම්වාදී වේදිකාවක් මත තරඟ කළ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ (TULF) විසින් සිංහලයින් විසින් ඓතිහාසික ව දෙමළ

---

23. ගල්ඔය යෝජනා ක්‍රමය 1948 සිට 1952 දක්වා කාලය තුළ ක්‍රියාත්මක වූ අතර එය ශ්‍රී ලංකාවේ නිදහසින් පසු පළමු බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය විය. ආසන්න වශයෙන් 80,000 ක් දෙනා පදිංචි කරනු ලැබූ බව ගණන් බලා තිබේ (කුලසිංහ, 2015). මහවැලි යෝජනාක්‍රමය 1970 දී ආරම්භ කරන ලද අතර එය පරිපාලන දිස්ත්‍රික්ක 13 ක් හා වාරිමාර්ග පද්ධති 14 ක් පුරා පැතිරී ඇති අතර මහවැලි ප්‍රධාන සැලැස්ම තුළ සංවර්ධනය සඳහා ඉඩම් හෙක්ටයාර් 365,000 ක් වෙන් කොට තිබේ (නීතිය හා සමාජ භාරය, 2015). පවුල් 134,000 ක (ජයවීර, 2002) සිට 134,000 ක් (අබේවික්‍රම, 2015) දක්වා වූ ප්‍රමාණයක් පදිංචි කර තිබෙන බවට ගණන් බලා තිබේ.

24. 1931 සිට 1947 දක්වා කාලය තුළ 3,145 ක් දෙනා ජනපද 13 ක පදිංචි කරනු ලැබූ අතර 1948 සිට 1953 දක්වා කාලය තුළ දී ජනපද යෝජනා ක්‍රම 16 ක් තුළ 10,426 දෙනා පදිංචි කරවනු ලැබී ය (බැස්ටියන්, 2009).

25. උදාහරණයක් ලෙස, ත්‍රිකුණාමලයේ සිංහල ජනගහනය 1946 දී සියයට 21 සිට 1981 දී සියයට 33 දක්වා ඉහළ නැගුණි. එම කාල පරිච්ඡේදයන්හි මුස්ලිම් ජනගහනය දළ වශයෙන් සියයට 30 ක මට්ටමක පැවතුනි. මේ අතර, ත්‍රිකුණාමලයේ දෙමළ ජනගහනය 1911 දී 58% සිට 1946 දී 45% දක්වාත් 1981 දී 36% දක්වාත් පහළ වැටුණි. 1963 දී දෙමළ බහුතර දිස්ත්‍රික්කයක් වන මඩකලපුවෙන් වෙන් කරන ලද පරිපාලන දිස්ත්‍රික්කයක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ ද්‍රවිඩයන් සියයට 24 ක සුළුතරයක් බවට පත් වූ අතර මුස්ලිම්වරුන් සියයට 46 ක් සහ සිංහලයන් සියයට 29 ක් බවට පත් විය. 1981 වන විට සිංහලයන් දිස්ත්‍රික්කයෙන් සියයට 38 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර මුස්ලිම්වරුන් සියයට 42 ක් දක්වා ද ද්‍රවිඩයන් 20 ක් දක්වා ද වෙනස් විය. (ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෘප්, 2008).

26. 1953 වන තෙක් කුඹුරු ඉඩම් අක්කර 5 ක් සහ ගොඩ ඉඩම් අක්කර 3 ක් ද විය. 1953 දී මෙය කුඹුරු ඉඩම් අක්කර 3 ක් සහ ගොඩ ඉඩම් අක්කර 2 ක් දක්වා අඩු කරන ලද අතර 1956 දී එය කුඹුරු ඉඩම් අක්කර 2 ක් සහ ගොඩ ඉඩම් අක්කර 1 ක් දක්වා ද අඩු කරන ලදී. නව ජනාවාසවල ඒකාකාර වෙන් කිරීමේ දී කුඹුරු ඉඩම් අක්කර 2.5 ක් සහ නිවාස සඳහා අක්කර 0.5 ක් වෙන් කොට තිබේ.

භූමිය ජනපදකරණය කිරීම ඊලාම් වෙන ම රාජ්‍යක් සඳහා වන ඉල්ලීම යුක්ති සහගත කරන හේතු නවයෙන් එකක් ලෙස ලැයිස්තුගත කළේ ය (1976 මැයි 14 වඩුක්කෝඩයි යෝජනාව). වියළි කලාපීය ජනපදකරණය මගින් විරැකියාව අඩු කිරීම මගින් ජනවාර්ගික ආතතිය අව ම වන බව 1982 දී කඩිනම් මහවැලි වැඩසටහන විසින් පවසනු ලැබී ය. කෙසේ වෙතත්, වියළි කලාපයේ මීට පෙර ඇතිකරනු ලැබූ ජනාවාසවල දී එක්සත් ජාතික පක්ෂය (UNP) විසින් මතු කළ "දෙමළ හින්දු ආක්‍රමණික සතුරන්ට වෛර කළ සාමකාමී බෞද්ධ අතීතයක..." ප්‍රතිරූපය මෙම වැඩසටහන මගින් ඉදිරියට ගැනුණි (පීබල්ස්, 1990). උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ නිජබිම ප්‍රතිරූපය මගින් දෙමළ ජාතික කණ්ඩායම් විසින් මෙයට පිළිතුරු දෙන ලදී. මේ අනුව, සිංහල හා දෙමළ යන දෙගොල්ලන් ම විසින් සාම්ප්‍රදායික නිජබිමක් ලෙස සැලකූ ඉඩම්, එනම් විශේෂයෙන් ම වියළි කලාපය සමථයකට පත් කළ නොහැකි ජනවාර්ගික ජාතිකවාදයේ ප්‍රශ්නයක් ලෙස රාමුගත විය. වියළි කලාපයේ ජනපද යෝජනා ක්‍රම මගින් ඉඩම් පරිහරණය හා අසමානතාව පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ හානිකර ප්‍රතිඵල පිළිබිඹු වන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ ගැටුම්වල නැගී ඒමට ද සම්බන්ධ වේ. නිරිතදිගින් සිංහල ගොවීන් (කුරුණෑගල සහ පුත්තලම අතර) සහ නැගෙනහිර හින්දු හා මුස්ලිම් වී ගොවීන් (මඩකලපුව සහ ත්‍රිකුණාමලය අතර) වශයෙන් වියළි කලාපයට සිදු වූ අභ්‍යන්තර සංක්‍රමණයන් මිශ්‍ර වී ඇතැයි 19 වන සියවසේ වාර්තා අනුව පෙනෙන බව පීබල්ස් (1990) සඳහන් කරයි. වියළි කලාපයේ නැවත පදිංචි කිරීම 20 වන සියවසේ දී වේගයෙන් වැඩි වූ අතර එය ඡන්දය සඳහා තරඟ කිරීමට උනන්දුවක් දක්වන සිංහල දේශපාලනඥයින්ගේ ඡන්දය සඳහා ඉක්මණින් කළ යුතු ම කාරණයක් බවට පත්විය.

*70 දශකයේ ඉඩම් බෙදාදීමේ ප්‍රතිපත්තිය*

1970 දශකයේ දී ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ මගින් පෞද්ගලික හිමිකාරීත්වයක් සහිත විශාල ඉඩම් ජනසතු කිරීම කෙරෙහි අවධානය යොමු විය. 1956 සහ 1977 අතර කාලය තුළ තිබූ සමාජවාදී ප්‍රතිපත්ති මගින් කේන්ද්‍රීය සැලසුම්කරණය, ජනසතුකරණය, රාජ්‍ය මැදිහත්වීම ඇතිකිරීම සහ ඒකාධිකාරය කෙරෙහි අවධානය යොමු කළ බව පැවසේ (ජයවීර, 2002). 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය මගින් පෞද්ගලික හිමිකාරීත්වය සහිත කුඹුරු ඉඩම් සඳහා අක්කර 25 ක් ද, වෙනත් ඉඩම් සඳහා අක්කර 50 ක් ද වූ සීමා කිරීමක් නිර්මාණය විය. මෙම ප්‍රතිපත්තිය යටතේ අක්කර මිලියනයකටත් වඩා අඩු ප්‍රමාණයක් අත්පත් කර ගෙන තිබූ බවත්, එයින් අඩක් පොල් ඉඩම් වූ බවත්, නමුත් එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක නැවත බෙදාහැරීමක් සිදු නොවූ බවත් පැවසේ (බැස්ටියන්, 2009). 1975 දී අක්කර දහස් ගණනක් ආවරණය වන පරිදි අපනයන අරමුණු කරගත් වතු වගා බිම් දක්වා රාජ්‍ය හිමිකාරීත්වය ව්‍යාප්ත විය. මෙය ද මහා පරිමාණ නැවත බෙදාහැරීමට හේතු නොවීය. බැස්ටියන් මෙසේ පවසයි, "හැත්තෑ ගණන්වල ඉඩම් ප්‍රතිසංස්කරණවල දේශපාලනය සුවිශේෂී විය. එහි ශුද්ධ ප්‍රතිඵලය වූයේ ඉඩම් නොමැති අය වෙනුවෙන් සිදු වූ ඉඩම් බෙදා හැරීමකට වඩා රාජ්‍ය හිමිකාරීත්වය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය ඉහළ යාම යි."

*ඉඩම් නොමැති සුලුතර ජනගහනයක් ඇතිකරවනු ලැබූ ප්‍රතිපත්ති හා භාවිතයන්*

1920 තරම් ඈත අතීතයේ ජාතිකවාදීන්ගේ කැළඹවීම් දක්වා මලයාහා දෙමළ ජනයාට ඉඩම් හිමිවීමට එරෙහි ප්‍රතිපත්තිය සම්බන්ධ බව පෙන්වා දිය හැකිය (සමරවීර, 1981). මෙම ජනවාර්ගික කණ්ඩායම ඉඩම් හිමිකාරීත්වයෙන් බැහැර කරවන නීති පැනවීමෙන් ද 1948 දී ඔවුන් ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා නොදීමෙන් ද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය. "ඉඩම් සංවර්ධන ආඥා පනත බලාත්මක කිරීමත් සමඟ, ඉඩම් ප්‍රතිපත්තියට අනුකූල සියලු ප්‍රායෝගික අරමුණු සඳහා ඉන්දියානු ද්‍රවිඩයන් අහෝසි වූ බව" ද සමරවීර පවසයි. පුරවැසිභාවය පිළිගැනීම යම් ප්‍රගතියක් ලබා 2009 වන විට දී පමණ එය පිළිගෙන තිබුණ ද, තවමත් මතභේදයට තුඩු දෙන කාරණයක් වන ඉඩම් අයිතිවාසිකම් යනු මෙම සුළුතර ජනවාර්ගික ප්‍රජාව සඳහා අඛණ්ඩ දරිද්‍රතාවය සහ සූරාකෑමේ ශ්‍රම භාවිතයන් ඇතිකරවමින් පාලනය කිරීමේ ප්‍රධාන මාධ්‍යය වී තිබෙන්නකි.

නිල ප්‍රතිපත්ති පත්‍රිකාවල දක්වා නැති නමුත්  රජයේ හෝ රජයේ ආයතනවල ක්‍රියාකාරීත්වයන් වන ඉඩම් හා ඉඩම් නොමැතිකම හා සම්බන්ධ 'ප්‍රතිපත්ති' පිළිබඳ උදාහරණ ගණනාවක් තිබේ.

එල්ටීටීඊය විසින් උතුරෙන් ඉවත් කරන ලද මුස්ලිම්වරුන් නැවත පදිංචි කිරීම පහත පරිදි විස්තර කර තිබේ; "රටපුරා අවතැන්වූවන් පිළිබඳ ප්‍රතිපත්ති වෙනස්වීම ද ඇතුළත් ව 1995 දී රජයේ ප්‍රතිපත්ති වෙනස් කිරීම හේතුවෙන් සමහර පුද්ගලයින්ට කඳවුරුවලින් ඉවත් වී වඩාත් ස්ථිර ජනාවාස කරා යාමට අවස්ථාව ලැබුණි. පුත්තලම සම්බන්ධයෙන් සිදු වූ අලුත් දෙයක් වූයේ ඉඩම් මිල දී ගැනීම සහ ජනාවාස ඉදිකිරීම සඳහා සංවිධානය වූ ජනතාවගේ ක්‍රියාකාරී භූමිකාව යි. වෙනත් නිවාස වැඩසටහන්වල දී රජය විසින් ඉඩම් ලබා දුන්න ද, මේ අවස්ථාවේ දී, උතුරින් මුස්ලිම්වරුන්ට ස්ථිර ලෙස මාරුවීමට රජය සහය නොදක්වන ලද බැවින් ජනතාවට ඉඩම් මිල දී ගැනීමට සිදු විය. බොහෝ අය මිල දී ගත්තේ බොහෝ විට පර්චස් 10 ක් (c.250 m2) පමණ වූ ඉතා කුඩා බිම් කැබලි ය. මෙම බිම් කැබලි වල ප්‍රමාණය නිසා ඔවුන් ට ගොවිතැන් කටයුතුවල යෙදීමට නොහැකි වූ අතර, ඔවුන්ගේ දරුවන්ට එම ඉඩම් ලබා දීමට තරම් ඔවුන් ට ප්‍රමාණවත් ඉඩමක් නොතිබූ නිසා වැඩසටහනේ තිරසර බව පහළට ම වැටුණි" (බෘන් සහ ලුන්ඩ්, "ශ්‍රී ලංකාවේ ජාතික නිවාස ප්‍රතිපත්තියේ ආඛ්‍යානය නිරාවරණය කිරීම").

ඒ හා සමානව ම, ඉඩම් බෙදාදීම සමග බැඳී ඇති කාරණයක් විය හැකි විශේෂයෙන් මුහුදු ආරක්ෂක කලාපයෙන් වෙනත් ස්ථානයක පදිංචිකරවීමේ අවශ්‍යතාව ඇති අය පිළිබඳ ව වූ **සුනාමි නිවාස** ප්‍රශ්නය පිළිබඳ තක්සේරු කිරීමේ දී ද සුළු ජාතිකයින් සඳහා සමාන සැලකිල්ලක් දැක්වීමටත් ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමටත් රජය අපොහොසත් වී ඇති බව පෙන්නුම් කරයි. "ගැටුම්වලින් පීඩා විඳි සහ ආන්තිකකරණය වූ ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීමේ දී රජය කෙතරම් දුර්වල ද නැතිනම් උනන්දුවක් නොදක්වන්නේ ද යන්න සුනාමියෙන් පසු බොහෝ නිවාස ඉදිකිරීමේ භාවිතයන් හි දී... නිදර්ශනය වේ. ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමග එක් ව දකුණ නැවත ගොඩනැගීම සඳහා සිය ප්‍රයත්නයන් සහ වෘත්තීය ධාරිතාවයන් කේන්ද්‍රගත කර ඇති අතර, නැගෙනහිර හා උතුරේ දැඩි ප්‍රහාරයට ලක් වූ හා හුදෙකලා ප්‍රදේශ පරිත්‍යාගශීලීන්ගේ සංවිධාන සමූහයකට හෝ දෙමළ හා මුස්ලිම් ආධිපත්‍යය දරන පළාත් පාලන ආයතනවලට ඉතිරි වී තිබේ. මෙම තත්වය නිසා නිවාස ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සහ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වෘත්තීය, ජනවාර්ගික හා සංස්කෘතික අගතිගාමීත්වයන් ඇති වී තිබේ" (බෘන් සහ ලුන්ඩ්, "ශ්‍රී ලංකාවේ ජාතික නිවාස ප්‍රතිපත්තියේ ආඛ්‍යානය නිරාවරණය කිරීම").

### *හමුදාව විසින් අත්පත්කර ගැනීම සහ පෞද්ගලික දේපළ හා පූජනීය ස්ථාන විනාශ කිරීම*

හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම පශ්චාත් යුධ සමයේ අඛණ්ඩ ව පවතින ගැටලුවකි. එය මූලික වශයෙන් උතුරු පළාතේ දෙමළ ප්‍රජාව සඳහා වූ ගැටලුවකි. මෙම භාවිතය නැගෙනහිර පළාතේ සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන්ට බලපා ඇති බව වාර්තා මගින් පෙන්වා දෙයි (හියුමන් රයිට්ස් වොච්, 2018). 2017 දී රජය විසින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අක්කර 119,000 ක පමණ ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති බව වාර්තා වන අතර ඒ සඳහා රජයේ ඉඩම් අක්කර 89,000 ක් සහ පෞද්ගලික ඉඩම් අක්කර 30,000 ක් ඇතුළත් වන නමුත් මෙයට යුද්ධයේ දී නීත්‍යානුකූලව අත්පත් කර ගන්නා ලද ඉඩම් මීට අයත් ව තිබේ ද යන්න පැහැදිළි නැත (හියුමන් රයිට්ස් වොච්, 2018). එසේ ම උතුරු හා නැගෙනහිර දෙමළ සහ මුස්ලිම්වරුන්ට බලපාන පෞද්ගලික දේපොළ හා පූජනීය ස්ථාන විනාශ කිරීම පිළිබඳ වාර්තා කිහිපයක් හියුමන් රයිට්ස් වොච් වාර්තාවෙන් වාර්තා විය.

### *සංවර්ධන ප්‍රතිපත්ති*

සංවර්ධනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති පශ්චාත් යුධ සමයේ දී වේගවත් කර ඇති අතර ඉඩම් මෙම න්‍යාය පත්‍රයේ ප්‍රධාන කරුණක් වී තිබේ. 2011-2030 ජාතික භෞතික සැලැස්ම හරහා බටහිර, උතුරු, උතුරු නැගෙනහිර, නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවල මහා නගර සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය

යොමු කිරීම මගින් මෑතක දී එහි පුනර්ජීවනයක් ඇතිවනු දක්නට ලැබිණි. කොළඹ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති අසාධාරණ හා අයුක්ති සහගත ක්‍රියාවන් රාශියක් හරහා නාගරික දුප්පතුන් අවතැන් කිරීමට හේතු වී තිබේ. සමාන සැලසුම් මගින් අනෙකුත් මහා නගර කලාප සඳහා ද උපදේශන නොමැතිකම, අසාධාරණ භාවිතයන්, අවතැන් වීම සහ අසමානතාව හා දරිද්‍රතාව ඉහළ යාම පිළිබඳ ගැටලු ඇති කොට තිබේ. අවතැන්වූවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ප්‍රතිපත්ති නොමැතිකම, නීතිමය රැකවරණය නොමැතිකම සහ සැබෑ පොදු අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් පුද්ගලික දේපොළ මහජන ප්‍රයෝජනය සඳහා ගැනීමට රජයකට ඇති අයිතිය (අනිසි ලෙස) භාවිත කිරීම කොළඹ නාගරික සංවර්ධනය මගින් විශේෂයෙන් ම පෙන්නුම් කෙරේ (පෙරේරා, උයංගොඩ සහ ටෙගල්, 2017).

*ජාතික ප්‍රතිපත්තියක් නොමැතිවීම*

ශ්‍රී ලංකාවේ ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ගත් කළ, එවැන්නක් සකස් කිරීම සඳහා අසාර්ථක උත්සහයන් කිහිපයක් ගෙන තිබුණි. 1979 දී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශයක් පිහිටුවන ලද නමුත් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි විය (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2005). 1990 දී ඉඩම් බෙදා හැරීම හා උපයෝජනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කරන ලද අතර 1995 දී ඉඩම් හා කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සැකසීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියේ හා ජාතික ඉඩම් ප්‍රතිපත්තියේ කෙටුම්පත් සකස් කළ ද මේ දක්වා ජාතික ප්‍රතිපත්ති සකස් කර නැත. කෙසේ වෙතත්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමෙන් පීඩාවට පත්වූවන් නැවත පදිංචි කරවීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රාමුවක් සපයන කැබිනට් මණ්ඩලය විසින් 2000 දී අනුමත කරන ලද ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් තිබේ. ඉඩම් පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේ වගකීම තිබෙන්නේ පළාත්සභා නියෝජනය සහිත ජාතික ඉඩම් කොමිසමට ය. කෙසේ වෙතත්, ජාතික ඉඩම් කොමිෂන් සභාවක් කැඳවා නොමැති අතර මෙම රික්තකය තුළ මධ්‍යම රජය විසින් බොහෝ විට තමන්ගේම බහුතරවාදී අවශ්‍යතා මත අභිප්‍රේරණය වන ප්‍රතිපත්ති හා වැඩසටහන් තීරණය කොට ක්‍රියාත්මක කිරීම දැකිය හැකි ය.

## ඉඩම් නීති

ඉඩම් නීති බලාත්මක කිරීම ඉහත දක්වා ඇති ඉඩම් ප්‍රතිපත්ති සමඟ කියවිය යුතු ය. වසර ගණනාවක් පුරා, ඉඩම් සම්බන්ධ නීති එක්රැස් වී ඇති අතර, ශ්‍රී ලංකාවේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය පාලනය කරනු ලබන්නේ මෙහෙයුම් නීති 39 කට වඩා වැඩි ගණනකිනි (මාපා සහ වෙනත්, 2002).

යටත් විජිත නීති පිළිබඳ ව සටහන් වන පරිදි, "...බෙදීමේ ආඥා පනත 1863, ඉඩම් මැනුම් ආඥා පනත 1863, සේවය හා සම්බන්ධ භුක්තිය පිළිබඳ ආඥා පනත 1870 සහ තවත් සමහරක් නීති ඉඩම් ගනුදෙනු ක්‍රියාවලිය විධිමත් කිරීම හා සුමට කිරීම සඳහා උපකාරී වූ නමුත් මූලික වශයෙන් ඒවා එවකට යටත් විජිතයට උනන්දුව දැක් වූ වැවිලි අංශයේ වර්ධනය හා සංවර්ධනය පෝෂණය කිරීමේ මාධ්‍යයක් වශයෙන් සංකල්පනය වී තිබේ. (හේරත්, ජනරංජන. 2006).

1935 ඉඩම් සංවර්ධන ආඥා පනත 1927 ඉඩම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර, එය 1947 ඔටුන්නට හිමි ඉඩම් ආඥා පනත සමඟ, රජයේ ඉඩම් බෙදීමේ හා ජනාවාස යෝජනා ක්‍රමවල ප්‍රධාන නීතිමය මෙවලමක් ලෙස පවතින අතර තනි භාවිතය සඳහා රජයේ ඉඩම් බෙදාහැරිය හැක්කේ කුමන කොන්දේසි යටතේ ද යන්න නිර්වචනය කරයි. (ලින්ඩ්බර්ග් සහ හෙරත්, 2014). 1935 ආඥා පනත මගින් වියළි කලාපයේ වඩාත් සමෘද්ධිමත් ජනාවාස පිහිටුවීමට සහ තෙත් කලාපයේ දරිද්‍රතාවය සහ විරැකියාවෙන් මිදීම සඳහා යටත් ජනපදකරණ යෝජනා ක්‍රම

වෙනුවෙන් වූ යාන්ත්‍රණයන් ද නිර්මාණය විය (පීබල්ස්, 1990). 1935 සහ 1947 යන ද්විත්ව ආඥා පනත් මගින් ඉඩම් බලපත්‍ර නිකුත් කරන ආකාරය නියම කරන ලද අතර එහි දී බොහෝ විට ස්ථිර හිමිකාරිත්වය පසුව ලැබෙනු ඇතැයි උපකල්පනය කරමින් තාවකාලික බලපත්‍ර නිකුත් කෙරේ - ගොවීන්ට දේපොළවල කිසිදු ගොඩනැගිල්ලක් වෙනස් කිරීම හෝ මෙම බලපත්‍ර විකිණීම තහනම් කර ඒවා භාවිත කිරීම ප්‍රායෝගික ව බෙහෙවින් සීමා කර තිබේ. ඉඩම් පරිහරණය සීමා කිරීම ද ඉඩම් මිල දී ගැනීමේ දී කළු වෙළෙඳපොළවල් වර්ධනය වීම ඇතුළු ගැටලු රැසකට තුඩු දී තිබේ (ලින්ඩ්බර්ග් සහ හේරත්, 2014).

(1950) අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත මගින් ප්‍රකාශිත පොදු අරමුණු සඳහා රජය විසින් රජයට පවරා ගත හැකි ආකාරය නියම කර තිබේ. ෆොන්සේකා සහ රහීම් විසින් ලියා ඇති පරිදි; "ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ සඳහන් පරිදි, ස්ථාපිත නීතිමය ක්‍රියාදාමයන්ට අනුකූල ව පොදු අරමුණු සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගත යුතු ය. කෙසේ වෙතත්, අවතැන්වූවන් ප්‍රායෝගිකව තම ඉඩම් අත්පත් කර ගෙන තිබේ ද සහ ඒ කුමන අරමුණු සඳහා ද යන්න නොදන්නා වියවුල් සහගත ක්‍රියාවලීන් අනුගමනය කර තිබේ. බොහෝ අවස්ථාවන් හි දී, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන වන්දි ලබාදීමක් නොපවතී හෝ ඉතා අඩු මට්ටමක පවතී" (ෆොන්සේකා සහ රහීම්, 2011). ඉඩම් පරිහරණය හා හිමිකාරිත්වය සම්බන්ධයෙන් පුද්ගලයන් විසින් පොරොන්දු වී ඇති දේ (උදාහරණයක් ලෙස දේශපාලනඥයින්) සහ සැබෑ ඉඩම් පරිහරණ නීති, බලපත්‍ර සහ ප්‍රතිපත්ති අතර වටහා ගැනීමේ පරතරයක් පවතින බව ඔවුන් තවදුරටත් සඳහන් කරයි.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය තෙත් කලාපයේ නව ජනාවාස සඳහා ඉහළ යන ඉඩම් හිඟය සහ වියළි කලාපයේ යටත් විජිතකරණය සඳහා ඉඩම්වල දැවැන්ත සංවර්ධන පිරිවැය සඳහා දැක් වූ ප්‍රතිචාරයක් ලෙස සැලකේ. එමගින් පෞද්ගලික කෘෂිකාර්මික ඉඩම් හිමිකාරීත්වය වෙනුවෙන් කුඹුරු ඉඩම් සඳහා අක්කර 25 ක් ද සහ වෙනත් ඉඩම් සඳහා අක්කර 50 ක් ද වූ සීමාවක් නියම කර තිබේ.

1987 දී හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය දශක ගණනාවක ප්‍රචණ්ඩ ගැටුමට දැක් වූ ප්‍රතිචාරයක් වූ අතර ගැටුම නිරාකරණය කිරීම සඳහා ඉන්දියානු මැදිහත්වීම හා පීඩනයෙහි ප්‍රතිඵලයක් ද වේ. මෙම සංශෝධනය මගින් ඉඩම් පිළිබඳ බලතල සහ සිංහල සහ දෙමළ ජාතික භාෂාවන් ලෙස පිළිගැනීම ඇතුළු පළාත් සභා ඒකකයට බලය බෙදා හැරීම හඳුන්වා දෙන ලදී. ඉඩම් විෂය තුළ 'ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් භුක්තිය, ඉඩම් පැවරීම සහ වෙන් කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම' ආදී වශයෙන් පළාත් සභාවලට බලතල බෙදා දී තිබේ. මෙම ඉඩම් බලයන්ට සීමාවන් දෙකක් තිබේ: 1) අදාළ පළාත් සභාවේ උපදෙස් මත සියලු රාජ්‍ය ඉඩම් වෙන් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු ව පවතී 2) දෙවනුව, එක් පළාතක ට වැඩි ගණනක් හරහා දිවෙන ගංගා හෝ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් රජයට පළාතක් තුළ ඇති ඉඩම් භාවිත කළ හැකි ය. භූමියෙන් 82% ක් රජයට හිමි ව ඇති නිසා, රජයේ ඉඩම් සඳහා පළාත් සභා ඉඩම් බලතල සීමාවීම සැලකිය යුතු සීමා කිරීමක් වේ.

ඉඩම් අත්පත් කර ගැනීමේ හා භුක්තිය සඳහා ලබා ගැනීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමගාමී ලැයිස්තුවේ හමුවන නිසා මධ්‍යම හා පළාත් ආණ්ඩු දෙකට ම මෙම බලතල ක්‍රියාත්මක කළ හැකි ය. මධ්‍යම රජයට මෙම බලය ලබා ගත හැකි නීති ගණනාවක් තිබේ - ඉඩම් අත්පත් කර ගැනීමේ පනත, රජයේ ඉඩම් (අත්පත් කර ගැනීමේ) පනත, ඉඩම් භුක්තියට ලබා ගැනීමේ පනත සහ ඉඩම් නැවත ලබා ගැනීමේ ආඥා පනත. කෙසේ වෙතත්, පළාත් සභා විසින් මෙම බලය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමක් පිළිබඳ ව දැනගන්නට නැත.

නෛතික රාමුව විසින් ඉඩම් පරිපාලනය සඳහා වේදිකාව සකසයි. පළාත් සභා ඉඩම් බලතල කෙරෙහි මධ්‍යම රජයට ඍජු හා වක්‍ර පාලනයක් ඇති බව පෙන්වා දී තිබේ. ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම

මධ්‍යම රජයේ විෂයක් වන අතර ඒවා පරිපාලනය කරනු ලබන්නේ ඉඩම් කොමසාරිස් විසිනි. 1992 දී ප්‍රාදේශීය ලේකම්වරුන්ට රජයේ ඉඩම් සම්බන්ධ බලතල ක්‍රියාත්මක කිරීමට බලය ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ ඉඩම් විෂය ඉඩම් කොමසාරිස් ජෙනරාල්, ප්‍රාදේශීය ලේකම්වරුන් (මධ්‍යම රජය විසින් පාලනය කරනු ලබන) සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ (ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබේ) විෂය පථයට අයත් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නෛතික රාමුවේ දේශපාලන ඇඟවුම් පිළිබඳ ව අදහස් දක්වමින් බැස්ටියන් (1997 සහ 2013) විශේෂයෙන් නැගෙනහිර පළාතේ වාර්ගික සංයුතිය සහ ඉඩම් බලතල වෙනස්කළ ගැටුම්කාරී වාර්ගික ආතතීන් අතර සම්බන්ධයක් පෙන්වා දෙයි.

වඩාත් මෑත කාලීන නීති සහ යෝජිත නීති මගින් නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය වෙත ඉඩම් විවෘත කිරීමේ පියවරක් පෙන්නුම් කරයි. 2017 අංක 3 දරණ ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත මගින් විදේශිකයන්ට සහ විදේශීය සමාගම්වලට බදු දී ඇති ඉඩම් සඳහා බදු දීමේ බදු පැනවීමේ සීමාවන් ඉවත් කරන ලදී. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් නිදහස් කිරීම වෙනුවෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත 1935 (1935 අංක 19) සංශෝධනය කිරීමට 2017 නොවැම්බර් 14 වන දින අමාත්‍ය මණ්ඩලය එකඟ විය. කෘෂිකාර්මික නොවන අරමුණු සඳහා වී ඉඩම් භාවිත කිරීමට ඉඩ දීම වෙනුවෙන් 1958 අංක 1 දරණ කුඹුරු ඉඩම් පනත සහ 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත සංශෝධනය කිරීමට සැලසුම් කර ඇති බව 2018 රජයේ අයවැය මගින් හෙළි කරන ලදි (චාමිකර, එස්). විදේශිකයන්ට සහ විදේශීය සමාගම්වලට ඉඩම් විකිණීමට ඉඩ සැලසීම සඳහා තවත් උත්සහයක් ලෙස 2019 දී ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ තවත් සංශෝධනයක් යෝජනා කරන ලදී. 2016 දී ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව යෝජනා කළේ රජයේ ඉඩම් සන්තකය පැවරීමේ දී විවිධ රාජ්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමේ දී ඇති වන සංකීර්ණතාවන් සඳහා විසඳුම් ලබා දෙනු ඇතැයි යන සාධාරණීකරණය සහිත ව රජයේ ඉඩම් බෙදා හැරීමේ බලය ඇති ඉඩම් බැංකුවක් පිහිටුවීම සඳහා නීති සම්පාදනය කළ යුතු බවයි.

## ඉඩම් සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය

සෑම ආගමකටම අයත් ප්‍රධාන ප්‍රජාවන් අතර ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට ඉඩම් දේපොළ සඳහා අයිතිවාසිකම් සැලකිය යුතු ගැටලු ඇති බව සඳහන් වී තිබේ (අගර්වාල්, 1994). ඉඩම් සංවර්ධන ආඥා පනත පැහැදිලි නෛතික වෙනස්කම් කිරීමක් ලෙස හඳුනාගෙන ඇති අතර, එම පනත අනුව සැමියා මිය ගිය බිරිඳට සහ දියණියන්ට උරුම ඉඩම් අයිතිය අහිමි කොට තිබේ (ජයවර්ධන සහ ගුණරත්න, 2010 සහ හේරත්, 2010). ඉඩම් ගැටලු ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්බන්ධතාවන්ට සැලකිය යුතු ලෙස බලපෑමට හැකි අතර, විශේෂයෙන් ම පශ්චාත් යුධ සමයේ අවදානමට ලක්විය හැකි කාන්තාවන් ඈත් කිරීම හෝ අවතැන් කිරීම සිදුකරවන පුරුෂාධිපත්‍යමය භාවිතයන් නිසා මූල්‍යමය සුරක්ෂිතතාව අහිමිවීමට, පවුල් බිඳවැටීමට හා සියදිවි නසා ගැනීමට පවා තුඩු දිය හැකි ය. කේන්ද්‍රීය ව, ඉඩම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බොහෝ ගැටලු නැවතත් බලය හා සම්බන්ධ වේ: පාලනය සහ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ ගැටලු තුළ දී කාන්තාවන් සතු ව තීරණ ගැනීමේ බලය නොමැති වීම හා සාමය ගොඩනැඟීමේ ක්‍රියාවලියට සහභාගී වීමට සහ එබැවින් ප්‍රතිසංස්කරණයට බලපෑම් කිරීමේ හා පුනරුත්ථාපන උත්සහයන් සඳහා බලය නොමැති වීම.

ඉඩම් පිළිබඳ ගැටලුවලට අදාළ ව බලය සංකේන්ද්‍රණය වීම බොහෝ කලක් තිස්සේ ශ්‍රී ලංකා දේශපාලනයේ හානිකර ගැටලුවකි. විශේෂයෙන් ම උතුරු පළාතේ ඉඩම් පරිහරණයට ඇති අභියෝග පිළිබඳ ව සඳහන් කරන ෆොන්සේකා සහ රහීම්, "බලය සංකේන්ද්‍රණය වී ඇත්තේ රජයේ වැදගත් කාර්යයන් සහ පුරවැසියන්ගේ ඉඩම් අයිතිවාසිකම් කෙරෙහි බලපාන අරමුදල් බොහොමයක් පාලනය කරන ප්‍රධාන පුද්ගලයින් කිහිප දෙනෙකු අතරය" (ෆොන්සේකා සහ රහීම්, 2011: 38).

එබැවින්, මධ්‍යගත රාජ්‍යයට සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ට ඉඩම් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා දායක වීමට, හැඩගැස්වීමට සහ අභිමිකරවන ලද්දන්ගේ දුක්ගැනවිලි විසඳීමට හැකියාවක් තිබෙන නමුත් අවදානමට ලක්විය හැකි කාන්තාවන් සඳහා (එල්ටීටීඊය විසින් ශ්‍රී ලංකාවේ උතුරින් නෙරපා හරින ලද මුස්ලිම් සුළුතරය වැනි වෙනත් නෙරපා හරින ලද කණ්ඩායම් ද සමඟ) විවාදය පාලනය කිරීමටත් එබැවින් ඔවුන්ගේ අනාගත ජීවනෝපායන් සඳහාත් පාලනය සඳහාත් අවකාශය ඇත්තේ ඉතා අල්ප වශයෙනි. පීතෘමූලික සම්මතයන් සහ නීති මගින් ඔවුන් ට අයිති ඉඩම් නැවත ලබා ගැනීමත් සහ එමගින් ඔවුන්ගේ පවුලේ අතුරුදහන් වූ ස්වාමිපුරුෂයන්, පියවරුන් හෝ සහෝදරයන් සම්බන්ධයෙන් ආර්ථික මානයක් එක් කිරීමටත් ඉතාමත් අපහසු වේ (ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප්, 2011).

කමන්ති වික්‍රමසිංහ විසින් 2016 දී ඩේලි මිරර් පුවත්පතේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාවේ ඉඩම් නීති සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීම සඳහා ඇති අභියෝග රාශියක් හඳුනාගෙන, ඒවායේ ප්‍රගතිය ජාත්‍යන්තර නීතිය යටතේ ව්‍යවස්ථාමය බැඳීම් හෝ වගකීම් හා නොගැලපෙන බව ඇය සඳහන් කරයි, උදාහරණයක් ලෙස ඉඩම් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම. සාම්ප්‍රදායික අර්ථයෙන් කාන්තාවන් ගෘහ මූලිකයන් ලෙස නොසළකන සහ පීතෘමූලික ආකල්ප හා භාවිතයන් නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරන පරිපාලකයින් සහ හමුදා නිලධාරීන් සමඟ රජයට එරෙහි ව අරගල කළ හැකි යැයි නොසැලකෙන බැවින් "ඉඩම් හිමිකම, පාලනය සහ ප්‍රවේශවීමේ දී පුද්ගලයෙකුට ඇතිවිය හැකි අභියෝග සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි" බව ෆොන්සේකා සහ රහීම් අවධාරනය කරයි. (2011: 108).

*පශ්චාත් යුධ ශ්‍රී ලංකාව*

උන්රු සහ විලියම්ස් (2013) සඳහන් කළ පරිදි, සන්නද්ධ ගැටුමක අවසානය බොහෝ විට තවත් ආකාරයේ ගැටුමක් හඳුන්වා දෙයි: බලපෑමට ලක් වූ ජනගහනය ඉක්මනින් ඉඩම් හෝ ඉඩම් පදනම් කරගත් සම්පත් සොයනු ඇත. සාම ගිවිසුම් වල අවිනිශ්චිත කොන්දේසි හෝ ඉඩම් භුක්තියේ හිමිකම් ඉල්ලීම් වටා ඇති අඛණ්ඩ අනාරක්ෂිතභාවය සිවිල් ගැටුමක් අලුත් කිරීමට හෝ නව ඒවා දියත් කිරීමට දායක වන්නේ කෙසේද යන්න සඳහා සමාන්තර උදාහරණ වශයෙන් ලොව පුරා සටන්වලට ඉක්බිතිව මෙය සිදු වූ උදාහරණ ගණනාවක් තිබේ.

රාජපක්ෂ පාලන සමයේ පශ්චාත් යුධ ප්‍රතිසංස්කරණ පැමිණියේ "නූල් ගණනාවක් ඇමිණුම් සහිතවය" (ගුඩ්හැන්ඩ්, 2012). නිර්ලජ්ජිත ලෙස කේන්ද්‍රීයවාදී වූ රජයකට පූර්ව දෙමළ ආධිපත්‍යය සහිත ප්‍රදේශ මත සිය පාලනය තහවුරු කර ගැනීමට එමගින් ඉඩ ලබා දුන් අතර එසේම එමගින් ඇතිවිය හැකි දෙමළ කැරලිකාර සටන්කාමීත්වයක් විනාශ කිරීමට හැකිවනු ඇතැයි ද එය තර්ක කළේ ය.

යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන් තවදුරටත් කොන් කිරීම වළක්වමින් මෙන් ම ඉඩම් නැවත ලබාදීම ඇතුළු ව වන්දි ගෙවීම් මගින් දිගුකාලීන සාමය ගොඩනැංවීමේ ප්‍රයත්නයන් සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දිය හැකි බව ෆොන්සේකා සහ රහීම් සටහන් කරති. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාවේ තත්වය එසේ නොවීය. දශක තුනක යුද්ධය තුළ දී හා ඉන් ඉක්බිතිව ද, ජාතික හා ප්‍රාදේශීය දේශපාලන න්‍යාය පත්‍රයන් හි ප්‍රමුඛ කාර්යභාරයක් ඉඩම් මගින් ඉටු කර ඇති අතර, ඉඩම් කොමිෂන් සභා සහ සිවිල් සමාජ කණ්ඩායම් ගණනාවක් විසින් විශේෂයෙන් ම දක්වා ඇති පරිදි, ඉඩම් නැවත ලබාදීම හරහා ඓතිහාසික දුක්ගැනවිලි වෙනුවෙන් සාමකාමී සහජීවනය, ප්‍රතිසන්ධානය සහ කල් පවත්නා විසඳුම් සඳහා පහසුකම් සැලසීමේ අවශ්‍යතාව ඉස්මතු කර තිබේ. එහෙත් අවතැන්වීම ගැටුමේ විශේෂ තේමාවක් වූ අතර, ඊසානදිග උණුසුම් ස්ථාන ගණනාවක ඇති වූ සටන් මෙන්ම අධි ආරක්ෂිත කලාප (HSZ) සහ වෙනත් නිදහස් වෙළෙඳ හෝ සංචාරක සංවර්ධන කලාප මගින් ද දසදහස් ගණනාවක් ඔවුන්ගේ නිවෙස්වලින් හෝ ඔවුන්ගේ ජීවනෝපාය රඳා පවතින භූමියෙන් අවතැන් කොට තිබේ. නැවත පැමිණීමේ සහ ප්‍රතිෂ්ඨාපනයේ අපේක්ෂාව සරල එකක් නොවේ.

සාරා පැන්ටුලියානෝ විවිධ සමාජ-දේශපාලනික හා සංස්කෘතික සන්දර්භයන් තුළ අවතැන් වූවන් නැවත පැමිණීම හා නැවත පදිංචි කිරීම පිළිබඳ ව ලියා තිබෙන අතර, එය එල්එල්ආර්සී වාර්තාවේ උපුටා දක්වා තිබේ: "පශ්චාත් ගැටුම් කාලවල දී ඉඩම් ගැටලු බොහෝ විට මතු වී ඇත්තේ ජනගහනය විසින් ඉඩම් අත්පත් කර ගැනීමට සහ නැවත ලබා ගැනීමට උත්සහ කරන නිසා ය. "පශ්චාත් ගැටුම්" යැයි කියනු ලබන පරිසරයක වුව ද, සරණාගතයින්ට නැවත සිය නිවෙස් කරා යාම සරල ක්‍රියාවලියක් නොවේ. මෙය සංකීර්ණ කාරණයක් වන අතර සෑම තත්වයක්ම විවිධ ය, ගැටුම අතිශයින් ම පරිවර්තනීය ක්‍රියාවලියක් වන අතර කෙතරම් සුදුසු වුවත්, යුද්ධයට පෙර තත්ත්වය කිසි විටෙකත් සම්පූර්ණයෙන් ස්ථාපිත කළ නොහැකිය" (පැන්ටුලියානෝ, 2009).

සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රකාශිත අරමුණ ඇතිව, 2015 ඔක්තෝම්බර් මාසයේ දී ශ්‍රී ලංකා රජය (GOSL) සහ UNHRC විසින් සම අනුග්‍රහය දැක් වූ එක්සත් ජාතීන්ගේ යෝජනාව අවතැන්වූවන් සඳහා කල් පවත්නා විසඳුම් සඳහා වූ අවශ්‍යතාව නිශ්චිතව ම ආමන්ත්‍රණය කිරීම අරමුණු කර තිබේ.

උතුරු හා නැගෙනහිර පළාත්වල හමුදාව විසින් ඉඩම් අත්පත්කර ගැනීම හැරුණු විට, අවතැන්වීම යනු ප්‍රජා අනන්‍යතාව, ආධාරක පද්ධති සහ පවුල් ව්‍යුහය මෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දීර්ඝ කාලීන බලපෑම් ඇති සමහර කණ්ඩායම් සඳහා විශේෂයෙන් ම කාන්තා මූලික නිවාසවල වැඩි ප්‍රමාණයක් තිබෙන ප්‍රජාවන් සඳහා දීර්ඝ ඉතිහාසයක් තිබෙන ගැටලුවකි.

### ඉඩම් සහ වන්දි ලැබීමේ අයිතිය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (14 වන වගන්තිය) සඳහන් වන පරිදි, සෑම පුරවැසියෙකුටම "ගමන් කිරීමේ නිදහස සහ ශ්‍රී ලංකාව තුළ තම පදිංචිය තෝරා ගැනීමට සහ ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ නිදහස" සඳහා හිමිකම් තිබේ. අවතැන්වූවන්ට ඔවුන්ගේ අහිමි වූ ජීවනෝපායන් ස්ථාපිත කිරීමට සහ එහි ප්‍රතිඵලය වශයෙන් ජීවිතය නැවත ලබා ගැනීමෙන් දරිද්‍රතාවයෙන් මිදීමේ මාධ්‍යයක් ලෙස ඉඩම් හිමිකාරිත්වය සැලකේ. අනෙක් සියල්ලන් ම හා සමාන වූ අයිතිවාසිකම් සහ හිමිකම් සහිත ව, නීතිය ඉදිරියේ සමාන පුරවැසියන් ලෙස පිළිගැනීමට ලක්වුවහොත්, ජනතාවට රාජ්‍යය පිළිබඳ නව විශ්වාසයක් ද ලබා දිය හැකි ය. කෙසේ වෙතත්, මෙම ප්‍රායෝගික හා දේශපාලන අවශ්‍යතාවන්ට වඩා ඉඩම කෙරෙහි ඊටත් වඩා විශාල වටිනාකමක් තිබේ: එය කෙනෙකුගේ අනන්‍යතාව පිළිබඳ හැඟීම සහ හිමිව සිටීම පිළිබඳ හැඟීම වෙනුවෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි, භූමිය සමඟ බොහෝ බැඳීම් කෙනෙකුගේ ප්‍රජාව සමඟ බැඳීම් හා සමාන වේ; ඒවා ඇත්ත වශයෙන් ම ප්‍රමාණනය කළ නොහැකි බැඳීම් ය (බෘන්, 2003). මෙම සමාජ සම්බන්ධතා සහ ආධාරක ජාල බිඳවැටීම, ප්‍රතිසන්ධාන ක්‍රියාමාර්ග සහ ආයතනික ප්‍රතිසංස්කරණවල සෑම අදියරක දී ම විසඳිය යුතු ගැටලු අවතැන්වීම නිසා ඇති වේ.

ඉඩම් ප්‍රතිස්ථාපනය, විශේෂයෙන් ම වන්දි ගෙවීමේ වැදගත් අංගයකි. වන්දි ගෙවීමේ අයිතිය පිළිබඳ ප්‍රකාශය තුළ ප්‍රතිස්ථාපනය අන්තර්ගත කොට තිබෙන්නේ "නිදහස, නෛතික අයිතිවාසිකම්, සමාජ තත්වය, පවුල් ජීවිතය සහ පුරවැසිභාවය යථා තත්ත්වයට පත් කිරීම; කෙනෙකුගේ වාසස්ථානයට නැවත පැමිණීම සහ රැකියාව යථා තත්ත්වයට පත් කිරීම සහ දේපොළ ආපසු ලබා දීම" යනුවෙනි (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වාර්තාව, උතුරු පළාතේ ඉඩම්, 2016). කෙසේ වෙතත්, ඒ හා සමාන ව වැදගත් වන්නේ ඉඩම් පරිහරණය සහ අයිතිවාසිකම් දිගුකාලීන සාමයක් ගොඩනැංවීමේ හා ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් ඉටු කිරීමයි. අවතැන්වූවන් සඳහා කල් පවත්නා විසඳුම් ස්ථාපිත කිරීම ඕනෑම විශ්වසනීය ප්‍රතිසන්ධාන ප්‍රතිපත්තියක කොටසක් ලෙස අවධානය යොමු කළ යුතු ය.

වැරදිකිරීම්වල අත්දැකීම් පිළිගෙන වැරදිකරුවන් වූ පුද්ගලයන්ගේ හෝ කණ්ඩායම්වල අයිතිවාසිකම් ද එමගින් ප්‍රතිස්ථාපනය කරන නිසා පශ්චාත් යුධ සමයේ ප්‍රතිස්ථාපනය ඉතා වැදගත් වේ. මෙම අයිතිවාසිකම් සඳහා ගමන් කිරීමේ නිදහස, ස්වයං නිර්ණ අයිතිය (පුද්ගල හා සාමූහික), දේපොළ අයිතිය, ප්‍රමාණවත් ජීවන තත්වයක් සහ වැඩ කිරීමේ අයිතිය ඇතුළත් වේ.

පශ්චාත් ගැටුම් කලාපවල කාන්තාවන් විශාල පිරිසකට අවතැන්වීම සහ බැහැර කිරීම පිළිබඳ සිද්ධීන් බලපාන විට, ඉඩම් සඳහා ප්‍රවේශය හෝ 'භුක්තියේ අනාරක්ෂිතතාව' යනු ස්ථාවර සාමයක් සඳහා පුළුල් අපේක්ෂාවන් විදහා දැක්විය හැකි භෞතික අංගයකි. සාමය ගොඩනැගීමේ දී ඉඩම් සඳහා වන ප්‍රවේශය මගින් බරපතල ප්‍රතිවිපාක ඇති කරන්නේ කෙසේදැයි උන්රු සහ විලියම්ස් සටහන් කරයි: නරක ම අවස්ථාවෙහි දී, ඉඩම් පිළිබඳ ආතතීන්ට පිළියම් යෙදීමට අපොහොසත් වීමෙන් දුක්ගැනවිලි ඇති කිරීම හෝ ඇතිවිය හැකි දුක්වේදනා කල්පැවතීමට ඉඩ ලැබිය හැකි ය. කෙසේ වෙතත්, ඉඩම් ගැටලු සඳහා වන සාර්ථක ප්‍රවේශයන් මඟින් තිරසර සාමය කරා ප්‍රගතිය තහවුරු කර ගත හැකි අතර දීර්ඝකාලීන ව සාමය පවත්වා ගැනීමට උපකාරී වේ (2013: 1).

## පශ්චාත් යුධ කොමිෂන් සභා නිර්දේශවල සාරාංශ

පශ්චාත් යුධ සමයේ ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිස්ථාපනය හා නැවත පදිංචි කිරීම පිළිබඳ වඩාත් සවිස්තරාත්මක නිර්දේශයන් බොහොමයක් ඉඩම් ගැටලු පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ: නැවත පැමිණීම සහ නැවත පදිංචි කිරීම මාතෘකාව යටතේ එල්එල්ආර්සී වාර්තාවේ හයවන පරිච්ඡේදයෙන් ලබා ගත හැකි ය. මේවා පහත පරිදි ප්‍රධාන තේමාවන් කිහිපයකට සාරාංශගත කළ හැකි ය:

1. ඉඩම් පදනම් කරගත් ආරවුල් විසඳීමේ නිශ්චිත ඉලක්කයක් සහ අරමුණක් ලෙස ජනවාර්ගික සංහිඳියාවේ කාර්යභාරය. "දීර්ඝකාලීන ගැටුමකින් පසුව රටක් වහා ම පූර්ව ගැටුම් තත්වයට සමාන ව යථා තත්වයට පත් කිරීම පහසු කාර්යයක් නොවූවත්, ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් සහ ජනවාර්ගික පවිත්‍රකරණය මගින් අවුලුවන ලද නීතිවිරෝධී ඉඩම් පැවරීම් සහ සන්තකය පැවරීම් සදාකාලිකවීම හෝ ආයතනිකකරණය වීම සඳහා ඉඩ නොදෙන බව සහතික කිරීම වැදගත් බව කොමිසම පිළිගනී. ජනවාර්ගික සමගිය හා ජාතික සංහිඳියාව පෝෂණය කිරීම සඳහා මෙය ඉතා වැදගත් වේ. මක්නිසා ද යත් එය නොවිසඳී ඇත්නම් අනාගත ගැටුම සඳහා ප්‍රේරක ලක්ෂ්‍ය බවට එය පරිවර්තනය වනු ඇත" (9.121).

2. ඉඩම් හිමිකම් ආමන්ත්‍රණය කිරීමේ පරිපාලනමය හා සැපයුම්මය අභියෝගයන් රජයේ ඉඩම් ප්‍රතිපත්තිය හා එහි නැවත පදිංචි කිරීමේ වැඩසටහන සහ නිර්දේශිත විකල්ප (උදා: අධිකරණමය නොවන) විසඳුම් සමඟ ද සම්බන්ධ වී තිබේ. "අවතැන්වූවන් නැවත පැමිණීම සහ නැවත පදිංචි කිරීම පිළිබඳ රජයේ ඉඩම් ප්‍රතිපත්තිය සහ 2011 ජූලි මාසයේ දී යෝජනා කරන ලද ඒ හා සම්බන්ධ අවතැන්වූවන්ගේ හිමිකම් සහ පරිශීලක අයිතිවාසිකම් පිළිබඳ ඉඩම් ලේඛන හා ආරවුල් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා නිර්මාණය කර ඇති ආශ්‍රිත වැඩසටහන කොමිෂන් සභාව විසින් අගය කරයි. මෙම වැඩසටහන නව්‍යකරණයෙන් යුක්ත වන අතර, නිලධාරිවාදය වඩා අඩු හා අවිධිමත් හා සුදුසු ඕනෑ ම තැනක භාවිත කිරීමට බලාපොරොත්තු වන අතර, එමගින් අවතැන්වූවන්ගෙන් අතිමහත් බහුතරයක් සංකීර්ණ, කාලය ගතවන සහ නඩු පවරන්නන් සඳහා මිල අධික වූ විධිමත් අධිකරණ පද්ධතිය භාවිත කිරීමෙන් නිදහස් කිරීමට සැලසුම් කර තිබේ " (9.125).

3. රජයේ ඉඩම්වල සන්තකය පැවරීම සහ/හෝ හමුදාව විසින් පුද්ගලික ඉඩම් අඛණ්ඩ ව පාලනය කිරීම පිළිබඳ ව ද අවධානය යොමු කෙරේ. උදාහරණයක් ලෙස, මෙමගින් යෝජනා කරන්නේ "යෝජිත වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන තෙක්, රජයේ ඉඩම් වෙනත් අනුමත අරමුණු සඳහා අවශ්‍ය වන අවස්ථාවන්හි දී හැරුණු විට, අවතැන්වූවන් හැර රජයේ ඉඩම් සන්තකය පැවරීම වැළැක්වීම සඳහා දැඩි පාලනයන් ක්‍රියාත්මක කරනු ලැබේ... විධිමත් අධි ආරක්ෂිත කලාප නිසා හෝ වෙනත් අවිධිමත් හෝ තාවකාලික ආරක්ෂාව සම්බන්ධ අවශ්‍යතා නිසා ඉඩම් හා නිවාස අහිමි වූ සියලුම පවුල්වලට විකල්ප ඉඩම් ලබා දිය යුතු අතර අදාළ නීතිවලට අනුව වන්දි ගෙවිය යුතු බව ද කොමිසම නිර්දේශ කරයි. විකල්ප ඉඩම් ලබා දීම හෝ වන්දි ගෙවීම නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතු බව කොමිසම තවදුරටත් නිර්දේශ කරයි" (9.140-9.142).

උතුරු හා නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව සඳහා මන්දගාමී හා දුෂ්කර ක්‍රියාවලියක් පිළිබඳ මෙම භාර ගැනීම සැලසුම් කර ඇත්තේ බලපෑමට ලක්වූ පුද්ගලයන්ට ජීවිතය ඉදිරියට ගෙන යාමට උපකාර කිරීම සඳහා නැවත පැමිණීමේ හා ප්‍රතිස්ථාපන යාන්ත්‍රණයන් කඩිනම් කිරීම සඳහා ය. නැවත පදිංචි කළ ඉඩම්වල ජනවාර්ගික වෙන්කිරීමකින් තොර ව සියලු කණ්ඩායම් සඳහා අව්‍යාජ ප්‍රතිලාභයක් ඇති බව සහතික කිරීම වෙනුවෙන් 1990 දී එල්ටීටීඊය විසින් උතුරෙන් නෙරපා හරින ලද මුස්ලිම්වරුන් ද, උතුරු පළාතේ සුළුතරයක් වන සිංහල බහුතරය ද ඇතුළු ව සමහර විශේෂිත කණ්ඩායම්වලට විශේෂ සඳහන් කිරීමක් ලැබේ. LLRC මේ අනුව "මේ සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳ ව සෑහීමකට පත්විය නොහැකි බැවින් යාපනයෙන් සහ උතුරු පළාතෙන් නෙරපා හරින ලද සහ ආපසු යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ සිංහල පවුල් නැවත ස්වකීය ඉඩමකට හෝ විකල්ප ඉඩමකට හැකි ඉක්මනින්, නැවත පදිංචි කරවිය යුතු බව නිර්දේශ කරයි" (9.145).

අවසාන වශයෙන්, රජයේ ඉඩම් සමාන ව බෙදා හැරීම සහ ඉඩම් ප්‍රතිපත්තියේ පළාත් සඳහා බලය බෙදා හැරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් කිරීම සඳහා ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටුවීමට කොමිසම නිර්දේශ කරයි (9.150). දිස්ත්‍රික් පරිපාලනයට මඟ පෙන්වීම සඳහා (9.151) උතුරු හා නැගෙනහිර සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම ඉඩම් පරිහරණ සැලැස්මක් තිබිය යුතු බවත්, අවතැන් වූ සියලු දෙනාට ඉඩම් ප්‍රතිස්ථාපනය නැතහොත් විකල්ප ජනාවාස සහතික කිරීම සඳහා සියලු දේශපාලන පක්ෂ ද්වි පාර්ශවීය ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බවත්, සහ ජාතික සංහිඳියාව කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා හැකි සෑම තැනක ම වන්දි ලබාදිය යුතු බවත් එය තවදුරටත් නිර්දේශ කරයි. (9.152).

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ සමස්ත දිවයිනේ ජනතාවගේ උපදේශනය මත පදනම් ව 2016 මැයි මාසයේ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුවේ (PRC)** වාර්තාව ද ජනතාව මුහුණ දෙන ඉඩම් ප්‍රශ්නවල සංකීර්ණ බව පිළිගෙන තිබේ. කමිටුවේ නිර්දේශ පහත පරිදි වේ:

1. *ස්වභාවික සම්පත්, ශාක හා සත්වයන් භාවිත කිරීම සඳහා ව්‍යවස්ථාමය මාර්ගෝපදේශ තිබිය යුතු ය.*

2. *ඉඩම්, පරිසරය සහ සංවර්ධනය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ඇතුළත් කළ යුතු ය. සතුන් හා වන ජීවීන් පරිසරයේ හා පරිසර පද්ධතියේ කොටසක් ලෙස සැලකිය යුතු බැවින් පරිසරයට අදාළ මූලික අයිතිවාසිකම් පිළිබඳ කොටස සත්ව අයිතිවාසිකම් සහ සත්ව සුබසාධනය ද සලකා බැලිය යුතු ය. මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන ඉඩම්, පරිසරය හා සංවර්ධනය පිළිබඳ වෙන ම පරිච්ඡේද තුනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු ය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ දී කෙන්යානු සහ ඉක්වදෝර ව්‍යවස්ථාවන්හි උදාහරණ සලකා බැලීමට අපි යෝජනා කරමු. උදාහරණයක් ලෙස, මෙම පරිච්ඡේදවල ප්‍රතිපාදන ඇතුළත් විය යුත්තේ:*

   - *පරිසරය හා ස්වාභාවික සම්පත් තිරසර ලෙස ප්‍රයෝජනයට ගැනීම, භාවිතය, කළමනාකරණය සහ සංරක්ෂණය සහතික කිරීම සහ ලැබෙන ප්‍රතිලාභ සම ව බෙදා ගැනීම සහතික කිරීම;*

   - *පාරිසරික විශේෂඥයින් සමඟ සාකච්ඡා කර අව ම ගස් ආවරණයක් තීරණය කිරීම, එය සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම;*

3. *ප්‍රජාවන්ගේ ජෛව විවිධත්වය සහ ජානමය සම්පත් පිළිබඳ දේශීය දැනුම සහ දේශීය දැනුම ආරක්ෂා කිරීම සහ එහි නෛතික ආරකෂාව වැඩි දියුණු කිරීම;*

   - *පරිසරය කළමනාකරණය, ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජන සහභාගීත්වය දිරිමත් කිරීම;*

- *ජාන සම්පත් හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම;*
- *පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම.*

4. *පාරිසරික විගණනය සහ පරිසරය අධීක්ෂණය කිරීම*

5. *පරිසරයට අනතුරක් විය හැකි ක්‍රියාවලීන් හා ක්‍රියාකාරකම් ඉවත් කිරීම; සහ පරිසරය හා ස්වභාවික සම්පත් ශ්‍රී ලංකා ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම*

6. *පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සහ පාරිසරික වශයෙන් තිරසර සංවර්ධනය සහ ස්වභාවික සම්පත් භාවිතය සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන හා අනෙකුත් පුද්ගලයින් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සෑම පුද්ගලයෙකුගේම යුතුකමක් වේ.*

7. *සංවර්ධනය හා සම්බන්ධ සූරාකෑම සහ අවතැන් වීම වැළැක්වීම වෙනුවෙන් ප්‍රමාණවත් යාන්ත්‍රණ ඇති බව සහතික කිරීමට ආර්ථික සංවර්ධන දුක්ගැනවිලි විසඳීම සඳහා කොමිසමක් පිහිටුවීම.*

8. *ඉඩම්, පරිසරය හා සංවර්ධනයට අදාළ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූවන්ට සහන සහ වන්දි ගෙවීමේ ක්‍රමය.*

9. *සංවර්ධනයේ නාමයෙන් පරිසරයට හානි කරන හෝ මිනිසුන් සූරාකන ඕනෑ ම පුද්ගලයකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් පියවර ගැනීමට බලය තහවුරු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නිලධාරීන් වගකිව යුතු බවට ප්‍රතිපාදන සැලසීම.*

10. *රටේ මුළු භූමි ප්‍රමාණයෙන් පිළිගත හැකි ප්‍රතිශතයකින් අව ම ගස් ආවරණයක් පවත්වා ගැනීමට ක්‍රමයක් හඳුනා ගන්න.*

11. *රට වෙනුවෙන් තිරසර, සාධාරණ හා සමාජීය වශයෙන් සාධාරණ සමාජ ආර්ථික සංවර්ධන විසඳුම් සෙවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති කැපවීම්*

ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් සඳහා වන උපදේශන කාර්ය සාධක බලකායේ (CTF) වාර්තාවේ, සංසන්දනාත්මක ව බලන කළ, රට පුරා විවිධ ඉදිරිපත් කිරීම් හරහා "ඉඩම් පිළිබඳ විවිධාකාර හා පුනරාවර්තන ගැටලු" මතු වී තිබේ. (143)

3.6 (107) වගන්තියේ සඳහන් පරිදි: *"සෑම කලාපයක ම ඉඩම් පුනරාවර්තන ගැටලුවක් විය. පවතින මිලිටරි අත්පත්කර ගැනීම් හෝ සිවිල් වැසියන් විසින් ද්විතීයික ඉඩම් අත්පත් කර ගැනීම් සහ ලිපි ලේඛන නැතිවීමේ සිට ලියකියවිලි නොමැතිකම පිළිබඳ ගැටුම් නොවන ඉඩම් ගැටලු හෝ ඉඩම්වල හිමිකාරිත්වය සහ සංවර්ධනය සඳහා ප්‍රමාණවත් අයිතිවාසිකම් නොමැති වීම යන කරුණු දක්වා ගැටලුවල ස්වභාවය පැතිර තිබුණි".*

මිලිටරිය හෝ වෙනත් පාර්ශවයන් විසින් සිදුකළ අවතැන්කිරීම නිසා අහිමි වූ ඉඩම් සඳහා හිමිකම් ඉල්ලීම මෙන් ම දඹුල්ල පූජනීය ප්‍රදේශය පිළිබඳ අවධානය යොමු වූ කණ්ඩායම් සාකච්ඡාවක (FGD) දී මෙන් පූජනීය ප්‍රදේශ පිහිටුවීම නිසා ද පැන නගින වඩාත් පොදු ඉල්ලුම වූයේ ප්‍රතිස්ථාපනය යි. කලින් සඳහන් කළ පරිදි එල්ටීටීඊය විසින් ඉවත් කරන ලද උතුරේ මුස්ලිම්වරුන් මෙන් ම නිශ්චිත අවශ්‍යතා ඇති සමහර කණ්ඩායම් ද ඇතුළු ව සමහර විශේෂිත කණ්ඩායම් ද (නිදසුනක් වශයෙන්, කාන්තා සංවිධාන සමූහයක් විසින් කෘෂිකාර්මික වශයෙන් ශක්‍යතාවයෙන් යුත් ඉඩම් සඳහා වන්දි ගෙවීම සමඟ ජීවනෝපාය මත යැපෙන අයට ආපසු ලබා දීමේ වැදගත්කම පෙන්වා දුන්නේ ය) ඉස්මතු විය. දෙමළ හා මුස්ලිම් පැමිණිලි වාර්තාවේ ආධිපත්‍යය දරන බවට ඇති ජනප්‍රිය මතයට පටහැනිව, නැති වූ ඉඩම් සඳහා වන්දි ගෙවන ලෙස ඉල්ලා සිටි නැගෙනහිර පළාතේ සිට උතුරු මැද පළාත දක්වා අවතැන් වූ සිංහල ප්‍රජාව සම්බන්ධයෙන් ද සිංහල කණ්ඩායම් විසින් පැමිණිලි සහ සැළකිලිමත්වීම් මතු කළහ (145).

සිවිල් සමාජ සංවිධාන විසින් වහා ම පෙන්වාදෙනු ලැබුවේ මෙම නැවත පදිංචි කරවීමේ හා ප්‍රතිස්ථාපනයේ ක්‍රියාපටිපාටිය විසින් රට පුරා ඉඩම් නොමැති පුද්ගලයින්ගේ අවශ්‍යතා සහ විශේෂිත අවදානම් ද සලකා බැලීමට අවශ්‍ය බවයි. ඉදිරිපත් කිරීම් මගින් පෙන්වා දුන් පරිදි රාජ්‍ය, ආයතනික හා සමාජීය මට්ටමේ බොහෝ වැරදි ක්‍රියාමාර්ග නිසා ශ්‍රී ලංකාව දිගින් දිගටම පීඩාවට පත්වෙමින් සිටින අතර මැදිහත් වීමක් අවශ්‍ය වේ. එක් එක් සිද්ධිය අනුව පිළිතුරු ලබා දීමේ ප්‍රවේශයක් අනුග මනය කරන්නේ නම් ප්‍රජාවන් අතර වෙනස්කම් කොට සැළකීමේ අන්තරායන් හේතුවෙන් ඇතිවන ඉඩම් බෙදාහැරීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයක අවශ්‍යතාව ද ජාත්‍යන්තර සංවිධානයක් විසින් ඉදිරිපත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම ඇතුළු ව උදාහරණයක් ලෙස පළාත් වල ඉඩම් පරිපාලනයට දුරදිග යන බලපෑමක් ඇති කරනු ඇති ඉඩම් බලතල බෙදා හැරීම පිළිබඳ ව සාකච්ඡා කෙරිණි. මෙය ආරක්ෂක හේතුන් මත ප්‍රදේශය තවදුරටත් අවශ්‍ය නොවූ විට මෙම ඉඩම් එහි හිමිකරුවන්ට ආපසු ලබා දෙන බවට නිරන්තරයෙන් පොරොන්දු වී තිබිය දී ත්, මිලිටරිය විසින් ඉඩම් අත්පත් කර ගෙන ඇති බැවින් රට පුරා, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල හමුදාව ඉවත් කිරීම මගින් ඉඩම් ගැටලු විසඳනු ඇත.

3.2.2 වගන්තිය මගින් මිලිටරීකරණයේ ගැටලු කෙරෙහි අවධානය යොමු කර ඇති අතර හමුදාව සිටීම පිළිබඳ ව සංයුක්ත උදාහරණ මතු කළේ ය; "ඉඩම් අල්ලාගෙන සිටීම වඩාත් පැහැදිලි ව පෙනෙන පරිදි අයිතිවාසිකම් ලබාදීම සහ තත්වය යථා තත්වයට පත් කිරීම වළක්වයි" (33) එසේ ම කෙපපිලාවි, මුලතිව් සහ කෝකිලායි ඇතුළු නිශ්චිත ප්‍රදේශවල කණ්ඩායම් උපුටා දක්වමින්, අන්තර් වාර්ගික ඉඩම් ආරවුල් සහ ජනපදකරණය සඳහා මිලිටරිය මැදිහත්වීම, මිලිටරිය විසින් තමන්ගේ ම වාණිජ අරමුණු සඳහා පුද්ගලික ඉඩම් පරිහරණය කිරීම පිළිබඳ ව සඳහන් නොකිරීම, දේශීය ජීවනෝපායන් හා ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් කෙරෙහි විනාශකාරී වන බව පෙන්නුම් කළේ ය (297-300). යුක්තිය ඉටුවන්නේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ව්‍යුහමය පරිවර්තනයේ ක්‍රියාවලියක් ආරම්භ කරනු ලබන - දිගු කාලීන, මූලික වෙනස්කම් සිදුවන පරිවර්තනීය යුක්තිය හරහා පමණි (316).

3.6 වගන්තිය මගින් නැවත පදිංචි කරන ලද වාසස්ථාන සඳහා නිල හිමිකාරිත්ව අයිතිවාසිකම් නොමැති ව අවතැන්වූවන් ඔවුන්ගේ නව නිවාසවල ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනගා ගැනීමට උත්සහ කිරීම ඇතුළු ව වෙනත් තැන්වල ආවරණය නොවූ ඉඩම් ගැටලු (උදා.3.2.2), පිළිබඳ ව අවධානය යොමු කර තිබේ (109); මිලිටරි නොවන ආයතන සමග වන ඉඩම් ආරවුල් (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පූජනීය ප්‍රදේශ ඇතුළු ව) (111); සහ දකුණේ ප්‍රජාවන් රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ඉඩම් නොමැති අය බවට පත් කිරීම නිදසුනක් වශයෙන්, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සාධාරණ වන්දි ලබා නොදී ඉඩම් අත්පත් කර ගැනීම (112) ඇතුළු ව 3.6 වගන්තිය මගින් වෙනත් තැනකින් ආවරණය නොවූ ඉඩම් ගැටලු (උදා. 3.2.2) ආවරණය කෙරේ.

කෙසේ වෙතත්, රට පුරා වෙසෙන ප්‍රජාවන් තුළ මෙම විශාල අරගලයන් හි සන්දර්භය තුළ, තම ජීවනෝපායන් සහ යම් මට්ටමක සාමාන්‍ය තත්වයක් ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය අකර්මන්‍යතාවයට හා දූෂිත නිලධරයේ මට්ටම්වලට එරෙහි ව සටන් කළ නිර්භීතව තම ගැටලු මතු කිරීමට උත්සහ කළ නිශ්චිත ප්‍රජාවන්ගේ උදාහරණ මගින් මෙම ප්‍රබල කාරණා සමහරක් වඩාත් පැහැදිලි ව විස්තර කර තිබේ. කලාපීය කාර්ය සාධක බලකායේ (ZTF) වාර්තාව තුළ මෙම දුක්ගැනවිලි සඳහා බොහෝ උදාහරණ අඩංගු වේ.



# ඇමිණුම 2

## සිද්ධි අධ්‍යයන




# කේප්පාපිලවු

**(මහජන ඉඩම් කොමිෂන් සභා විභාගයන් හි දී සහ සිවිල් සමාජ සංවිධානවල වාර්තා මගින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව සකස් කර තිබේ)**

- **ස්ථානය** — කෙප්පපිලාවු ග්‍රාම නිලධාරී කොට්ඨාශය, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මුලතිව් දිස්ත්‍රික්කය
- **බලපෑමට ලක් වූ පවුල් / පුද්ගලයින් ගණන** — පවුල් 104 (2020 අප්‍රේල් වන විට
- **ආරවුලට භාජනය වූ ඉඩමේ ප්‍රමාණය** — 2009 දී ආසන්න වශයෙන් අක්කර 520 ක් පමණ හමුදාව විසින් පවරා ගන්නා ලදී.

  2020 අප්‍රේල් වන විට අක්කර 171 ක් හමුදාව පදිංචි වී සිටියි
- **ඉඩම් ආරවුල ආරම්භ වූ වර්ෂය** — 2009

2009 දී, යුද්ධයේ අවසාන අදියරවල දී, ශ්‍රී ලංකා හමුදාව විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ සූරිපුරම්, සීනියාමොට්ටායි, කෙප්පපිලාවු සහ පිලකුඩිරුප්පු යන ගම්මානවල පදිංචිකරුවන් බලහත්කාරයෙන් ඉවත් කළහ. පවුල් වවුනියාවේ මැණික් ෆාම් කඳවුරට ගෙන යන ලදී.

පවරා ගත් ඉඩම (අක්කර 171) තුළ - මුලතිව් කෙප්පපිලාවු රාජ්‍ය දෙමළ භාෂා පාසැලක්, දේවස්ථානයක්, බහුකාර්ය සමුපකාර සමිතියක්, පෙරපාසලක්, ප්‍රජා ශාලාවක්, පොදු ළිං පහක්, ක්‍රීඩා පිටියක්, ක්‍රිස්තියානි සුසාන භූමියක් සහ හින්දු සුසාන භූමියක් තිබුණි. ඉඩම පවරා ගැනීමෙන් පසු මුලතිව් ආරක්ෂක හමුදා මූලස්ථානය, ගුවන් හමුදා මූලස්ථානයක් සහ වෙනත් කඳවුරු එහි ඉදි කරන ලදී.

නෙරපා හරින ලද පවුල් අතරින් කිහිපයක් 'මහාවීර' පවුල් ලෙස හඳුනා ගනී. එල්ටීටීඊය විසින් මෙම පවුල් මෙම භූමියට ගෙන එන ලද්දේ එම පවුල්වල සාමාජිකයන් සටනේ දී ඝාතනය වීමෙන් පසුව ය. සෙසු පවුල් වසර 100 කට වැඩි කාලයක් ප්‍රදේශයේ ජීවත් වූ ඉඩමේ මුල් පදිංචිකරුවන් ලෙස හඳුනා ගනී.

2010 දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉඩමේ මුල් පදිංචිකරුවන් කැඳවා ඇති අතර ඔහු පවසා ඇත්තේ ඉඩම මහාවීර පවුල් සඳහා ලබා දීමට නියමිත ව තිබූ බවයි. පදිංචිකරුවන් තමන් විසින් රැගෙන ගිය ඔප්පු 60 ක් සහ බලපත්‍ර 20 ක් මගින් එම ඉඩම් තමන් ට හිමි බව ප්‍රකාශ කොට තිබේ. එමගින්, මෙම ඉඩම ජනතාව වෙනුවෙන් වෙන් ව තිබෙන බව ට ඔවුන් ට ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලැබුන ද ඉන්පසුව, කිසිවක් සිදු වී නැත. 2011 දී පදිංචිකරුවන් විසින් උසාවියට අභියාචනයක් ඉදිරිපත් කර තිබේ.

2012 දී මැණික් ෆාම් කඳවුර වසා දමා ඉතා ඉක්මනින් ජනතාව වෙනත් ස්ථානයක පදිංචිකර තිබේ. 2012 සැප්තැම්බර් දක්වා අවතැන් ව සිටි මෙම ගම්වැසියන් ගෙන් පවුල් 150 ක් පමණ 'කෙප්පපිලාවු ආදර්ශ ගම්මානයේ' නැවත ස්ථානගත කර තිබේ. මෙය ඔවුන්ගේ මුල් ගම්මානවලට යාබදව පිහිටි සූරිපුරම් නමින් හැඳින්වෙන ප්‍රදේශයක රජය විසින් ඉදිකරන ලද නිවාස යෝජනා ක්‍රමයකි. එය එළිපෙහෙළි කළ ඉඩමක් නොවූ අතර, කොහේදැයි නොදන්නා තැනක් යැයි තමන්ට දැණුනු බව, ඒ පිළිබඳ ව ජනතාව විස්තර කර තිබේ. එම 'අතහැර දැමූවන්ට' ඉඳුම් හිටුම් සකසා ගැනීමට කිසිදු සහයක් ලබා දී නැත. බලධාරීන්ගේ කිසිදු සහයක් නොමැති ව, ජනතාව කලින් අවතැන් ව සිටි මැණික් ෆාම් කඳවුරේ සිට ගෙන ආ අබලි ද්‍රව්‍යවලින් ඔවුහු පැල්පත් තනා ගත්හ. පවුල් 150ක් සඳහා තම නව ඉඩම් භාර ගැනීමේ පෝරමයකට අත්සන් කරන ලෙස මුලතිව් දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලා සිටින ලදී.

2013 ජනවාරි මාසයේ දී තවත් පවුල් 146 ක් සූරිපුරම් හි පදිංචි වී තිබේ. ඔවුන් ප්‍රදේශයේ සත්කාරක පවුල් සහ ඥාතීන් සමඟ නැවතී සිටිය හ. 2013 මාර්තු මාසයේ දී පවුල් 16කට සීනියාමොට්ටයි හි පිහිටි තම මුල් ඉඩම් වෙත ආපසු යාමට අවසරය ලැබුණි.

2017 ජනවාරි 30 වන දින රජය ප්‍රකාශ කළේ ඉතිරි ඉඩම නිදහස් කරන බවයි. කෙසේ වෙතත්,

මෙම නිදහස් කිරීම සිදු නොවූ හෙයින්, කෙප්පපිලාවි හි පවුල් 138 ක් සහ පිලකුඩිරුප්පු ගම්වැසියන් ඔවුන්ගේ ඉඩම්වලට පිවිසෙන දොරටුව ද වූ ආරක්ෂක හමුදා මූලස්ථානයේ දොරටුවෙන් පිටත, වාඩි වී සිටීමේ විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළහ. මෙම පවුල් විසින් ඉල්ලා සිටියේ ඔවුන්ගේ ප්‍රජා ගොඩනැගිලි සමග අක්කර 482 ක් වූ ඉඩම නිදහස් කරන ලෙසයි.

2017 අප්‍රේල් මාසයේ දී දෙමළ දේශපාලනඥයන් සමග විරෝධතා නායකයින් හමුදාව හමුවී අක්කර 100 ක් නිදහස් කරන බවට වූ වාචික එකඟතාවකට පැමිණියහ. නිදහස් කිරීමේ දිනය නැවත වරක් කල් යන ලදි.

2017 අගෝස්තු මාසයේ දී හමුදාව විසින් කෙප්පපිලාවු හි අත්පත් කරගත් ඉඩම් වලින් අක්කර 243 ක් ඒවායේ මුල් අයිතිකරුවන්ට නිදහස් කරන ලදී. මුදා හැරීමට නියමිත අක්කර 111 ක භූමි භාගයේ පිහිටි හමුදා ගොඩනැගිලි සහ උපකරණ වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා යුද හමුදාපති වෙත රුපියල් මිලියන 148 ක් ලබා දීම වෙනුවෙන් තම අමාත්‍යාංශයට කැබිනට් අනුමැතිය ලැබුණු බව එවකට නැවත පදිංචි කිරීමේ අමාත්‍ය ඩී. එම්. ස්වාමිනාදන් විසින් එම මස අග දී ජනතාවට පැවසුවේ ය. ඔවුන්ගේ නැවත පදිංචි කිරීම සඳහා වෙන්කළ යුතු රුපියල් මිලියන 148 ක් ජනතාවගේ ඉඩම් නැවත ජනතාවට ලබා දීම සඳහා හමුදාවට තෑගි කරන්නේ මන්දැයි ජනතාව ප්‍රශ්න කළහ.

2018 ජුනි මාසයේ දී ආසන්නව අක්කර 60 ක් පමණ භූමි ප්‍රමාණයක් කෙප්පපිලාවු වලින් ලබා ගැනීම වෙනුවෙන් නීත්‍යානුකූල ව අත්පත් කර ගැනීම සඳහා සහ ඔවුන්ගේ ඉඩම් සඳහා වන්දි ගෙවීමට ඇති හැකියාව පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා කරයිතුරයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෞද්ගලික ඉඩම් හිමිකරුවන් 55 දෙනෙකු සමග රැස්වීමක් පවත්වන ලදි. මෙම පවුල් වලින් බහුතරයක් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඔවුන්ගේ ඉඩම්වලට නැවතත් යාම වෙනුවෙන් වූ තම ඉල්ලීම දිගටම පවත්වා ගෙන ගිය ද, පවුල් පහක් පමණක් මූල්‍ය වන්දි ලබා ගැනීමට එකඟ විය. ඉතිරි පවුල් තම ඉඩම් ආපසු ලබා ගැනීම වෙනුවෙන් දිගින් දිගට ම විරෝධය පළ කරමින් සිටිති.

ජනවාරි 26 වන දින, කෙප්පපිලාවු ගම්වාසීන් ප්‍රධාන වශයෙන් කාන්තාවන් විසින් තම ඉඩම් නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීමට එරෙහි විරෝධතාවයේ කොටසක් ලෙස හමුදාව අත්පත්කරගෙන සිටින තම ඉඩම් වෙත කිලෝමීටර් දෙකක් පමණ පා ගමනක යෙදුන හ. ඔවුන් හමුදා කඳවුරේ ප්‍රධාන දොරටුව දෙසට ගමන් කරන විට ඔවුන් ට පොලිස් නිලධාරීන් 45 ක් දෙනෙකු සහ අව ම වශයෙන් පොලිස් වාහන පහක් පමණ (බස් රථයක්, ලොරි රථයක්, ජීප් රථයක් සහ මෝටර් රථයක් ඇතුළු ව) කඳවුරේ දොරටුවලින් පිටත නවතා තිබෙනු හමු විය. කඳවුරේ ගේට්ටුව ඉදිරිපිට රැස් වී සිටීමට හිතාමතා ම බාධා කිරීම වෙනුවෙන් නවතා තිබූ පොලිස් වාහන ඉදිරිපිට සිටගෙන සිටි මෙම කාන්තාවන් කණ්ඩායමට තව තවත් අවතැන් වූ ගම්වැසියන් ඉක්මණින් එකතු විය. තම ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් බලධාරීන්ගෙන් නිශ්චිත හා ලිඛිත සහතිකයක් ලැබෙන තෙක් කඳවුරේ ගේට්ටුව ඉදිරිපිට හිඳීමට විරෝධතාකරුවන් විසින් අදහස් කළහ. ජනවාරි 27 වන දින ලැබුණු අධිකරණ නියෝගයකින් කියැවුණේ විරෝධතා ස්ථානය සහ හමුදා කඳවුරු පරිශ්‍රය අතර මීටර් 75 ක දුරක් විරෝධතාකරුවන් විසින් පවත්වා ගෙන යා යුතු බවයි.

මීට වසර 10 කට පෙර අහිමි වූ ඉඩම් ආපසු ලබා ගැනීම වෙනුවෙන් මෙම පවුල් තවදුරටත් විරෝධය පළ කරමින් සිටිති. ඔවුන් සමග අර්ථවත් එකඟතාවක් ඇති කර ගැනීමට රජය අසමත් වී ඇති අතර ඔවුන්ගේ අනාගතය පිළිබඳ නිශ්චිතභාවයක් නැත. ප්‍රධාන වශයෙන් මෙම විරෝධතාකරුවන් කාන්තාවන් වේ. ඔවුන් එම දේශපාලන කටයුත්ත වටා තම දිනය සංවිධානය කරගෙන ඇති අතර, එයින් ඔවුන්ගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇතත්, හමුදා කඳවුරේ දොරටුවට ආසන්නයේ වූ මඩුවක ඔවුන් තම විරෝධතාවය දිගටම කරගෙන යමින් සිටියි. දැඩි රස්නය සහ අධික මෝසම් වැසි සහ වියළි කලාපයේ සමහර විට ඇති වන තද සීතල රාත්‍රීන් පුරා විරෝධතා මඩුවේ වාඩි වී සිටින්නේ ඔවුන් ය. වැටුප් සහිත ශ්‍රමය මෙන් ම වැටුප් නැති සියලුම රැකවරණ කටයුතු ද ඇතුළු ව ඔවුන්ගේ දින මෙම දේශපාලන ක්‍රියාමාර්ගය වටා සංවිධානය වී තිබේ. එය ඔවුන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්මට විශාල බලපෑමක් ඇති කර තිබේ.



# උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය

**(මූලික වශයෙන් ප්‍රජා සාමාජිකයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මත පදනම් වූ සිවිල් සමාජ වාර්තා අනුව සකස් කර තිබේ)**

- **ස්ථානය** බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙළ, හාලි-ඇළ, වැලිමඩ, ඌව පරණගම සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය
- **බලපෑමට ලක් වූ පවුල් / පුද්ගලයින් ගණන** දළ වශයෙන් පවුල් 7500 කට වැඩි ගණනක් (2020 අප්‍රේල් වන විට)
- **ආරවුලට භාජනය වූ ඉඩමේ ප්‍රමාණය** දළ වශයෙන් ගොවි බිම් අක්කර 2,200ක් ඍජුව බලපෑමට ලක් වී තිබේ

  දළ වශයෙන් නිවාස 7100 ක් සම්පූර්ණ හෝ අර්ධ හානියක් වාර්තා කරයි

  දළ වශයෙන් ළිං 3090 ක් වියළී ගොස් ඇත

  දළ වශයෙන් ස්වාභාවික ජල ප්‍රභවයන් 45
- **ඉඩම් ආරවුල ආරම්භ වූ වර්ෂය** 2008 සිට මේ දක්වා

උමා ඔය ව්‍යාපෘතියට 1950 දශකය තරම් ඈත ඉතිහාසයක් තිබේ. වරින් වර විවිධ යෝජනා ප්‍රධාන වශයෙන් අරමුදල් හෝ පාරිසරික ගැටළු හේතුවෙන් අතහැර දමා තිබේ.

1991 දී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය (CECB) ශ්‍රී ලංකාවේ දකුණු දෙසට ජලය හරවා යැවීමට යෝජනා කරමින් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ අතර එය ජනතාවගේ ජල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බැවින් ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීමට ලක්විය. එය 2000 දී නැවත යෝජනා කරනු ලැබූ අතර 2008 දී උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉරාන රජය විසින් අරමුදල් සපයන ලදී. ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ඉරාන ඉදිකිරීම් සමාගමක් වන ෆාරාබ් වෙත ප්‍රදානය කිරීම සිදු විය. මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රධාන වශයෙන් ම ජල විදුලිය ඉහළ නැංවීම සහ හම්බන්තොට වියළි කලාපයේ වාරිමාර්ග ධාරිතාව ඉහළ නැංවීම සිදුකරන බව පැවසුනි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය මගින් මත්තල ගුවන්තොටුපළ, හම්බන්තොට කාර්මික කලාපය සහ හම්බන්තොට වරාය සහ තෙල් පිරිපහදුව සඳහා ජලය ලබා දීමට ප්‍රමුඛතාව ලබාදෙනු ඇතැයි කනස්සල්ල පළ වී තිබේ.

මෙම ව්‍යාපෘතියට අදාළ විවිධ ඉදිකිරීම් සඳහා අක්කර 5022 ක් පමණ වැලිමඩ, ඌව පරණගම, ඇල්ල, හාලි ඇල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශවලින් රජය අත්පත් කර ගෙන තිබේ. මුළු ඉදිකිරීම් වියදම රුපියල් මිලියන 60,842 ක් වන අතර එයින් 85% ක් වසර 20ක ණයක් ලෙස ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් අරමුදල් සැපයීමට නියමිත ය. ඉතිරි ඉදිකිරීම් පිරිවැයෙන් 15% ක් සහ ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, පාරිසරික හානි අව ම කිරීම, වාරිමාර්ග ජාලය යථා තත්ත්වයට පත් කිරීම, ව්‍යාපෘති කළමනාකරණය සහ උපදේශනය සඳහා අතිරේක ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 15,475 ක් ශ්‍රී ලංකාව විසින් ලබා දීමට නියමිත ය.

මෙම ව්‍යාපෘතිය කෙරෙහි පීඩාවට පත් වූවන්ගෙන් සහ විශේෂඥයින්ගෙන් මුල සිට ම විශාල විරෝධයක් එල්ල විය. මෙම ව්‍යාපෘතිය 2008 අප්‍රේල් මාසයේ දී ආරම්භ කරන ලද අතර, 2008 ජූලි මාසයේ දී පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලද අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලද පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (වෙළුම් 3 කින් යුත්) 2010 දෙසැම්බර් මාසයේ දී දින 30 ක් මහජන අදහස් සඳහා ලබාගත හැකි පරිදි ඉදිරිපත් කරන ලදි. මෙම පාරිසරික බලපෑම් තක්සේරුව වෙත වැඩි ම මහජන ඉදිරිපත් කිරීම් සංඛ්‍යාවක් ලැබී ඇතැයි විශ්වාස කෙරේ. පාරිසරික සංවිධාන, ගොවි සංගම්, ප්‍රජා කණ්ඩායම් සහ බලපෑමට ලක් වූ පුද්ගලයින් විසින් විරෝධතා ඉදිරිපත් කරන ලදී. මධ්‍යම පරිසර

අධිකාරිය 2012 විසින් අප්‍රේල් මාසයේ දී මෙම වාර්තාව කොන්දේසි සහිත ව අනුමත කරනු ලැබීය. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මගින් පස අස්ථාවර වීම, භූගත ජලය කෙරෙහි ඇති බලපෑම සහ ජල ප්‍රභවයන් කෙරෙහි ඇති කරවන බලපෑම පිළිබඳ ව ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වී ඇති අතර පාංශු ඛාදනය, සිදුවිය හැකි නායයෑම් සහ භූගත ජලය ක්ෂය වීම සඳහා භූගත උමං මාර්ගවල බලපෑම පිළිබඳ ව ද සඳහන් කිරීමට අපොහොසත් වී තිබේ. 2017 දී පැවති මාධ්‍ය සාකච්ඡාවක දී වාර්තා වූ පරිදි මාධ්‍ය තුළ විශේෂඥ මණ්ඩලය වැඩි වැඩියෙන් විවේචනවලට ලක් වූ පසුව ඉදිකිරීම් අදියරේ දී ජල ස්ථරය පහළ බැසිය හැකි බව පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව විසින් පෙන්වා දී ඇති බවත්, භූගත ජල උච්චාවචනයන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් අධීක්ෂණය කළ යුතු බවත් ආරක්ෂාව සහ හදිසි ක්‍රියාමාර්ග සහ අධීක්ෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශයට පවරා ඇති බවත් පෙන්වා දෙන ලදි.

මෙම ව්‍යාපෘතිය අනුමත කරන ලද කැබිනට් සංදේශයේ සඳහන් වන්නේ 1995 ජුනි 15 දිනට පෙර රජයේ ඉඩම්වල පදිංචි ව සිටි අය, කුලී නිවාසවල ජීවත් වූ අය, කුලී ගෙවන ගොවීන් සහ අනුබද්ධ පවුල් යන සියල්ලන්ට ම නිවසක් සහ ඉඩමක් සඳහා වන්දි ලැබිය යුතු බවයි. මෙම යෝජනා ක්‍රමය සාර්ථක ව ක්‍රියාත්මක කර නොමැති අතර ව්‍යාපෘතිය සඳහා ඉඩම් ලබා දුන් සහ ඒ සඳහා කිසිදු වන්දි මුදලක් නොලැබූ අයගෙන් ඒ පිළිබඳ ව පැමිණිලි තිබේ. අස්වැන්න කන්න 12 ක් අහිමි වුව ද 2013 දී අහිමි වූ ඉඩම්වලට වන්දි ලබා දී ඇත්තේ එක් අස්වැන්නක් සඳහා පමණි. විකල්ප ගොවිබිම් ලබා නොදුන් ගොවිබිම් තිබූ පුද්ගලයින් සහ නව නිවහනක් තැනීමට නොහැකි තේ වතු ලෙස භාවිත කළ දැඩි පල්ලම් සහිත ස්ථානවල නැවත පදිංචි කර ඇති අය ද සිටිති. 2016 දී ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් අයිතිය පිළිබඳ ව ප්‍රශ්න ඇති පීඩාවට පත් පවුල්වලට දැනුම් දී ඇත්තේ ඔවුන් වෙනුවෙන් වෙන් කර ඇති වන්දි මුදල අධිකරණයට ඉදිරිපත් කරන බවයි. කෙසේ වෙතත්, එය ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ ව වැඩිදුර තොරතුරු ජනතාවට ලබා දී තිබුණේ නැත. එපමණක් නොව, හිමිකාරිත්වය පිළිබඳ සාක්ෂි තිබුණ ද සමහර පුද්ගලයින්ට වන්දි ගෙවීම, පෞද්ගලික සතුරුකම හේතුවෙන් නිලධාරීන් විසින් ප්‍රමාද කර තිබේ. වන්දි ප්‍රදානය කිරීමේ දී සහ තක්සේරු කිරීමේ දී විෂමතාවන් අත්විඳ තිබේ. සමහර ව්‍යාපාරිකයින්ට මිලියන ගණනින් වන්දි ලැබී ඇති අතර ගොවීන්ට ලැබී ඇත්තේ ඉතා අඩු මුදලකි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටළු විසඳීම, අක්‍රමිකතා විමර්ශනය කිරීම සහ යුක්තිය සහතික කිරීම සඳහා ස්වාධීන කමිටුවක් වෙනුවෙන් දැඩි හා හදිසි ඉල්ලීමක් තිබේ.

කාන්දුවීම් ව්‍යාපෘතියේ බරපතල ගැටළුවක් වී තිබේ. 2015 දී කාන්දුවක් වාර්තා වූ අතර 2019 අප්‍රේල් මාසයේ දී මෙම කාන්දුව නිසා විනාඩියකට ජලය ලීටර් 800 ක් අහිමි වූ බව වාර්තා විය. කෘෂිකර්මාන්තයට අත්‍යවශ්‍ය ජල ප්‍රභවයන් සහ කුඩා ගම්මාන විසින් භාවිත කරන ජල ප්‍රභවයන් කාන්දුවීම් හේතුවෙන් වියළී ගොස් තිබේ. ළිං සිය ගණනක් වියළී ගොස් ඇති අතර කුඩා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සපයන ජලයට හානි වී ඇති බැවින් කෘෂිකාර්මික ඉඩම් අක්කර දහස් ගණනක් භාවිතයට නුසුදුසු වී තිබේ. ජනතාව අත්විඳින ජල හිඟයට වන්දි ගෙවීම වෙනුවෙන් ආධාර බෙදා දෙන ලදී. ආධාර පිළිබඳ චෝදනාවක් වූයේ ඒවා ලබා දී ඇත්තේ එක් ගොවි කන්නයක් සඳහා පමණක් වන බවත්, බලපෑමට ලක්වූවන්ගෙන් සුළු පිරිසකට පමණක් බවත් ය. දූෂිත ජල ප්‍රභවයන් අසල නැවත පදිංචි කළ අය සඳහා ජල පිරිසිදු කිරීමේ ක්‍රියාමාර්ග ලබා දී නැත. මේ දක්වා පානීය ජලය ක්‍රමානුකූල ව බෙදා හැරීමක් නැත. පීඩාවට පත් ප්‍රජාවන්හි කාන්තාවන් තම නිවෙස් සඳහා ජලය ලබා ගැනීම වෙනුවෙන් දුර ගමන් සඳහා අමතර බරක් දරති.

කැනීම් නිසා ද පොළොව අස්ථාවර වී ඇති අතර එමගින් ගොඩනැගිලි දහස් ගණනකට හානි සිදු වී තිබේ. පවුල් 7500 කට අධික සංඛ්‍යාවක් මෙම ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ව ඇති බව වාර්තා වේ. නිවාස 7100 ක් පදිංචි වී සිටීමට නොහැකි තත්වයට පත් වී තිබේ. බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස 42 ක් සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස 15 ක් මුළුමනින් ම විනාශ වී තිබේ. නිවාස මුළුමනින් ම විනාශ වූ අයට කුලී ලෙස භාවිත කිරීම සඳහා මූල්‍යාධාර ලබා

දී ඇතත්, ව්‍යාපෘතියෙන් පීඩාවට පත් වූ බොහෝ දෙනෙකු ට කිසිදු ආකාරයකින් වන්දි ලබා දී නැත. දහස් සංඛ්‍යාත ජනතාවක් තම නිවාසවලට සිදු වූ හානිය වෙනුවෙන් වන්දි ඉල්ලා සිටිති. කිහිප දෙනෙකුට වන්දි ලැබී ඇති බව පෙනී යන අතර ඒ සඳහා දේශපාලන හා වෙනත් සම්බන්ධතා උපකාර වී ඇති බව විශ්වාස කෙරේ.

පීඩාවට පත් වූවන් දහස් ගණනක් විසින් විරෝධතා දැක්වීමකින් පසුව එවකට ජනාධිපති සිරිසේන මහතා සමග සිදු කළ රැස්වීමකට අනුව 2017 ජුනි 27 වන දින ව්‍යාපෘතිය නවතා දමා උමං මාර්ග ඉදිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිවැසියන් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ ව සොයා බලා වාර්තා කිරීම වෙනුවෙන් කැබිනට් මණ්ඩලය අමාත්‍ය අනු කමිටුවක් පත් කළේ ය. කමිටුවේ වාර්තාව 2017 ජූලි 18 දින ඉදිරිපත් කරන ලදී. පානීය ජලය බෙදා හැරීම, නිවාස, පාසල්, පන්සල් ඇතුළු වෙනත් ස්ථාන ඉරිතැලීම් ඇති ස්ථාන පිළිබඳ තොරතුරු, නැවත පදිංචි කරවීම, වන්දි ගෙවීම සහ ජනතාව නැවත පදිංචි කරවීම සඳහා ක්‍රේග් වතුයායෙන් අක්කර 50 ක ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා වූ නිර්දේශයන් වාර්තාවට ඇතුළත් විය.

මිනිසුන්ගේ ජීවනෝපායන්, ජනතාවගේ නිවාස, පෞද්ගලික මූල්‍ය තත්වය, සෞඛ්‍ය හා යහපැවැත්ම කෙරෙහි ඇති අවදානම් හේතුවෙන් ජීවන රටාවේ වෙනස්වීම්, ජලය සඳහා ප්‍රවේශය සහ ඔවුන්ගේ පවුල් සඳහා සුරක්ෂිත හා සමෘද්ධිමත් අනාගතය සහතික කිරීමේ දුෂ්කරතා නිසා බොහෝ මට්ටම්වල දී පුළුල් ලෙස විනාශකාරී බලපෑමක් ඇති වී තිබේ. කලාපයේ අනාගත සැලසුම් කෙරෙහි ප්‍රතිවිපාක ගෙන දෙන සැලකිය යුතු පාරිසරික බලපෑමක් ද තිබේ. පීඩාවට පත් ජනතාව සහන, ප්‍රමාණවත් වන්දි, ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් සහ යුක්තිය බලාපොරොත්තුවෙන් සිටිති.





# බාරන්ද වතුයාය

**(මහජන ඉඩම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද විභාගයේ දී ලැබුණු තොරතුරු අනුව සකස් කර තිබේ)**

- **ස්ථානය** — මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඩියන්ලෙන
- **බලපෑමට ලක් වූ පවුල් / පුද්ගලයින් ගණන** — පවුල් 139
- **ආරවුලට භාජනය වූ ඉඩමේ ප්‍රමාණය** — අක්කර 100
- **ඉඩම් ආරවුල ආරම්භ වූ වර්ෂය** — 2012

ඉලේපෙරුම පවුල කියා සිටින පරිදි ඔවුන් 2006 දී තේ වතුයායේ අක්කර 100 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් රු. 384,982.36 කට මිල දී ගෙන තිබේ. එවකට ඉඩම මිල දී ගත් බව පවසන අවස්ථාවේ දී දළ වශයෙන් ලයින් කාමර 100 ක නිවාස, ඔවුන්ගේ මාසික වැටුපෙන් අඩු කිරීම් සිදු කරනු ලබන වැවිලි මානව සංවර්ධන භාරයේ ණය ආධාරයෙන් ඉදිකරන ලද නිවාස 25 කින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයක්, කෝවිලක්, සමුපකාරයක් (සමුපකාර සමිතිය) සහ ක්‍රීඩා පිටියක් වත්තේ තිබුණි. මෙම වතුයායේ පාසල් යන වයසේ දරුවන් 450 ක් ද ඇතුළු ව පුද්ගලයන් 756 කින් සමන් විත පවුල් 115 ක් සිටී. අවුරුදු 150 කට ආසන්න කාලයක් තිස්සේ ඔවුන් මෙම භූමියේ ජීවත් වන බව එම පවුල් කියා සිටිති.

ඉලේපෙරුමවරුන් විසින් 2006 දී පමණ උසාවියේ නඩුවක් ගොනු කර ඇති බවත්, පීඩාවට පත් පවුල් පදිංචි ව සිටින ඉඩම තමන් සන්තකයේ ඇති බව පෙනෙන ඇති ඉඩම පිළිබඳ නඩුව ඔවුන් ජයගෙන ඇති බවත් පසු ව පීඩාවට පත් පවුල් වලට 2012 දී දැනගන්නට ලැබුණි. විපතට පත් පවුල් මෙම නඩුවේ පාර්ශවකරුවෙකු බවට පත් කර නොතිබූ අතර අධිකරණ නඩුව පිළිබඳ ව ඔවුන්ට දැනුම් දී නොතිබුණි. මෙම නඩුවේ පාර්ශවකරුවන් වන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, පීඩාවට පත් කුටුම්භවල සේවායෝජකයා වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) සහ ඉලේපෙරුම පවුල බව ඔවුහු දැන ගනිති. උසාවියට ඉදිරිපත් කරන ලද ලිපිවල ඉලප්පෙරුම පවුල විසින් ප්‍රකාශ කර ඇත්තේ වතුයායේ පවුල් 8 ක් සිටින නිවාස 5 ක් පමණක් සිටින බව යැයි ඔවුන් දැන ගනිති.

පවුල් විසින් නඩුව පිළිබඳ ව දැනගනු ලැබුවේ 2012 දී ග්‍රාම නිලධාරී, ෆිස්කල් නිලධාරී සහ රජයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නියෝජනය කරන නිලධාරියෙකු උසාවියෙන් සහතික කරන ලද නිවැසියන් ඉවත් ව යා යුතු යැයි යැයි කියනු ලබන ෆිස්කල් නිවේදනයක් සමඟ වතුයායට පැමිණි විට දී ය. පීඩාවට පත් පදිංචිකරුවන් 86 දෙනෙකු විසින් ඉලප්පෙරුම පවුල ට එරෙහි ව නඩු පවරා ඇති නමුත් කලින් අධිකරණ නියෝගය සමාලෝචනය කළ නොහැකි බව ඔවුන් ට දන්වන ලදී. මෙම තීරණය ලබා දී ඇත්තේ 2019 අගෝස්තු මාසයේ දී නඩුව ගොනු කර වසර 5 කට පසුව වන අතර ඒ වන විට විත්තිකරුවන් 4 දෙනෙකු අභාවප්‍රාප්ත වී තිබුණි. පීඩාවට පත් පවුල් ද ඉලප්පෙරුම පවුල සමඟ මේ කාරණය පැහැදිලි කිරීමට හා සාකච්ඡා කිරීමට උත්සහ කර ඇති නමුත් ඔවුන් ට හමුවීමක් ප්‍රතික්ෂේප කළ හ. ඉලප්පෙරුම පවුල ඔවුන් ට පක්ෂ ව අධිකරණ තීන්දුවක් මත පදනම් ව පවුල් ඉවත් කිරීම සඳහා නියෝගයක් ලබා ගැනීමට තවදුරටත් උත්සහ කරමින් සිටිති.

ඔවුන් වතුයායේ නිවාස හැර නොගිය බැවින් තමන් ඉලප්පෙරුම පවුල වෙත සෑම මසකම රු. 500,000 ක් බැගින් ගෙවන බව ඔවුන්ගේ සේවායෝජකයා වන JEDB විසින් පවුල් වෙත දන්වා තිබේ.

වතු කම්කරුවන් සඳහා ඉඩම් අයිතිය ලබා දීම අරමුණු කරගත් රාජ්‍ය වැඩසටහනක් වන 'හරිත භූමි' වැඩසටහනේ කොටසක් වශයෙන් 2019 දී එවකට රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල විසින් නඩුව ගොනු කළ පවුල් 86 ට 'හරිත භූමි' ප්‍රදානයන් ලබා දෙන ලදී.

'ප්‍රදාන' ලේඛනය මගින් ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් කොන්දේසි ගණනාවක් දක්වා ඇති අතර එහි ප්‍රමාණය හෝ සීමාවන් පිළිබඳව විස්තර නොකෙරේ.

2020 දී පීඩාවට පත් පවුල් වලට දැනගන්නට ලැබුණේ ඔවුන් ඉවත් කිරීම සඳහා වූ අධිකරණ ක්‍රියාමාර්ග යේ දී, 2020 මාර්තු 12 වන දින පැවති නඩු විභාගයකින් පසුව, ඉලප්පෙරුම පවුල ට ලබා දීම සඳහා බරන්ඩා වතුයාය අයත්වන බොහිල් වතුයාය තුළ JEDBට අයත් තවත් අක්කර 100 ක් තෝරා ගැනීම සඳහා JEDB වෙත මාස දෙකක කාලයක් ලබා දී ඇති බවයි. මීළඟ උසාවි දිනය 2020 මැයි 28 දිනට නියම කර තිබේ.

පරම්පරා ගණනක් තිස්සේ සන්තකයේ තබා ගැනීම මත පදනම් වූ ඔවුන්ගේ හිමිකම් අගය කළ යුතු බවත් එය නීත්‍යානුකූල ව පිළිගත යුතු බවත් එම පවුල් පවසා සිටියි. යථාර්ථය නම් ඔවුන් ට ලබා දිය හැකි එක ම උරුමය මෙය බැවින් තම දරුවන් සඳහා දැනට පවතින බිම් කොටස් බෙදා වෙන් කර තිබෙන බවයි. ඔවුන්ගේ ජීවිත පුරා අවිනිශ්චිතතාව පවතී. නීති පද්ධතිය විසින් ඔවුන් වෙත දැනුම් දීමකින් තොර ව හෝ ඔවුන්ගේ නඩුව ඉදිරිපත් කිරීමට කිසිදු අවස්ථාවක් ද ලබා නොදී ඔවුන් දන්නා එක ම ඉඩම සහ නිවාසය දැන් තමන් නීතිවිරෝධී ලෙස අත්පත් කරගෙන සිටින බව තීරණය කර තිබීම ඔවුන් ට හදිසියේ ම දැන ගැනීම ට සිදුවීම සම්බන්ධයෙන් ඔවුන් තුළ අසාධාරණය පිළිබඳ ගැඹුරු හැඟීමක් තිබේ. ඔවුන්ගෙන් කිහිප දෙනෙකු ට ඔවුන්ගේ ඉඩම්වල යම් ආකාරයක හිමිකාරිත්වයක් ලබා දීමට රජය දක්වන ප්‍රතිචාරය ද කොන්දේසි සහිත සහ අපැහැදිලි එකකි.





# පැලවත්ත

**(මහජන ඉඩම් කොමිෂන් සභාවේ විමසීම්වල දී සහ සිවිල් සමාජ සංවිධානවල වාර්තා වල ඉදිරිපත් කිරීම් වලින් සකස් කර තිබේ)**

- **ස්ථානය** මොණරාගල දිස්ත්‍රික්කය
- **බලපෑමට ලක් වූ පවුල් / පුද්ගලයින් ගණන** පවුල් 2700 කට වැඩි ගණනක් ලබපෑමට ලක් ව තිබේ
- **ආරවුලට භාජනය වූ ඉඩමේ ප්‍රමාණය** ආසන්නව අක්කර 84000
- **ඉඩම් ආරවුල ආරම්භ වූ වර්ෂය** 1980 දශකය

පරම්පරා ගණනාවක් පැලවත්ත ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින සාම්ප්‍රදායික ගොවීන්ගේ ඉඩම් ශ්‍රී ලංකා රජය විසින් අත්පත් කර ගනු ලැබීය. 1980 දශකයේ මුල් භාගයේ දී අක්කර 84000 ක ඉඩමක් වසර 30 ක් සඳහා පැලවත්ත සීනි සමාගමට බදු දී තිබේ. සමාගම කිහිප වතාවක් අයිතිකරුවන් වෙනස් කරනු ලැබූ අතර 2011 නොවැම්බරයේ දී රජය 'ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම්' පිළිබඳ නීතියක් සම්මත කරමින් සමාගම රජයට ලබා ගත්තේ ය.

උක් වගා කර සමාගමට විකිණීමේ කොන්දේසි පිළිගත් මුල් සාම්ප්‍රදායික ගොවීන්ගෙන් සමහරෙකුට භූමියේ රැඳී සිටීමට හැකි විය. උක් වගාව සඳහා දිවයිනේ වෙනත් ප්‍රදේශවලින් ගොවීන් පැලවත්ත කරා ගෙන එන ලදී. සෑම ගොවියෙකුටම ආසන්න වශයෙන් අක්කර 4 1/2 ක භූමි ප්‍රමාණයක් ලබා දී ඇති අතර එයින් අක්කර 1/2 යක ප්‍රමාණයක් ඔවුන්ගේ නේවාසික භාවිතය සඳහා වෙන් කර තිබේ. පදිංචිකරුවන්ට එම බිම් කොටසෙහි නිවසක් තැනිය හැකි නමුත් ඉඩමට හෝ දේපළට ඔප්පු හෝ හිමිකම් නැත. සමාගම සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත්තු ඉංග්‍රීසි බසින් වූ අතර අද දක්වා ම ඔවුන්ගේ ජනාවාස පරිපාලනය සමාගම විසින් සිදු කරනු ලබන අතර එහි ජීවත් වන පවුල් වලට ප්‍රාදේශීය පරිපාලන සේවාවන් සඳහා ප්‍රවේශය අව ම හෝ හෝ ප්‍රවේශයක් නොමැති තත්වයක් තිබේ. වැවිලි භූමිය තුළ පවුල් 2700 ක් ජීවත් වන බවට ගණන් බලා තිබේ.

සමාගම විසින් වගාකරුවන් ඉඩමෙහි පදිංචි වූ විට එහි ජනාවාස සංවිධානය කරන ලද අතර දැන් ජනාවාස 16 ක් තිබේ. සමහරුන් අවුරුදු 30 කට වැඩි කාලයක් වශයෙන් වසර ගණනාවක් තිස්සේ ඔවුන් නේවාසික බිම් කැබැල්ලක ජීවත් වුව ද, ගොවීන්ට ඉඩම්වල කිසිදු ආකාරයක අයිතියක් හිමි නොවේ. මෙයින් අදහස් කරන්නේ ඔවුන් තම නේවාසික බිම් කොටසෙහි ආයෝජනය කර ඇති ඕනෑ ම දෙයක් තම දරුවන්ට සහ මුණුබුරන්ට ලබා දිය නොහැකි බවයි. තමන් ට නිවෙස් හිමි කර ගැනීමේ හැකියාව අඛණ්ඩ ව වගා කිරීමේ හැකියාව සමඟ බැඳී ඇති හෙයින් ඔවුහු තම නිවාස අහිමි වේ යැයි බිය පළ කරති. සමහර වැඩිහිටි වගාකරුවන්ට තමන් තම පවුල් මුහුණ දෙන අස්ථිර තත්වයට වගකිව යුතු යැයි හැඟේ - අසනීප හේතුන් මත වගා කිරීමට නොහැකි නම්, වයස හෝ වෙනත් හේතුවක් නිසා වැඩ කිරීමට නොහැකි නම්, ඔවුන්ගේ මුළු පවුලට ම තම නිවස අහිමි වනු ඇත.

රජය සහ සමාගම අතර බදු ගිවිසුම අවසන් වී ඇති බව 2017 දී ගොවීන්ට දැන ගැනීමට ලැබුණි. බදු සඳහා නැවත සාකච්ඡා කිරීම වෙනුවෙන් රජය විසින් නිවාස ඉදිකර ඇති ඉඩම් ද ඇතුළු ව ඉඩම් මැනීම ආරම්භ කර තිබේ. අව ම වශයෙන් ඔවුන් තම නිවස යැයි පවසන අක්කර 1/2 යක වත් හිමිකාරිත්වය ලබා ගැනීම වෙනුවෙන් වගාකරුවන් අරගල කිරීම ආරම්භ කළහ.

ඔවුන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් බුත්තල සහ වැල්ලවාය කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම්වරු විසින් ජනාවාස හෝ ජනපද ලෙස හඳුන්වන ජනපද 4 ක පදිංචිකරුවන් පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. එක් ජනාවාසයක දී, 'ඉඩම් කච්චේරි'යක් (ඉඩම් නොමැති අයට රජයේ ඉඩම් ලබාදීම පිළිබඳ ව තීරණය කිරීමට පෙර පවත්වන රැස්වීමක්) පවත්වන ලද අතර නේවාසික වගා පවුල් විසින් ඒ සඳහා අයදුම්පත් 90 ක් එවන ලදී. අයදුම්කරුවන්ගෙන් 84 දෙනෙකුට 2019 දී අයදුම්පත් ලැබී

වසර 2 කට පමණ පසු හිමිකාරිත්වය සඳහා සුදුසුකම් ඇති බවට ඔප්පු ලැබී ඇති බව සඳහන් විය. සමහර පදිංචිකරුවන් තමන්ට ලැබී ඇති ලියවිල්ලෙන් නියෝජනය වන ඉඩම් සඳහා ඇති හිමිකම පිළිබඳ පැහැදිලිකම පිළිබඳ ව කනස්සල්ල පළ කර තිබේ. කාන්තා මූලිකත්වයෙන් යුත් පවුල් ද ඔවුන්ගේ හිමිකම සඳහා වන හිමිකම් නිසි ලෙස සලකා නොදෙන බවට පැමිණිලි කර තිබේ. එසේ ම, ජීවත්වන කාලත්‍රයෙකුට දිගට ම හිමිකාරීත්වය ලබා ගත හැකි බවට සහතික වන ඒකාබද්ධ හිමිකම ද හඳුනාගෙන නැත. 9 සහ 11 ජනපද සඳහා නිවැසියන් ට පවසා තිබුණේ ඔවුන්ගේ ඉඩම්වල හිමිකාරීත්වය ඇත්තේ කතරගම පන්සලට බැවින් ඔවුන් ට ඔප්පු ලබා දිය නොහැකි බවයි. 3 ජනපදයේ පදිංචිකරුවන් පවසන්නේ ඔවුන් තම ඉඩම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති නමුත් තවමත් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බවයි. ග්‍රාම නිලධාරි විසින් අයදුම්පත් 174 ක් පමණ අතින් සකස් කළ යුතු බැවින් කාලය ගතවන බව ඔවුන් ට දන්වා තිබේ. 16 වන ජනපදයේ පවුල් 67 කට ඔවුන්ගේ ඉඩම් සඳහා බලපත්‍ර ලැබී ඇති අතර, එයින් අදහස් වන්නේ ඉඩම සංවර්ධනය නොකිරීමේ පදනම මත රජය ට ඉඩම් ආපසු ලබා ගත හැකි බවයි. එම අවසර පත්‍ර ලබා දී තිබුණ ද, සමහරුන් කියා සිටියේ සමාගමෙන් අනුමැතිය සඳහා ලිපියක් ලබා නොගෙන බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි වූ බවත්, එය පවුලක මූල්‍ය තීරණ සම්බන්ධයෙන් සමාගම ට ඇති පාලනය කෙරතම් ද සහ වගා පවුලක ට බරපතල ප්‍රතිවිපාක ඇති විය හැකි බැවින්, ගැටළු මතු කිරීම හා වඩා හොඳ තත්වයන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම කෙතරම් දුෂ්කර ද යන්නේ ද යන්නයි.


සමාගම විසින් වතු කම්කරුවන්ට බීජ, යන්ත්‍රෝපකරණ සහ පළිබෝධනාශක ලබා දීමේ විධිවිධානයට එකඟ වීමට වගාකරුවන්ට බල කෙරුණු අතර අස්වැන්න විකුණන විට සමාගම මෙම වියදම්වල පිරිවැය ගොවියා ට ගෙවන මුදලින් අඩු කරයි. සමහර ගොවීන් පවසන්නේ මුල් අවදියේ දී අස්වැන්න වඩා හොඳ බවත් අඩු කිරීම්වලින් පසුවත් ඔවුන් ප්‍රමාණවත් වැටුපක් ලැබූ බවත් ය. කෙසේ වෙතත්, කාලයත් සමඟ අස්වැන්න අඩු වී ඇති අතර පිරිවැය සාපේක්ෂ ව ඉහළ බැවින් එය අතිශය දුෂ්කර ජීවනෝපායක් බවට පත් වී තිබේ. එක් වගාකරුවෙක් පවසන්නේ ඔවුන් අස්වැන්න ටොන් 200 ක් ලබා ගැනීමට භාවිත කළ ස්ථානයේ දැන් ටොන් 50 ක් වත් ලබාගත නොහැකි බවත්, ඒක-බෝග වගාව හේතුවෙන් පාංශු භ්‍රමණයක් නොමැති වීම අස්වැන්න කෙරෙහි බලපාන බවත් ය. දේශගුණික විපර්යාසයන් භූමියට බලපාන බවත්, මේ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බවත් ඔවුහු පවසති. වගාකරුවන්ට භූමියේ වෙනත් බෝගයක් වගා කිරීමට අවසර නොමැති අතර, ඔවුන් පදිංචි ව සිටින ඉඩම් ද මෙයට ඇතුළත් ය. ඔවුන්ගේ නේවාසික බිම් කැබලිවල පරිභෝජනය සඳහා ගස් (පොල් ගස් වැනි) හෝ වෘක්ෂලතාදිය වගා කරන්නේ නම් ඔවුන් ට සමාගමෙන් අනතුරු ඇඟවීමේ ලිපි ලැබී තිබේ. සමහර අනතුරු ඇඟවීමේ ලිපි වලට අනුකූල නොවන්නේ නම් ඔවුන්ගේ නිවාස අහිමිවන බවට තර්ජනය කර තිබේ.

සමාගම විසින් ඔවුන් මත තබා ඇති අතිරේක මූල්‍යමය බර ද වගාකරුවන් විසින් හඳුනා ගනී. උදාහරණ ලෙස, ලැව් ගින්නක් හේතුවෙන් බෝග වලට හානි සිදුවුවහොත්, වගාකරු විසින් හානිය සඳහා වන වියදම දැරිය යුතු අතර, දින 3 ක් ඇතුළත බෝගය භාර නොදුන්නේ නම් වගාකරුවන්ට දඩ මුදල් අය කරනු ලැබේ. එසේම කතරගම පන්සල විසින් ද කුඩා 'බද්දක්' අය කරන බව ගොවීන් පවසයි. ඒ හා සමාන ව, 2016 දී සමහර පවුල් තම ඉඩම් සඳහා බලපත්‍ර ඉල්ලා සිටි විට දී රාජ්‍ය නිලධාරීන් විසින් 'ලේඛන සකස් කිරීම' පිළිබඳ 'චෝදනා' එල්ල කරන ලද අතර පසුව ඒ සඳහා කිසිදු පදනමක් නොමැති බව ඔවුහු දැන ගත්හ. බලපත්‍ර ලබාගත් අය අතර නොසිටි රන්දෙනියාවේ පවුල් 30 ක පමණ අය පවසන්නේ තමන්ට අසාධාරණ ලෙස සලකන ඉඩම් සහ නිවාස සඳහා බද්දක් ගෙවීමට අපේක්ෂා කර ඇති බවයි. කෙසේ වෙතත් 1990 දශකයේ සිට සේවාවන් සහ පහසුකම් නඩත්තු කිරීමේ අඩුවීමක් දක්නට ලැබෙන බවත්, සමහරු පවසන පරිදි 2000 වර්ෂයේ දී සමාගමේ හිමිකාරිත්වය වෙනස් වීමෙන් පසුව එහි සේවා සැපයීම් නැති වී ගොස් ඇති බවයි. ප්‍රවාහන පහසුකම් ඉතා දුර්වල වන අතර එක් ජනපදයක සිට තවත් ජනපදයට යාමට පවා අපහසු ය. මෙම තත්වය ඔවුන් ට මිල අධික ත්‍රිරෝද රථ

කුලියට ගැනීමට බල කර තිබේ. ජල හිඟය පවුල්වල සෞඛ්‍යය කෙරෙහි ද බලපා තිබේ. ලබා ගත හැකි පානීය ජලය උණුසුම් අව්වේ ප්ලාස්ටික් බහාලුම්වල ගබඩා කර ඇති අතර මෙහි සෞඛ්‍ය ප්‍රතිවිපාක පිළිබඳ ව පවුල් සැලකිලිමත් වේ. ජනපදවල ඉතා වැඩි පිරිසක් නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩා විඳිති. මෙය මරණයන් ගණනාවකට හේතු වී ඇති අතර එහි දී කාන්තා මූලික වූ නිවාස කිහිපයක්ම අතහැර දැමීමට ලක් වී තිබේ.

වගාකරුවන්ගේ පවුල්වලට ඔවුන් ජනපදවල කොටසක් බවට පත් වීම නිසා සමාජ අපකීර්තියට පත්වන බවත් රාජ්‍ය පරිපාලන සේවයෙන් තමන් ඉවත් වී ඇති බවත් හැඟේ. ඔවුන් ට ඔවුන්ගේ ඉඩම්, නිවාස සම්බන්ධයෙන් ඉතා අඩු පාලනයක් පමණක් තිබෙන අතර, වතුයාය තුළ සීනි වගාව සඳහා පනවා ඇති සූරාකෑමේ කොන්දේසි සැලකිල්ලට ගෙන, ඔවුන්ගේ මූල්‍යමය යහපැවැත්ම පිළිබඳ ව නිරන්තරයෙන් සැලකිලිමත් වන අතර ම ඔවුන්ගේ අනාගතය හෝ දරුවන්ගේ සැලසුම් පිළිබඳ ව කිසිවක් කළ නොහැක. එක් ගොවියෙක් තමන් වහලෙකු මෙන් යැයි පවසා සිය අත්දැකීම් සාරාංශ කළේ ය.






# සිරිසර උයන, දෙමටගොඩ

**(මහජන ඉඩම් කොමිෂන් සභාවේ විමසීම්වල දී සහ සිවිල් සමාජ සංවිධානවල වාර්තා වල ඉදිරිපත් කිරීම් වලින් සකස් කර තිබේ)**

- **ස්ථානය** කොළඹ දිස්ත්‍රික්කය
- **බලපෑමට ලක් වූ පවුල් / පුද්ගලයින් ගණන** පවුල් 700කට වැඩි
- **ආරවුලට භාජනය වූ ඉඩමේ ප්‍රමාණය** නිවාස 700 කට වැඩි
- **ඉඩම් ආරවුල ආරම්භ වූ වර්ෂය** 2014

සිරිසර උයන යනු නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ නෙරපා හරින ලද හෝ බලහත්කාරයෙන් නැවත පදිංචි කරන ලද කොළඹ නාගරික දුප්පතුන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ගොඩනගන ලද මහල් ගොඩනැගිල්ලකි. මෙම ව්‍යාපෘතිය කොළඹ නගරය 'ලෝක මට්ටමේ නගරයක්' බවට පත් කිරීමේ විශාල අරමුණෙහි කොටසකි. මෙම මහල් නිවාසය 2014 දී විවෘත කරන ලද අතර එහි මහල් 12 ක් තුළ නිවාස 700 කට අධික ප්‍රමාණයක් තිබේ. එය පිහිටා තිබෙන්නේ දෙමටගොඩ ය. මේ දක්වා පවුල් 15,000 ක් පමණ නාගරික සංවර්ධන අධිකාරිය විසින් උතුරු කොළඹ ඉදිකරන ලද විවිධ උස් ගොඩනැගිලි සංකීර්ණ වෙත ගෙන ගොස් තිබේ. සිරිසර උයනෙහි හි වෙසෙන පදිංචිකරුවන් කොටා පාර, 168 වත්ත, ඇපල් වත්ත, මාලිගාවත්ත, 43 වත්ත සහ බේකරි වත්ත වැනි ප්‍රදේශවල සිට ස්වකැමැත්තෙන් තොර ව තම නිවෙස්වලින් වෙනත් ස්ථානයකට ගෙන ගොස් හෝ බලහත්කාරයෙන් ඉවත් කරන ලද අය වේ. සමහර පවුල් දශක ගණනාවක් තිස්සේ තම නිවෙස්වල වාසය කර ඇති අයයි. පදිංචිකරුවන්ගෙන් බොහෝ දෙනෙක් කොළඹ පුරා වැඩ කරන දෛනික වැටුප් කම්කරුවන් ය - ත්‍රිරෝද රථ රියදුරන්, ගෙවතු වගාකරුවන්, සනීපාරක්ෂක කම්කරුවන්, ගෘහ සේවකයින්, කර්මාන්තශාලා සේවකයින්; සමහරුන් කොළඹ මහ නගර සභාවේ සහ වරාය අධිකාරියේ සේවය කරන හෝ පෞද්ගලික කාර්යාලවල සේවය කරන සිවිල් සේවකයින් ය.

නාගරික පුනර්ජනන ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය 'නිවසක් සඳහා නිවසක්' මිස පවුලකට නිවසක් නොවේ. බලපෑමට ලක් වූ පවුල්වල අදහස් විමසීමකින් තොර ව මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලදී. එහි දී පෙර නිවසේ ප්‍රමාණය හෝ ඒ තුළ පදිංචි ව සිටි පවුල් සංඛ්‍යාව සැලකිල්ලට නොගනී. මෙයින් අදහස් කරන්නේ වර්ග අඩි 500 ට වඩා විශාල නිවාස හෝ බහු මහල් හෝ පවුල් කිහිපයක් එකට වාසය කළ නිවාස සඳහා - සාමාන්‍යයෙන් මෙන් - එක් මහල් නිවාසයකට පමණක් හිමිකම් ඇති බවයි. එබැවින්, දැන් විශාල නිවසක එකට ජීවත් වූ පවුල් සියල්ලන් ම ජීවත් විය යුත්තේ වර්ග අඩි 400 ක එක් නිවසක වන අතර එය එක් එක් නිවාස ඒකකයේ ආසන්න ප්‍රමාණයයි. මෙම අවකාශය නොමැතිකම සහ සමස්ත සංකීර්ණයේ සැලසුමෙහි අර්ථය වන්නේ අවිධිමත් ජීවනෝපායක නියැලී සිටින බොහෝ දෙනෙකුට - ආහාර ද්‍රව්‍ය සෑදීමේ සිට බයිසිකල් අළුත්වැඩියා කිරීම දක්වා සහ කුඩා සාප්පු කළමනාකරණය දක්වා - නැවත ස්ථානගත කිරීමෙන් පසු ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට නොහැකි වීමයි.

මෙම මහල් නිවාසවල සීමිත ඉඩකඩ සහ සංයුක්ත ස්වභාවය සහ උස් භාවය නිසා පවුලක් තුළ සහ පවුල් අතර පෞද්ගලිකත්වයට බාධා ඇති වන අතර බොහෝ විට එහි ප්‍රතිඵලය වන්නේ පවුලේ සාමාජිකයන් හෝ අසල්වාසීන් අතර ගැටළු ඇති වීමයි. මෙම නව පසුබිම තුළ, කොළඹ විවිධ ප්‍රදේශවලින් පදිංචියට එන පුද්ගලයින් ඔවුන්ගේ පෙර සමාජ ජාල වලින් පිටත සිටින පුද්ගලයින්ට සමීප ව ජීවත් වේ. එමනිසා, ගොඩනගන ලද ප්‍රජා පරිසරය මගින් වරක් හුරුපුරුදු අසල්වැසියා ප්‍රජාවගේ ආරක්ෂාව විසුරුවා හරිනු ලබන අතර, කාන්තාවන් සහ ළමුන් සඳහා ඉහළ මට්ටමේ අනාරක්ෂිත පරිසරයක් නිර්මාණය වේ.

සිරිසර උයන වැසියන්ගේ ප්‍රධාන ම ගැටළුවක් වන්නේ ඔවුන්ගේ මහල් නිවාසවලට හිමිකාරිත්වයක් හෝ නීතිමය ලියවිල්ලක් නොමැති වීමයි. සමහර පදිංචිකරුවන්ට ඔවුන්ගේ කලින් දේපොළ සඳහා ඔප්පු ද තිබූ නමුත් ඒ සඳහා ඔවුන් ට වන්දි නොලැබුණි. ඔවුන්ගේ නිවෙසට ඇති හිමිකාරිත්වය හෝ ඊකියාව කුමක් වුවත්, සෑම නිවසක් ම තම නව මහල් නිවාසයට ඔප්පුවක් ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත රුපියල් මිලියනයක් ගෙවිය යුතු ය. උපයෝගිතා බිල්පත් ද සමඟ මෙම මාසික වාරිකය ගෙවීමට සිදුවීම නැවත පදිංචි කිරීමෙන් පසු ඔවුන්ගේ ආදායම සැලකිය යුතු ලෙස අඩු වී ඇති පවුල් වලට විශාල මූල්‍ය බරක් නිර්මාණය කර තිබේ.

නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යංශයේ පාලනය යටතේ තිබිය දී සිරිසර උයනෙහි පවුල් නැවත පදිංචි කිරීම ආරම්භ විය. එමනිසා, ඔවුන් කලින් නිවාසවලින් ඉවත් කරනු ලැබුවේ හමුදාව මිස කිසිදු රජයේ නිලධාරියෙකු හෝ නිවාස අධිකාරියක් නොවේ. මිලිටරි කරණය වූ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ, ඔවුන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී හිරිහැර, බිය ගැන්වීම් සහ තර්ජන වලට මුහුණ දුන්හ. හමුදාවේ මැදිහත්වීම නිසා ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සහ ඔවුන්ගේ ගැටළු අදාළ බලධාරීන්ට ඉදිරිපත් කිරීම සඳහා ඇති ඉඩකඩ සීමිත විය.

2014 දී උස ගොඩනැගිළි විවෘත කළ දින සිට ම එහි භෞතික තත්ත්වය වේගයෙන් පිරිහී තිබේ. පදිංචිකරුවන් පවසන්නේ පොදු ස්ථාන අපිරිසිදු වීම හා පිරිසිදු නොකිරීම, බිත්තිවල ඉරිතැලීම්, පරෙවියන් බෝවීම සහ තට්ටු 12 ක් උස ගොඩනැගිල්ලක සෝපාන බිඳවැටීම නිසා මිනිසුන්ට පඩි පෙළක් නැගීමට සිදුවීම දැන් පවතින තත්වය බවයි. අපරාධ, මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය ජාවාරම් කිහිපයක් ද වසර කිහිපය තුළ වාර්තා වී තිබේ. සිරිසර උයනෙහි හි නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යාලයක් තිබුණ ද, ඔවුන් ගොඩනැගිල්ල ප්‍රමාණවත් ලෙස නඩත්තු නොකරන අතර පහසුකම් බිඳවැටීම හෝ යටිතල පහසුකම් පිළිබඳ පැමිණිලි වලට පැමිණෙන්නේ ද කලාතුරකින් පමණි.



# විමර්ශන

## References

අබේවික්‍රම, යූ.ජී.පී.සී. 2015. "මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ මානව ජනාවාස ඇතිකිරීමේ උපායමාර්ගය", පි 222, දේපොළ වෙළෙඳාම් කළමනාකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ පළමු ජාතික සම්මන්ත්‍රණය, 2015 නොවැම්බර් 5, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

අගර්වාල්, බිනා. 1994. තමන්ගේම ක්ෂේත්‍රයක්: දකුණු ආසියාවේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ඉඩම් අයිතිවාසිකම්. කේම්බ්‍රිජ්: කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය.

බැස්ටියන්, සුනිල්. 2009. "ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ හා ඉඩම් ජනාවාස ඇතිකිරීමේ දේශපාලනය".

http://www.sunilbastian.com/content_images/1401161701Politics%20of%20Land%20Reform%20in%20Sri%20Lanka.pdf

භවානි ෆොන්සේකා සහ මිරාක් රහීම්, "උතුරු පළාතේ ඉඩම්: පශ්චාත් යුධ දේශපාලනය, ප්‍රතිපත්ති හා භාවිතයන්" විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය, 2011 දෙසැම්බර්.

විකල්ප ප්‍රතිපත්ති සඳහා මධ්‍යස්ථානය. "පශ්චාත් සුනාමි ශ්‍රී ලංකාවේ ඉඩම් නොමැතිකම සහ ඉඩම් අයිතිවාසිකම්" (කොළඹ, 2005).

චාමිකර, සජීව. "රජය මිලියන ගණනකට බලපාන විනාශකාරී ඉඩම් ප්‍රතිපත්ති අනුගමනය කිරීම නතර කළ යුතුයි", මොන්ලාර් (https://monlar.lk/landbankenglish.html)

සිට්රාලේකා, මාවු සහ සරලා එමානුවෙල්. පෙන්කාලින් නිලම්:.

මඩකලපුවේ පශ්චාත් සුනාමි නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාන්තා ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යයනයක්. මඩකලපුව: සූරිය කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, 2010.

ද සිල්වා, සරත් මතිලාල්, 2016. "ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව සඳහා රජයේ ඉඩම් ඉවත් කිරීමේ නීතිමය හා ප්‍රතිපත්තිමය ගැටලු" (දේපොළ වෙළෙඳාම් කළමනාකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ 2 වන ජාතික සම්මන්ත්‍රණය, 2016 පර්යේෂණ හා වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (EMV-RPDC), විශ්ව විද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර, ශ්‍රී ලංකාව.)

දිවිතුර, එච් සහ සී ටැන්ග් (2013) ශ්‍රී ලංකාවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ හා කැඩැස්ට්‍රල් මැනුම් පද්ධතිවල විකාශනය, සමීක්ෂණ සමාලෝචනය, 45: 329, 126-135

ෆොන්සේකා, භවානි සහ මිරාක් රහීම්. "උතුරු පළාතේ ඉඩම්: පශ්චාත් යුධ දේශපාලනය, ප්‍රතිපත්ති සහ භාවිතයන්." (විකල්ප ප්‍රතිපත්ති සඳහා මධ්‍යස්ථානය, 2011 දෙසැම්බර්).

ගුඩ්හැන්ඩ්, ජොනතන්. "ජයග්‍රාහකයාගේ සාමය ස්ථාවර කිරීම? නැගෙනහිර ශ්‍රී ලංකාවේ මානුෂීය ක්‍රියාමාර්ග සහ ප්‍රතිනිර්මාණය" (ආපදා: 2010, 34 (එස් 3): එස් 342 - එස් 367).

වික්‍රමසිංහ, කමන්ති. 2016. "දේපොළ අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව සහ වෙනස් කොට සැලකීම සම්බන්ධ ඔප්පු", ඩේලි මිරර් පුවත්පත, 2016 නොවැම්බර් 2.

http://www.dailymirror.lk/article/Deeds-pertaining-to-property-rights-gender-inequality-and-discrimination-118537.html

හේරත්, ජනරංජන. 2006. ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්ති බෙදා හැරීමේ බලපෑම්. ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය (SAEA) ජාතික ඉඩම් හා කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ සඳහා වූ ව්‍යාපාරය (MONLAR).

හේරත්, කේ. 2010. රජයේ ඉඩම් නීතිය ප්‍රතිසංස්කරණය කිරීම (යෝජනා) - රජයේ ඉඩම් සම්බන්ධ නීතිය 2010

Herath, K. 2010. Reform of Law of State land (Proposals)- Law Relating to State Land 2010

හියුමන් රයිට්ස් වොච්. 2018. "අපට ගෙදර යා නොහැක්කේ ඇයි ?: ශ්‍රී ලංකාවේ හමුදා ඉඩම් අත්පත් කර ගැනීම".

Human Rights Watch. 2018. "Why can't we go home?: Military occupation of land in Sri Lanka".

ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම, "ශ්‍රී ලංකාවේ උතුර I: සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම." ආසියා වාර්තාව අංක. 219 - 2012 මාර්තු 16: http://www.crisisgroup.org/en/regions/asia/south-asia/sri-lanka/219-sri-lankas-north-i-the-denial-of-minority-rights.aspx

International Crisis Group, "Sri Lanka's North I: The Denial of Minority Rights." Asia Report no. 219 - 16 March 2012: http://www.crisisgroup.org/en/regions/asia/ south-asia/sri-lanka/219-sri-lankas-north-i-the-denial-of-minority-rights.aspx

ජයවර්ධන, කිෂාලි පින්ටෝ සහ ජයන්ත ද අල්මේදා ගුණරත්න. 2010. (සංස්), "මිනිසුන් සඳහා ඉඩම් සාධාරණද" නීතිය සහ සමාජ භාරය විසින් ප්‍රකාශයට පත් කරන ලද්දේ 2010 සැප්තැම්බර්.

ජයවීර, ස්වර්ණා. 2002. "දේශපාලන නිදහසෙන් වසර පනහක්: දළ විශ්ලේෂණයක්" යන මාතෘකාව යටතේ පශ්චාත් ස්වාධීන ශ්‍රී ලංකාවේ කාන්තාවන්, කාන්තා පර්යේෂණ මධ්‍යස්ථානය.

පෙරේරා, යොහාන් 2012. ප්‍රායෝගිකව නොවුනත්, ඉඩම් විධිමත් ලෙස බලය බෙදා හැරීමකි: "පළාත් සභා (පළාත් සභා) රජයට ඉඩම් බලතල ලබා දීමට ඉඩ ඇත.", ඩේලි මිරර් පුවත්පත, 2012 පෙබරවාරි 1.

මඩුමබන්දර, සී. එම්. (2000). ඉඩම් සම්පත්: කොන්දේසි සහ ප්‍රවණතා. ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්, ජාතික විද්‍යා පදනම, 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 7, ශ්‍රී ලංකාව.

මාපා, රංජිත් සහ කුමාරාමගේ, දර්ශනි සහ ඩබ්ලිව්ඩීඑල්, ගුණරත්න සහ දසනායක, ඒ.ආර්. 2002. "ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය: අතීතය, වර්තමානය සහ අනාගතය". ඉඩම් සංවර්ධනය, කෘෂිකර්ම හා සමුපකාර අමාත්‍යාංශය (LDD), පාංශු හා පොහොර තායිලන්ත සංගමය (SFST), ජාත්‍යන්තර පාංශු විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද 17 වන ලෝක පාංශු විද්‍යා සමුළුවේදී 2002 අගෝස්තු 14 සිට 21 දක්වා තායිලන්තයේ දී සම්මන්ත්‍රණ පත්‍රය ඉදිරිපත් කරන ලදී. (IUSS).

පෙරේරා, ඉරෝමි, ඩිඅැන් උයංගොඩ සහ අර්මිසා ටෙගල්. 2017. ලෝක මට්ටමේ නගරයක් සෑදීම: කොළඹ අවතැන්වීම සහ ඉඩම් අත්පත් කර ගැනීම. කොළඹ: විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය.

කෝර්ෆ්, බෙනඩික්ට් සහ කේ ටී සිල්වා. "ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ජනවාර්ගිකත්වය සහ ගැටුම." දුප්පත් වීම: නිදන්ගත දරිද්‍රතාවය සහ සංවර්ධන ප්‍රතිපත්තිය, 2003 අප්‍රියෙල් 7 සිට 9 දක්වා, ප්‍රකාශයට පත් නොකළ සම්මන්ත්‍රණ පත්‍රය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය.

කුලසිංහ, කේ.වී.පී.පී. 2015. "නැවත පදිංචි වූවන්ගේ තෘප්තිමත් මට්ටම පිළිබඳ විශ්ලේෂණයක්: මිහිඳු සෙන්පුර නිවාස වැඩසටහනේ සිද්ධි අධ්‍යයනයක්", පි 236, දේපොළ වෙළෙඳාම් කළමනාකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ පළමු ජාතික සම්මන්ත්‍රණය, 2015 නොවැම්බර් 5, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

පොන්ස්-විග්නොන්, එන්. සහ එච්. සොලිග්නාක් ලෙකොම්ට් (2004), "ඉඩම්, ප්‍රචණ්ඩ ගැටුම් සහ සංවර්ධනය", OECD සංවර්ධන මධ්‍යස්ථානයේ වැඩ පත්‍රිකා, අංක 233, OECD ප්‍රකාශන, පැරීසිය.

නීතිය හා සමාජ භාරය, ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරියඃ අදාළ නීතිය. 2015

ලෙඩරක්, ජෝන් පෝල්. සාමය ගොඩනැගීමඃ බෙදුණු සමාජවල තිරසර ප්‍රතිසන්ධානය (වොෂිංටන්ඃ එක්සත් ජනපද සාම ආයතනය, 1997).

ලින්ඩ්බර්ග්, ජොන්ස් සහ ධම්මිකා හේරත්. 2014. පශ්චාත් ගැටුමේ ඉඩම් හා දුක්ගැනවිලි ශ්‍රී ලංකාවඃ දූෂණ පැමිණිලිවල භූමිකාව ගවේෂණය කිරීම, තුන්වන ලෝක කාර්තු ප්‍රකාශනය, 35ඃ 5 888-904.

ඊගර්, පෙයිග් වේලි 2008ඃ නිදහස් සටන්කරුවන්ගේ සිට ත්‍රස්තවාදීන් දක්වාඃ කාන්තාවන් සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය, රූට්ලෙජ්, නිව්යෝක්.

පරණගේ, කවින්ද්‍ර. 2018. ඉඩම් සඳහා අයිතිවාසිකම් සීමා කිරීමේ ප්‍රතිවිපාකඃ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ඉඩම් කුලී ප්‍රතිපත්තිවල බලපෑම අවබෝධ කර ගැනීම, තිරසරභාවයඃ විද්‍යාව, පුහුණුවීම් සහ ප්‍රතිපත්ති, 14ඃ 1, 46-54.

පරණගේ, කවින්ද්‍ර. 2018. "ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ වේල්ල, ඇළ සහ ජල මාර්ග වෙන් කරවා ගැනීමේ 'නීත්‍යානුකූලභාවය' ඉදිකිරීම් සංවර්ධන අධ්‍යයන පර්යේෂණ, 5:1, පි 59-68.

පීබල්ස්, පැට්රික්. 1990. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජනපදකරණය සහ ජනවාර්ගික ගැටුම, ආසියානු අධ්‍යයන ජර්නලය, වෙළුම. 49, අංක 1 (1990 පෙබරවාරි), 30-55 පි.

සමරවීර, විජය. 1981. ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනය සඳහා ඉඩම්, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ අංශීය අවශ්‍යතා. නූතන ආසියානු අධ්‍යයන, 15 (1), 127-162.

උන්රු, ජේ, සහ ආර්. සී. විලියම්ස්. 2013. ඉඩම්ඃ සාමය ගොඩනැගීම සඳහා පදනමක්. ඉඩම් සහ පශ්චාත් ගැටුම් සාමය ගොඩනැගීම, ජේ. උන්රු සහ ආර්. සී. විලියම්ස්. ලන්ඩන්ඃ අර්ත්ස්කෑන්



**ප්‍රකාශනය:**

PARL
People's Alliance for Right to Land

ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය යනු 2011 සිට ශ්‍රී ලංකාවේ ආන්තීකරණයට ලක් වූ ජනතාවගේ නිවාස, ඉඩම් හා දේපොළ අයිතිය පිළිබද වත්, ඉඩම් මංකොල්ලයට එරෙහි වත් එක් ව වැඩකරන සිවිල් සමාජ සංවිධාන හා පුද්ගලයින්ගේ ස්වේච්ඡා එකතුවකි. එය පීඩිතයින්ට තමන්ගේ ඉඩම්වල, ධීවර ප්‍රදේශවල හා නිවාසවල අයිතිය අහිමි කරවීමට එරෙහි ව හා අවතැන්වූවන්ගේ අරගල වලට සහයෝගිතාවෙන් කටයුතු කරන පාරිසරික සංවිධාන, සමාජ සාධාරණත්වය, මානව හිමිකම් උදෙසා කටයුතු කරන කාන්තාවන්ගේ, සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, වතුකම්කරුවන්ගේ හා සිවිල් සමාජ එක් වේදිකාවකට ගෙන එයි.

*facebook.com/parlsl*
*twitter.com/ParlSl*
*parlsl.com*